මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# මජ්ඣිම නිකාය

# 5

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආය්‍ර්‍යරත්න රේරුකාන මහතා

# මජ්ඣිම නිකාය

## 5

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1954
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**
**මජ්ඣිම නිකාය 5**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 නොවැම්බර්.

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ අටවෙනිවූ මේ පොතට මජ්ඣිම නිකායෙන් සූත්‍ර විසි හයක් පිළිවෙළට අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. සඟියේ සූත්‍ර මධ්‍යම ප්‍රමාණවූ බැවින් ඊට මජ්ඣිම නිකාය යන නාමය යෙදේ. එහි ඇති සූත්‍ර එකසිය පනස් දෙක මූල පණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය, උපරි පණ්ණාසකයයි පණ්ණාසක තුනකට බෙදා තිබේ.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, තමන්ට වැඩි සනීපයක්ද නැතුව සිටින නමුත් ඒ හිරිහැර ගැන කිසිසේත් නොසලකා ශාසන ආලයෙන් ආචාර්ය ආයසීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයසීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, අහුන්ගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ ද, බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන් වහන්සේද, පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

26 - 6 - 54,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

x

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | | පිට |
|---|---|---|
| 27 | අනුරුද්ධ සූත්‍රය | 1785 |
| 28 | උපක්ලෙශ සූත්‍රය | 1795 |
| 29 | බාල පණ්ඩිත සූත්‍රය | 1810 |
| 30 | දේවදූත සූත්‍රය | 1832 |
| 31 | භද්දෙකරත්ත සූත්‍රය | 1844 |
| 32 | ආනන්ද භද්දෙකරත්ත සූත්‍රය | 1848 |
| 33 | මහා කච්චායන භද්දෙකරත්ත සූත්‍රය | 1857 |
| 34 | ලොමසකඞ්ගිය භද්දෙකරත්ත සූත්‍රය | 1877 |
| 35 | චූලකම්ම විභඞ්ග සූත්‍රය | 1885 |
| 36 | මහාකම්ම විභඞ්ග සූත්‍රය | 1896 |
| 37 | සළායතන විභඞ්ග සූත්‍රය | 1912 |
| 38 | උද්දෙස විභඞ්ග සූත්‍රය | 1928 |
| 39 | අරණ විභඞ්ග සූත්‍රය | 1944 |
| 40 | ධාතු විභඞ්ග සූත්‍රය | 1955 |
| 41 | සච්ච විභඞ්ග සූත්‍රය | 1970 |
| 42 | දක්ඛිණා විභඞ්ග සූත්‍රය | 1978 |
| 43 | අනාථ පිණ්ඩිකොවාද සූත්‍රය | 1985 |
| 44 | ඡන්නොවාද සූත්‍රය | 1997 |
| 45 | පුණ්ණොවාද සූත්‍රය | 2005 |
| 46 | නන්දකොවාද සූත්‍රය | 2012 |
| 47 | චූල රාහුලොවාද සූත්‍රය | 2032 |
| 48 | ඡඡක්ක සූත්‍රය | 2039 |
| 49 | මහාසළායතන සූත්‍රය | 2062 |
| 50 | නගර වින්දෙය්‍ය සූත්‍රය | 2069 |
| 51 | පිණ්ඩපාත පාරිශුද්ධි සූත්‍රය | 2074 |
| 52 | ඉන්ද්‍රිය භාවනා සූත්‍රය | 2084 |

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - 'අකුරු' අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිගාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# මජ්ඣිම නිකාය

## (උපරි පණ්ණාසකය)

## 27. අනුරුද්ධ සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු මහසිටුහුගේ අරමෙහි වැඩ වාසය කරණසේක. එකල්හි 'පඤ්චකංග' නම් වඩුතෙම එක්තරා පුරුෂයෙකුට කථාකළේය. "පින්වත් පුරුෂය, නුඹ මෙහි එව. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ යම් තැනකද, එහි යව. ගොස්, මගේ වචනයෙන් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ගේ පාදයන් සිරසින් වඳුව. මෙසේද කියව, 'ස්වාමීනි, 'පඤ්චකංග' වඩුතෙම ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ගේ පා සිරසින් වඳියි. මෙසේත් කියයි. ස්වාමීනි, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ හෙට පඤ්චකංග නම් වඩුවාගේ බත තමන් සතර වැනිව ඉවසනසේක්වා. ස්වාමීනි, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ කල් ඇතිව වඩිනු මැනවි. පඤ්චකංග වඩුතෙම රජුන් පිළිබඳ බොහෝ වැඩ ඇත්තේය. බොහෝ කටයුතු ඇත්තේය' කියායි. පුරුෂතෙම "ස්වාමීනි, එසේයයි" කියා පඤ්චකංග වඩුවාට උත්තර දී ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ වැඳ, එක් පැත්තක හුන්නේය.

2. එක් පැත්තක හුන් ඒ පුරුෂතෙම ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේට මෙය සැල කළේය. "ස්වාමීනි, පඤ්චකංග වඩුතෙම ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ පාදයන් මුදුනෙන් වඳී. මෙසේත් කියයි "ස්වාමීනි, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ හෙට පඤ්චකංග වඩුවාගේ බත තමන්

සතර වැනිව ඉවසනසේක්වා. ස්වාමීනි, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ කල් ඇතිව වඩිනු මැනව. ස්වාමීනි, පඤ්චකංග වඩුතෙම රජුන් පිළිබඳ බොහෝ කෘත්‍ය ඇත්තේය. බොහෝ කටයුතු ඇත්තේය' කියායි. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසුවේය.

3. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම ඒ රාත්‍රිය ඉක්මීමෙන් පෙරවරු කාලයෙහි හැඳ පාසිවුරු ගෙන පඤ්චකංග වඩුවාගේ ගෙය යම් තැනකද එහි ගියේය. ගොස්, පනවන ලද අසුනෙහි හුන්නේය. ඉක්බිති පඤ්චකංග වඩුතෙම ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් ප්‍රණීත ඛාද්‍ය භොජ්‍යයෙන් සියතින් වැළඳවීය. ඇතිතාක් වැළඳවීය. ඉක්බිති පඤ්චකංග වඩුතෙම වළඳා අවසන්හි, වළඳා පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වෙත එක්තරා පහත් ආසනයක් ගෙන එක් පැත්තක හුන්නේය.

4. එක් පැත්තක හුන් පඤ්චකංග වඩුතෙම ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය කීය. "ස්වාමීනි, මේ ශාසනයෙහි ස්ථවිර භික්ෂූහු මවෙත එළඹ මෙසේ කීවාහුය. 'ගෘහපතිය, අප්‍රමාණ සමාධිය වඩවයි කියා'යි. 'ස්වාමීනි, ඇතැම් ස්ථවිර භික්ෂූහු පැමිණ 'ගෘහපතිය, මහග්ගත සමාධිය වඩවයි, කීවාහුය. ස්වාමීනි, යම් මේ අප්‍රමාණ සමාධියක් වේද, යම් මේ මහග්ගත සමාධියක් වේද, මේ ධර්ම වෙනස් වෙනස් අර්ථ ඇත්තාහුද, වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහුද, නැතහොත් සමාන අර්ථ ඇත්තාහුද, ව්‍යංජනයෙන් පමණක් වෙනස්ද?"

"ගෘහපතිය, එසේවී නම් ඇතැම් තෙරුන් වහන්සේලා අප්‍රමාණ සමාධිය වඩවයි කීවාහුද, ඇතැම් තෙරුන් වහන්සේලා මහග්ගත සමාධිය වඩවයි කීවාහුද මෙහිදී මෙයින් තොපට විරුද්ධයක් නොවනසේ තොපටම වැටහේවා."

"ස්වාමීනි, මට මෙසේ අදහස් වෙයි. යම් මේ අප්‍රමාණ සමාධියක් වේද, යම් මේ මහග්ගත සමාධියක් වේද, මේ ධර්මයෝ එකම අර්ථ ඇත්තාහුය. ව්‍යංජන පමණක් වෙනස්ය කියායි."

**5.** "ගෘහපතිය, යම් මේ අප්‍රමාණ සමාධියක් වේද, යම් මහග්ගත චිත්ත සමාධියක් වේද, මේ ධර්ම අර්ථ වශයෙන්ද වෙනස්ය. ව්‍යංජන වශයෙන්ද වෙනස්ය. ගෘහපතිය, එය යම්සේ මේ ධර්ම අර්ථ වශයෙන් වෙනස් ද, ව්‍යංජන වශයෙන් වෙනස්ද යනු මේ ක්‍රමයෙන් දතයුතුය.

"ගෘහපතිය, අප්‍රමාණ සමාධිය කවරේද? ගෘහපතිය, මේ ශාසනයෙහි මහණතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසයකෙරෙයිද. එසේ දෙවෙනි දිසාවද, එසේ තුන්වෙනි දිසාවද, එසේ සතරවැනි දිසාවද, මෙසේ උඩ යට සරස සෑම තන්හි හැමතැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තක් වශයෙන් සියලු ලෝකය මෛත්‍රී සහගත සිතින් මහත්වූ, මහග්ගතවූ, අප්‍රමාණ, අවෛර සංඛ්‍යාත අව්‍යාපාද සිතින් පතුරුවා වාසය කරයිද

"කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරෙයිද, එසේ දෙවෙනි දිසාවද, එසේ තුන්වෙනි දිසාවද, එසේ සතරවැනි දිශාවද, මෙසේ උඩ යට සරස සෑම තන්හි හැම තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තක් වශයෙන් සියලු ලෝකය මෛත්‍රී සහගත සිතින් මහත්වූ, මහග්ගතවූ, අප්‍රමාණ, අවෛර සංඛ්‍යාත අව්‍යාපාද සිතින් පතුරුවා වාසය කරයිද,

"මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරෙයිද, එසේ දෙවෙනි දිසාවද, එසේ තුන්වෙනි දිසාවද, එසේ සතරවැනි දිසාවද, මෙසේ උඩ යට සරස සැමතන්හි හැමතැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තක් වශයෙන් සියලු ලෝකය මෛත්‍රී සිතින් මහත්වූ, මහග්ගතවූ, අප්‍රමාණ, අවෛර සංඛ්‍යාත අව්‍යාපාද සිතින් පතුරුවා වාසය කරයිද,

"උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරෙයිද, එසේ දෙවෙනි දිසාවද, එසේ තුන්වෙනි දිසාවද, එසේ සතරවැනි දිසාවද, මෙසේ උඩ යට සරස සැමතන්හි හැමතැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තක් වශයෙන්

සියලු ලෝකය මෛත්‍රී සහගත සිතින් මහත්වූ, මහග්ගතවූ, අප්‍රමාණ, අවෛර සංඛ්‍යාත අව්‍යාපාද සිතින් පතුරුවා වාසය කරයිද. ගෘහපතිය, මේ කියන ලද්ද අප්‍රමාණ සමාධියයි.

**6.** "ගෘහපතිය, මහග්ගත සමාධිය කවරේද? ගෘහපතිය, මේ සස්නෙහි මහණතෙම යම්තාක් එක් රුක්මුලක් පමණ තැනක් කසිණ නිමිත්තෙන් පතුරුවා වාසය කෙරේද, ගෘහපතිය, මේ මහග්ගත සමාධියයි කියනු ලැබේ. ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම්තාක් රුක්මුල් දෙකක් හෝ තුනක් පමණ තැන් කසිණ නිමිත්තෙන් පතුරුවා වාසය කෙරේද, ගෘහපතිය, මෙයද මහග්ගත සමාධියයි කියනු ලැබේ.

**7.** 'ගෘහපතිය, මේ සස්නෙහි මහණතෙම යම්තාක් එක් ගමක් පමණ තැනක් කසිණ නිමිත්තෙන් යටකොට පතුරුවා වාසය කරයිද, ගෘහපතිය, මෙයද මහග්ගත සමාධියයි කියනු ලැබේ.

"ගෘහපතිය, මේ සස්නෙහි මහණතෙම යම්තාක් ගම් දෙකක් හෝ තුනක් පමණ තැන් කසිණ නිමිත්තෙන් පතුරුවා වාසය කෙරේද, ගෘහපතිය, මෙයද මහග්ගත සමාධියයි කියනු ලැබේ.

**8.** "ගෘහපතිය, මේ සස්නෙහි මහණතෙම යම්තාක් එක් මහා රාජ්‍යයක් පමණ තැන කසිණ නිමිත්තෙන් පතුරුවා වාසය කෙරේද, ගෘහපතිය, මෙයද මහග්ගත සමාධියයි කියනුලැබේ. ගෘහපතිය, මේ සස්නෙහි මහණතෙම යම්තාක් මහාරාජ්‍ය දෙකක් තුනක් පමණ තැන් කසිණ නිමිත්තෙන් පතුරුවා වාසය කෙරේද, ගෘහපතිය, මෙයද මහග්ගත සමාධියයයි කියනු ලැබේ.

**9.** "ගෘහපතිය, මේ සස්නෙහි භික්ෂුතෙම යම්තාක් මුහුද කෙළවර කොට ඇති පොළොව පමණ තැන කසිණ නිමිත්තෙන් පතුරුවා වාසය කෙරේද, ගෘහපතිය, මෙයද මහග්ගත සමාධියයයි කියනු ලැබේ. ගෘහපතිය, යම්සේ මේ ධර්මයෝ නානාර්ථද නානා ව්‍යඤ්ජනද එය මේ ආකාරයෙන් දතයුතුයි.

**10.** "ගෘහපතිය, මේ භවයන්හි ඉපදීම් සතරකි. ඒ සතර කවරහුද? ගෘහපතිය, මේ ලෝකයෙහි ඇතැමෙක් ස්වල්ප රශ්මිය

ඇත්තේයයි පතුරුවා වාසය කෙරේද, හෙතෙම කායයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි පරිත්තාභ දෙවියන් හා එක්වීමට පැමිණෙයි. ගෘහපතිය, මේ ලෝකයෙහි ඇතැමෙක් අප්‍රමාණ රශ්මි ඇත්තේයයි පතුරුවා වාසය කෙරේද, හෙතෙම ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි අප්පමාණාභ දෙවියන් හා එක්වීමට පැමිණෙයි. ගෘහපතිය, මේ සස්නෙහි ඇතැමෙක් අපිරිසිදු රශ්මිය ඇත්තේයයි පතුරුවා වාසය කෙරේද, හෙතෙම ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සංකිලිට්ඨාභ දෙවියන් හා එක්වීමට පැමිණෙයි. ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැමෙක් පිරිසුදු රශ්මිය ඇත්තේයයි පතුරුවා වාසය කෙරේද, හෙතෙම ශරීරයාගේ භේදයෙන් මරණින් මතු පරිසුද්ධාභ දෙවියන් හා එක්වීමට පැමිණෙයි. ගෘහපතිය, මේ සතරක්වූ භවයන්හි ඉපදීම් වෙති.

11. "ගෘහපතිය, යම් ඒ දෙවියන් එකට රැස්වන්නාවූද අවස්ථාවෙක් වෙයි. එකල ඒ දෙවියන්ගේ වර්ණයේ වෙනසක් පැනෙයි. රශ්මියේ වෙනසක් නොපෙනෙයි. ගෘහපතිය, පුරුෂයෙක් බොහෝ කල් තෙල් පහන් යම්සේ එක ගෘහයකට ඇතුල් කරන්නේද, ඒ ගෙට ඇතුල් කළ ඒ ප්‍රදීපයන්ගේ ගිනි සිළුවල වෙනසක් පැනෙන්නේය. ආලෝකයේ වෙනසක් නොපෙනෙන්නේය. ගෘහපතිය, එපරිද්දෙන් යම් ඒ දෙවියන් එකට රැස්වන අවස්ථාවක් වෙයිද, එකල ඒ දෙවියන්ගේ වර්ණයේ වෙනසක් පෙනේ. ආලෝකයාගේ වෙනසක් නොපෙනේ. ගෘහපතිය, යම් ඒ දෙවියන් එයින් නික්මෙන්නාවූ අවස්ථාවක් ඇත්තේ වෙයිද, එකල එයින් නික්මෙන ඔවුන්ගේ වර්ණයේද වෙනසක් පෙනේ. ආලෝකයේ වෙනසද පෙනේ. ගෘහපතිය, යම්සේ පුරුෂයෙක් ඒ බොහෝ තෙල් පහන් ඒ ගෙයින් යම්සේ බැහැර කරන්නේද, එයින් බැහැර කරණ ප්‍රදීපයන්ගේ ගිනිසිළුවලද වෙනසක් පෙනේ. ආලෝකයේද වෙනසක් පෙනෙන්නේමය.

12 "ගෘහපතිය, එපරිද්දෙන්ම යම් ඒ දෙවියන් එයින් නික්මෙන්නාවූ අවස්ථාවක් වෙයිද, එකල එයින් නික්මෙන

ඔවුන්ගේ වර්ණයේද වෙනසක් පෙනේ. ආලෝකයේද වෙනසක් පෙනෙන්නේය. ගෘහපතිය, ඒ දෙවියන්ට අපගේ ස්ථානය නිත්‍යය කියා හෝ ස්ථිරය කියා හෝ සදාකාලිකය කියා හෝ මෙසේ අදහස් නොවෙයි. නමුත් ඒ දෙවියෝ උයන් ආදි යම් යම් තැනක වෙසෙත්ද, ඒ දෙවියෝ ඒ ඒ තැනම ඇලෙති. ගෘහපතිය, යම්සේ කදකින් හෝ පැසැකින් ගෙන යනු ලබන්නාවූ මැස්සන්ට මෙසේ අදහස් නොවේද, කෙසේද? අපගේ මේ ස්ථානය නිත්‍යය කියා හෝ ස්ථිරය කියා හෝ සදාකාලිකය කියා හෝ යි. තවද, යම් යම් තැනක ඒ මැස්සෝ වෙත්ද, ඒ ඒ තැන ඇලෙති. ගෘහපතිය, එපරිද්දෙන්ම ඒ දෙවියන්ට මෙසේ අදහස් නොවෙයි. අපගේ මේ ස්ථානය නිත්‍යය කියා හෝ ස්ථිරය කියා හෝ සදාකාලිකය කියා හෝ යි. තවද යම් යම් තැනක ඒ දෙවියෝ වෙසෙත්ද, ඒ දෙවියෝ ඒ ඒ තැන ඇලෙති."

13. මෙසේ ප්‍රකාශ කළ කල්හි ආයුෂ්මත් සභිය කච්චායන නම් ස්ථවිරතෙම ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය සැලකළේය.

"ස්වාමීනි, අනුරුද්ධය, මැනවි. මෙහිදී මවිසින් තවත් ඇසිය යුත්තක් ඇත. ස්වාමීනි, යම් ඒ දෙවියෝ ආලෝක ඇත්තාහු වෙත්ද, ඒ සියල්ලෝ ස්වල්ප ආලෝකය ඇත්තාහුද, නැතහොත් මෙහි ඇතැම් දෙවියෝ අප්‍රමාණවූ ආලෝකය ඇත්තාහු වෙත්ද?" කියායි.

"ඇවැත්නි, කච්චායනය, ඒ ඒ කරුණු වශයෙන් මෙහි ඇතැම් දෙවියෝ ස්වල්ප ආලෝක ඇත්තාහුද, මෙහි ඇතැම් දෙවියෝ අප්‍රමාණවූ ආලෝක ඇත්තාහුද වෙත්.

14. "ස්වාමීනි, අනුරුද්ධ ස්ථවිරයන් වහන්ස, එකම දිව්‍ය නිකායක උපන් දේවතාවන් අතුරෙන් මෙහි සමහර දේවතාවන් ස්වල්ප ආලෝක ඇත්තවුන් වීමටත්, මෙහි සමහර දේවතාවන් අප්‍රමාණවූ ආලෝක ඇත්තවුන් වීමටත් හේතු කවරේද?

"ඇවැත්නි, කච්චායනය, එසේවී නම් එය ඔබගෙන්ම විචාරන්නෙමි. යම්සේ නුඹට වැටහේ නම් එය එසේ ප්‍රකාශ

කළ මැනව. ඇවැත්. කච්චායනය, යම් මේ භික්ෂුවක් යම්තාක් එක් රුක්මුලක් පමණ තැනක් කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද යම් මේ භික්ෂුවක් යම්තාක් රුක්මුල් දෙකක් හෝ තුනක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද, මේ චිත්ත භාවනා දෙක අතුරෙන් කිනම් චිත්ත භාවනාවක් ඉතා උසස්ද? ස්වාමීනි, යම් මේ භික්ෂුවක් යම්තාක් රුක්මුල් දෙකක් තුනක් පමණ තැන් කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම් මෙය, මේ චිත්ත භාවනා දෙක අතුරෙන් ඉතා උසස්ය.

"ඇවැත්නි, කච්චායනය, යම් මේ භික්ෂුවක් යම්තාක් රුක්මුල් දෙකක් හෝ තුනක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද යම් මේ භික්ෂුවක් යම්තාක් එක් ගමක් පමණ තැන් කසිණ නිමිත්ත පතුරුවා, වාසය කෙරේ නම් ඒ කුමකැයි සිතන්නෙහිද? මේ චිත්ත භාවනා දෙක අතුරෙන් කවර චිත්ත භාවනාවක් ඉතා උසස්ද?

"ස්වාමීනි, යම් මේ භික්ෂුවක් යම්තාක් එක් ගමක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම් මෙය, මේ චිත්ත භාවනා දෙක අතුරෙන් ඉතා උසස්ය.

15. "ඇවැත්නි, කච්චායනය, යම් මේ භික්ෂුවක් යම්තාක් එක් ගමක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා, වාසය කෙරේ නම්, යම් මේ භික්ෂුවක් යම්තාක් ගම් දෙකක් හෝ තුනක් පමණ තැන් කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම් මේ කුමකැයි හඟින්නෙහිද? මේ චිත්ත භාවනා දෙක අතුරෙන් කිනම් චිත්ත භාවනාවක් ඉතා උසස්ද?

"ස්වාමීනි, යම් මේ භික්ෂුවක් යම්තාක් ගම් දෙකක් හෝ තුනක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම් මේ චිත්ත භාවනා දෙක අතුරෙන් මෙය, ඉතා උසස්ය.

"ඇවැත්නි, කච්චායනය, යම් මේ භික්ෂුවක් යම්තාක් ගම් දෙකක් හෝ තුනක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම්, යම් මේ භික්ෂුවක් යම්තාක් එක්

මහාරාජ්‍යයක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම් ඒ කුමකැයි හඟින්නෙහිද? මේ චිත්ත භාවනා දෙක අතුරෙන් කවර චිත්ත භාවනාවක් ඉතා උසස්ද?

16. "ස්වාමීනි, යම් මේ භික්ෂුවක් යම්තාක් එක් මහා රාජ්‍යයක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද, මේ චිත්ත භාවනා දෙක අතුරෙන් මෙය ඉතා උසස්ය.

"ඇවැත්නි, කච්චායනය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් මේ භික්ෂුවක් යම්තාක් එක් මහාරාජ්‍යයක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද, යම් මේ භික්ෂුවක් යම්තාක් දෙතුන් මහාරාජ්‍යයක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද, මේ චිත්ත භාවනා දෙක අතුරෙන් කවර චිත්ත භාවනාවක් ඉතා උසස්ද? "ස්වාමීනි, යම් මේ භික්ෂුවක් යම්තාක් දෙතුන් මහාරාජ්‍යයක් පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම් මෙය මේ චිත්ත භාවනා දෙක අතුරෙන් ඉතා උසස්ය.

17. "ඇවැත්නි, කච්චායනය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් මේ භික්ෂුවක් යම්තාක් දෙතුන් මහාරාජ්‍යයක් පමණ තැන් කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද, යම් මේ භික්ෂුවක් යම්තාක් මුහුද කෙළවරකොට ඇති පොළොව පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද, මේ චිත්ත භාවනා දෙක අතුරෙන් කිනම් චිත්ත භාවනාවක් ඉතා උසස්ද? "ස්වාමීනි, යම් මේ භික්ෂුවක් යම්තාක් මුහුද කෙළවරකොට ඇති පොළොව පමණ තැන කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේ නම් මෙය මේ චිත්ත භාවනා දෙක අතුරෙන් ඉතා උසස්ය.

18. "ඇවැත්නි, කච්චායනය, යම්හෙයකින් එකම දිව්‍යයෝනියක උපන් මේ දේවතාවන් අතුරෙන් ඇතැම් දෙවියෝ ස්වල්ප ආලොක ඇත්තාහුද ඇතැම් දෙවියෝ අප්‍රමාණ ආලොක ඇත්තාහුද මේ ඊට හේතුවය, මේ ප්‍රත්‍යයය

"ස්වාමීනි, අනුරුද්ධ ස්ථවිරයන් වහන්ස, මැනවි. මෙහිදී මා විසින් තවත් ඇසිය යුත්තක් ඇත. "ස්වාමීනි, යම් පමණ

දෙවියෝ ආලෝක ඇත්තාහුද, ඒ සියල්ලෝ අපිරිසිදු ආලෝක ඇත්තාහුද? නැතහොත් සමහර දෙවියෝ පිරිසිදු ආලෝක ඇත්තාහු වෙත්ද? "ඇවැත්නි, කච්චායනය, ඒ ඒ කරුණු වශයෙන් මෙහි ඇතැම් දෙවියෝ අපිරිසිදු ආලෝක ඇත්තෝ වෙති. ඇතැම් දෙවියෝ පිරිසිදු ආලෝක ඇත්තෝ වෙති.

"ස්වාමීනි, අනුරුද්ධ ස්ථවිරයන් වහන්ස, යම්හෙයකින් එකම දිව්‍යයෝනියක උපන් ඒ දෙවියන් අතුරෙන් මෙහි සමහර දෙවියෝ අපිරිසිදු ආලෝක ඇත්තාහු වෙත්ද, මෙහි සමහර දෙවියෝ පිරිසිදු ආලෝක ඇත්තාහු වෙත්ද ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?

**19.** "ඇවැත්නි, කච්චායනය, එසේ වීනම් ඔබට උපමාවක් දක්වන්නෙමි. මේ ලෝකයෙහි ඇතැම් නුවණැති පුරුෂයෙක් උපමාවෙන්ද දෙශනා කරන ධර්මයාගේ අර්ථ දැනගනී. ඇවැත්නි, කච්චායනය, දැල්වෙන්නාවූ තෙල් පහනේ තෙල් යම්සේ අපිරිසුදුද, වැටියත් අපිරිසුදුද, තෙලුත් අපිරිසුදු බැවින් වැටියත් අපිරිසුදු බැවින් ඒ එළිය ඉතා අඳුරක් මෙන් දැල්වෙයි. ඇවැත්නි, කච්චායනය, එපරිද්දෙන්ම මේ ලොකයෙහි ඇතැම් භික්ෂුවක් අපිරිසුදු ආලොකය පතුරුවා වාසය කෙරේද, ඔහුගේ කයේ අලස භාවයද හොඳහැටි සංසිඳුනේ නොවෙයි. ථීනමිද්ධයද උදුරා නොදමන ලද්දේ වෙයි. උද්ධච්චකුක්කුච්චයද මනාකොට නොහික්මවන ලද්දේ වෙයි. හෙතෙම කයේ අලස භාවය නොසංසිඳුවන ලද බැවින්ද, ථීනමිද්ධය උදුරා නොදමන ලද බැවින්ද, උද්ධච්චකුක්කුච්චය නොහික්මවන ලද බැවින් ද අඳුරුවූවක් මෙන් අරමුණ බලයි. හෙතෙම කායයාගේ භේදයෙන් මරණින් මතු සංකිලිට්ඨාභ දෙවියන් හා එක්වීමට පැමිණෙයි. ඇවැත්නි, කච්චායනය, දැල්වෙන තෙල් පහනේ තෙල් පිරිසුදුද, වැටියත් පිරිසුදුද, ඒ ආලෝකය තෙල් පිරිසුදු බැවින් වැටිය පිරිසුදු බැවින් අඳුරක් මෙන් නොදැල් වෙයි. ඇවැත්නි, කච්චායනය, එපරිද්දෙන්ම මේ ලොකයෙහි ඇතැම් මහණෙක් පිරිසුදු ආලොකය ඇත්තේයයි කසිණ නිමිත්ත පතුරුවා වාසය කෙරේද ඔහුගේ කයේ අලස භාවයද සංසිඳුවන ලද්දේ වෙයි.

ථිනමිද්ධයත් උදුරාදමන ලද්දේ වෙයි. උද්ධච්චකුක්කුච්චය හික්මවන ලද්දේ වෙයි. හෙතෙම කයේ අලස භාවය සංසිඳුවන ලද බැවින්ද, ථිනමිද්ධය උදුරා දමන ලද බැවින්ද, උද්ධච්චකුක්කුච්චය හික්මවන ලද බැවින්ද, අන්ධවූවාක් මෙන් අරමුණ නොබලයි. හෙතෙම කායයාගේ භේදයෙන් මරණින් මතු පරිසුද්ධාභ දෙවියන් හා එක්වීමට පැමිණෙයි.

**20.** "ඇවැත්නි, කච්චායනය, යම්හෙයකින් එකම දිව්‍ය නිකායෙහි උපන් ඒ දෙවියන් අතුරෙන් ඇතම් දෙවියෝ අපිරිසුදු ආලෝක ඇත්තාහු වෙත්ද, ඇතැම් දෙවියෝ පිරිසුදු ආලෝක ඇත්තාහු වෙත්ද, මෙය ඊට හේතුවයි. මෙය ඊට ප්‍රත්‍යයයි. එසේ කීකල්හි ආයුෂ්මත් සභිය කච්චායන තෙම ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය කීය. "ස්වාමීනි, අනුරුද්ධ ස්ථවිරයන් වහන්ස, යහපති. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ මා විසින් මෙසේ අසනලදී කියා හෝ මෙසේ වීමට සුදුසුයයි කියා හෝ නොකීහ. එහෙත් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ඒ දේවතාවෝ මෙසේද වෙත්, ඒ දේවතාවෝ මෙසේද වෙත් යනුම කියන්නාහ. ස්වාමීනි, ඒ කාරණය ගැන මට මෙසේ අදහස් වෙයි. ඒකාන්තයෙන් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ඒ දේවතාවන් හා පෙර එකට වාසය කළහයිද කථා කරන ලදහයිද සාකච්ඡා කළහයිද කියායි. ඇවැත් කච්චායනය, ඒකාන්තයෙන් ඔබ විසින් එළඹ කියයුතු වචනයක් කියන ලදී. එහෙත් ඔබට මම ප්‍රකාශ කරන්නෙමි. ඇවැත්නි, කච්චායනය, මා විසින් බොහෝ කාලයක් මුලුල්ලෙහි ඒ දේවතාවන් සමඟ එකට වසන ලද විරූය. කථා කරන ලද විරූය. සාකච්ඡාවට පැමිණෙනලද විරූය."

**21.** එසේ කීකල්හි ආයුෂ්මත් සභිය කච්චායන තෙම පඤ්චකංග නම් වඩුවාට මෙසේ කීය. වඩ්ඪකිය තොපට ලාභයක් විය. වඩ්ඪකිය, තොපට යහපත් ලාභයක් විය. තෙපිද යම් සැකයක් වීනම් ඒ සැකයද දුරු කළාහුය. අපිද යම් මේ ධර්ම ක්‍රමයක් ඇසීමට ලැබීමු යනුයි.

**සත්වෙනි අනුරුද්ධ සූත්‍රය නිමි. (3-7)**

# 28. උපක්ලෙශ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර සමීපයෙහිවූ ඝෝෂිතාරාමයෙහි වැඩවාසය කරණ සේක. එකල්හි වනාහි කොසඹෑ නුවර භික්ෂූහු දබරකර ගනිමින්, කෝලාහල කරගනිමින්, වාදකර ගනිමින්, ඔවුනොවුන් වචන නමැති හුල්වලින් ඇනගනිමින් වාසය කරති. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේය. "ස්වාමීනි, මේ කොසඹෑ නුවර වැසි භික්ෂූහු දබරකර ගනිමින්, කෝලාහල කර ගනිමින්, වාදකර ගනිමින්, ඔවුනොවුන්, වචන නමැති හුල්වලින් ඇනගනිමින් වාසය කරති. "ස්වාමීනි, ඒ භික්ෂූහු යම් තැනකද එහි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා කොට වැඩමවන්නේ නම් මැනවි" එය භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසා වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූහු යම් තැනකද එහි වැඩිසේක. වැඩ ඒ භික්ෂූන්ට මෙය වදාළ සේක. "මහණෙනි, නුසුදුසුය, දබර නොකරව්, කලහ නොකරව්, කෝලාහල නොකරව්, විරුද්ධ වාද නොකරව්," කියායි.

එසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේය. "ස්වාමීනි, ධර්මස්වාමීවූ භාග්‍යවතුන් වහන්සේ ඉවසන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වෙහෙස නොගනිත්වා. භාග්‍යවතුන් වහන්සේ ඵල සමාපත්ති සැප විහරණයෙහි යෙදී වාසය කරණ සේක්වා. අපි මේ දබරයෙන් කලහයෙන් කෝලාහලයෙන් විරුද්ධ වාදයෙන් පැනෙන්නෙමු" කියායි.

දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට මෙය වදාළසේක. "මහණෙනි, නුසුදුසුය, දබර නොකරව්, කලහ නොකරව්, කෝලාහල නොකරව්, විරුද්ධ වාද නොකරව්," කියායි. දෙවනුවත් ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය

සැලකෙළේය. "ස්වාමීනි, ධර්මස්වාමීවූ භාග්‍යවතුන් වහන්සේ ඉවසන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වෙහෙස නොගනිත්වා. භාග්‍යවතුන් වහන්සේ ඵල සමාපත්ති සැප විහරණයෙහි යෙදී වාසය කරණ සේක්වා. අපි මේ දබරයෙන්, කලහයෙන්, කෝලාහලයෙන්, විරුද්ධ වාදයෙන්, පැණෙන්නෙමුයයි" කියායි. තෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට මෙය වදාළසේක. "මහණෙනි, නුසුදුසුය, දබර නොකරව්, කෝලාහල නොකරව්, විරුද්ධ වාද නොකරව්" කියායි. තෙවනුවත් ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේය. "ස්වාමීනි, ධර්ම ස්වාමීවූ භාග්‍යවතුන් වහන්සේ ඉවසන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නොවෙහෙසෙන සේක්වා. භාග්‍යවතුන් වහන්සේ ඵලසමාපත්ති සැපවිහරණයෙහි යෙදී වාසය කරණ සේක්වා. අපි මේ දබරයෙන් කෝලාහලයෙන් විරුද්ධ වාදයෙන් පැණෙන්නෙමුයි." කියායි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පාසිවුරු ගෙන කොසඹෑ නුවරට පිඬු පිණිස වැඩිසේක. කොසඹෑ නුවර පිඬු පිණිස හැසිර, බතින් පසුව, පිණ්ඩපාතයෙන් වැළකුණේ සෙනසුන තැන්පත් කොට තබා පාසිවුරු ගෙන වැඩසිටියේම මේ ගාථාවන් වදාළසේක.

1. "මහත් ශබ්ද ඇති එක හා සමාන කලහකාරී ජනතෙම (මම) අඥානයයි, කිසිවෙක් නොසැලකීය. සංඝයා බිඳෙන කල්හිත් ඊට වඩා වැඩි අනිකක් නොසිතී.

2. "මුළාවූ සිහිය ඇති වචනය පමණක් ගොචර කොට ඇති, යම්තාක් මුඛය විවෘත කිරීමට කැමති නම් ඒ තාක් මුඛය විවෘත කොට කියන්නාවූ පණ්ඩිතයෝ යම් කලහයකින් ලජ්ජා නැති බවට පමුණුවන ලද්දාහු නම් එය ආදීනව සහිතයයි නොදනිත්.

3. "අසවලා මට බැන්නේය, ගැසුවේය, මා පැරැද්දුවේය, මා සතු දෙය පැහැරගත්තේයයි යම් කෙනෙක් ක්‍රොධයෙන්

ඔහුට වෛර කරත් නම් ඔවුන්ගේ වෛරය නොසංසිඳෙන්නේය. (අසවලා) මට බැන්නේය, ගැසුවේය, මා සතු දේ පැහැර ගත්තේයයි යමෙක ඔවුන්ට වෛර නොකරන්නේ නම් ඔවුන්ගේ වෛරය සංසිඳෙන්නේය.

4. "මේ ලොකයෙහි කිසිකලෙකත් වෛර කිරීමෙන් වෛර සංසිඳීමෙක් නැත. වෛර නොකිරීමෙන්ම සංසිඳෙත්. මෙය පෞරාණික උතුම් ධර්මය වේ.

5. "නුවණැතියන්ගෙන් අන්‍යවූ අඥානයෝ අපි මරණයට පැමිණෙන්නෙමුයි නොදනිති. ඒ බව යමෙක් දනිත් නම් ඒ හේතුකොටගෙන කලහය සංසිඳෙත්.

6. "ඇට සිඳින්නාවූ ප්‍රාණය නැති කරන්නාවූ ගව අස් ආදී ධන පැහැර ගන්නාවූ සොරු වෙත්ද, රට විනාශ කරන්නාවූ ඔවුන්ගේ පවා සමගිය ඇත. කුමක් හෙයින් තොපගේ එබන්දක් නැත්තේද?

7. "ස්ථානොචිත ප්‍රඥාවෙන් යුක්තවූද, සමග වසන්ට නිසිවූද, යහපත් හැසුරුම් ඇති, පණ්ඩිතවූ, කල්‍යාණ මිත්‍රයකු ඉදින් ලද්දේ නම් සිහියෙන් යුක්තවූ පුද්ගලතෙමේ ඔහු හා සමග සතුටු සිත් ඇතිව වාසය කරන්නේය.

8. "තැනට නිසි නුවණැති, එකට හැසිරීමට සුදුසුවූ, මනා හැසුරුම් හා ධාරණ ප්‍රඥා ඇති, කල්‍යාණ මිත්‍රයෙකු ඉදින් නොලද්දේ නම් දිනාගත් රජය හැර, (හුදකලාව වනයට වැද තපස් පැවිද්දට පැමිණි මහාජනක) රජු මෙන්ද, (හස්ති සමූහයා හැරපියා මේ රක්ෂිත වනයෙහි හුදකලාව හැසිරෙන) පාරිලෙය්‍යක නම් ඇතු මෙන්ද සමූහයෙන් වෙන්ව හුදකලාව වාසය කරන්නේය.

9 "දෙලෝ වැඩ නොදත් අඥානයා කෙරෙහි එකට විසීමක් නැතිව, තනිව විසීම උතුම්. පාරිලෙය්‍යක ඇතු මෙන් පිරිස් පාලනයෙහි උත්සාහ රහිතව හුදකලාව වසන්නේය. ස්වල්පමාත්‍රවූද පව්කම් නොකරන්නේය."

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩසිටියේම මේ ගාථාවන් වදාරා "බාලකලොණකාර" නම් ගම යම් තැනෙක්හිද එහි වැඩි සේක. එසමයෙහි ආයුෂ්මත් භගුස්ථවිර තෙම "බාලකලොණකාර" ගමෙහි වාසය කෙරෙයි. ආයුෂ්මත් භගුස්ථවිර තෙම වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක්කේය. දැක, ආසනයක් පැනවීය. පා දෝනා දිය තැබීය. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ පා සේදීය. ආයුෂ්මත් භගු ස්ථවිර තෙමේද භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන් ආයුෂ්මත් භගු ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. "මහණ කිම ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිම පිණ්ඩපාතයෙන් ක්ලාන්ත නොවෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකිවෙමි. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැක. ස්වාමීනි, ආහාරයෙන් ක්ලාන්ත නොවෙමියි" (කීය.)

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් භගු ස්ථවිරයන් දැහැමි කථාවෙන් කරුණු දක්වා (එහි) සමාදන් කරවා (ඉන්) තෙද ගන්වා, (එහි) පහදවා හුනස්නෙන් නැගිට "ප්‍රාචීන වංශදාය වනය" යම් තැනෙක්හිද එහි වැඩිසේක. එසමයෙහි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් නන්දිය ස්ථවිර තෙමේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිර තෙමේද එහි වෙසෙති. උයන්පල්ලා වඩින භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක්කේය. දැක, භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "ශ්‍රමණය, මේ වනයට නොපිවිසෙව, මෙහි කුලපුත්‍රයෝ තිදෙනෙක් කැමති පරිදි වෙසෙති. ඔවුන්ට අපහසු නොකළ මැනව" කියායි.

4. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ සමග කථාකරන වනපාලකයාගේ කථාව ඇසීය. ඒ කථාව අසා, වනපාලකයාට මෙය කීය. "ඇවැත්නි, වනපාලකය, භාග්‍යවතුන් වහන්සේ නොවලක්වව. අපගේ ශාස්තෘවූ භාග්‍යවතුන් වහන්සේ වැඩ වදාළසේක" කියායි. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙම, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන්ද ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන්ද යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත්

නන්දිය ස්ථවිරයන්ටද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන්ටද මෙය කීය. "ආයුෂ්මත්වරුනි, ඉදිරියට එව්. ආයුෂ්මත්වරුනි, ඉදිරියට එව්. අපගේ ශාස්තෘවූ භාග්‍යවතුන් වහන්සේ වැඩිසේක," කියායි.

**5.** ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් නන්දිය ස්ථවිර තෙමේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිර තෙමේද, භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, එකනමක් භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු ගත්තේය. එකනමක් අසුන් පැණවීය. එකනමක් පාදෝනා පැන් තැබීය. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද ආසනයෙහි වැඩහුන් සේක. වැඩහිඳ, පා සේදූ සේක. ඒ ආයුෂ්මත්වරුද, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තක හුන්නාහුය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. "අනුරුද්ධයිනි, නුඹලාට කිම ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිම පිණ්ඩපාතයෙන් ක්ලාන්ත නොවූවහුද?" කියායි. "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකිය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැක. ස්වාමීනි, පිණ්ඩපාතයෙන් ක්ලාන්ත නොවමු."

**6.** "අනුරුද්ධයිනි, නුඹලා සමගිව, සතුටු සිතැතිව, විරුද්ධවාද නැතිව, කිරි හා දිය මෙන් එක්වූවාහු, ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලන්නාහු, කිම වාසය කරහුද?" "ස්වාමීනි, අපි ඒකාන්තයෙන් සමගිව, සතුටු සිතැතිව, විවාද රහිතව, කිරි හා දිය මෙන් එක්සත්ව, ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලමින් වාසය කරමු."

"අනුරුද්ධයිනි, තෙපි සමගිව, සතුටු සිතැතිව, විවාද රහිතව, කිරි හා දිය මෙන් එක්සත්ව, ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලමින් කෙසේ වනාහි වාසය කරව්ද?"

"ස්වාමීනි, මෙහිදී මට මෙසේ අදහස් වෙයි. 'යම් බඳුවූ මම මෙබඳුවූ සබ්‍රහ්මචාරීන් සමග වෙසෙම්ද එය, ඒකාන්තයෙන් මට ලාභයකි. ඒකාන්තයෙන් මා විසින් ලාභයක් ලබන ලදී.' ස්වාමීනි, ඒ මාගේ මේ ආයුෂ්මතුන් කෙරෙහි මෛත්‍රී සහගත කාය කර්මය ප්‍රකටවත්, රහසිගතවත් එළඹ සිටියේය. මෛත්‍රී

සහගත වාක් කර්මය ප්‍රකටවත්, රහසි ගතවත් එළඹ සිටියේය. මෛත්‍රී සහගත මනො කර්මය ප්‍රකටවත්, රහසිගතවත් එළඹ සිටියේය. ස්වාමීනි, ඒ මට මෙසේ අදහස් වෙයි. 'සිය සිත බහා තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් වශයෙන් මම පවතින්නෙම් නම් ඉතා හොඳය කියායි.' ස්වාමීනි, ඒ මම සිය සිත බහා තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් වශයෙන් පවතිමි. ස්වාමීන්වහන්ස, අපේ ශරීර වෙන් වෙන්වූ නමුත් සිත එකක්මයයි හඟිමි.

7. ආයුෂ්මත් නන්දිය තෙමේද, ආයුෂ්මත් කිම්බිල තෙමේද, භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළාහුය. "ස්වාමීනි, මටත් මෙසේ අදහස් විය. 'යම්බඳු මම මෙබඳු සබ්‍රහ්මචාරීන් සමග වෙසෙම්ද, එය ඒකාන්තයෙන් මට ලාභයකි. ඒකාන්තයෙන් මා විසින් ලාභයක් ලබන ලදී.' ස්වාමීනි, ඒ මාගේ මේ ආයුෂ්මතුන් කෙරෙහි මෛත්‍රී සහගත කාය කර්මය ප්‍රකටවත්, රහසිගතවත් එළඹ සිටියේය. මෛත්‍රීසහගත වාක් කර්මය, ප්‍රකටවත්, රහසිගතවත් එළඹ සිටියේය. මෛත්‍රී සහගත මනොකර්මය ප්‍රකටවත් රහසිගතවත් එළඹ සිටියේය. ස්වාමීනි, ඒ මට මෙසේ අදහස් වෙයි. 'සිය සිත බහාතබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් වශයෙන් මම පවතින්නෙම් නම් ඉතා යෙහෙකැයි' කියායි. ස්වාමීනි, ඒ මම සිය සිත බහා තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් වශයෙන් පවතිමි. ස්වාමීනි, අපේ ශරීර වෙන් වෙන්වූ නමුත් සිත එකක්මයයි හඟිමි.

"ස්වාමීනි, අපි මෙසේ වනාහි සමගිව, සතුටු සිතැතිව, විවාද රහිතව, කිරි හා දිය මෙන් එක්සත්ව ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලමින් වාසය කරමුයි" කීවාහුය.

'අනුරුද්ධයිනි, යහපති, යහපති. අනුරුද්ධයිනි, තෙපි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, සිවු මගට පමුණුවන ලද සිත් ඇතිව කිම වාසය කරව්ද?"

"ස්වාමීනි, අපි ඒකාන්තයෙන් අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව සිවු මගට පමුණුවන ලද සිත් ඇතිව වාසය කරමු."

"අනුරුද්ධයිනි, තෙපි කෙසේ වනාහි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, සිව් මගට පමුණුවන ලද සිතැතිව, වාසය කරව්ද?"

8. "ස්වාමීනි, මෙහි අපගෙන් යමෙක් පළමුව පිඬු පිණිස ගොස් ගමින් පෙරළා එයිද, හෙතෙම අසුන් පනවයි. පියයුතු පැන් හා පරිභෝග කටයුතු පැන් ගෙනත් තබයි. ඉතුරු ආහාර දමන භාජනය සූදානම් කොට තබයි. යමෙක් පසුව පිඬු පිණිස ගොස් ගමෙන් පෙරළා එයිද, ඉදින් වළඳා ඉතිරියක් වේද, ඉදින් කැමති නම් වළඳයි. ඉදින් අකමැති නම් තණ පැලෑටි නැති තැනක දමයි. සතුන් නැති දියෙහි හෝ පාකොට හරියි. හෙතෙම අසුන් තැන් පත් කොට තබයි. පියයුතු පැන් හා පරිභෝග කටයුතු පැන් පිළියෙළ කොට තබයි. ඉතිරි බත් දමන භාජනය සෝදා තැන්පත් කොට තබයි. දන් ශාලාව හමදී. යමෙක් පියයුතු පැන් තබන කළය හෝ පරිභෝග කටයුතුවූ ජලය තබන කළය හෝ හිස්ව තිබෙනු දකීද, හෙතෙම දිය ගෙනත් තබයි. ඉදින් මොහුට නොඉසිලිය හැකි වේ නම් අත වැනීමෙන් දෙවැන්නකු අමතා අත් විලංගුවෙන් ගෙන ගොස් තබයි. ස්වාමීනි, අපි ඒ හේතුවෙන් කථා නොකරමු. ස්වාමීනි, අපි පස්දවසකට වරක් මුලු රෑ දැහැමි කථාවෙන් යුක්තව හිඳිනෙමු. ස්වාමීනි, අපි මෙසේ වනාහි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, සිව් මගට යවන ලද සිතැතිව වාසය කරමු."

9. 'අනුරුද්ධයිනි, යහපති, යහපති. අනුරුද්ධයිනි, මෙසේ අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, සිව් මගට යවනලද සිතැතිව, වාසය කරන තොප විසින් මනුෂ්‍ය ධර්මයට වැඩි ආර්‍ය්‍යභාවය කිරීමට සුදුසු පහසු විහරණයක්වූ ඥානදර්ශන විශෙෂයක් අවබෝධ කරන ලද්දේ වේද?" "ස්වාමීනි, මෙහි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, සිව් මගට යවනලද සිතැතිව, වාසය කරන අපි (පරිකර්මයන්ගේ) ආලෝකයද, දිව්‍යසින් රූප දැක්මද, හැඳින ගනිමු. අපගේ ඒ ආලෝකයද, රූප දැකීමද, නොබෝ වේලාවකින් අතුරුදහන් වෙයි. ඊට කාරණය නොදනිමු."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"අනුරුද්ධයිනි, ඊට කාරණය තොප විසින් දැනගත යුතුය. අනුරුද්ධයිනි, මමද සම්‍යක් සම්බොධියෙන් පෙර සම්‍යක් සම්බුද්ධ නොවූයේම, බොධිසත්ව වූයේම (පරිකර්මයන්ගේ) ආලෝකයද, දිවැසින් රූප දැකීමද දනිමි. මාගේ ඒ ආලෝකයත් රූප දැකීමත් නොබෝ වේලාවකින් අතුරුදන් වෙයි.

"අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යම්හෙයකින් මාගේ ඒ ආලෝකයත්, දිවැසින් රූප දැකීමත්, 'අතුරුදන් වේ නම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යයකවරේද?' කියායි අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'මට සැකය ඇති විය. සැකය හේතු කොට ගෙන මගේ සමාධිය නැතිවිය. සමාධිය නැතිවූ කල්හි ආලෝකයත් දිවැසින් රූප දැකීමත් අතුරුදහන් වෙයි. ඒ මම යම්සේ මට සැකය නූපදින්නේද එසේ කරන්නෙමි අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, සිව්මගට යවන ලද සිතැතිව වාසය කරන්නේ ආලෝකයද, රූප දැකීමද, හඳුනමි. මාගේ ඒ ආලෝකයද, රූප දැකීමද, අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දැකීමද අතුරුදහන්වේ නම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි.

**10.** "අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'මම දැන් කිසිවක් මෙනෙහි නොකරන්නෙමි. යන "අමනසිකාරය" පහළ විය. අමනසිකාරය' හේතුකොට මාගේ සමාධිය නැතිවිය. සමාධිය නැතිව ගිය කල්හි ආලෝකයද, රූප දැකීමද අතුරුදහන් වෙයි. ඒ මම යම්සේ මට නැවත සැකය නූපදින්නේ නම් අමනසිකාරය නොවේ නම් එසේ කරන්නෙමි' කියායි. අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, සිව් මඟට යවන ලද සිතැතිව, වාසය කරන්නේ ආලෝකයද, රූප දැකීමද දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දැකීමද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දැකීමද අතුරුදහන්වේ නම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි.

"අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'මට ථීනමිද්ධය පහළවිය. ථීනමිද්ධය හේතුකොට ගෙන මාගේ සමාධිය පහළවිය. සමාධිය පහව ගිය කල්හි ආලෝකයද, රූප දැකීමද, අතුරුදහන් වෙයි ඒ මම යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නේද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, එසේ කරන්නෙමි. අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, සිව් මඟට යවන ලද සිතැතිව, වාසය කරන්නේ ආලෝකයද, රූප දර්ශනයද, දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි' අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය 'යමකින් මාගේ ආලෝකයද, රූප දැකීමද අතුරුදහන් වේනම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි.

11. "අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'මට තැතිගැනීමක් පහළවිය. තැතිගැන්ම හේතුකොට ගෙන මගේ සමාධිය පහවිය. සමාධිය පහවගිය කල්හි ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි.' අනුරුද්ධයිනි, යම්සේ පුරුෂයෙක් දීර්ඝ මාර්ගයට පිළිපන්නේ ඔහු දෙපස වධකයෝ උපන්නාහු නම් ඔහුට දෙපස හේතුකොට ගෙන තැතිගැන්ම උපදින්නේය. අනුරුද්ධයිනි, 'එපරිද්දෙන්ම මටත් තැතිගැන්ම පහළ විය. තැතිගැන්ම හේතුකොට, මාගේ සමාධිය පහවිය. සමාධිය පහවගිය කල්හි ආලෝකයද, රූප දර්ශනයද, අතුරුදහන් වෙයි. යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නේද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැති ගැන්ම නූපදින්නේද, ඒ මම එසේ කරන්නෙමි' කියායි.

"අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, සිව් මඟට යවන ලද සිතැතිව, වාසය කරන්නේ ආලෝකයද, රූප දර්ශනයද, දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහසවිය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වේනම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?" කියායි.

12. "අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'මට අධික ප්‍රීතිය පහළවිය. අධික ප්‍රීතිය හේතුකොට මාගේ සමාධිය පහවිය. සමාධිය පහවූ කල්හි ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන්විය.' අනුරුද්ධයිනි, යම්සේ පුරුෂයෙක් එක් නිදන් පළක් සොයන්නේ එක් උත්සාහයකින්ම නිදන් පොළවල් පහක් ලබන්නේද, ඔහුට ඒ හේතුකොට අධික ප්‍රීතිය උපදින්නේය. අනුරුද්ධයිනි, එපරිද්දෙන්ම මට අධික ප්‍රීතිය පහළවිය. අධික ප්‍රීතිය කරණකොට ගෙන මාගේ සමාධිය නැතිවිය. සමාධිය පහවූ කල්හි ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. ඒ මම යම්සේ නැවත මට විචිකිච්ඡාවද නූපදින්නේද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැතිගැන්මෙක් නූපදින්නේද, බලවත් ප්‍රීතියක් නූපදින්නීද, එසේ කරන්නෙමි. අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, සිව් මඟට යවන ලද සිතැතිව, වාසය කරන්නේ ආලෝකයද, රූප දර්ශනයද, දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වේනම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි.

"අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'මට කාය පීඩාවක් පහළවිය කියායි. කාය පීඩාව හේතුකොට ගෙන වනාහි මාගේ සමාධිය පහවිය. සමාධිය පහව ගිය කල්හි, ආලෝකයද, රූප දැකීමද අතුරුදහන් වෙයි. ඒ මම යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නේද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැතිගැන්ම නූපදින්නේද අධික ප්‍රීතිය නූපදින්නේද, කායික පීඩාව නූපදින්නේද එසේ කරන්නෙමි.'

13. "අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, සිව් මඟට යවන ලද සිතැතිව, වාසය කරන්නේ, ආලෝකයද, රූප දර්ශනයද දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දර්ශනයද

අතුරුදහන් වේනම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි.

"අනුරුද්ධයිනි, ඒ මට මේ සිත විය. 'මට අතිශයින් පටන්ගන්නා ලද වීර්‍ය්‍යය පහළ විය' කියායි. දැඩිව කරන ලද වීර්‍ය්‍යය හේතුකොට ගෙන, මාගේ සමාධිය පහවිය. සමාධිය පහවූ කල්හි ආලෝකයත්, රූප දර්ශනයත්, අතුරුදහන් වෙයි. අනුරුද්ධයෙනි, යම්සේ පුරුෂයෙක් දෑතින් පෙරළිය හැකි දෙයක් දැඩිකොට ඔසවාගන්නේද, හෙතෙම එහිම මැරෙන්නේය. අනුරුද්ධයිනි, එපරිද්දෙන්ම මට දැඩිව පටන්ගන්නා ලද වීර්‍ය්‍යය පහළවිය. දැඩි වීර්‍ය්‍යය හේතුකොට ගෙන මාගේ සමාධිය පහවිය. සමාධිය පහවූ කල්හි, ආලෝකයත්, රූප දර්ශනයත් අතුරුදහන් වෙයි. ඒ මම යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නේද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැතිගැන්ම නූපදින්නේද, බලවත් ප්‍රීතිය නූපදින්නේද, කායික පීඩාව නූපදින්නේද, අධික වීර්‍ය්‍යය නූපදින්නේද එසේ කරන්නෙමි.

14. "අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, සිව් මගට යවන ලද සිතැතිව, වාසය කරන්නේ ආලෝකයද, රූප දර්ශනයද දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වේනම් ඊට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි.

"අනුරුද්ධයිනි, ඒ මට මේ සිත විය. 'මට ඉතා ලිහිල් වීර්‍ය්‍යය පහළ විය, යනුවෙනි. ඉතා ලිහිල් වීර්‍ය්‍යය හේතු කොටගෙණ මාගේ සමාධිය පහවිය. සමාධිය පහවූ කල්හි ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි.' අනුරුද්ධයිනි, යම්සේ පුරුෂයෙක් තෙම පෙරළිය හැක්කක් ලිහිල්කොට අල්ලා ගන්නේද, එය ඔහු අතින් වැටෙන්නේය. අනුරුද්ධයිනි, එපරිද්දෙන්ම මට ඉතා ලිහිල් වීර්‍ය්‍යය උපන්නේය. ඉතා ලිහිල් වීර්‍ය්‍යය හේතුකොටගෙන මාගේ සමාධිය පහවිය. සමාධිය පහවූ කල්හි, ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. ඒ මම,

යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නීද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැතිගැන්ම නූපදින්නේද, අධික ප්‍රීතිය නූපදින්නේද, කායික පීඩාව නූපදින්නේද, අධික වීය්‍ය්‍ය නූපදින්නේද, ඉතා ලිහිල් වීරිය නූපදින්නේද, එසේ කරන්නෙමි.

15. "අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇත්තේ, සිව් මඟට යවනලද සිතැතිව, වාසය කරන්නේ ආලෝකයද, රූප දර්ශනයද දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වේ නම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. මට තණ්හාව පහළවිය යනුයි. තෘෂ්ණාව හේතුකොට ගෙන මාගේ සමාධිය පහවිය. සමාධිය පහවූ කල්හි, ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. ඒ මම, යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නීද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැතිගැන්ම නූපදින්නේද, අධික ප්‍රීතිය නූපදින්නේද, කායික පීඩාව නූපදින්නේද, අධික වීය්‍ය්‍ය නූපදින්නේද, ඉතා ලිහිල් වීය්‍ය්‍ය නූපදින්නේද, තෘෂ්ණාව නූපදින්නේද, එසේ කරන්නෙමි.'

16. "අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇත්තේ, සිව්මඟට යවනලද සිතැතිව, වාසය කරන්නේ ආලෝකයද, රූප දර්ශනයද දැනගනිමි. මාගේ ඒ ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යමකින් මාගේ ආලෝකයද, රූප දර්ශනයද, අතුරුදහන් වේ නම් ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' කියායි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'මට නානත්ත සංඥාව පහළවිය යනුයි. නානත්ත සංඥාව හේතුකොට මාගේ සමාධිය පහවිය. සමාධිය පහවූ කල්හි, ආලෝකයද, රූප දර්ශනයද අතුරුදහන් වෙයි. යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නීද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැතිගැන්ම නූපදින්නේද, අධික ප්‍රීතිය නූපදින්නීද, කායික පීඩාව

නූපදින්නේද, අධික වීර්‍ය්‍යය නූපදින්නේද, ඉතා ලිහිල් වීර්‍ය්‍යය නූපදින්නේද, තෘෂ්ණාව නූපදින්නේද, නානත්ත සංඥාව නූපදින්නීද එසේ කරන්නෙමි.'

"අනුරුද්ධයිනි, ඒ මම වනාහි අප්‍රමාද වූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, සිව් මඟට යවනලද සිතැතිව, වාසය කරන්නේ, ආලෝකයද රූප දර්ශනයද දනිමි. ඒ මේ ආලෝකය වනාහි අතුරුදහන් වෙයි. රූප දර්ශනයද අතුරුදහන් වෙයි. අනුරුද්ධයිනි, ඒ මට මෙසේ අදහස් වෙයි. 'යම් හෙයකින් මාගේ ආලෝකය හා රූප දර්ශනය අතුරුදහන් වේ නම් ඊට හේතුව කුමක්ද? ප්‍රත්‍යය කුමක්ද?' අනුරුද්ධයිනි, මට මේ අදහස ඇතිවිය. 'මට රූපයන් පිළිබඳ අතිශයින් නැවත නැවත සිතා බලන බව පහළ විය යනුයි. රූපයන් පිළිබඳ අතිශයින් නැවත නැවත සිතා බලන බව හේතුකොටගෙන සමාධිය පහවිය. සමාධිය පහව ගිය කල්හි ආලෝකයත් රූප දර්ශනයත් අතුරුදහන් වෙයි. යම්සේ මට නැවත විචිකිච්ඡාව නූපදින්නීද, අමනසිකාරය නූපදින්නේද, ථීනමිද්ධය නූපදින්නේද, තැතිගැන්ම නූපදින්නේද, අධික ප්‍රීතිය නූපදින්නේද, කායික පීඩාව නූපදින්නේද, අධික වීර්‍ය්‍යය නූපදින්නේද, ඉතා ලිහිල් වීර්‍ය්‍යය නූපදින්නේද, අධික තෘෂ්ණාව නූපදින්නේද, නානත්ත සංඥාව නූපදින්නීද, රූපයන් පිළිබඳ අතිශයින් නැවත නැවත සිතා බලන බව නූපදින්නේද එසේ කරන්නෙමි.'

17. "අනුරුද්ධයිනි, ඒ මම විචිකිච්ඡාව සිත කෙලෙසන ධර්මයක්යයි මෙසේ දැන, සිත කෙළෙසන්නාවූ විචිකිච්ඡාව දුරු කෙළෙමි. අමනසිකාරය සිත කෙළෙසන ධර්මයක්යයි මෙසේ දැන, සිත කෙළෙසන්නාවූ අමනසිකාරය දුරු කෙළෙමි. ථීනමිද්ධය සිත කෙළසන ධර්මයක්යයි මෙසේ දැන, ථීනමිද්ධය දුරු කෙළෙමි. තැතිගැන්ම චිත්තොපක්ලෙශයක්යයි මෙසේ දැන, චිත්තොපක්ලෙශයවූ, තැතිගැන්ම දුරු කෙළෙමි. අධික ප්‍රීතිය චිත්තොපක්ලෙශයක් යයි මෙසේ දැන, චිත්තොපක්ලේශයවූ, අධික ප්‍රීතිය දුරු කෙළෙමි. කායික පීඩාව චිත්තොපක්ලෙශයක්යයි මෙසේ දැන, චිත්තොපක්ලෙශයවූ

කායික පීඩාව දුරු කෙළෙමි. දැඩිව පටන්ගන්නාලද වීර්‍ය්‍යය චිත්තොපක්ලෙශයක්යයි මෙසේ දැන, චිත්තොපක්ලෙශයවූ, අධික වීර්‍ය්‍යය දුරු කෙළෙමි. ඉතා ලිහිල් වීර්‍ය්‍යය චිත්තොපක්ලෙශයක්යයි මෙසේ දැන, චිත්තොපක්ලෙශයක්වූ, ඉතා ලිහිල් වීර්‍ය්‍යය දුරු කෙළෙමි. තෘෂ්ණාව චිත්තොපක්ලේශයක්යයි මෙසේ දැන, චිත්තොපක්ලේශයක්වූ අධික තෘෂ්ණාව දුරු කෙළෙමි. නානත්ත සංඥාව චිත්තොපක්ලේශයක්යයි මෙසේ දැන, චිත්තොපක්ලේශයක්වූ නානත්ත සංඥාව දුරු කෙළෙමි. රූපයන් අතිශයින් නැවත නැවත සිතා බලන බව චිත්තොපක්ලේශයක්යයි මෙසේ දැන, චිත්තොපක්ලේශයක්වූ රූපයන් අතිශයින් නැවත නැවත සිතා බලන බව දුරු කෙළෙමි.

18. "අනුරුද්ධයිනි, ඒ මම පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, සිව්මගට යවනලද සිතැතිව වාසය කරමින් ආලෝකය දැනගනිමි. රූප නොදකිමි. යම්හෙයකින් රූප දකිම්ද, හුදෙක් රාත්‍රියද, හුදෙක් දාවලද, හුදෙක් රෑ දාවල්ද, ආලෝකය නොහඳුනමි. අනුරුද්ධයිනි, ඒ මට මෙය අදහස් විය. ඒ මම ආලෝකය හඳුනම්ද, රූප නොදක්නෙම්ද, ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද? ඒ කාලයෙහි රූප දකිමි. හුදෙක් රෑද, හුදෙක් දාවල්ද, හුදෙක් රෑ දාවල් දෙක්හිද ආලෝකය නොහඳුනමි. අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස ඇතිවිය. 'මම යම් සමයෙක්හි රූප විෂය මෙනෙහි නොකොට, ආලෝක විෂය මෙනෙහි කෙරෙම්ද, ඒ කාලයෙහි ආලෝකය හඳුනමි. රූප නොදකිමි. යම් කලක ආලෝක විෂය මෙනෙහි නොකොට, රූප විෂය මෙනෙහි කෙරෙම්ද, එකල රූප දකිමි. හුදෙක් රෑද, හුදෙක් දාවල්ද, හුදෙක් රෑ දාවල්ද ආලෝකය නොහඳුනමි.'

19. "අනුරුද්ධයිනි, ඒ මම අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, සිව්මගට යවනලද සිතැතිව, වාසය කරන්නේ සුළු කර්මස්ථානයෙහිවූ ආලෝකය හඳුනමි. සුළු කර්මස්ථානයෙහිවූ රූප දක්නෙමි. අප්‍රමාණ කර්මස්ථානයෙහිවූ, ආලෝකය හඳුනමි. හුදෙක් රෑද, හුදෙක් දවල්ද, හුදෙක් රෑ දාවල්ද, අප්‍රමාණ කර්මස්ථානයෙහිවූ රූපයන් දක්නෙමි. අනුරුද්ධයිනි, ඒ මට

මේ අදහස ඇතිවිය. 'ඒ මම සුළු කර්මස්ථානයෙහිවූ ආලෝකය හඳුනම්ද, සුළු කර්මස්ථානයෙහිවූ රූපයන් දක්නෙම්ද, අප්‍රමාණ කර්මස්ථානයෙහිවූ ආලෝකය හඳුනම්ද, හුදෙක් රෑද, හුදෙක් දවල්ද, හුදෙක් රෑ දාවල්ද අප්‍රමාණ කර්ම ස්ථානයෙහිවූ රූපයන් දක්නෙම්ද, ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?' අනුරුද්ධයිනි, ඒ මට මේ අදහස විය. 'යම් කලෙක සමාධිය කුඩාද? එසමයෙහි මගේ දිවැසද කුඩාය. ඒ මම ස්වල්ප මාත්‍රවූ, දිවැසින් ස්වල්ප මාත්‍රවූද ආලෝකය හඳුනමි. ස්වල්පමාත්‍රවූ රූපයන්ද දකිමි. යම් කලෙක සමාධිය අප්‍රමාණද එකල මගේ දිවැසද අප්‍රමාණය. ඒ මම අප්‍රමාණවූ දිවැසින් අප්‍රමාණවූ ආලෝකයද හඳුනමි. හුදෙක් රෑද, හුදෙක් දවල්ද, හුදෙක් රෑ දාවල්ද, අප්‍රමාණවූ රූපයන් දක්නෙමි.'

**20.** "අනුරුද්ධයිනි, යම් හෙයකින් විචිකිච්ඡාව චිත්තොප ක්ලෙශයයි මෙසේ දැන, විචිකිච්ඡා චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, අමනසිකාරය චිත්තොපක්ලෙශයයි මෙසේ දැන, අමනසිකාර චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, ථිනමිද්ධය චිත්තොපක්ලෙශයයි මෙසේ දැන, ථිනමිද්ධ චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, තැතිගැන්ම චිත්තොපක්ලෙශයයි මෙසේ දැන, චිත්තොපක්ලෙශයවූ තැතිගැන්ම ප්‍රහීණවීද අධික ප්‍රීති චිත්තොපක්ලෙශයයි මෙසේ දැන, අධික ප්‍රීති චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, කායික පීඩාව චිත්තයාගේ උප ක්ලෙශයයි මෙසේ දැන, කායික පීඩා චිත්තොප ක්ලෙශය ප්‍රහීණවීද, අධික වීය්‍ර්‍යය, චිත්තොපක්ලෙශයයි මෙසේ දැන, අධික වීය්‍ර්‍ය චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, ඉතා ලිහිල් වීය්‍ර්‍යය චිත්තයාගේ උප ක්ලෙශයයි මෙසේ දැන, ඉතා ලිහිල් වීය්‍ර්‍ය චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, තෘෂ්ණාව චිත්තොප ක්ලෙශයයි මෙසේ දැන, අධික තෘෂ්ණා චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, නානත්ත සංඥාව චිත්තොපක්ලෙශයයි මෙසේ දැන, නානත්ත සංඥා චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද, රූපයන් පිළිබඳව අතිශයින් නැවත නැවත සිතා බලන බව චිත්තොපක්ලෙශයයි මෙසේ දැන, රූපයන් පිළිබඳව අතිශයින් නැවත නැවත සිතා බලන චිත්තොපක්ලෙශය ප්‍රහීණවීද අනුරුද්ධයිනි, ඒ මට මේ

අදහස විය. මාගේ සිතට යම් උපක්ලෙශයෝ වෙත්ද, ඔව්හු මට ප්‍රහීණය. එබැවින් මම දැන් විධි තුනකින් යුත් සමාධිය වඩමි' කියායි.

21. "අනුරුද්ධයිනි, ඒ මම විතර්ක සහිත, විචාර සහිත සමාධිය වැඩුවෙමි. විතර්ක රහිත විචාරය පමණක් ඇති සමාධිය වැඩුවෙමි. විතර්ක රහිත විචාර රහිත සමාධිය වැඩුවෙමි. ප්‍රීති සහිත සමාධිය වැඩුවෙමි. ප්‍රීති රහිත සමාධිය වැඩුවෙමි. සුඛ සහගත සමාධිය වැඩුවෙමි. උපෙක්ෂා සහගත සමාධිය වැඩුවෙමි. අනුරුද්ධයිනි, යම් හෙයකින් මා විසින් විතර්ක සහිත, විචාර සහිත, සමාධිය වඩන ලද්දේද, විතර්ක රහිත විචාරය පමණක් ඇති සමාධිය වඩන ලද්දේද, විතර්ක රහිත විචාර සමාධිය වඩන ලදද, ප්‍රීති සහිත සමාධිය වඩන ලදද, ප්‍රීති රහිත සමාධිය වඩන ලදද, සුඛ සහගත සමාධිය වඩන ලදද, උපෙක්ෂා සහගත සමාධිය වඩන ලදද ඒ මට ඥාන දර්ශනයද පහළවිය. මාගේ චිත්ත විමුක්තියද කෝප නොවීය. මේ අන්තිම උපැත්මය. දැන් පුනරුත්පත්තියක් නැත."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක. සතුටු සිතැති අනුරුද්ධායුෂ්මත් තෙම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තේය.

අටවැනි උපක්ලෙශ සූත්‍රයයි. (3-8)

---

## 29. බාල පණ්ඩිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරණසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැ' යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. "මහණෙනි, බාලයාගේ මේ බාල ලක්ෂණ, බාලයයි හැඳිනීමට

කරුණු, බාලයාගේ චරිත තුනකි. ඒ තුන කවරහුද? මහණෙනි, මේ ලෝකයෙහි බාලතෙම නපුරුකොට සිතන්නේත් වෙයි. නපුරුකොට කියන්නේත් වෙයි. නපුරුකොට කරන්නේත් වෙයි. මහණෙනි, ඉදින් බාලතෙම නපුරුකොට නොසිතන්නේ නම් නපුරුකොට නොකියන්නේ නම් නපුරුකොට නොකරන්නේ නම් කුමකින් ඔහු මේ භවත් අසත්පුරුෂයා බාලයෙකැයි පණ්ඩිතයෝ දැනගන්නාහුද? මහණෙනි, යම් හෙයකින් බාලතෙම නපුරුකොට සිතන්නේද, නපුරුකොට කියන්නේද, නපුරුකොට කරන්නේද, එහෙයින් ඔහු මේ භවත් අසත් පුරුෂයා බාලයෙකැයි පණ්ඩිතයෝ දැනගනිත්. මහණෙනි, ඒ මේ බාලයා මේ ආත්මභාවයෙහි තෙවැදෑරුම්වූ, දුක් දොම්නසක් විඳී. මහණෙනි, ඉදින් ඒ බාලයා සභාවක හෝ හුන්නේ වේද, වීථියෙක හුන්නේ වේද, සතර මංසන්ධියෙක හෝ හුන්නේවේද, එහි ජනයා ඒ වැරදිවලට සුදුසු, වැරදිවලට ගැලපෙන (පස්පවෙහි ආදීනව ආදි) කථා කරත්ද මහණෙනි, ඉදින් බාලතෙම ප්‍රාණඝාත කරන්නේ වේද, නුදුන් දෙය ගන්නේ වේද, කාමයෙහි වරදවා හැසිරෙන්නේ වේද, බොරු කියන්නේ වේද, ප්‍රමාදයට කරුණුවූ, මත්පැන් බොන්නේ වේද, මහණෙනි. එහිදී බාලයාහට මෙසේ අදහස් වෙයි 'ජනයා යම් හෙයකින් ඒ වැරදිවලට සුදුසු, වැරදිවලට ගැලපෙන කථා කෙරෙයිද, ඒ වරද ස්වභාවයෝ මා තුළ ඇත්තාහුය. මමද ඒ ධර්මයන් දක්නා ලැබෙමි' කියායි. මහණෙනි, බාල තෙම ඉහාත්මභාවයෙහි මේ පළමු දුක දොම්නස විඳී.

2. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. රජුන් විසින් අපරාධකාරී සොරකු අල්වා, නන් වැදෑරුම් කම්කටුලු කරවනු බාලතෙම දකී. කසවලින් තළවනු ලබන්නවුන්ද, වේවැල් වලින් තලවනු ලබන්නවුන්ද, සතර රියන් දිග දණ්ඩෙන් අත කපනු ලබන්නවුන්ද, පා කපනු ලබන්නවුන්ද, අත් පා දෙකම කපනු ලබන්නවුන්ද, කණ කපනු ලබන්නවුන්ද, නාසය කපනු ලබන්නවුන්ද, කන් නාසා දෙකම කපනු ලබන්නවුන්ද, "බිලංගථාලික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "සඞ්ඛමුණ්ඩික"

නම් කර්මය කරන්නවුන්ද, "රාහුමුඛ" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "ජෝතිමාලික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "හත්ථපජ්ජොතික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "ඒරකවත්තික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "චීරකවාසික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "ඒණෙයාක" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "බලිසමංසික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "කහාපණක" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "ඛාරාපතච්ඡික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "සලිසපරිවත්තික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, "පලාලපිට්ඨික" නම් කර්මය කරනු ලබන්නවුන්ද, උණුකරනලද තෙල් ඉසිනු ලබන්නවුන්ද, බඩගින්නෙන් පීඩිත සුනඛයන් ලවා කවන්නවුන්ද, පණපිටින් හුල හිඳුවනු ලබන්නවුන්ද, කඩුවෙන් හිස සිඳිනු ලබන්නවුන්ද, දකී.

3. "මහණෙනි, එහිදී බාලයාහට මෙසේ අදහස් වෙයි. 'යම්බඳු පාප කර්මයන් හේතුකොටගෙන රජවරු අපරාධකාරී සොරුන් අල්වාගෙන නන්වැදෑරුම් කම්කටුලු කරවත්ද, එනම්ඃ කසවලින් තළවත්ද, වේවැල්වලින් තළවත්ද, මුගුරුවලින් තළවත්ද, අත කපත්ද, පා කපත්ද, අත් පා දෙකම කපත්ද; කණ කපත්ද, නාසය කපත්ද, කන් නාසා දෙකම කපත්ද, බිලංගථාලික නම් කර්මය කරත්ද, සඞ්ඛමුණ්ඩික නම් කර්මය කරත්ද, රාහුමුඛ නම් කර්මය කරත්ද, ජෝතිමාලික නම් කර්මය කරත්ද, හත්ථපජ්ජෝතක නම් කර්මය කරත්ද, ඒරකවත්තික කර්මය කරත්ද, චීරකවාසික කර්මය කරත්ද, ඒණෙයාක කර්මය කරත්ද බලිසමංසික කර්මයකරත්ද, කහාපණක කර්මය කරත්ද, ඛාරාපතච්ඡික කර්මය කරත්ද, පලිසපරිවත්තික කර්මය කරත්ද, පලාලපිට්ඨික කර්මය කරත්ද, රත්වූ තෙල් ඉසිත්ද, බඩසයින් පීඩිත සුනඛයන්ලවා කවත්ද, ජීවත්වසිටියදීම හුල හිඳුවත්ද, කඩුවෙන් හිස සිඳිත්ද, ඒ පාපධර්ම මා කෙරෙහිද ඇත්තාහුය. මමද ඒ ධර්මයන්හි දක්නා ලැබෙමි.

4. "රජවරු මාද දන්නහු නම්, රජවරු මාත් අල්වාගෙණ, නානා ප්‍රකාර කම්කටුලු කරවන්නහුය. කසවලින් තළවන්නාහුය.

වේවැල්වලින් තළවන්නාහුය. මුගුරුවලින් තළවන්නාහුය. අතද කප්පවන්නාහුය. පයද කප්පවන්නාහුය. අත් පා දෙකම කප්පවන්නාහුය. කණද කප්පවන්නාහුය. නාසයද කප්පවන්නාහුය. කන් නාසා දෙකම කප්පවන්නාහුය. බිලංගථාලික කර්මය කරවන්නාහුය. සඞ්ඛමුණ්ඩික කර්මය කරවන්නාහුය. රාහුමුඛ නම් කර්මය කරවන්නාහුය. ජෝතිමාලික නම් කර්මය කරවන්නාහුය. හත්ථපජ්ජෝතික නම් කර්මය කරවන්නාහුය. ඒරකවත්තික නම් කර්මය කර වන්නාහුය. ඒණෙයාක නම් කර්මය කරවන්නාහුය. බලිසමංසික නම් කර්මය කරවන්නාහුය. කහාපණක නම් කර්මය කරවන්නාහුය. ඛාරාපතච්ඡික නම් කර්මය කරවන්නාහුය. පලිඝපරිවත්තික නම් කර්මය කරවන්නාහුය. රත්වූ තෙල් ඉස්වන්නාහුය. බඩසයින් පීඩිත සුනඛයින් ලවා කවන්නාහුය. ජීවත්වත්ම හුල හිඳුවන්නාහුය. කඩුවෙන් හිස කප්පවන්නාහුය.' මහණෙනි, බාලතෙම මේ ආත්මභාවයෙහි මේ දෙවෙනි දුක් දොම්නසද විඳියි.

5. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. පුටුවක හිඳගත්තාවූ හෝ ඇඳක නිදාගත්තාවූ හෝ බිම නිදන්නාවූ හෝ බාලයා වෙත ඔහු විසින් පෙර කයින් නපුරුකොට කරණ ලද්දාවූද වචනයෙන් නපුරුකොට කියන ලද්දාවූද, සිතින් නපුරුකොට සිතන ලද්දාවූද, යම් ලාමක අකුසල ධර්මයෝ වෙත්ද, ඒ ලාමක අකුශල ධර්මයෝ එළඹ සිටිත්. එල්බ සිටිත්. විශෙෂයෙන් එල්බ සිටිත්. මහණෙනි, යම්සේ පර්වත කූටයන්ගේ සෙවණ සවස් කාලයෙහි පොළොවෙහි පැතිර පවතීද, අධිකව පැතිර පවතීද, විශේෂයෙන් පැතිර පවතීද, මහණෙනි, එපරිද්දෙන්ම පුටුවෙහි හුන්, ඇඳෙහි සයනය කළ, බිම හෝනා, මේ බාලයා විසින් පූර්වයෙහි යම් කායික දුශ්චරිත, වාක් දුශ්චරිත, මනෝ දුශ්චරිත කරණ ලද්දාහුද, ඔහු වෙත ඒ ලාමක අකුශල ධර්මයෝ එළඹ සිටිත්. එල්බ සිටිත්. විශේෂයෙන් එල්බ සිටිත්. මහණෙනි, එහිදී බාලයාහට මෙසේ අදහස් වෙයි. 'මා විසින් යහපතක් නොකරණලදී. කුසලයක් නොකරණලදී. භය දුරු

කරන්නක් නොකරණලදී. පාපයක් කරණලදී. රෞද්‍රකම් කරණලදී. නරකක් කරණලදී. නොකරණලද හොඳ ඇති, නොකරණලද කුසල් ඇති, නොකරණලද භය දුරු කිරීමක් ඇති, කළ පව් ඇති, කළ රෞද්‍රකම් ඇති, කළ නරකකම් ඇති අයගේ යම් ගතියක් වේද, පරලොවදී ඒ ගතියට යමියි, හෙතෙම ශෝක කරයි. ක්ලාන්ත වෙයි. වැළපෙයි. ළෙහි අත්ගසා හඬයි. මුළාවට පැමිණෙයි. මහණෙනි, බාලයා මේ ආත්මභාවයෙහි මේ තුන්වන දුක් දොම්නස විඳියි.

**6.** "මහණෙනි, ඒ මේ බාලතෙම කයින් දුශ්චරිතකොට වචනයෙන් දුශ්චරිතකොට, සිතින් දුශ්චරිතකොට, කාය භේදයෙන්, මරණින් මතු, පහවූ සැප ඇති, නපුරු ගති ඇති, අතරක් නැතිව දුක් දෙන නරකයෙහි උපදී. මහණෙනි, ඒ යමක් ඒකාන්තයෙන් අනිෂ්ටය, ඒකාන්තයෙන් අයහපත්ය, අමනාපයයි මනාව කියන්නේ නම්, මේ නිරය මට ඒකාන්තයෙන් අනිෂ්ටය, ඒකාන්තයෙන් අයහපත්ය, ඒකාන්තයෙන් අමනාපයයි කියයුතු වන්නේය. මහණෙනි, නිරය දුක මේසා දුකයයි උපමාවකිනුදු දැක්වීමට පහසු නොවේ."

**7.** "එසේ කීකල්හි එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මට උපමාවන්ගෙන් දැක්විය හැකිදැයි" ඇසීය.

භාග්‍යවතුන් වහන්සේ "මහණ, හැකියයි" වදාළසේක. "මහණ, අපරාධකාරී සොරකු අල්වා, 'රජුට දෙවයන්වහන්ස, මේ ඒ අපරාධකාරී හොරාය. මොහුට යමක් කැමති නම් ඒ දඬුවම පමුණුවනු මැනවැයි දක්වන්නාහුය.' රජතෙම ඒ මොහුට 'පින්වත, යව්. මේ පුරුෂයාට උදය කාලයෙහි අඩයටි සියයකින් අනිව්යයි කියන්නේය. ඒ මොහුට අඩයටි සියයකින් පෙරවරු කාලයෙහි අනින්නාහුය.' ඉක්බිති රජතෙම දවල් කාලයෙහි 'පින්වත, ඒ පුරුෂයා කෙසේදැයි අසන්නේය.' 'දෙවයන් වහන්ස, එසේම ජීවත් වේයයි' කියන්නාහුය. රජතෙම ඒ මොහුට මෙසේ කියන්නේය.' පින්වත, යව්. ඒ පුරුෂයාට දවල් කාලයෙහි අඩයටි

සියයකින් අනිව්' යයි කියන්නේය. ඒ මොහුට දවල් කාලයෙහි අඩයටි සියයකින් අනින්නාහුය. ඉක්බිති රජතෙම සවස් කාලයෙහි 'එම්බල පුරුෂය, ඒ පුරුෂතෙම දැන් කෙසේ දැයි' අසන්නේය. 'දෙවයන් වහන්ස, එසේම ජීවත් වේයයි' කියන්නාහුය. රජතෙම ඒ මොහුට 'පින්වත, යව්. සවස් කාලයෙහි ඒ පුරුෂයාට අඩයටි සියයකින් අනිව්යයි' කියන්නේය. ඒ මොහුට සවස් කාලයෙහි අඩයටි සියයෙන් අනින්නාහුය. මහණෙනි, ඒ කුමකැයි හඟින්නෙහිද? අඩයටි තුන්සියයකින් අනිනු ලබන්නාවූ ඒ පුරුෂතෙම ඒ හේතුවෙන් දුක් දොම්නස විඳින්නේද?"

8. "ස්වාමීනි, එක් අඩයටියකින් අනිනු ලබන්නාවූ පුරුෂතෙම ඒ හේතුවෙන් දුක් දොම්නස විඳින්නේය අඩයටි තුන්සියයකින් අනිනු ලබන කල්හි කියනුම කවරේද?"

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මිට පමණ කුඩාවූ ගලක් අතට ගෙණ භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, කුමක් සිතන්නහුද? මා විසින් ගන්නා ලද මිට පමණ යම් මේ ගලක් වේද, යම් හිමවත් පර්වත රාජයෙක් වේද, ඒ දෙක අතුරෙන් කවරක් ඉතා මහත්වන්නේ දැයි" ඇසූහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අතට ගන්නා ලද කුඩාවූ මිට පමණ මේ ගල ඉතා කුඩාය, හිමවත් පර්වතරාජයා හා සමානකොට බලනවිට ගණනකටවත් නො පැමිණෙයි. සියක් වැනි, දහස් වැනි, ලක්ෂයක් වැනි, කොටසටවත් නොපැමිණෙයි. බලන්නෙකුට සමාන කිරීමේ පමණටත් නොපැමිණෙයි. මහණෙනි, එපරිද්දෙන්ම ඒ පුරුෂතෙම අඩයටි තුන්සියයකින් අනිනු ලබන්නේ ඒ හේතුවෙන් යම් දුක් දොම්නසක් විඳීනම් එය නිරයකට සමාන කොට බලනවිට ගණනකටවත් නොපැමිණෙයි. සියක්වැනි, දහස්වැනි, ලක්ෂයක් වැනි කොටසකටත් නොපැමිණෙයි. බලන්නෙකුට සමාන කිරීමේ පමණටවත් නොපැමිණෙයි."

9. "මහණෙනි, නිරයපාලයෝ මොහුට පඤ්චවිධ බන්ධන නම් කම්කටුල්ලක් කරත්. (එනම්,) රත්වූ යහුලක් අතෙහි අනිත්.

රත්වූ යහුලක් දෙවෙනි අතෙහිද අනිත්. රත්වූ යහුලක් පාදයෙහි අනිත්. රත්වූ යහුලක් දෙවෙනි පාදයෙහිද අනිත්. රත්වූ යහුලක් ළය මැද අනිත්. හෙතෙම එහි තියුණුවූ, දැඩිවූ දුක්ඛ වේදනාවක් විඳී. යම්තාක්කල් ඒ පාප කර්මය කෙළවර නොවේද, ඒතාක් කලුරිය නොකෙරෙයි.

10. "මහණෙනි, නිරයපාලයෝ ඔහු බිම බාවා කෙටේරිවලින් සසිත්. හෙතෙම එහි දුක්වූ කටුකවූ වේදනා විඳී යම්තාක් ඒ පාප කර්මය නොගෙවේද ඒතාක් හෙතෙම නොමැරෙන්නේය.

11. "මහණෙනි, නිරයපාලයෝ ඒ මොහු පා උඩුකුරු කොට, හිස යටිකුරුකොට තබා, වෑවලින් සසිත්. හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවක් විඳී. යම්තාක් කල් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒ තාක්කල් කලුරිය නොකෙරෙයි.

12. "මහණෙනි, නිරයපාලයෝ ඒ මොහු රථයෙහි යොදා ගිනිගෙන ඇවිලෙන්නාවූ, අතිශයින් දිලියෙන්නාවූ, ගිනිදැල් සහිතවූ පොළොවෙහි ඉදිරියටද ගමන් කරවත්. පස්සටද ගමන් කරවත්. හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවක් විඳී. යම්තාක්කල් මේ පාපකර්මය කෙළවර නොවේද, ඒ තාක්කල් කළුරිය නොකෙරෙයි.

13. "මහණෙනි, ඒ මොහු නිරයපාලයෝ ගිනිගෙන ඇවිලෙන්නාවූ, අතිශයින් දිලිසෙන්නාවූ, ගිනිදැල් සහිතවූ, අඟුරු පර්වතයකට නැංවීමද බැස්වීමද කරවත්. හෙතෙම එහි දුක්වූ, තියුණුවූ කටුකවූ වේදනාවන් විඳියි. යම්තාක් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒ තාක් කළුරිය නොකෙරෙයි. මහණෙනි, නිරයපාලයෝ ඒ මොහු පා උඩුකුරුකොට, හිස යටිකුරුකොට ගෙන, ගිනිගෙන ඇවිලෙන්නාවූ, අතිශයින් දිලිසෙන්නාවූ, ගිනිදැල් සහිතවූ, තැවීම ඇති ලෝකුඹු නරකයෙහි බහාලත්. හෙතෙම එහි පෙණ නගිමින් පැසෙයි. හෙතෙම එහි පෙණ නැගීම් සහිතව පැසෙන්නේ වරක් උඩටද යෙයි. වරක් යටට යයි. වරක් සරසටද යයි. හෙතෙම එහි දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනා විඳියි. යම්තාක් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒතාක්

කළුරිය නොකරයි. මහණෙනි, නිරය පාලයෝ ඒ මොහු මහා නිරයෙහි දමත්. මහණෙනි, ඒ මහා නිරය නම්,

1. "කොන් සතරක් ඇත්තේය, දොරටු සතරක් ඇත්තේය, කොටස් වශයෙන් බෙදන ලද්දේය, කොටස් වශයෙන් ප්‍රමාණ කරන ලද්දේය, යකඩ පවුරකින් වට කරන ලද්දේය, යකඩ පියනකින් වසන ලද්දේය."

2. "ඒ මහා නිරයෙහි බිම යකඩයෙන්ම නිමකරන ලදී. දැල්වෙන ගින්නෙන් යුක්තය. සියලු කල්හි හාත්පස යොදුන් සියයක් ගින්න පැතිර සිටී.

14. "මහණෙනි, මම නොයෙක් ක්‍රමයෙන් නිරය පිළිබඳ විස්තර කථාව කියන්නෙමි. මහණෙනි, වර්ෂ සියයක් දහසක් කියන්නේ වී නමුත් ඒ කීමෙන් නිරය දුක කියා කෙළවර කරන්නට පහසු නොවේ.

"මහණෙනි, තණකොළ කන තිරිසන්ගත සත්වයෝ වන්නාහ. ඔව්හු තෙත්වූ තණද, වියලි තණද, දත්වලින් උළා කති. මහණෙනි, තණ කන තිරිසන්ගත සත්තු කවරහුද? අශ්වයෝද, ගොන්හුද, කොටළුවෝද, එළුවෝද, මුවෝද යන මොවුහු වෙති. එයින් අන්‍ය තණ බුදින තිරිසන්ගත සත්වයෝද වෙති. මහණෙනි, මේ ලොකයෙහි ඒ මේ බාලතෙම රස තෘෂ්ණාවෙන් රස අනුභව කිරීම සඳහා මෙහිදී පව්කම් කොට කාය භේදයෙන් මරණින් මතු යම් ඒ තණ අනුභව කරන සත්වයෝ වෙත්ද, ඒ සත්වයන්ගේ සහභාවයට පැමිණෙයි.

15. "මහණෙනි, අසූචි අනුභවකරන තිරිසන්ගත සත්වයෝ ඇත්තාහ. ඔව්හු දුරදීම අසූචි ගන්ධය ආඝ්‍රාණයකොට දුවති. මෙහි අනුභව කරන්නෙමු, මෙහි අනුභව කරන්නෙමු කියායි. බමුණෝ යාග ගන්ධයෙන් මෙහි අනුභව කරන්නෙමු, මෙහි අනුභව කරන්නෙමුයි යම්සේ දුවත්ද, මහණෙනි, එපරිද්දෙන්ම අසූචි අනුභව කරන තිරිසන්ගත සත්වයෝ වෙති. ඔව්හු දුරදීම අසූචි ගඳ ආඝ්‍රාණයකොට දුවත්. මෙහිදී කන්නෙමු, මෙහිදී කන්නෙමු කියායි. මහණෙනි, අසූචි අනුභව කරන තිරිසන්ගත

සත්වයෝ කවරහුද? කුකුලන් හා ඌරෝද, බල්ලන් හා සිවල්ලුද යන මොවුහු වෙති. එයින් අන්‍ය වූ අසූචි අනුභව කරන අන්‍ය සත්වයෝද වෙති. මහණෙනි, මේ ලෝකයෙහි ඒ බාලතෙම රස තෘෂ්ණාවෙන් රස අනුභව කිරීම සඳහා මෙහිදී ලාමක අකුශලකර්ම කොට කාය භේදයෙන් මරණින් මතු අසූචි අනුභව කරන යම් සත්වයෝ වෙත් නම් ඔවුන්ගේ සහභාවයට පැමිණෙයි.

16. "මහණෙනි, අඳුරෙහි උපදින, අඳුරෙහි දිරන, අඳුරෙහි මැරෙණ, තිරිසන්ගත සත්වයෝ වෙති. අඳුරෙහි උපදින, අඳුරෙහි දිරණ, අඳුරෙහි මැරෙණ, තිරිසන්ගත සත්වයෝ කවරහුද? ලොකු පණුවෝද කුඩා පණුවෝද, ගැඩවිල්ලුද වෙති. එයින් අන්‍යවූ අඳුරෙහි උපදින, අඳුරෙහි දිරණ, අඳුරෙහි මැරෙණ තිරිසන්ගත සත්තුද වෙති. මහණෙනි, ඒ මේ බාලතෙම රස තෘෂ්ණාවෙන් රස අනුභව කිරීම සඳහා මෙහිදී පව්කම් කොට කාය භේදයෙන් මරණින් මතු යම් මේ සත්වයෝ අඳුරෙහි උපදිත්ද, අඳුරෙහි දිරත්ද, අඳුරෙහි මැරෙත්ද, ඔවුන්ගේ සහභාවයට පැමිණෙයි.

17. "මහණෙනි, දියෙහි උපදින, දියෙහි දිරණ, දියෙහි මැරෙණ, තිරිසන්ගත සත්වයෝ වෙති. දියෙහි උපදින, දියෙහි දිරණ, දියෙහි මැරෙණ, තිරිසන්ගත සත්වයෝ කවරහුද? මත්ස්‍යයෝද, කැසුබුවෝද, කිඹුල්ලුද වෙති. එයින් අන්‍යවූ දියෙහි උපදින, දියෙහි දිරණ, දියෙහි මැරෙණ තිරිසන් ගත ප්‍රාණීහුද වෙති. මහණෙනි, යම් මේ බාලතෙම මෙලොව රස අනුභව කිරීම සඳහා මෙහිදී පව්කම් කොට කාය භේදයෙන් මරණින් මතු දියෙහි උපදින, දියෙහි දිරණ, දියෙහි මැරෙණ යම් ඒ සත්වයෝ වෙත්ද, ඔවුන්ගේ සහභාවයට පැමිණෙයි.

18. "මහණෙනි, අසූචියෙහි උපදින, අසූචියෙහි දිරණ, අසූචියෙහි මැරෙණ, තිරිසන්ගත ප්‍රාණීහු ඇත්තාහ. මහණෙනි, අසූචියෙහි උපදින, අසූචියෙහි දිරණ, අසූචියෙහි මැරෙණ තිරිසන්ගත ප්‍රාණීහු කවරහුද? මහණෙනි, යම් මේ සත්වයෝ කුණු මස්වල උපදිත්ද, කුණුමස්වල දිරත්ද, කුණුමස්වල මැරෙත්ද,

කුණු කුණපයෙහි හෝ උපදිත්ද, කුණු කුණපයෙහි හෝ දිරත්ද, කුණු කුණපයෙහි හෝ මැරෙත්ද, කුණු පිට්ටුවල හෝ උපදිත්ද, කුණු පිට්ටුවල හෝ දිරත්ද, කුණු පිට්ටුවල හෝ මැරෙත්ද, ගවර වලෙහි හෝ උපදිත්ද, ගවර වලෙහි හෝ දිරත්ද, ගවර වලෙහි හෝ මැරෙත්ද, අපිරිසිදු දිය රැස්වන තැනක හෝ උපදිත්ද, අපිරිසිදු දිය රැස්වෙන තැනක හෝ දිරත්ද, අපිරිසිදු දිය රැස්වෙන තැනක හෝ මැරෙත්ද, එයින් අන්‍යවූ අසූචියෙහි උපදින, අසූචියෙහි දිරණ, අසූචියෙහි මැරෙණ තිරිසන්ගත ප්‍රාණීහුද වෙති. මහණෙනි, ඒ මේ බාලතෙම රස අනුභව කිරීම සඳහා මෙහිදී පව්කම්කොට කාය භේදයෙන් මරණින් මතු යම් ඒ සත්වයෝ අසූචියෙහි උපදිත්ද, අසූචියෙහි දිරත්ද, අසූචියෙහි මැරෙත්ද, ඔවුන්ගේ සහභාවයට පැමිණෙයි.

"මහණෙනි, මම නොයෙක් ක්‍රමයෙන් තිරිසන් යෝනියේ විස්තර කියන්නෙම්ද, මහණෙනි, තිරිසන්ගත සත්වයින්ගේ දුක මෙතෙකැයි කීමෙන් මුදුන් අවසාන කරන්නට පහසු නොවෙයි.

**19.** "මහණෙනි, පුරුෂයෙක් තෙම එක සිදුරක් ඇති වියදණ්ඩක් මහමුහුදෙහි දමන්නේය. ඒ වියදණ්ඩ පෙරදිග වාතයෙන් අපරදිගට පමුණුවන්නේය. අපරදිග වාතයෙන් පෙර දිගට ගෙනයන්නේය. උතුරුදිග වාතයෙන් දකුණු දිගට ගෙනයන්නේය. දකුණුදිග වාතයෙන් උතුරු දිගට ගෙන යන්නේය. ඒ මුහුදෙහි කණ කැස්බෙක් වන්නේය. ඌ වර්ෂ සියයක්, වර්ෂ දහසක්, වර්ෂ ලක්ෂයක් ඇවෑමෙන් වරක් උඩට එන්නේය. මහණෙනි, ඒ කැස්බා මේ එක් සිදුරක් ඇති වියදණ්ඩෙහි බෙල්ල ඇතුල් කරන්නේ නම් ඒ කුමකැයි හඟින්නෙහිද?"

"ස්වාමීනි, ඉදින් ඒකාන්තයෙන් බොහෝ කාලයක් ඇවෑමෙන් කිසියම් කලෙක සිදුවන්නකි."

**20.** "මහණෙනි, ඒ කණකැස්බා මේ එක් සිදුරක් ඇති වියදඬු සිදුරෙහි බෙල්ල ඇතුල් කරන්නේ නම් එය වහා සිදුවන්නකි. මහණෙනි, වරක් නිතර දුක් ඇති සතර අපායටවත්

බාලයා විසින් වරක් මිනිසත් බව ලැබීම ඊටත් වඩා අතිශයින් දුර්ලභයයි මම කියමි. ඊට හේතු කවරේද? මහණෙනි, මෙහි ධර්මයට අනුව හැසිරීමක්, සම හැසිරීමක්, කුසල ක්‍රියාවක්, පින්කිරීමක් නැත්තේද, එහෙයිනි. මහණෙනි, මෙහි ඔවුනොවුන් අල්ලාගෙන කන්නාහු වෙති, දුර්වලයන් අල්ලාගෙන කන්නාහු වෙති. මහණෙනි, ඒ මේ බාලතෙම ඉදින් කිසියම් කලෙක බොහෝ කාලයක්හුගේ ඇවෑමෙන් මිනිසත් බවට පැමිණේද, එකල්හි සැඩොල් කුලය හෝ වැදි කුලය හෝ කුලුපොතු කුලය හෝ රථකාර කුලය හෝ රදා කුලය හෝ යන යම් මේ නීච කුලයෝ වෙත්ද, එබඳු දිළිඳු මද ආහාර පැන් බොජුන් ඇති යම් කුලයක දුකින් බඩගින්න නිවාගැනීම ලබයිද, එබඳු දුක් පැවතුම් ඇති කුලයක උපදී. හෙතෙමේද දුර්වර්ණ වෙයි. යකකුමෙන් දැකීමට දුෂ්කර වෙයි. මිටි වෙයි. බොහෝ ආබාධ ඇත්තේ වෙයි. කණෙක් හෝ කොරෙක් හෝ කුදෙක් හෝ පිලෙක් හෝ වෙයි. ආහාර පැන් රෙදි යානා මල් ගඳ විලවුන් විසීමට තැනක් සහ පහන් දල්වන උපකරන නොලබන්නෙක් වෙයි. හෙතෙම කයින් දුශ්චරිත කෙරෙයි. වචනයෙන් දුශ්චරිත කෙරෙයි. සිතින් දුශ්චරිත කෙරෙයි. හෙතෙම කයින් දුශ්චරිතකොට, වචනයෙන් දුශ්චරිත කොට, සිතින් දුශ්චරිතකොට කාය භේදයෙන් මරණින් මතු සැපයෙන් පහවූ නරක ගති ඇති, අතරක් නැති දුක් ඇති නරකයෙහි උපදී.

21. "මහණෙනි, සූදුකෙළින්නෙක් යම්සේ පළමු පැරදීමෙන්ම පුත්‍රයාද නැතිවන්නේද, භාර්‍ය්‍යාවද නැතිවන්නේද, සියලු වස්තුවද නැතිවන්නේද, පසුව තමාත් බන්ධනයට අසුවන්නේද, මහණෙනි, ඒ සූදුකාරයාගේ පළමු පරාජයෙන්ම පුත්‍රයාගේ නැතිවීමද, භාර්‍ය්‍යාවගේ නැතිවීමද, පසුව තමනුත් බැඳීමද යන සියලු වස්තුව නැතිවීමද, ඒ පැරදීම ස්වල්ප කාරණයකි. තවද යම්හෙයකින් ඒ බාලතෙම කයින් දුශ්චරිත කොට, වචනයෙන් දුශ්චරිත කොට, සිතින් දුශ්චරිත කොට, කාය භේදයෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරුගති ඇති අතරක් නැති, දුක් ඇති නරකයෙහි උපදී නම් මෙය ඊටත් වඩා ඉතා මහත් පැරදීමකි. මහණෙනි, මේ වනාහි සියල්ල සම්පූර්ණවූ බාලභූමිය වන්නීය.

22. "මහණෙනි, පණ්ඩිතයාගේ මේ පණ්ඩිත ලක්ෂණ, පණ්ඩිත නිමිති. පණ්ඩිත චරිත තුනක් වෙති. ඒ තුන කවරහුද? මහණෙනි, මේ ලෝකයෙහි පණ්ඩිත තෙම මනාකොට සිතන්නේත්, මනාකොට කියන්නෙත්, මනාකොට කරන්නේත් වෙයි. මහණෙනි, පණ්ඩිත තෙම මනාකොට නොසිතන්නේ වේනම්, මනාකොට නොකියන්නේ වේනම්, මනාකොට නොකරන්නේ වේනම්, කුමකින් ඔහු මේ භවත් සත්පුරුෂතෙම පණ්ඩිතයායයි පණ්ඩිතයෝ දැනගන්නාහුද? මහණෙනි, යම්හෙයකින් පණ්ඩිතතෙම මනාකොට සිතන්නේත් වේද, මනාකොට කියන්නේත් වේද, මනාකොට කරන්නේත් වේද එහෙයින් ඔහු මේ භවත් සත්පුරුෂතෙම පණ්ඩිතයායයි පණ්ඩිතයෝ දැනගනිත්. මහණෙනි, ඒ මේ පණ්ඩිතතෙම මේ ආත්මභාවයෙහිදීම තෙවැදෑරුම් සැප සහගත සොම්නසක් විඳියි. මහණෙනි, ඉදින් පණ්ඩිතතෙම සභාවෙක හෝ හුන්නේ වේද, වීථියෙක හෝ හුන්නේ වේද සතරමංසන්ධියෙක හෝ හුන්නේ වේද, එහි සිටි ජනතෙම ඒ යහපත් ක්‍රියාවන්ට අනුරූපවූ සුදුසුවූ කථාකෙරෙයි. මහණෙනි, ඉදින් පණ්ඩිත තෙම ප්‍රාණඝාතයෙන් තොරවූයේ වේද, නුදුන් දෙය ගැන්මෙන් තොරවූයේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් තොරවූයේ වේද, බොරු කීමෙන් තොරවූයේ වේද, ප්‍රමාදයට කරුණුවූ මත්පැන් පානයෙන් තොරවූයේ වේද, මහණෙනි, එහිදී පණ්ඩිතයාහට මෙබඳු අදහසක් වෙයි. 'යම්හෙයකින් ජනතෙම ඒ යහපත් ක්‍රියාවන්ට අනුරූපවූ සුදුසුවූ කථාකරන්නේ වෙයි. ඒ ධර්ම මා කෙරෙහි නැත්තාහු වෙති. මම ඒ ධර්මයන්හි දකිනු ලබන්නෙමි' කියායි. මහණෙනි, පණ්ඩිතතෙම මේ පළමුවෙනි සැපයවූ සොම්නස විඳියි.

23. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. පණ්ඩිතතෙම රජවරුන් අපරාධකාරී සොරු අල්වාගෙණ නන්වැදෑරුම් කම්කටුලු කරවනු ලබන්නවුන් දකී. එනම්ඃ කසවලින් තළනු ලබන්නවුන්, වේවැල්වලින් තළනුලබන්නවුන්, මුගුරුවලින් තළනු ලබන්නවුන්, අත කපනු ලබන්නවුන්, පා කපනු ලබන්නවුන්,

අත් පා දෙකම කපනු ලබන්නවුන්, කණ කපනු ලබන්නවුන්, නාසය කපනු ලබන්නවුන්, කණ්-නාසා දෙකම කපනු ලබන්නවුන්, බිලංගථාලික නම් කර්මය කරනු ලබන්නවුන්, සඞ්ඛමුණ්ඩික නම් කර්මය කරනු ලබන්නවුන්, රාහුමුඛ නම් කර්මය කරනු ලබන්නවුන්, ජෝතිමාලික නම් කර්මය කරනු ලබන්නවුන්, හත්ථපජ්ජොතික නම් කර්මය කරනු ලබන්නවුන්, ඒරකවත්තික නම් කර්මය කරනු ලබන්නවුන්, චීරවාසික නම් කර්මය කරනු ලබන්නවුන්, ඒණෙයයක නම් කර්මය කරනු ලබන්නවුන්, බලිසමංසික නම් කර්මය කරනු ලබන්නවුන්, කහාපණක නම් කර්මය කරනු ලබන්නවුන්, ඛාරාපතච්ඡික නම් කර්මය කරනු ලබන්නවුන්, පලිඝපරිපත්තික නම් කර්මය කරනු ලබන්නවුන්, පලාලපිට්ඨි නම් කර්මය කරනු ලබන්නවුන්, කකියවන ලද තෙල් ඉසිනු ලබන්නවුන්, සාදුකින් පීඩිත බල්ලන් ලවා කවනු ලබන්නවුන්, පණපිටින් හුල හිඳුවනු ලබන්නවුන් සහ කඩුවෙන් හිස සිඳිනු ලබන්නවුන්ය.

**24.** "මහණෙනි, එහිදී පණ්ඩිතයාහට මෙසේ අදහස් වෙයි. 'යම්බඳු පාප කර්මයක් හේතුකොටගෙණ අපරාධකාරී සොරු ගෙණ නන්වැදෑරුම් කම්කටුලු කෙරෙත්. එනම්ඃ කසවලින්ද තළත්. වේවැල්වලින්ද තළත්. මුගුරුවලින්ද තළත්. අතද කපත්. පයද කපත්. අත් පා දෙකමද කපත්. කණද කපත්. නාසයද කපත්. කණ්-නාසා දෙකමද කපත්. බිලංගථාලික නම් කර්මයද කෙරෙත්. සඞ්ඛමුණ්ඩික නම් කර්මයද කෙරෙත්. රාහුමුඛ නම් කර්මයද කෙරෙත්. ජොතිමාලික නම් කර්මයද කෙරෙත්. හත්ථපජ්ජොතික නම් කර්මයද කෙරෙත්. ඒරකවත්ථික නම් කර්මයද කෙරෙත්. චීරකවාසික නම් කර්මයද කෙරෙත්. ඒණෙයයක නම් කර්මයද කෙරෙත්. බලිසමංසික නම් කර්මයද කෙරෙත්. කහාපණක නම් කර්මයද කෙරෙත්. ඛාරාපතච්ඡිකද නම් කර්මයද කෙරෙත්. පලිඝපරිවත්තික නම් කර්මයද කෙරෙත්. පලාලපිට්ඨික නම් කර්මයද කෙරෙත්. කකියවනලද තෙල්ද ඉසිත්. සාදුකින් පීඩිත බල්ලන් ලවාද කවත්. පණපිටින් හුලද හිඳුවත්. කඩුවෙන්ද හිස සිඳිත්. ඒ ධර්මයෝ මා කෙරෙහි විද්‍යාමාන

නොවෙත්. මම ඒ ධර්මයන්හි පෙනී නොසිටිනු ලබන්නෙමියි කියායි.' මහණෙනි, පණ්ඩිතතෙම මේ ආත්මභාවයෙහි මේ දෙවෙනි සැපයවූ සොම්නස විඳී."

**25.** "මහණෙනි, නැවතද අනෙකක් කියමි. පුටුවෙහි හුන්න වූ හෝ, ඇඳේ හෝනාවූ හෝ, බිම හෝනාවූ හෝ පණ්ඩිතයා වෙත ඔහු විසින් පෙර කයින් යම් යහපත්වූ සුචරිත කර්ම කරනු ලැබීද, වචනයෙන් සුචරිත කර්ම කරනු ලැබීද, මනසින් සුචරිත කර්ම කරනු ලැබීද, ඔහු විසින් කරණලද ඒ කර්ම එකල්හි එල්බ සිටිත්. වැඩියෙන් එල්බ සිටිති. විශේෂයෙන් එල්බ සිටිති. මහණෙනි, යම්සේ මහත් පර්වතකූටයන්ගේ සෙවන සවස් කාලයෙහි පොළොවෙහි එල්බ සිටිත්ද, වැඩියෙන් එල්බ සිටිත්ද, විශෙෂයෙන් එල්බ සිටිත්ද, මහණෙනි, එපරිද්දෙන්ම පුටුවට නැංගා වූ හෝ, ඇඳේ හෝනාවූ හෝ, පොළොවේ හෝනාවූ හෝ, පණ්ඩිතයා කරා ඔහු විසින් පෙර කයින් යහපත්වූ යම් සුචරිත කර්ම කරනු ලැබීද, වචනයෙන් යම් සුචරිත කර්ම කරනු ලැබීද, මනසින් යම් සුචරිත කර්ම කරණු ලැබීද, ඔහු විසින් කරණලද ඒ කර්ම එකල්හි එල්බ සිටිති. වැඩියත් එල්බ සිටිති. විශේෂයෙන් එල්බ සිටිති. මහණෙනි, එහිදී ඒ පණ්ඩිතයාහට මෙසේ අදහස් වෙයි. 'මා විසින් ඒකාන්තයෙන් පව් නොකරණලදී. රෞද්‍රකම් නොකරණලදී. නරකක් නොකරණලදී. යහපතක් කරණලදී. කුසල් කරණ ලදී. භය දුරුකිරීමක් කරණලදී. නොකරණලද පාප ඇත්තන්ගේ, නොකරණලද රෞද්‍රකම් ඇත්තන්ගේ නොකරණ ලද නරකකම් ඇත්තන්ගේ යම් ගතියක් වේද, පරලොව ඒ ගතියට පැමිණෙන්නෙමියි, හෙතෙම ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොහඬයි. පපුවේ අත් ගස්සා නොගනියි. මුළාවට නොපැමිණෙයි. මහණෙනි, පණ්ඩිතතෙම මේ ආත්මයෙහි මේ තුන්වන සැපයවූ සොම්නස විඳියි.

**26.** "මහණෙනි, ඒ මේ පණ්ඩිතතෙම කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, කාය භේදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. මහණෙනි, ඒ යමක් ඒකාන්තයෙන් ඉෂ්ටය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒකාන්තයෙන් යහපත්ය. ඒකාන්තයෙන් මනාපයයි මනාව කියන්නේ නම්, මහණෙනි, ඒකාන්තයෙන් ඉෂ්ටය. ඒකාන්තයෙන් මනාපයයි ස්වර්ග කිය යුතුය. ස්වර්ගය සැපය දැක්වීමට උපමාවකුදු පහසු නොවේ.” එසේ වදාළකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට උපමාවක් කළ හැකිද, යන මෙය සැළකෙළේය. “මහණ, හැකියයි” වදාළ සේක.

**27.** “මහණ, සක්විති රජතෙම රත්න සතකින් හා ඍද්ධි සතරකින්ද යුක්තවූයේ ඒ හේතුවෙන් සැපක් සොම්නසක් විඳින්නේය. කවර සතකින්ද? මහණෙනි, මේ ලෝකයෙහි මුදුනෙහි අභිෂේක කරණ ලද පසළොස්වක් පොහෝදා හිස සහිතව නෑවාවූ පෙහෙවස්වූ පහ මතුවට නැගුණු, ක්ෂත්‍රිය රජුට දහස් ගණන් අර ඇති, නේමි සහිත, නැබ සහිත, සියලු ආකාරයෙන් හාත්පසින් පිරුණු චක්‍රරත්නය පහළවේද, එය දැක මුදුනෙහි අභිෂේක කරණ ලද ක්ෂත්‍රිය රජහට මෙසේ අදහස් වෙයි. ‘මා විසින් එය අසන ලද්දේය. කුමක් මුදුනෙහි අභිෂේක කරණලද පොහෝ දින හිස සහිතව නෑවාවූ, පෙහෙවස්වූ, පහමතුවට නැගුණාවූ, යම් ක්ෂත්‍රිය රජකුට දහස් ගණන් අර ඇති, නේමි සහිත, නැබ සහිත, සියලු ආකාරයෙන් හාත්පසින් පිරුණු චක්‍රරත්නය පහළ වේද, හෙතෙම ඒ සක්විති රජවෙයිය, මම දැන් සක්විති රජ වූයේ වෙම්දැයි” අදහස් වෙයි.

**28.** “ඉක්බිති මහණෙනි, මුදුනෙහි අභිෂේක කරණලද සක්විති රජතෙම අස්නෙන් නැගිට වමතින් කෙණ්ඩිය ගෙණ, ‘පින්වත් චක්‍රරත්නය ගමන් කෙරේවා පින්වත් චක්‍රරත්නය දිනවායි, චක්‍රරත්නයට දකුණතින්, පැන් වත්කරයි. ඉක්බිති මහණෙනි, ඒ චක්‍රරත්නය පෙරදිගට ගමන්කරයි. සක්විති රජතෙම සිව්රඟ සෙනගද සමග අනුව ගමන්කරයි. මහණෙනි, යම් පෙදෙසක චක්‍රරත්නය පිහිටාද, එපෙදෙසෙහි සිව්රඟ සෙනගත් සමග විසීමට පැමිණෙයි.

“මහණෙනි, පෙරදිග යම් විරුද්ධ රජවරු වෙත්ද, ඔව්හු සක්විති රජහු වෙත පැමිණ, ‘මහරජතුමනි, එනු මැනවි. මහරජතුමනි, යහපත් පැමිණීමකි. මහරජ තුමනි, ඔබ වහන්සේට

අප අයත් වේවා. මහරජතුමනි, අපට අනුශාසනා කරනු මැනවැයි' කීවාහුය. සක්විති රජතෙම මෙසේ කීය. 'පරපණ නොනැසිය යුතුයි. නොදුන් දෙය නොගත යුතුයි. කාමයන්හි වරදවා නොහැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් නොපිය යුතුයි. අනුභව කළ රාජ්‍යම අනුභව කරව්' කියායි. මහණෙනි, පෙරදිග යම් විරුද්ධ රජවරු වෙත්ද, ඔව්හු සක්විති රජු අනුගමනය කරන්නෝ වෙත්.

**29.** "ඉක්බිති මහණෙනි, ඒ චක්‍රරත්නය පෙරදිග මුහුදෙහි ගැළී මතුවී දකුණුදිගට ගමන් කරයි. සක්විති රජතෙම සිව්රඟ සෙනග සමග අනුවයයි. මහණෙනි, යම් පෙදෙසක චක්‍රරත්නය පිහිටාද එපෙදෙසෙහි සිව්රඟ සෙනගත් සමග විසීමට පැමිණෙයි. මහණෙනි, දකුණුදිග යම් විරුද්ධ රජවරුවෙත්ද, ඔව්හු සක්විති රජහු වෙත එළඹ මෙසේ කීවාහුය. 'මහරජතුමනි, එනු මැනවි. මහරජතුමනි, (ඔබතුමාගේ පැමිණීම) යහපත් පැමිණීමකි. මහරජතුමනි, ඔබවහන්සේට (අප) අයත් වේවා. මහරජතුමනි, (අපට) අනුශාසනා කරනු මැනව' කියායි. (එවිට) සක්විති රජතෙම මෙසේ කීයේය. 'පරපණ නොනැසිය යුතුයි. නොදුන් දෙය නොගත යුතුයි. කාමයන්හි වරදවා නොහැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් පානය නොකළ යුතුයි. අනුභව කළ රාජ්‍යයම අනුභව කරව්' කියායි. මහණෙනි, දකුණුදිග යම් විරුද්ධ රජවරු වෙත්ද, ඔව්හු සක්විති රජුට අනුව යන්නෝ වෙත්.

**30.** "ඉක්බිති මහණෙනි, ඒ චක්‍ර රත්නය දකුණුදිග මුහුදෙහි ගැළී, මතුවී අපරදිග ගමන් කරයි. සක්විති රජතෙම සිව්රඟ සෙනග සමග අනුව යයි. මහණෙනි, යම් පෙදෙසක චක්‍ර රත්නය පිහිටාද එපෙදෙසෙහි සිව්රඟ සෙනගත් සමග විසීමට පැමිණෙයි. මහණෙනි, අපරදිග යම් විරුද්ධ රජවරු වෙත්ද, ඔව්හු සක්විති රජහු වෙත එළඹ මෙසේ කීවාහුය. 'මහරජතුමනි, එනු මැනවි. මහරජතුමනි, (ඔබතුමාගේ පැමිණීම), යහපත් පැමිණීමකි. මහරජතුමනි, ඔබවහන්සේට (අප) අයත් වේවා. මහරජතුමනි, (අපට) අනුශාසනා කරනු මැනව' කියායි. (එවිට) සක්විති

රජතෙම මෙසේ කීයේය. 'පරපණ නොනැසිය යුතුයි. නොදුන් දෙය නොගත යුතුයි. කාමයන්හි වරදවා නොහැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් පානය නොකළ යුතුයි. අනුභව කළ රාජ්‍යයම අනුභව කරව්' කියායි. මහණෙනි, අපරදිග යම් විරුද්ධ රජවරු වෙත්ද, ඔව්හු සක්විති රජුට අනුව යෙදුනෝ වෙත්.

31. "ඉක්බිති මහණෙනි, ඒ චක්‍රරත්නය අපරදිග මුහුදේ ගැලී මතුවී උතුරුදිගට ගමන් කරයි. සක්විති රජතෙම සිව්රඟ සෙනඟ සමග අනුව පවතී. මහණෙනි, යම් පෙදෙසක චක්‍රරත්නය පිහිටාද, ඒ පෙදෙසෙහි සක්විති රජතෙම සිව්රඟ සෙනඟ සමග විසීමට පැමිණෙයි. මහණෙනි උතුරුදිග යම් විරුද්ධ රජවරු වෙත්ද, ඔව්හු සක්විති රජුවෙත පැමිණ මෙසේ කීවාහුය. 'මහරජ, එනු මැනව. මහරජ, යහපත් පැමිණීමකි. මහරජ, ඔබට අප අයත් වේවා. මහරජ, අපට අනුශාසනය කරනු මැනවැයි' කියායි. සක්විති රජතෙම මෙසේ කීය. 'පරපණ නොනැසිය යුතුයි. නුදුන් දෙය නොගත යුතුයි. කාමයන්හි වරදවා නොහැසිරිය යුතුයි. බොරු නොකිය යුතුයි. මත්පැන් නොපිය යුතුයි. අනුභව කළ රාජ්‍යයම අනුභව කරව්' කියායි. මහණෙනි, උතුරුදිග යම් විරුද්ධ රජවරු වෙත්ද, ඔව්හු සක්විති රජ අනුගමනය කරන්නෝ වෙති. ඉක්බිති මහණෙනි, ඒ චක්‍රරත්නය මුහුද කෙළවරකොට ඇති පොළොව දිනා, එම රාජධානියට පැමිණ, සක්විති රජුගේ අන්තඃපුරයෙහි දොරටුව හොබවමින් සක්විති රජුගේ අන්තඃපුරය ද්වාරයෙහි කඩ ඇණය ගසන ලද්දක් මෙන් සිටී. මහණෙනි, සක්විති රජුට මෙබඳු චක්‍රරත්නයක් පහළවෙයි.

32. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජුට හස්ති රත්නය පහළ වෙයි. සියල්ල සුදු සත් තැනක් බිම පිහිටි, ඍද්ධි ඇති, අහසින් යන, උපෝසථ නම් ඇත් රජෙකි. ඔහු දැක සක්විති රජුගේ සිත පහදී. පින්වත්නි, මේ ඇත් යානය ඉදින් හික්මුණු බවට පැමිණෙන්නේ නම් ඒකාන්තයෙන් යහපත්ය. මහණෙනි, එකල්හි ඒ හස්ති රත්නය බොහෝ කලක්

හික්මවන ලද යහපත් ආජානීය හස්තිරාජයෙක් යම්සේද එමෙන්ම හික්මී පැමිණෙයි. මහණෙනි, පෙර වූ දෙයක් නම් සක්විති රජතෙම ඒ හස්ති රත්නය විමසනු පිණිස පෙරවරු ඇතු පිට නැගී, මුහුද කෙළවරකොට ඇති, පොළොවෙහි හැසිර එම රාජධානියට අවුත් උදය ආහාර ගත්තේය. මහණෙනි, සක්විති රජුට මෙබඳු හස්ති රත්නයක් පහළවෙයි.

33. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජුට අශ්ව රත්නයක් පහළවෙයි. කෙබඳු අශ්ව රත්නයක්ද සියල්ල සුදු, කවුඩෙක් මෙන් කලුපැහැ හිසක් ඇති, 'මුඤ්ජ" නම් තෘණ විශේෂය වැනි කෙහෙ ඇති, ඍද්ධි ඇති, අහසින් යන, වළාහක නම් අස් රජෙකි. ඌ දැක සක්විති රජුගේ සිත පහදී. පින්වත්නි, ඉදින් මේ අශ්වයානය හික්මුණු බවට පැමිණෙන්නේ නම් ඒකාන්තයෙන් යහපත්ය, මහණෙනි, එකල්හි ඒ අශ්වරත්නය බොහෝ කල් හික්මවන ලද යහපත් ආජානීය අශ්වයෙක් යම්සේද එමෙන්ම හික්මුණු බවට පැමිණෙයි. මහණෙනි, පෙර වූ දෙයක් නම් සක්විති රජතෙම ඒ, අශ්වරත්නය විමසීම සඳහා පෙරවරු කාලයෙහි අසුපිට නැගී මුහුද කෙළවර කොට ඇති පොළොවෙහි හැසිර එම රාජධානියට පැමිණ උදය ආහාර කෘත්‍ය කෙළේය. මහණෙනි, සක්විති රජුට මෙබඳු අශ්ව රත්නයක් පහළවෙයි.

34. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජුට මාණික්‍ය රත්නයක් පහළවෙයි. එය යහපත්වූ, ජාතිමත්වූ, අටහුලස් ඇති, මොනවට පිරියම් කරණලද, වෛඩූර්‍ය්‍ය මාණික්‍යයෙක් වෙයි. මහණෙනි, ඒ මාණික්‍යයාගේ ආලෝකය හාත්පස යොදුනක් පැතිර පවතී. මහණෙනි, පෙර වූ දෙයක් නම් සක්විති රජතෙම ඒ මැණික විමසීම සඳහා සිවුරඟ සෙනඟ සන්නද්ධ කොට, මැණික කොඩි මුදුනට නංවා රාත්‍රි අඳුරෙහි ගියේය. මහණෙනි, හාත්පස යම් ගම් වූවාහුද ඒ ගම් මැණික් එලියෙන් දවල්යයි හඟිමින් කර්මාන්ත කළහ. මහණෙනි, සක්විති රජුට මෙබඳු මිණි රුවනෙක් පහළ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**35.** "මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජුට ස්ත්‍රී රත්නයක් පහළ වෙයි. ඒ ස්ත්‍රී රත්නය විශිෂ්ට රූ ඇත්තේය. දැකුම් කලුය, ප්‍රසාද ජනකය, උතුම් වර්ණ සෞන්දර්‍යයෙන් යුක්තය, ඉතා දිග නොවෙයි, ඉතා කොටත් නොවෙයි, ඉතා කෙට්ටුත් නොවෙයි, ඉතා මහතත් නොවෙයි, ඉතා කලුත් නොවෙයි, ඉතා සුදුත් නොවෙයි, මිනිස් වර්ණය ඉක්මවූවා වෙයි, දිව්‍ය වර්ණයට නොපැමිණියාය. මහණෙනි, ඒ ස්ත්‍රී රත්නයාගේ මෙබඳු කාය ස්පර්ශයක් වෙයි, කපු පුලුන්වල ස්පර්ශය මෙනි, මහණෙනි, ඒ ස්ත්‍රී රත්නයේ ශරීරය සීත කාලයෙහි උෂ්ණවේ, උෂ්ණ කාලයෙහි සීතවේ, මහණෙනි, ඒ ස්ත්‍රී රත්නයාගේ කයින් සඳුන් සුවඳ හමයි, මුවෙන් උපුල් මල් සුවඳ හමයි, මහණෙනි, සක්විති රජුගේ ඒ ස්ත්‍රී රත්නය වනාහී හැමට කලින් පුබුදින්නී වෙයි, පසුව නිදන්නී වෙයි කීකරුකම දක්වන්නීය, මනාපසේ හැසිරෙන්නීය, ප්‍රිය තෙපුල් කියන්නීය, මහණෙනි, ඒ ස්ත්‍රී රත්නය වනාහි සක්විති රජ සිතින්වත්, ඉක්මවා නොහැසිරෙයි, කයින් කොයින් ඉක්මවයිද, මහණෙනි, සක්විති රජුට මෙබඳු ස්ත්‍රී රත්නයක් පහළවෙයි.

**36.** "මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජුට ගෘහපති රත්නයක් පහළවෙයි. යම් හෙයකින් සස්වාමිකවූ හෝ අස්වාමික නිධාන දකීද, එබඳු කර්ම විපාකයෙන් උපන් දිව්‍ය චක්ෂුසක් ඔහුට පහළවෙයි, හෙතෙම සක්විති රජුවෙත එළඹ මෙසේ කීය. 'දෙවයන් වහන්ස, ඔබ වහන්සේ මන්දොත්සාහි වනුමැනවි, මම ඔබ වහන්සේට ධනයෙන් කටයුතුදෙය ධනයෙන් කරන්නෙමි, කියායි. මහණෙනි, පෙර සක්විති රජතෙම එම ගෘහපති රත්නය විමසන්නේ නැව් නැග ගඟ මැද ගඟේ සැඩ පහරට බැසගෙණ ගෘහපති රත්නයට මෙය කීය. 'ගෘහපතිය, මට හිරණ්‍ය ස්වර්ණයෙන් ප්‍රයෝජනය.' 'මහරජ එසේ වීනම් නැව එක ඉවුරකට පැමිණේවා' 'ගෘහපතිය, මට මෙහිදී හිරණ්‍ය ස්වර්ණයෙන් ප්‍රයෝජනය. 'මහණෙනි, එකල්හි ඒ ගෘහපති රත්නය දෑතින් ජලය මැඩ, හිරණ්‍ය ස්වර්ණයෙන් පිරුණු නිදන් සැළියක් උඩට ගෙන සක්විති රජුට මෙසේ කීය. 'මහරජතුමනි, මෙපමණකින් ප්‍රමාණද? මහරජතුමනි, මෙපමණකින් කරණ

ලදද? මහරජතුමනි, මෙපමණකින් පුදන ලදද? 'සක්විති රජතෙම මෙසේ කීය.' ගෘහපතිය, මෙපමණකින් ප්‍රමාණය. මෙපමණකින් කරණලදී. ගෘහපතිය, මෙපමණකින් පුදන ලදී.' මහණෙනි, සක්විති රජුට මෙබඳු ගෘහපති රත්නයක් පහළවෙයි.

37. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජුට පුත්‍රරත්නයක් පහළවෙයි. කෙබඳු පුත්‍රරත්නයක්ද, පණ්ඩිතවූ, ව්‍යක්තවූ, බුද්ධි ඇති, උපස්ථාන කටයුතු, සක්විති රජුට උපස්ථාන කරවන්නට, අස්කළයුත්තන් අස්කරන්නට, ඒ ඒ තනතුරෙහි තබන්නට, සුදුස්සන් තබවන්නට, ශක්තිමත් පුත්‍රරත්නයකි. හෙතෙම සක්විති රජු වෙත එළඹ මෙසේ කීය. 'දෙවයිනි, ඔබවහන්සේ මන්දොත්සාහී වනු මැනවි. මම අනුශාසනය කරන්නෙමි. මහණෙනි, සක්විති රජුට මෙබඳු පුත්‍රරත්නයක් පහළවෙයි.

"මහණෙනි, සක්විති රජතෙම මේ සප්ත රත්නයෙන් යුක්තවූයේ වෙයි. ඍද්ධි සතරකින්ද යුක්තවූයේ වෙයි. කවර ඍද්ධි සතරකින්ද යත්?

38. "මහණෙනි, මේ ලෝකයෙහි සක්විති රජතෙම විශිෂ්ට රූ ඇත්තේය. දැකුම්කලුය. ප්‍රසාද ජනකය. අන් මිනිසුන්හට වඩා අතිශයින්ම උතුම් වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්තය. මහණෙනි, සක්විති රජතෙම මේ පළමුවෙනි ඍද්ධියෙන් යුක්තය.

"මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජ තෙම දීර්ඝායුෂ ඇත්තේ වෙයි. අන් මිනිසුන්හට වඩා බොහෝ කල් ජීවත්ව සිටින්නේය. මහණෙනි, සක්විති රජ තෙම මේ දෙවෙනි ඍද්ධියෙන් යුක්තය.

"මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජ තෙම පීඩා නැත්තේය. රෝග නැත්තේය. අන් මිනිසුන්ට වඩා අතිශයින් ඉතා සිහිල් නොවූ, ඉතා උෂ්ණ නොවූ, සමව ආහාර පැසෙන ගින්නෙන් යුක්තය. මහණෙනි, සක්විති රජතෙම මේ තුන්වෙනි ඍද්ධියෙන් යුක්තය.

"මහණෙනි, නැවතද අනෙකක් කියමි. සක්විති රජතෙම බමුණු ගෘහපතියනට ප්‍රිය මනාපය, මහණෙනි, පුතුන්හට පියෙකු මෙන් ප්‍රියය, මනාපය, මහණෙනි, එපරිද්දෙන්ම සක්විති රජතෙම බමුණු ගෘහපතියනට ප්‍රියය, මනාපය, මහණෙනි, සක්විති රජුට බමුණු ගෘහපතියෝද ප්‍රිය වෙත්. මනාප වෙත්. මහණෙනි, පියාහට පුතුන්මෙන් ප්‍රියය. මනාපය. මහණෙනි, එපරිද්දෙන්ම සක්විති රජුට බමුණු ගෘහ පතියෝ ප්‍රියය, මනාපය. මහණෙනි, පෙර වූවක් කියමි. සිව්රඟ සෙනඟ විසින් සක්විති රජතෙම උයන් බිමට පමුණුවනු ලැබීය. මහණෙනි, එකල්හි බමුණු ගැහැවියෝ සක්විති රජුවෙත එළඹ මෙසේ කීවාහුය. 'දෙවයන් වහන්ස, අපි, ඔබවහන්සේ යම්සේ බොහෝකල් දක්නෙමුද, හෙමිහිට යනු මැනව. 'මහණෙනි, සක්විති රජතෙම රියැදුරු ඇමතීය. 'රියැදුර, යම්සේ බමුණු ගෘහපතියෝ බෝකල් මා දකින්නාහුද, එසේ හෙමිහිට රිය ගමන් කරව,' කියායි. මහණෙනි, සක්විති රජතෙම මේ සතරවැනි ඍද්ධියෙන් යුක්තය. මහණෙනි, සක්විති රජතෙම මේ ඍද්ධි සතරින් යුක්තය. මහණෙනි, තවද සක්විති රජතෙම මේ සත් වැදෑරුම් රත්නයෙන් හා සතර ඍද්ධියෙන් යුක්තවූයේ ඒ හේතුවෙන් සැප සොම්නස විඳින්නේ නම් ඒ කුමකැයි හඟින්නෙහිද?"

**39.** "ස්වාමීන්වහන්ස, එකම රත්නයෙන් යුක්තවූ සක්විති රජතෙම ඒ හේතුවෙන් සැප සොම්නස විඳින්නේය. සප්ත රත්නයෙනුත් චතුර්විධ ඍද්ධියෙනුත් යුක්තවූයේ කියනුම කවරේද?"

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මිටක් පමණ ගලක් ගෙණ භික්ෂූන් අමතා වදාළසේක. "මහණෙනි, මා විසින් ගන්නාලද ස්වල්ප මාත්‍ර මිටක් පමණ යම් මේ ගලක් වේද, යම් මේ හිමවත් පර්වතරාජයෙක් වේද, කවරක් ඉතා මහත්යයි හඟනෙහිද?"

"ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ගන්නා ලද ස්වල්ප මාත්‍ර මිටක් පමණ ගල හිමවත් පර්වතරාජයාහට සමකොට බලනවිට ඉතා ස්වල්පය. ගණනකටද නොපැමිණෙයි. කලභාගයකටවත් නොපැමිණෙයි. සමානත්වයටද නොපැමිණෙයි."

40. "මහණෙනි, එපරිද්දෙන්ම සක්විති රජතෙම සප්තවිධ රත්නයෙන්ද, සතර ඍද්ධියෙන්ද යුක්තවූයේ ඒ හේතුවෙන් යම් සැපවූ සොම්නසක් විඳීද, ඒ සැපය දිව්‍ය සැපයට සමකොට බලනවිට ගණනකටද නොපැමිණෙයි. කලභාගයකටද නොපැමිණෙයි. සමානත්වයටද නොපැමිණෙයි. මහණෙනි, ඒ මේ පණ්ඩිත තෙම ඉදින් කිසියම් කලෙක දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් මිනිසත් බවට පැමිණේද, ක්ෂත්‍රිය මහාසාර කුලයක් හෝ බ්‍රාහ්මණ මහාසාර කුලයක් හෝ ගෘහපති මහාසාර කුලයක් හෝ යන යම් උසස් කුලයෝ වෙත්ද, එබඳු පිරුණු මහත් ධන ඇති, බොහෝ රන් රිදී ඇති, බොහෝ වස්තු ඇති, බොහෝ ධන ධාන්‍ය ඇති කුලයක උපදී. හෙතෙමේද විශිෂ්ට රූ ඇත්තේය, දැකුම්කලු වූයේ, ප්‍රසාදජනක වූයේ, උතුම් වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්තවූයේ වෙයි. අහර, පැන්, වස්ත්‍ර, යාන, මල් ගඳ විලවුන්, සයන, වාසභූමි, පහන් ලබන්නෙක් වෙයි. හෙතෙම කයින් සුචරිත කරයි. වචනයෙන් සුචරිත කෙරෙයි. සිතින් සුචරිත කෙරෙයි. හෙතෙම කයින් සුචරිතකොට, වචනයෙන් සුචරිත කොට, සිතින් සුචරිතකොට, කාය භේදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයට පැමිණෙයි. මහණෙනි, සූදුකාරයෙක් පළමු දිනීමෙන් මහත් වස්තු රාශියක් යම්සේ ලබන්නේද, ඒ සූදුකාරයා යම් හෙයකින් පළමු ජයගැනීමෙන්ම මහත් වස්තු රාශියක් ලබන්නේ නම් ඒ දිනීම ස්වල්ප මාත්‍ර වූවකි. ඉක්බිති ඒ පණ්ඩිතතෙම යම් හෙයකින් කයින් සුචරිතකොට, වචනයෙන් සුචරිතකොට, සිතින් සුචරිතකොට කාය භේදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදී නම්, ඒ ජයගැනීම ඊට වඩා ඉතා මහත්ය. මහණෙනි, මෙය සියල්ලෙන් පිරුණු පණ්ඩිත භූමියයි."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තාහුය.

**නවවැනි බාලපණ්ඩිත සූත්‍රය නිමි (3-9)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 30. දේවදූත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, ජේතවන නම් අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩවාසය කරණසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි, භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට වදාළසේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැයි' භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්සේ දොරවල් සහිත ගෙවල් දෙකක් වෙත්ද, එහි ඇස් ඇති පුරුෂයෙක් මැද සිටියේ ගෙට ඇතුල් වන්නාවූද, ගෙයින් පිට වන්නාවූද, හැසිරෙන්නාවූද, ඔබ මොබ යන්නාවූද, මිනිසුන් දක්නේද, මහණෙනි, එපරිද්දෙන්ම මම චුත වන්නාවූද, උපදින්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද, සුගතිවලට පැමිණියාවූද, දුගතිවලට පැමිණියාවූද, කර්මයවූ පරිදි පැමිණියාවූ සත්වයන් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිවැසින් දකිමි. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූවාහුය. වාක් සුචරිතයෙන් යුක්ත වූවාහුය. මනො සුචරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්ට පරිභව නොකළාහුය. සම්‍යක් දෘෂ්ටි වූවාහුය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදානයෙන් යුක්ත වූවාහුය. ඔව්හු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපන්නාහුය. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූවාහුය. වාක් සුචරිතයෙන් යුක්ත වූවාහුය. මනෝ සුචරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්හට පරිභව නොකරන්නාහුය. සම්‍යක් දෘෂ්ටික වූවාහුය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදානයෙන් යුක්ත වූවාහුය. ඔව්හු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු මිනිසුන් අතර උපන්නාහුය.

3. "ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්හට පරිභව

කරන්නාහුය. මිථ්‍යා දෘෂ්ටි කර්ම සමාදානයෙන් යුක්ත වූවාහුය. මිථ්‍යා දෘෂ්ටි වූවාහුය. ඔව්හු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු තිරිසන් යෝනියෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්හට පරිභව කරන්නාහුය. මිථ්‍යා දෘෂ්ටික වූවාහුය. මිථ්‍යා දෘෂ්ටි කර්ම සමාදානයෙන් යුක්ත වූවාහුය. ඔව්හු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති නිරයෙහි උපන්නාහුය.

4. "මහණෙනි, නිරය පාලයෝ ඒ මොහු නොයෙක් ලෙස අත්වලින් අල්වාගෙණ 'දේවයන් වහන්ස, මේ පුරුෂයා මවට කළයුතු සංග්‍රහ නොකරන්නෙක. පියාට කළයුතු සංග්‍රහ නොකරන්නෙක. උතුමන් නොහඳුනන්නෙක. කුලදෙටුවන් නොපුදන්නෙක," "ළදරුවෙකු නුදුටුවෙහිද?" "හෙතෙම ස්වාමීනි, දුටුවෙමියි' කියයි.

'මහණෙනි, යම රජතෙම ඔහුට මෙසේ කියන්නේය. එම්බා පුරුෂය, නුවණැත්තාවූ මහලුවූ ඒ නුඹට මේ අදහස ඇති නොවීද? මමත් ජාතිය ස්වභාවකොට ඇත්තේ වෙමි. ජාතිය නොඉක්ම වූවෙමි. එබැවින් කයින්ද වචනයෙන්ද සිතින් කුසල් කරමි. යන මේ අදහස ඇති නොවීද?' හෙතෙම 'ස්වාමීනි, කුසල් කරන්නට නොහැකිවීමි. වහන්ස, පමාවූයෙමියි' කියයි. ඔහුට යම රජතෙම 'එම්බා පුරුෂය, පමාවූ බැවින් කයින් වචනයෙන් සිතින් කුසල් නොකෙළෙහිද? එම්බා පුරුෂය, පමාවූවහුට යම්සේ කෙරේද? තට එසේ කරන්නෙමි. තාගේ ඒ මේ පාප කර්මය මව විසින් නොකරණ ලද්දේය. පියා විසින් නොකරණ ලද්දේය. සහෝදරයා විසින් නොකරණ ලද්දේය. නැඟනිය විසින් නොකරණ ලද්දේය. යහළු මිත්‍රයන් විසින් නොකරණ ලද්දේය. සහලේ නෑයන් විසින් නොකරණ ලද්දේය. මහණ බමුණන් විසින් නොකරණ ලද්දේය. දෙවියන් විසින් නොකරණ ලද්දේය. තා විසින්ම මේ පාප කර්මය කරණ ලද්දේය. මේ පාප කර්මයට විපාකය තෝම විඳින් නෙහියයි කියන්නේය."

5. "මහණෙනි, යමරජතෙම මේ පළමුවෙනි දේවදූතයා දක්වා කරුණු සහිතව පිළිගන්වා තර්ජනය කොට දෙවැනි දේවදූතයා දක්වන්නේය. පිළිගන්වන්නේය. කියන්නේය. 'එම්බා පුරුෂය, මනුෂ්‍යයන් අතරෙහි පහළවූ දෙවෙනි දේව දූතයා තෝ නුදුටුවෙහිද?" හෙතෙම 'ස්වාමීනි, නුදුටිමියි' කියන්නේය. ඔහුට යමරජතෙම 'එම්බා පුරුෂය, තෝ මනුෂ්‍යයන් අතරෙහි උත්පත්තියෙන් අසූ වයස් ගියාවූ, හෝ අනූ වයස් ගියාවූ හෝ අවුරුදු සියයක් ඉක්ම ගියාවූ හෝ ජරාජීර්ණවූ ගොනැස්සක් සේ වක්වූ, මැදින් බිඳුනු සැරයටිය පිහිට කොට ඇති, වෙවුලමින් හැසිරෙන්නාවූ, ජරාවෙන් ආතුරවූ ඉක්මගිය තරුණකම් ඇති, වැටුණු දත් ඇති, පැසුණු හිසකෙහෙ ඇති, ඉගිලීගිය හිසකෙහෙ ඇති, බොහෝසේ ඉගිලීගිය හිසකෙහෙ ඇති, රැළිනැගුණ සම ඇති, තල කැලලින් යුත් සිරුරැති, ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ නුදුටුවෙහිද?' හෙතෙම, 'ස්වාමීනි, දුටුවෙමියි, කියයි.'

6. "මහණෙනි, යම රජ තෙම ඔහුට මෙසේ කියයි. 'එම්බා පුරුෂය, නුවණැති වැඩි වයසට පැමිණි ඒ තොපට මමත් ජරාව ස්වභාවකොට ඇත්තේ වෙමි. ජරාව නොඉක්මවූයේ වෙමි. එබැවින් මම කයින්, වචනයෙන්, සිතින් කුසල් කරන්නෙම් නම් යහපති යන අදහස ඇති නොවීද?' හෙතෙම ස්වාමීනි, 'කුසල් කරන්නට නොහැකිවීමි. ස්වාමීනි, පමාවීමියි' කියන්නේය. මහණෙනි, යමරජ තෙම ඔහුට මෙසේ කියයි. 'එම්බා පුරුෂය තෝ පමාවූ බැවින් කයින්, වචනයෙන්, සිතින් කුසල් නොකෙළෙහි නම් එම්බා පුරුෂය, යම්සේ පමාවූවහුට යම්සේද තට එසේ කරන්නාහුය. තාගේ ඒ මේ පාපකර්මය මව විසින් නොකරණලදී. පියා විසින් නොකරණලදී. සහෝදරයා විසින් නොකරණලදී. නැගණිය විසින් නොකරණ ලදී. යහළු මිත්‍රයන් විසින් නොකරණ ලදී. සහ ලේ නෑයන් විසින් නොකරණලදී. මහණ බමුණන් විසින් නොකරණලදී. දෙවියන් විසින් නොකරණලදී. මේ පාප කර්මය තා විසින්ම කරණ ලද්දේය. ඒ අකුසලයාගේ විපාකය තෝම විඳිනෙහිය.'

7. "මහණෙනි, යම රජ තෙම මේ දෙවෙනි දේවදූතයා දක්වා පිළිගන්වා කියා තුන්වන දේවදූතයා දක්වන්නේය.

පිළිගන්වන්නේය. කියන්නේය. 'එම්බා පුරුෂය, නුඹ මිනිසුන් අතරෙහි පහළවූ තුන්වන දෙවදූතයා නුදුටුවෙහිද?' හෙතෙම 'ස්වාමීනි, නුදුටිමියි' කියායි. මහණෙනි, මොහුට යම රජ තෙම එම්බා පුරුෂය, තෝ මනුෂ්‍යයන් අතරෙහි රෝග ඇත්තාවූ, දුකට පත්වූ, දැඩි ගිලන් ඇත්තාවූ, ස්වකීය මළ මුත්‍ර මතුයෙහි සයනය කරණ අනුන් විසින් නැගිටුවනු ලබන්නාවූ, අනුන් විසින් හොවනු ලබන්නාවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ නුදුටුවෙහිදැයි' අසන්නේය. 'ස්වාමීනි, දුටුවෙමියි' කියයි. මහණෙනි, ඔහුට යම රජතෙම 'එම්බා පුරුෂය, නුවණැත්තාවූ වැඩි වයසට පැමිණියාවූ ඒ නුඹට මමත් ලෙඩවීම ස්වභාව කොට ඇත්තේ වෙමි, ලෙඩවීම නොඉක්මවූයේ වෙමි. එබැවින් මම කයින්, වචනයෙන්, සිතින් කුසලයක් කරමි කියා අදහස් නොවූයෙහිදැයි' අසන්නේය. හෙතෙම 'ස්වාමීනි, කුසල් කරන්නට නොහැකිවීමි. ස්වාමීනි, පමාවීමියි' කියයි. මහණෙනි, යම රජ තෙම ඔහුට එම්බා පුරුෂය, පමාවූ බැවින් කයින්, වචනයෙන් සිතින් කුසලයක් නොකෙළෙහි නම් එම්බා පුරුෂය, පමා වූවහුට යම්සේ කෙරෙත්ද, එසේ තට කරන්නාහුය. තගේ ඒ මේ පාපකර්මය මව විසින් කරණ ලද්දක් නොවෙයි. පියා විසින් කරණ ලද්දක් නොවෙයි සහෝදරයා විසින් කරණ ලද්දක් නොවෙයි, නැගණිය විසින් කරණ ලද්දක් නොවෙයි. යහළු මිත්‍රයන් විසින් කරණ ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරණ ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරණ ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරණ ලද්දක් නොවෙයි. තා විසින් ඒ පාප කර්මය කරණ ලදී. ඒ පාප කර්මයාගේ විපාකය තෝම විඳිනෙහිය.'

8. "මහණෙනි, යම රජ ඔහුට මේ තුන්වන දේවදූතයා දක්වා පිළිගන්වා කරුණු කියා සිව්වන දේවදූතයා දක්වයි. පිළිගන්වයි. කරුණු කියයි. 'එම්බා පුරුෂය, නුඹ මිනිසුන් අතරෙහි පහළවූ සිව්වන දේවදූතයා නුදුටුවෙහිද?' හෙතෙම ස්වාමීනි, නොදුටිමි' යි කියයි. 'මහණෙනි, යම රජ තෙම ඔහුට 'එම්බා පුරුෂය, මිනිසුන් අතරෙහි අල්වාගෙණ රජුන් විසින් නොයෙක්

දඬුවම් කරවන්නාවූ අපරාධ කළ සොරුන් නුදුටුවෙහිද? එනම්: කසවලින් තැලුම් කන්නවුන්, වේවැල්වලින් තැලුම් කන්නවුන්, මුගුරුවලින් තැලුම් කන්නවුන්, අත් කප්පවන්නවුන්, පා කප්පවන්නවුන්, අත් පා කප්පවන්නවුන්, කණ කප්පවන්නවුන්, නාසය කප්පවන්නවුන්, කණ් නාසා කප්පවන්නවුන්, බිලංගථාලික නම් කර්මය කරනු ලබන්නවුන්, සඛ්ඛමුණ්ඩික නම් කර්මය කරනු ලබන්නවුන්, රාහුමුඛ නම් කර්මය කරනු ලබන්නවුන්, ජෝතිමාලික නම් කර්මය කරනු ලබන්නවුන්, හත්ථපජ්ජොතික නම් කර්මය කරනු ලබන්නවුන්, එරකවත්තික නම් කර්මය කරනු ලබන්නවුන්, චීරකවාසික නම් කර්මය කරනු ලබන්නවුන්, ඒණෙයක නම් කර්මය කරනු ලබන්නවුන්, බලිසමංසික නම් කර්මය කරනු ලබන්නවුන්, කහාපණක නම් කර්මය කරනු ලබන්නවුන්, ඛාරාපතච්ඡික නම් කර්මය කරනු ලබන්නවුන්, පලිඝපරිවත්තික නම් කර්මය කරනු ලබන්නවුන්, පලාලපිට්ඨික නම් කර්මය කරනු ලබන්නවුන්, උණු කරණලද තෙල් ඉසිනු ලබන්නවුන්, සුනඛයන් ලවා කනු ලබන්නවුන්, ජීවත්ව සිටියදීම උල තබනු ලබන්නවුන්, කඩුවෙන් හිස කපනු ලබන්නවුන් දුටුවෙහිදැ' යි අසන්නේය. හෙතෙම 'ස්වාමීනි, දුටුවෙමි' යි කියයි.

**9.** "මහණෙනි, යම රජ තෙම ඔහුට 'එම්බා පුරුෂය, නුවණැති වැඩි වයසට පැමිණි නුඹට යම් කෙනෙක් පාපකර්ම කෙරෙත් නම් ඒ සත්වයෝ මේ ආත්මභාවයෙහිම මෙබඳු කම් කටුලු කරවනු ලබත්. පරලොවදී කියනුම කිම? එබැවින් මම කයින්, වචනයෙන්, සිතින් යහපතක් කරමියි අදහස් නොවූයෙහිද, හෙතෙම 'ස්වාමීනි, යහපතක් කරන්නට නොහැකිවීමි. ස්වාමීනි, පමාවීමි'යි කියයි. මහණෙනි, යම රජතෙම ඔහුට 'පින්වත් පුරුෂය, තෝ පමාවූ බැවින් කයින්, වචනයෙන්, සිතින් කුසලයක් නොකෙළෙහි නම්, එම්බා පුරුෂය, පමා වූවහුට යම්සේ කෙරෙත්ද, එසේ තට වධ කරන්නාහුය. තගේ ඒ මේ පාප කර්මය මව විසින් කරන ලද්දක් නොවෙයි. පියා විසින් කරණ ලද්දක් නොවෙයි. සහෝදරයා විසින් කරණ ලද්දක් නොවෙයි. නැගණිය විසින් කරණ ලද්දක් නොවෙයි.

යහළු මිත්‍රයන් විසින් කරණ ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරණ ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරණ ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරණ ලද්දක් නොවෙයි. තා විසින්ම ඒ පාප කර්මය කරණ ලද්දේය. ඒ පාප කර්මයාගේ විපාකය තෝම විඳිනෙහිය.

10. "මහණෙනි, යම රජතෙම, මේ සතරවැනි දේවදූතයා දක්වා පිළිගන්වා කරුණු කියාදී පස්වැනි දේවදූතයා දක්වන්නේය. පිළිගන්වන්නේය. කරුණු කියා දෙන්නේය. 'එම්බා පුරුෂය, නුඹ මනුෂ්‍යයන් කෙරෙහි පහළවූ පස්වැනි දෙවදූතයා නුදුටුවෙහිද?' හෙතෙම 'ස්වාමීනි, නුදුටිමියි' කියයි. මහණෙනි, යම රජතෙම ඔහුට 'එම්බා පුරුෂයා, නුඹ මනුෂ්‍යයන් අතරෙහි මැරී එක දවසක් ගියාවූ හෝ මැරී දෙදවසක් ගියාවූ හෝ මැරී තුන් දවසක් ගියාවූ හෝ ඉදිමී ගියාවූ හෝ නිල්වූ හෝ ඕජාව වැහෙන්නාවූ හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයකු නුදුටුවෙහිදැ'යි අසන්නේය. 'ස්වාමීනි, දුටිමි යි කියයි. 'එම්බල පුරුෂය, නුවණැති වැඩිවයසට පැමිණි තට මමද මරණය ස්වභාවකොට ඇත්තෙමි. මරණය නොඉක්ම වූයෙමි. මම කයින්, වචනයෙන්, සිතින් කුසලක් කරන්නෙම් නම් යහපතැයි අදහස් නොවූයෙහිදැ' යි අසන්නේය. හෙතෙම 'ස්වාමීනි, නොහැකි විය. ප්‍රමාදයට පැමිණියෙමි' යි කියයි. 'එම්බා පුරුෂය, ප්‍රමාදය ඇතිවූ බැවින් නුඹ කයින්, වචනයෙන් සිතින් ඒකාන්තයෙන් කුසලයක් නොකෙළෙහි නම් 'එම්බා පුරුෂය, පමා වූවහුට යම්සේ කරත් නම් තට එසේ කරන්නාහුය ඒ මේ පාප කර්මය තගේ මව විසින්ද නොකරණ ලදී. පියා විසින්ද නොකරණලදී. සොහොයුරු විසින්ද නොකරණලදී. නැගණිය විසින්ද නොකරණලදී. යහළු මිත්‍රයන් විසින්ද නොකරණ ලදී. සහලේ නෑයන් විසින්ද නොකරණලදී. මහණ බමුණන් විසින්ද නොකරණ ලදී. දෙවියන් විසින්ද නොකරණලදී. මේ පාප කර්මය තා විසින්ම කරණලදී. ඒ මේ පාප කර්මයාගේ විපාකය තෝ විඳින්නෙහිය. මහණෙනි, යම රජ තෙම මේ පස්වෙනි දෙවදූතයා දක්වා පිළිගන්වා කරුණු කියාදී නිශ්ශබ්දවෙයි.

11. "මහණෙනි, නිරය පාලයෝ ඔහුට පඤ්චවිධ බන්ධන නම් වධයක් කරත්. රත්වූ යකඩ හුලක් අතෙහි ගසත්. රත්වූ යකඩ හුලක් දෙවෙනි අතෙහි ගසත්. රත්වූ යකඩ හුලක් පයෙහි ගසත්. රත්වූ යකඩ හුලක් දෙවෙනි පයෙහි ගසත්. රත්වූ යකඩ හුලක් පපුව මැද ගසත්. හෙතෙම එහි තියුණුවූ කටුකවූ දුක් වේදනාවන් විඳී. යම්තාක් ඒ පාප කර්මය නොගෙවේද, ඒතාක් නොමැරෙයි. මහණෙනි, නිරය පාලයෝ ඔහු ගිනිගත් යකඩ පොළොවෙහි නිදිකරවා කෙටේරිවලින් සසිත් හෙතෙම එහි දුක්වූ තියුණුවූ කටුකවූ දුක් වේදනාවන් විඳී. යම්තාක් කල් ඒ පාප කර්මය කෙළවර නොවේද, ඒතාක් කල් කලුරිය නොකෙරෙයි. මහණෙනි, නිරය පාලයෝ ඔහු උඩුකුරුකොට හිස යටිකුරුකොට තබා වෑවලින් සසිත්. හෙතෙම එහි දුක්වූ තියුණුවූ කටුකවූ දුක් වේදනාවන් විඳී. යම්තාක් කල් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒතාක් කල් කලුරිය නොකෙරෙයි. මහණෙනි, ඔහු නිරයපාලයෝ රථයක බැඳ ගිනිගෙන ඇවිලෙන්නාවූ දිළිසෙන්නාවූ ගිනිදැල් සහිත යකඩ පොළොවෙහි ඉදිරියට ගමන් කරවත්. පස්සටද ගමන් කරවත්. හෙතෙම එහි දුක්වූ, තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳී. යම්තාක් කල් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒතාක් කල් කලුරිය නොකෙරෙයි. මහණෙනි, නිරයපාලයෝ ඔහු ගිනිගෙන ඇවිලෙන දිළිසෙන ගිනිදැල් සහිත මහත්වූ අඟුරු පර්වතයට ඇන ඇන නැංවීමද කරත්. බැස්සීමද කරත්. හෙතෙම එහි දුක්වූ තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳී. යම්තාක් කල් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒතාක් කල් කලුරිය නොකෙරෙයි. මහණෙනි, නිරයපාලයෝ ඔහු පා උඩුකුරු කොට හිස යටිකුරු කොටගෙන ගිනිගෙන ඇවිලෙන දිළිසෙන ගිනිදැල් සහිත රත්වූ ලෝදිය සැලියෙක දමත්. හෙතෙම එහි පෙණ නගිමින් පැසෙන්නේ වරක උඩට එයි. වරක යටට යයි. වරක සරසට යයි. හෙතෙම දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනාවන් විඳී. යම්තාක් ඒ පාප කර්මය නොගෙවේද, ඒතාක් නොමැරෙන්නේය.

12. "මහණෙනි, ඔහු නිරය පාලයෝ මහා නරකයෙහි බහත්. මහණෙනි, ඒ මහා නරකය වනාහි

1. කොන් සතරක් ඇත්තේය. දොරටු සතරක් ඇත්තේය. කොටස් වශයෙන් බෙදන ලද්දේය. කොටස් වශයෙන් ප්‍රමාණ කරණ ලද්දේය. යකඩ පවුරකින් වට කරණ ලද්දේය. යකඩ පියනකින් වසන ලද්දේය."

2. ඒ මහා නිරයෙහි බිම යකඩයෙන්ම කරණලදී. දැල්වෙන ගින්නෙන් යුක්තය. හැමකල්හි හාත්පස යොදුන් සියයක් ගින්න පැතිර සිටී.

"මහණෙනි, ඒ මහා නිරයෙහි නැගෙනහිර බිත්තියෙන් ගිනිදැල් නගී. බස්නාහිර බිත්තියෙහි හැපෙයි. බස්නාහිර බිත්තියෙන් ගිනිදැල් නැගී නැගෙණහිර බිත්තියෙහි හැපෙයි. උතුරුදිග බිත්තියෙන් ගිනිදැල් නැගී දකුණු භිත්තියෙහි හැපෙයි. දකුණු භිත්තියෙන් ගිනිදැල් නැගී උතුරු භිත්තියෙහි හැපෙයි. යටින් ගිනිදැල් නැගී මත්තෙහි හැපෙයි. උඩින් ගිනිදැල් නැගී යට හැපෙයි. හෙතෙම එහි තියුණුවූ කටුකවූ දුක් වේදනාවන් විඳියි. යම් තාක් ඒ පාප කර්මය නොගෙවේද, ඒතාක් නොමැරෙන්නේය."

13. "මහණෙනි, දීර්ඝ කාලයක් ගතවීමෙන් යම්කිසි කලෙක ඒ මහා නිරයෙහි නැගෙනහිර දොරටුව විවෘතවේද, එබඳු කාලයක් වන්නේය එකල්හි හෙතෙම ඒ දොර දිශාවට ශීඝ්‍ර වේගයෙන් දුවයි. ශීඝ්‍ර වේගයෙන් දුවන්නාවූ ඔහුගේ සිවියද දවයි. සමද දවයි. මස්ද දවයි. නහරද දවයි. ඇටද විශෙෂයෙන් දුම් දමත්. නැගූ පියවර එසේම වෙයි. මහණෙනි, යම් හෙයකින් හෙතෙම නොයෙක් අවුරුදු දහසකින් ඒ සමීපයට පැමිණේද එකල්හි ඒ දොර වැසෙයි. හෙතෙම එහි තියුණුවූ කටුකවූ දුක් වේදනාවන් විඳී. යම්තාක් කල් ඒ පාප කර්මය කෙළවර වේද, ඒතාක් කල් නොමැරෙන්නේය.

14. "මහණෙනි, දීර්ඝ කාලයක් ගතවීමෙන් කිසිකලෙක් ඒ මහා නිරයාගේ බස්නාහිර දොරටුව විවෘතවේද, ඒ කාලය

ඇත්තේමය. හෙතෙම ඒ දොර දිසාවට ශීඝ්‍රවේගයෙන් දුවයි. ශීඝ්‍රවේගයෙන් දුවන්නාවූ, ඔහුගේ සිවියද දවයි සමද දවයි. මස්ද දවයි. නහරද දවයි. ඇටද වෙසෙසින් දවයි. නැඟූ පියවර එසේම වෙයි. මහණෙනි, යම්හෙයකින් හෙතෙම අනේක වර්ෂ සහශ්‍රයෙන් ගොස් සම්ප්‍රාප්ත වේද, එකල්හි ඒ දොර වැසෙයි. හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳීද, යම්තාක්කල් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒතාක්කල් කාලක්‍රියා නොකෙරෙයි.”

15. “උතුරු දොරටුව විවෘතවේද, ඒ කාලය ඇත්තේමය. හෙතෙම ඒ දොර දිසාවට ශීඝ්‍රවේගයෙන් දුවයි. ශීඝ්‍රවේගයෙන් දුවන්නාවූ, ඔහුගේ සිවියද දවයි. සමද දවයි. මස්ද දවයි. නහරද දවයි. ඇටද වෙසෙසින් දවයි. නැඟූ පියවර එසේම වෙයි. මහණෙනි, යම්හෙයකින් හෙතෙම අනේක වර්ෂ සහශ්‍රයෙන් ගොස් සම්ප්‍රාප්ත වේද, එකල්හි ඒ දොර වැසෙයි. හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳීද, යම්තාක්කල් ඒ පාපකර්මය කෙළවර නොවේද, ඒතාක් කල් කාලක්‍රියා නොකෙරෙයි.

16. “දකුණු දොරටුව විවෘතවේද, හෙතෙම එහි ශීඝ්‍රවේගයෙන් දුවයි ශීඝ්‍රවේගයෙන් දුවන්නාවූ ඔහුගේ සිවියද දවයි. සමද දවයි. මස්ද දවයි. නහරද දවයි. ඇටද විශෙෂයෙන් දුම්දමත්. නැඟූපියවර එසේම වෙයි. මහණෙනි, යම්හෙයකින් නොයෙක් අවුරුදු දහසින් ගොස් ඒ සමීපයට පැමිණෙයිද, එකල්හි ඒ දොර වැසෙයි. හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳී. යම්තාක් ඒ පාපකර්මය නොගෙවේද, ඒතාක්කල් නොමැරෙන්නේය.

17. “මහණෙනි, දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් කිසියම් කලෙක ඒ මහා නිරයේ නැගෙනහිර දොර විවෘත වෙයිද, හෙතෙම එහි ශීඝ්‍රවේගයෙන් දුවයි. ශීඝ්‍රවේගයෙන් දුවන ඔහුගේ සිවියද දවයි. සමද දවයි. මස්ද දවයි. නහරද දවයි. ඇටද විශෙෂයෙන් දුම් දමත්. නැඟූ පියවරද එසේම වෙයි. හෙතෙම එම දොරටුවෙන් නික්මෙයි.

18. "මහණෙනි, ඒ මහා නිරයට අනතුරුව මහත්වූ ගූථ නිරය එක්වම පිහිටියේය. හෙතෙම එහි වැටෙයි. මහණෙනි, ඒ ගූථ නිරයෙහි වනාහි ඉදිකටු තුඩ සමාන මුව ඇති පණුවෝ සිවිය සිඳිත්. සිවිය සිඳ සම සිඳිත්. සම සිඳ මස් සිඳිත්. මස් සිඳ නහර සිඳිත්. නහර සිඳ ඇට සිඳිත්. ඇට සිඳ ඇට මිදුලු කත්. හෙතෙම එහි තියුණුවූ, කටුක දුක් වේදනාවන් විඳී. ඒ පාපකර්මය යම්තාක්ද ඒතාක්කල් නොමැරෙන්නේය.

19. "මහණෙනි, ඒ ගූථනරකයට අනතුරුව මහත්වූ උණු අළු නිරය එක්වම පිහිටියේය. හෙතෙම එහි වැටෙයි. හෙතෙම එහිදී තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳී. ඒ පාපකර්මය යම්තාක් නොගෙවී පවතීද, ඒතාක් නොමැරෙන්නේය."

20. "මහණෙනි, ඒ උණු අළු නිරයට අනතුරුව යොදුන් උස නැගුණු අඟල් දහසයක් දිග යකඩ කටු ඇති, ගිනිගෙන ඇවිලෙන්නාවූ, අතිශයින් දිළිසෙන්නාවූ, ගිනිදැල් සහිතවූ, මහත්වූ කටුඉඹුල් වනය ලඟම පිහිටියේය. ඔහු එහි උඩටද නංවත්. පහතටද බස්වත් හෙතෙම එහි තියුණුවූ, කටුකවූ දුක් වේදනාවන් විඳී. යම්තාක්කල් ඒ පාපකර්මය නොගෙවී පවතීද, ඒතාක් නොමැරෙන්නේය.

21. "මහණෙනි, කටුඉඹුල් වනයට අනතුරුව මහත්වූ අසිපත්‍ර නම් නිරය එක්වම පිහිටියේය. හෙතෙම එහි වැටෙයි. ඒ නිරයෙහි වාතයෙන් වැටෙන කඩුපත් අතද කපත්. පාදයද කපත්. අත් පා දෙකමද කපත්. කණද කපත්. නාසයද කපත්. කන් නාසා දෙකමද කපත්. හෙතෙම එහි දියුණුවූ කටුකවූ, දුක් වේදනාවන් විඳී ඒ පාපකර්මය යම්තාක්කල් නොගෙවී පවතී නම් ඒතාක්කල් නොමැරෙන්නේය.

22. "මහණෙනි, ඒ අසිපත් නිරයට අනතුරුව මහත්වූ ක්ෂාර ජලයෙන් යුත් වෙතරණී නම් නරකය පිහිටියේය. හෙතෙම එහි වැටෙයි. හෙතෙම එහි යටිගං බලායන දියපහරටද ගසාගෙනයයි. උඩුගං බලායන දියපහරටද ගසාගෙනයයි. උඩුගං බලායන දියපහරට හා යටිගං බලායන දියපහරටද ගසාගෙන යයි.

හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳී. ඒ පාපකර්මය යම්තාක් නොගෙවේද, ඒතාක් කල් නොමැරෙන්නේය.

23. "මහණෙනි, නිරයපාලයෝ ඔහු බිලිකටුවෙන් අමුනා ගොඩට ගෙන පොළොවෙහි දමා 'එම්බා පුරුෂය, කුමක් කැමැත්තෙහිදැ'යි අසන්නාහ. හෙතෙම 'ස්වාමීනි, බඩගිනි ඇත්තෙමැ'යි කියන්නේය. මහණෙනි, නිරයපාලයෝ ඒ මේ නිරිසතාගේ ගිනිගෙන දිලියෙන්නාවූ අඬුවෙන් කට ඇර ගිනිගෙන දිලියෙන්නාවූ රත්වූ ලොහො ගුළියක් කටෙහි දමත් ඔහුගේ තොලද දවයි, කටද දවයි, උගුරද දවයි, ළයද දවයි, බඩවැලද අතුනු බහන්ද දවාගෙන යට භාගයෙන් නික්මෙයි. හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳී. ඒ පාපකර්මය යම්තාක් නොගෙවේද, ඒතාක් කල් නොමැරෙන්නේය.

24. "මහණෙනි, නිරයපාලයෝ ඔහුගෙන් 'එම්බා පුරුෂය, කුමක් කැමැත්තෙහිදැ"යි විමසන්නාහුය. ස්වාමීනි, පිපාස ඇත්තෙමි'යි කියන්නේය. මහණෙනි, නිරයපාලයෝ ඔහුගේ කට ගිනිගෙන දිලියෙන්නාවූ, අතිශයින් දිළිසෙන්නාවූ, ගිනි දැල් සහිතවූ, රත්වූ යකඩ අඬුවෙන් අරවා ගිනිගෙන ඇවිලෙන්නාවූ, අතිශයින් දිළිසෙන්නාවූ, ගිනිදැල් සහිතවූ, ගිනි ගෙන දිළිසෙන්නාවූ තඹපාට ලෝදිය කටේ වත්කරත්. එය ඔහුගේ තොල්ද දවයි. කටද දවයි. උගුරද දවයි. ළයද දවයි. බඩවැල්ද අතුනුබහන්ද දවාගෙන යට භාගයෙන් නික්මෙයි. හෙතෙම එහි තියුණුවූ, කටුකවූ, දුක් වේදනාවන් විඳී. ඒ පාපකර්මය යම්තාක් නොගෙවේද, ඒතාක් නො මැරෙන්නේය.

"මහණෙනි, නිරයපාලයෝ නැවතත් ඔහු මහා නිරයෙහි දමත්.

25. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. යමරජුට මෙබඳු සිතක් විය. පින්වත්නි, ලෝකයෙහි යම් කෙනෙක් පව්කම් කෙරෙත්ද, ඔව්හු මෙබඳු නානාප්‍රකාර කම්කටුලු කරනු ලබත්.

'මම මනුෂ්‍යාත්මයක් ලබන්නෙම් නම් අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ සර්වඥතෙම ලෝකයෙහි උපදින්නේ නම් මම ඒ භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රය කරන්නෙම් නම් ඒ භාග්‍යවතුන් වහන්සේ මට ධර්ම දෙශනා කරන්නේ නම් මම ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය දැනගන්නෙම් නම් යහපති' කියායි.

"මහණෙනි, මම ඒ කාරණය අන් ශ්‍රමණයකුගෙන් හෝ බමුණකුගෙන් හෝ අසා නොකියමි. වැලිදු කෙසේද යම් පමණ අටමහ නරකයෝ වෙත්ද, ඒ සියල්ල තමන් විසින්ම දැනගන්නා ලද්දේය, තමන් විසින්ම දක්නා ලද්දේය, තමන් විසින්ම ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය එයම මම කියමි."

**26.** භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව වදාළ සේක. සුගතයන් වහන්සේ මේ දේශනාව වදාරා නැවත ශාස්තෲන් වහන්සේ මේ ගාථා දේශනාව වදාළ සේක.

1 "දේවදූතයන් විසින් චෝදනා කරන ලද්දාවූ, යම් මනුෂ්‍යයෝ පමා වෙත්ද, හීනකාය සංඛ්‍යාත අපායට පැමිණියාවූ ඒ මිනිස්සු බොහෝ කාලයක් මුළුල්ලේ සෝක කරන්නාහුය."

2. "මේ ලෝකයෙහි ශාන්තවූ යම් සත්පුරුෂ කෙනෙක් දේවදූතයන් විසින් චෝදනා කරන ලද්දාහුද, ඔව්හු ආර්‍ය්‍ය ධර්මයෙහි කිසි කලෙකත් ප්‍රමාද නොවන්නාහුය."

3. "ඔවුහු ජාති මරණ දෙක හටගන්නාවූ මේ උපාදාන ස්කන්ධයෙහි බය දැක, ජාති මරණ දෙක කෙළවර කරන්නාවූ නිවණ නිමිතිකොට උපාදාන රහිතව මිදෙත්."

4. "නිර්භය ස්ථානයට පැමිණියාවූ, සුවපත්වූ, මේ ආත්මභාවයෙහිම ඒ සත්වයෝ සියලු භය දුරුකොට සියලු දුක් ඉක්මවන්නාහුය."

**දහවන දේවදූත සූත්‍රය නිමි. (3-10)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 31. භද්දෙකරත්ත සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, ජේතවන නම්වූ අනේපිඩුමහ සිටුහුගේ ආරාමයෙහි වැඩවාසය කරණසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි,' කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු පින්වතුන් වහන්සැයි' භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, තොපට විදර්ශනා භාවනාවෙහි යෙදී වාසය කරණ බැවින් යහපත්වූ එක් රැයක් පිළිබඳවූ උදෙසීමයයි කියනලද මාතෘකාවද විස්තර වශයෙන් බෙදීමද, දෙශනා කරන්නෙමි. එය අසව්, මොනවට මෙනෙහි කරව්, කියන්නෙමියි" වදාළේය. "එසේය ස්වාමීන් වහන්සැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේහට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන් ගෙන් නොයන්නේය. අනාගත (නූපන්) පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යමක් ඉක්ම ගියේද එයා ප්‍රහීණ වූයේ (නැතිවූයේවේ.) අනාගත පඤ්චස්කන්ධය නොපැමිණියේ (නූපන්නේ) වෙයි.

(2) "වර්තමානවූ (ඉපද පවත්නාවූ) යම් පඤ්චස්කන්ධයක් වේද, ඒ පඤ්චස්කන්ධය ඒ ඒ උපන් තන්හිම අනිත්‍යාදී වශයෙන් බලන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිත නොකොට පණ්ඩිත භික්ෂුතෙමේ වඩන්නේය.

(3) "අදම කෙලෙස් තවන වීර්‍ය්‍යය කළ යුත්තේය. හෙට මරණය සිදුවන්නේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති ඒ මාරයා සමග ගිවිසුම්කොට නැවතීමක් නොවන්නේමය.

(4) "මෙසේ වාසය කරන්නාවූ කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ රෑ දාවල් දෙක්හි අනලස්වූ මෙසේ පිළිපන් පුද්ගලයා

ඒකාන්තයෙන් යහපත්වූ එක් රැයක් ඇති භික්ෂුව යයි ශාන්තවූ බුද්ධ මුනිතෙමේ වදාළේය.

3. "මහණෙනි, කෙසේ වනාහි ඉකුත්ව ගිය ස්කන්ධයන් අනුව යන්නේද? අතීත කාලයෙහි මම මෙබඳු රූප ඇත්තෙක් වූයෙම් යයි එහි තෘෂ්ණාව අනුව පවත්වන්නේය. අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වූයෙම්යයි එහි තෘෂ්ණාව පවත්වන්නේය. අතීතකාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වූයෙම්යයි එහි තෘෂ්ණාව පවත්වන්නේය. අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වූයෙම්යයි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. අතීත කාලයෙහි මෙබඳු විඥාණ ඇත්තෙක් වූයෙම්යයි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. මහණෙනි, මෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව යන්නේය.

4. "මහණෙනි, කෙසේ නම් ඉකුත්වූ ස්කන්ධයක් අනුව නොයන්නේද? අතීත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වූයෙම්යයි එහි තෘෂ්ණාව නොපවත්නේය. අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වූයෙම්යයි, එහි තෘෂ්ණාව නොපවත්නේය. අතීත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වූයෙම්යයි, එහි තෘෂ්ණාව නොපවත්නේය. අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වූයෙම්යයි එහි තෘෂ්ණාව නොපවත්නේය. අතීත කාලයෙහි මෙබඳු විඥාණ ඇත්තෙක් වූයෙම්යයි එහි තෘෂ්ණාව නොපවත්නේය. මහණෙනි, මෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව නොයන්නේය.

5. "මහණෙනි, කෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කෙරේද? අනාගත කාලයෙහිදී මෙබඳු රූප ඇත්තෙක් වන්නෙම් යයි එහි තෘෂ්ණාව පවත් වන්නේය. අනාගත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙම්යයි එහි තෘෂ්ණාව පවත් වන්නේය. අනාගත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙම්යයි එහි තෘෂ්ණාව පවත් වන්නේය. අනාගත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙම්යයි එහි තෘෂ්ණාව පවත්වන්නේය. අනාගත කාලයෙහි මෙබඳු විඥාන

ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව පවත් වන්නේය. මහණෙනි, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය. මහණෙනි, කෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකෙරේද, අනාගත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව නොපවත්නේය. අනාගත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව නොපවත්නේය. අනාගත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගත කාලයෙහි මෙබඳු විඤ්ඤාණ ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. මහණෙනි, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන්හි ප්‍රාර්ථනා නොකරන්නේය.

**6.** "මහණෙනි, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන්හි විදර්ශනාවගේ අභාවයෙන් තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අදිනු ලැබේද? මහණෙනි, මේ ලොකයෙහි ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ නොවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුණාවූ, බුද්ධාදී සත්පුරුෂයන් නොදක්නාවූ, එම සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ, ඇසූ පිරූ තැන් නැති පෘථග්ජන තෙමේ රූප ස්කන්ධය තමා වශයෙන් දකින්නේය. තමන් රූප ස්කන්ධය ඇත්තෙකැයි කියා හෝ දකින්නේය. රූප ස්කන්ධය තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකින්නේය. රූප ස්කන්ධයෙහි තමා ඇත්තේයයි කියා හෝ දකින්නේය. වේදනා ස්කන්ධය තමායයි දකින්නේය. තමා වේදනා ස්කන්ධය ඇත්තෙක කියා හෝ දකින්නේය. වේදනා ස්කන්ධය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ දකින්නේය. වේදනා ස්කන්ධයෙහි තමා ඇත්තේය කියා හෝ දකින්නේය. සංඥා ස්කන්ධය තමා වශයෙන් දකින්නේය. තමා සංඥා ස්කන්ධය ඇත්තෙක කියා හෝ දකින්නේය. සංඥා ස්කන්ධය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ දකින්නේය. සංඥා ස්කන්ධයෙහි තමා ඇත්තේය කියා හෝ දකින්නේය. සංස්කාර ස්කන්ධය තමා වශයෙන්

දකින්නේය. තමා සංස්කාර ස්කන්ධය ඇත්තෙකැයි කියා හෝ දකින්නේය. සංස්කාර ස්කන්ධය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ දකින්නේය සංස්කාර ස්කන්ධයෙහි තමා ඇත්තේය කියා හෝ දකින්නේය. විඥාන ස්කන්ධය තමා වශයෙන් දකින්නේය. තමා විඥාන ස්කන්ධය ඇත්තෙක කියා හෝ දකින්නේය. විඥාන ස්කන්ධය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ දකින්නේය. තමා විඥාන ස්කන්ධය කෙරෙහි ඇත්තේය කියා හෝ දකින්නේය. මහණෙනි, මෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන්හි විදර්ශනා භාවනා නැති හෙයින් තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අදිනු ලැබේ.

7. "මහණෙනි, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණා දෘෂ්ටීන් විසින් නොඅදිනු ලැබේද, මහණෙනි, මේ සස්නෙහි ආයර්‍ය්‍යයන් දක්නා ස්වභාව ඇත්තාවූ, ආයර්‍ය්‍යධර්මයෙහි දක්ෂවූ, ආයර්‍ය්‍යධර්මයෙහි හික්මුනාවූ, බුද්ධාදී සත්පුරුෂයන් දක්නා ස්වභාව ඇත්තාවූ, එම සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ ඇසූ පිරූ තැන් ඇති ආයර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපය තමායයි නොදක්නේය. තමා රූප ඇත්තෙකැයි කියා හෝ නොදක්නේය. රූප ස්කන්ධය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ නොදක්නේය. රූප ස්කන්ධය කෙරෙහි තමා ඇත්තේය කියා හෝ නොදක්නේය. වේදනා ස්කන්ධය තමා වශයෙන් නොදක්නේය. තමා වේදනාව ඇත්තෙකැයි හෝ නොදක්නේය. වේදනාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදක්නේය. තමා වේදනාව කෙරෙහි ඇත්තේ යයි කියා නොදක්නේය. සංඥා ස්කන්ධය තමා වශයෙන් නොදක්නේය. තමා සංඥාව ඇත්තෙකැයි කියා හෝ නොදක්නේය. සංඥාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදක්නේය. තමා සංඥාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදක්නේය. සංස්කාර ස්කන්ධය තමා වශයෙන් නොදක්නේය. තමා සංස්කාර ඇත්තෙකැයි කියා හෝ නොදක්නේය. සංස්කාර තමාකෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදක්නේය. තමා සංස්කාර කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදක්නේය. විඥාන ස්කන්ධය තමා වශයෙන් නොදක්නේය. තමා විඥාන ස්කන්ධය

ඇත්තෙකැයි හෝ නොදක්නේය. විඥාන ස්කන්ධය තමා කෙරෙහි හෝ නොදක්නේද, තමා විඥාන ස්කන්ධය කෙරෙහි හෝ නොදක්නේද, මහණෙනි, මෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණා දෘෂ්ටීන් විසින් නොඇදිනු ලැබේ.

8. "අතීත පඤ්ච ස්කන්ධයන් අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. අනාගත පඤ්ච ස්කන්ධයන් තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. ඒකාන්තයෙන් එබඳු පුද්ගලයා යහපත් එක් රැයක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධ මුනි තෙමේ වදාරන්නේයි.

"මහණෙනි, තොපට යහපත් එක් රාත්‍රියක් ඇති තැනැත්තාගේ උද්දෙස සංඛ්‍යාත මාතෘකාවක් විභංගයයි කියනලද විස්තර දෙශනාවක් දෙශනා කරන්නෙමි යන යම් වචනයක් කියන කරන ලද්දේද, එය මේ සඳහා කියන ලද්දේ වෙයි."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළේය. සතුටු සිත් ඇති ඒ භික්ෂූන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට විශෙෂයෙන් සතුටු වූවාහුය.

**පළමුවැනිවූ භද්දෙකරත්ත සූත්‍රය නිමි. (4-1)**

---

## 32. ආනන්ද භද්දෙකරත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජෙතවන නම් අනේපිඩු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවාසය කරණසේක. ඒ කාලයෙහි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ උපස්ථාන ශාලාවෙහි භික්ෂූන්ට දැහැමි කථාවෙන් කරුණු ගෙණහැර දක්වයි. එහි යොදවයි. තෙද ගන්වයි. සතුටු කරවයි. යහපත් එක් රැයක් ඇත්තහුගේ උද්දේසයයි කියනලද මාතෘකාවක්, විභංගයයි කියනලද විස්තරයත් ප්‍රකාශ කරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵල සමාපත්තියෙන් නැගිට උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එතැන්හි වැඩිසේක. වැඩමවා පනවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, කවරෙක් වනාහි උපස්ථාන ශාලාවෙහි භික්ෂූන්ට දැහැමි කථාවෙන් කරුණු ගෙනහැර දැක්වූයේද, යෙදවූයේද, තෙදගැන්වූයේද සතුටු කෙළේද, යහපත් එක් රැයක් ඇත්තහුගේ මාතෘකාවත් විස්තරයත් කීයේදැයි ඇසූහ.

3. "ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ උපස්ථාන ශාලාවෙහි භික්ෂූන්ට දැහැමි කථාවෙන් කරුණු දැක්වූයේය. යෙදවූයේය. තෙද ගැන්වූයේය. සතුටු කෙළේය යහපත් එක් රැයක් ඇත්තහුගේ මාතෘකාවත් විස්තරයත් කෙළේ යයි" (සැළකෙළේය.)

4. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණය කළසේක. "ආනන්දය, තෙපි වනාහි කවර පරිද්දෙකින් භික්ෂූන්ට දැහැමි කථාවෙන් කරුණු දැක්වූයේද, යෙදවූයේද, තෙදගැන්වූයේද සතුටු කෙළේද, යහපත් එක් රැයක් ඇත්තහුගේ මාතෘකාවත් විස්තර බෙදීමත්, ප්‍රකාශ කෙළේදැයි" (විචාළසේක.) "ස්වාමීනි මම මෙසේ වනාහි භික්ෂූන්ට දැහැමි කථාවෙන් කරුණු දැක්වූයෙමි. යෙදවූයෙමි. තෙද ගැන්වූයෙමි. සතුටුකෙළෙමි. යහපත් එක් රැයක් ඇත්තහුගේ මාතෘකාවත් විස්තර බෙදීමත් ප්‍රකාශ කෙළෙමියි (සැලකෙළේය.)

5 (1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන් ගේ වශයෙන් නොයන්නේය. අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද, එය ප්‍රහීණවූයේ (නැතිවූයේ) වෙයි. අනාගතවූ යම් ස්කන්ධයක්වේද, එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය අනිත්‍යානු පස්සනාදීන්ගෙන් ඒ උපන් උපන් තන්හි විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිත නොකොට පණ්ඩිත භික්ෂුතෙමේ වඩන්නේය.

(3) "අදම කෙළෙස් තවන වීර්‍ය්‍යය කළ යුත්තේය. මරණය හෙට හෝ සිදුවන්නේයයි කවරෙක් දන්නේද, මහත් සෙනගක් ඇති ඒ මාරයා සමග ගිවිසුමක් නැත්තේය.

(4) "මෙසේ වාසය කරන්නාවූ කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ රෑ දාවල් දෙක්හි අනලස්ව පිළිපන්නාවූ ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යහපත්වූ එක් රැයක් ඇති භික්ෂුව යයි ශාන්තවූ බුද්ධ මුනි තෙමේ වදාළේයි.

**6.** "ඇවැත්නි, කෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව යන්නේද, 'මම අතීත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වූයෙමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය.

"මම අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තේ වීමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව පවත් වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව පවත්වන්නේය. ඇවැත්නි, මෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව යන්නේය.

**7.** "ඇවැත්නි, කෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව නොයන්නේද? 'මම අතීත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වීමියි, එහි තෘෂ්ණාව නොපවත් වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු විඥාන ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය.' ඇවැත්නි, මෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව නොයන්නේය.

**8.** "ඇවැත්නි, කෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේද? 'අනාගත කාලයෙහි මම මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙමියි, එහි

තෘෂ්ණාව පවත්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. මම අනාගත කාලයෙහි මෙබඳු විඥානය ඇත්තෙක් වන්නෙමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. 'ඇවැත්නි, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය.

**9.** "ඇවැත්නි, කෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේද? 'අනාගත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙමියයි, එහි තෘෂ්ණාව නොපවත්නේය. අනාගතයෙහි මම මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමියයි, එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගතයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමියයි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු විඥාන ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය.' ඇවැත්නි, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය.

**10.** "ඇවැත්නි, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇද ගනීද? ඇවැත්නි, මේ ශාසනයෙහි ආර්‍යයන් නොදක්නා ස්වභාව ඇත්තාවූ, ආර්‍ය ධර්මයෙහි දක්ෂ නොවූ, ආර්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නා ස්වභාව ඇත්තාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ, ඇසූ පිරූතැන් නැති පෘථග්ජන තෙමේ රූපය තමා වශයෙන් හෝ දක්නේය. තමා රූපය ඇත්තෙකැයි කියා හෝ දක්නේය. රූපය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ දක්නේය. තමා රූපය කෙරෙහි ඇත්තේය කියා හෝ දක්නේය. වේදනාව තමා වශයෙන් හෝ දකියි. තමා වේදනාව ඇත්තෙකැයි කියා හෝ දකියි. වේදනාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. තමා වේදනාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. සංඥාව තමා වශයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හෝ දකී. තමා සංඥාව ඇත්තෙකැයි කියා හෝ දකී. සංඥාව තමා කෙරෙහි ඇත්තේ යයි කියා හෝ දකී. තමා සංඥාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. සංස්කාර තමා වශයෙන් හෝ දකී. තමා සංස්කාර ඇත්තෙකැයි කියා හෝ දකී. සංස්කාර තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. තමා සංස්කාර කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. විඥානය තමා වශයෙන් හෝ දකින්නේය. තමා විඥානය ඇත්තෙකැයි කියා හෝ දක්නේය. විඥානය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ දක්නේය. තමා විඥානය කෙරෙහි ඇත්තේය කියා හෝ දක්නේය. ඇවැත්නි, මෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි ඇද ගැනීම වේ.

11. "ඇවැත්නි, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි ඇදීම නොවේද, ඇවැත්නි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යයන් දක්නා ස්වභාව ඇත්තාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුනාවූ, සත්පුරුෂයන් දක්නා ස්වභාව ඇත්තාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ ඇසූපිරූතැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ රූපය තමා වශයෙන් හෝ නොදක්නේය. තමා රූපය ඇත්තෙකැයි කියා හෝ නොදක්නේය. රූපය තමා කෙරෙහි ඇත්තේය කියා හෝ නොදක්නේය. වේදනාව තමා වශයෙන් හෝ නොදක්නේය. තමා වේදනාව ඇත්තෙකැයි කියා හෝ නොදකී. වේදනාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. තමා වේදනාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. සංඥාව තමා වශයෙන් හෝ නොදක්නේය. තමා සංඥාව ඇත්තෙකැයි කියා හෝ නොදකී. සංඥාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. තමා සංඥාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. සංස්කාර තමා වශයෙන් හෝ නොදක්නේය. තමා සංස්කාර ඇත්තෙකැයි කියා හෝ නොදකී. සංස්කාර තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. තමා සංස්කාර කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. විඥානය තමා වශයෙන් හෝ නොදක්නේය. තමා විඥානය ඇත්තෙකැයි කියා හෝ නොදක්නේය. විඤ්ඤාණය

තමා කෙරෙහි ඇත්තේය කියා හෝ නොදක්නේය. තමා විඤ්ඤාණය කෙරෙහි ඇත්තේය කියා හෝ නොදක්නේය.

ඇවැත්නි, මෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණා වශයෙන් ඇදගනීම නොවේ.

12. 1. "අතීත පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

2. "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. රාගාදීන්ගෙන් විසිරීමක් නැත්තාවූ කුපිත නොවන්නාවූ ඒ විදර්ශනාව පණ්ඩිත භික්ෂුතෙම වඩන්නේය.

3. "අදම කෙලෙස් තවන වීය්‍ය කළ යුත්තේය හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති, ඒ මාරයා සමග ගිවිසුමක් අපට නැත්තේය.

4. "මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීය්‍යීයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඒකාන්තයෙන් මෙසේ පිළිපන් ඒ පුද්ගලයා යහපත්වූ එක් රැයක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධමුනි තෙමේ වදාළේය.

"ස්වාමීනි, මම මෙසේ වනාහි භික්ෂූන්ට දැහැමි කථාවෙන් කරුණු දැක්වූයෙමි. යෙදවූයෙමි. තෙද ගැන්වූයෙමි. සතුටු කෙළෙමි. යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවත් විස්තර විභාගයත් ප්‍රකාශ කෙළෙමියි' සැලකෙළේය.

13. 'යහපති ආනන්දය, යහපති ආනන්දය, ඔබ ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. අනාගත පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණාව නොපවත්වන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය

නොපැමිණියේය. ඒකාන්තයෙන් ඒ පුද්ගලයා යහපත් එක් රැයක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධමුනි තෙම වදාළේයයි භික්ෂූන්ට ධර්ම කථාවක් දැක්වූයෙහිය, එහි සමාදන් කරවූයෙහිය, උත්සාහවත් කරවූයෙහිය, පැහැද වූයෙහිය, යහපත් රාත්‍රියකගේ සංක්ෂෙපයෙන්ද විස්තර වශයෙන්ද කීයෙහිය.

14. "ආනන්දය, කෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව යන්නේද? 'මම අතීත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වූයෙමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වීමියි, එහි තෘෂ්ණාව පවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වීමියි. එහි තෘෂ්ණාව පවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව පවත්වන්නේය.' ආනන්දය, මෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව යන්නේය.

15. "ආනන්දය, කෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව නොයන්නේද? 'මම අතීත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව නොපවත් වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වීමියි. එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වීමියි. එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. මම අතීත කාලයෙහි මෙබඳු විඤ්ඤාණ ඇත්තෙක් වීමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය.' ආනන්දය, මෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව නොයන්නේය.

16. "ආනන්දය, කෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කෙරේද? 'අනාගත කාලයෙහි මම මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමියි එහි

තෘෂ්ණාව පවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු විඥ්ඥාණ ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වන්නේය.' ආනන්දය, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය.

17. "ආනන්දය, කෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකෙරේද? 'අනාගත කාලයෙහි මම මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත් වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය. අනාගත කාලයෙහි මම මෙබඳු විඥ්ඥාණ ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වන්නේය.' ආනන්දය, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය.

18. "ආනන්දය, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇදගනීද? ආනන්දය, මේ ශාසනයෙහි ආර්‍ය්‍යයන් නොදක්නා ස්වභාවය ඇත්තාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ නොවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නා ස්වභාව ඇත්තාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ, ඇසූපිරූතැන් නැති පෘථග්ජන තෙමේ රූපය තමා වශයෙන් හෝ දකී. තමා රූපය ඇත්තෙකැයි කියා හෝ දකී. රූපය තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. තමා රූපය කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. වේදනාව තමා වශයෙන් හෝ දකියි. තමා වේදනාව ඇත්තෙකැයි කියා හෝ දකියි. වේදනාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. තමා වේදනාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. සංඥාව තමා වශයෙන් හෝ දකී. තමා සංඥාව ඇත්තෙකැයි කියා හෝ දකී. සංඥාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. තමා සංඥාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. සංස්කාර තමා වශයෙන් හෝ දකී. තමා සංස්කාර

ඇත්තෙකැයි කියා හෝ දකී. සංස්කාර තමා කෙරෙහි ඇත්තේ යයි කියා හෝ දකී. තමා සංස්කාර කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. විඤ්ඤාණය තමා වශයෙන් හෝ දකී. තමා විඤ්ඤාණය ඇත්තෙකැයි කියා හෝ දකී. විඤ්ඤාණය තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. තමා විඤ්ඤාණය කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකී. ආනන්දය, මෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගනී.

19. "අනන්දය, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ ඇදීම නොකෙරේද? ආනන්දය, මේ ශාසනයෙහි ආය්‍ර්‍යයන් දක්නා ස්වභාව ඇත්තාවූ. ආය්‍ර්‍ය ධර්මයෙහි දක්ෂවූ, ආය්‍ර්‍ය ධර්මයෙහි හික්මුනාවූ, සත්පුරුෂයින් දක්නා ස්වභාවය ඇත්තාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ, ඇසූපිරූතැන් ඇති, ආය්‍ර්‍ය ශ්‍රාවක තෙමේ රූපය තමා වශයෙන් හෝ නොදකී. තමා රූපය ඇත්තෙකැයි කියා හෝ නොදකී. රූපය තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. තමා රූපය කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. වේදනාව තමා වශයෙන් හෝ නොදකී. තමා වේදනාව ඇත්තෙකැයි කියා හෝ නොදකී. වේදනාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී තමා වේදනාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. සංඥාව තමා වශයෙන් හෝ නොදකී. තමා සංඥාව ඇත්තෙකැයි කියා හෝ නොදකී. සංඥාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. තමා සංඥාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. සංස්කාර තමා වශයෙන් හෝ නොදකී. තමා සංස්කාර ඇත්තෙකැයි කියා හෝ නොදකී. සංස්කාර තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. තමා සංස්කාර කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී විඤ්ඤාණය තමා වශයෙන් හෝ නොදකී. තමා විඤ්ඤාණය ඇත්තෙකැයි කියා හෝ නොදකී. විඤ්ඤාණය තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. තමා විඤ්ඤාණය කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකී. ආනන්දය, මෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණාදෘෂ්ටීන්ගේ වශයෙන් ඇදීම නොකෙරේ.

**20.** (1) "ඉකුත් පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් අනුව නොයන්නේය. නොපැමිණියාවූ පඤ්ච ස්කන්ධයෙහි තෘෂ්ණා වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට, කුපිත නොකොට පණ්ඩිත භික්ෂු තෙමේ වඩන්නේය.

(3) "අදම කෙළෙස් තවන වීර්‍ය්‍යය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති ඒ මාරයා සමග අපට ගිවිසුමක් නැත්තේය.

(4) "මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ ඒකාකන්තයෙන් මෙසේ පිළිපන් ඒ පුද්ගලයා යහපත් රාත්‍රියක් ඇති තැනැත්තේයයි, ශාන්තවූ බුද්ධ මුනි තෙමේ වදාළේයයි, භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළේය.

සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට විශෙෂයෙන් සතුටුවූයේයි."

**ආනන්ද භද්දෙකරත්ත සූත්‍රය. (4-2)**

---

## 33 මහා කච්චායන භද්දේකරත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ තපෝදාරාමයෙහි වැඩවාසය කරණසේක. එකල්හි වනාහි ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරතෙමේ රාත්‍රියෙහි අළුයම් කාලයෙහි හුනස්නෙන් නැගිට, තපෝදා නම් උණුදිය ගඟ යම් තැනෙක්හිද එතැනට ස්නානය කිරීම පිණිස ගියේය.

තපෝදා නම් ගඟෙහි ස්නානය කොට ගොඩට පැමිණ එක් සිවුරකින් යුක්තව ශරීරය වියලනු ලබමින් සිටියේය. එකල්හි වනාහි එක්තරා දේවතාවෙක් රාත්‍රි කාලය බොහෝ ඉක්ම ගිය පසු බබළන ශරීර වර්ණය ඇතිව මුළු තපෝදා ගඟ බබුළුවා ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරතෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, එකත්පසක සිටියේය, එකත් පසක සිටියාවූ ඒ දෙවතා තොමෝ ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන් වහන්සේට මෙසේ කීවාය.

2. "භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ යහපත්වූ එක් රාත්‍රියක් ඇත්තාහුගේ උදෙසීම් සංඛ්‍යාත මාතෘකාවද, විභංග සංඛ්‍යාත විස්තර වශයෙන් බෙදීමදැයි, (යන මෙය) දරන්නෙහිද?" යනුයි. "ඇවත, මම යහපත් එක්රාත්‍රියකගේ මාතෘකාවද බෙදීමද නොමදරන්නෙමියි කීයෙමි ඇවත, තෙපි වනාහි යහපත්වූ එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවත් බෙදීමත් දරන්නෙහිදැයි (ඇසූ) මමද යහපත්වූ එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද නොදරන්නෙමියි" කීය "භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ යහපත්වූ එක්රාත්‍රියක් ඇත්තහුගේ ගාථාවන් දරන්නෙහිදැයි' (ඇසී.) ඇවත, මම යහපත්වූ එක් රැයක් ඇත්තහුගේ ගාථාවන් නොදරන්නෙමියි කීයෙමි. "ඇවත, නුඹ වනාහි යහපත්වූ එක්රාත්‍රියක් ඇත්තහුගේ ගාථාවන් දරන්නෙහිදැයි, ඇසීමි." "භික්ෂූන්වහන්ස, මමද යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේගාථාවන් නොදරන්නෙමියි" (කීයෙමි.)

"භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ යහපත්වූ එක් රැයක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද ඉගෙණගනු මැනවි. භික්ෂූන් වහන්ස, නුඹ වහන්සේ යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද පුරුදු කරණු මැනවි. භික්ෂූන්වහන්ස, නුඹ වහන්සේ යහපත් එක් රැයක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද දරණු මැනවි. "භික්ෂූන්වහන්ස, යහපත්වූ එක් රැයක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද අර්ථ සහිත වන්නේය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල වන්නේයයි" (කී.)

3. ඒ දේවතාතොමෝ මෙය කීවේය. මෙය කියා එහිම අතුරුදහන් විය. එකල්හි වනාහි ආයුෂ්මත් සමිද්ධි ස්ථවිර තෙමේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසක හුන්නේය. එකත්පසක හුන්නාවූ ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය. "ස්වාමීනි, මම රාත්‍රියේ අළුයම් කාලයෙහි හුනස්නෙන් නැගිට තපෝදා නම් ගඟ යම් තැනෙක්හිද ස්නානය කිරීම සඳහා එහි ගියෙමි. තපෝදා නම් ගඟෙහි ස්නානය කොට ගොඩ අවුත් ශරීරාවයවයන් වියලමින් එක සිවුරකින් යුක්තව සිටියෙමි. ස්වාමීනි, එකල්හි වනාහි එක්තරා දේවතාවෙක් රාත්‍රිය බොහෝ සෙයින් ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණයෙන් යුක්තව සියලු තපෝදා නම් ගංගාව බබුළුවා මම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ එකත්පසක සිටියේය. ස්වාමීනි, එකත්පසක සිටියාවූ ඒ දේවතාතොමෝ මට මෙසේ කීවාය. 'භික්ෂූන් වහන්ස, නුඹ වහන්සෙ යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවද විස්තර බෙදීමද දරන්නෙහිදැයි? ඇසී.

4. "ස්වාමීනි, මෙසේ කී කල්හි මම ඒ දේවතාවාට මෙසේ කීයෙමි. 'ඇවැත්නි, මම යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවත් බෙදීමත් නොමදරමි.'

'ඇවැත්නි, නුඹ වනාහි යහපත් එක් රාත්‍රියකගේ මාතෘකාවද බෙදීමද දරන්නෙහිදැයි' (ඇසීමි.) 'භික්ෂූන්වහන්ස, මමද යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද නොදරමි. 'භික්ෂූන්වහන්ස, නුඹ වහන්සේ වනාහි යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ ගාථාවන් දරන්නෙහිදැයි, (ඇසී.)

'ඇවැත්නි, මම වනාහි යහපත්වූ එක් රාත්‍රියක් ඇත්තහුගේ ගාථාවන් නොදරමි. ඇවැත්නි, නුඹ වනාහි යහපත් එක් රාත්‍රිය සම්බන්ධ ගාථාවන් දරන්නෙහිදැයි,' (ඇසීමි.) 'භික්ෂූන්වහන්ස, මමද යහපත්වූ එක් රාත්‍රියක් ඇත්තහුගේ ගාථා නොදරමි. භික්ෂූන්වහන්ස, නුඹ වහන්සේ යහපත්වූ එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද ඉගෙණගනු මැනවි. භික්ෂූන්වහන්ස, නුඹ වහන්සේ යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ

මාතෘකාවද බෙදීමද, පුරුදු කළ මැනවි. භික්ෂූන් වහන්ස, නුඹ වහන්සේ යහපත්වූ එක් රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවද, බෙදීමද, දරාගත මැනවි. 'භික්ෂූන්වහන්ස, යහපත් එක් රාත්‍රියක් ඇත්තහුගේ උදෙසීමද, බෙදීමද, අර්ථයෙන් යුක්ත වන්නේය. මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාවට මුල වන්නේය, ස්වාමීනි, ඒ දේවතාතොමෝ මෙසේ කීයේය. මෙසේ කියා එහිම අතුරුදහන් වූවාහ.

**5.** "ස්වාමීනි, මට භාග්‍යවතුන්වහන්සේ යහපත් එක්රාත්‍රියක් ඇත්තහුගේ මාතෘකාවද බෙදීමද දෙශනා කරණ සේක්වායි" (සැලකෙළේය.) "මහණ, එසේ නම් අසව, මෙනෙහි කරව. කියන්නෙමියි" (වදාළේය.) "එසේය, ස්වාමීනියයි" ආයුෂ්මත් සමිද්ධි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

(1) "ඉකුත්වූ ස්කන්ධයන් අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද, එය ප්‍රහීණ වූයේ (නැතිවූයේ) වෙයි. අනාගත ස්කන්ධ නොපැමිණියේ වෙයි.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක්වේද, එය අනිත්‍යානු පස්සනාදී වශයෙන් ඒ ඒ තන්හි විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිත නොකොට පණ්ඩිත භික්ෂුතෙමෙ වඩන්නේය.

(3) "අදම කෙලෙස් තවන වීය්‍ර්‍යයකළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහත් සෙනගක් ඇති ඒ මාරයා සමග, අපට ගිවිසුමක් නැත්තේය.

(4) "මෙසේ වාසය කරන්නාවූ කෙලෙස් තවන වීය්‍ර්‍යයෙන් යුක්තවූ රෑ දාවල් දෙක්හි අනලස්ව පිළිපන්නාවූ ඒ පුද්ගලයා ඒකාන්තයෙන්, යහපත්වූ එක් රැයක් ඇති තැනැත්තේයයි" ශාන්තවූ බුද්ධ මුනි තෙමේ වදාළේයි.

**6.** භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ වැඩමවා නොබෝ වේලාවක් ගතවූ කල්හි ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් විය. ඇවැත්නි, මේ වනාහි අපට භාග්‍යවතුන් වහන්සේ සංක්ෂෙප වශයෙන් උදෙසීම වදාරා, විස්තර වශයෙන් අර්ථ විභාග නොකොට, හුනස්නෙන් නැගිට විහාරයට වැඩමවූසේක.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. අනාගත පඤ්ච ස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්මගියේද එය ප්‍රහීණ වූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) 'වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිත නොකොට පණ්ඩිත භික්ෂු තෙමේ වඩන්නේය.

(3) "අදම කෙළෙස් තවන වීර්‍ය්‍යය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති ඒ මාරයා සමග අපට ගිවිසුමක් නැත්තේය.

(4) "මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ ඒකාන්තයෙන් මෙසේ පිළිපන් පුද්ගලයා යහපත් එක් රෑ යක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධ මුනි තෙමේ වදාළේය" (යනුවෙනි.)

7. කවරෙක් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙප වශයෙන් උදෙසීම පමණක් වදාළාවූ විස්තර වශයෙන් අර්ථ විභාග නොකළාවූ මේ දෙශනාවගේ අර්ථ විස්තර වශයෙන් දෙශනා කරන්නේද? කියායි. එකල්හි වනාහි ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් විය. මේ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ වනාහි ශාස්තෘන් වහන්සේ විසින්ද වර්ණනා කරණ ලද්දේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නුවණැති සබ්‍රහ්මචාරී භික්ෂූන් විසින්ද බුහුමන් කරණ ලද්දේ වෙයි.

8. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් උදෙසීම් මාත්‍රයක් වදාළාවූ විස්තර වශයෙන් අර්ථ විභාග නොකළාවූ මේ දෙශනාවගේ අර්ථ විස්තර වශයෙන් දෙශනා කිරීමට පොහොසත් වන්නේය. අපි ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරතෙමේ යම් තැනෙක්හිද එහි පැමිණෙන්නෙමු. පැමිණ, කාරණය විචාරන්නෙමු නම් යෙහෙක කියායි. එකල්හි වනාහි ඒ භික්ෂූන් වහන්සේලා ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එහි ගියාහුය. ගොස්, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් සමග සතුටු වූවාහුය. සතුටු විය යුතුවූ සිහි එළවිය යුතුවූ කථාව කොට නිමවා එකත්පසක හුන්නාහුය. එකත්පසක හුන්නාවූ ඒ භික්ෂූන් වහන්සේලා ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන්ට මෙය කීවාහුය. "ඇවැත් කාත්‍යායන ස්ථවිරය, භාග්‍යවතුන් වහන්සේ අපට මේ ධර්මය සංක්ෂෙපයෙන් වදාරා විස්තර වශයෙන් දෙශනා නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩමවූසේක.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. නොපැමිණියාවූ පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණා වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා කරන්නේය. විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට, කුපිත නොකොට, පණ්ඩිත භික්ෂුතෙම වඩන්නේය.

(3) "අදම කෙළෙස් තවන වීර්‍ය්‍ය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති, ඒ මාරයා සමග ගිවිසුම් කොට, නැවතීමක් නොවන්නේමය

(4) "මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, රෑ දාවල් දෙක්හි අනලස්වූ ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යහපත් රැයක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධ මුනි තෙමේ වදාළේය" යනුයි.

**9.** "ඇවැත් කාත්‍යායන ස්ථවිරය, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩමවා නොබෝ වේලාවකින් මෙබඳු සිතෙක් විය. ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ මේ දෙශනාව සංක්ෂෙප වශයෙන් දක්වා විස්තර වශයෙන් නොවදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩමවූසේක.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. නොපැමිණියාවූ පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණා වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිතනොකොට පණ්ඩිත භික්ෂුතෙමේ වඩන්නේය.

(3) "අදම කෙළෙස් තවන වීර්‍ය්‍යය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති ඒ මාරයා සමග ගිවිසුම්කොට නැවතීමක් නොවන්නේමය.

(4) 'මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යහපත්වූ එක් රැයක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධ මුනිතෙමේ වදාළේය" යනුයි.

"භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් දක්වා විස්තර වශයෙන් නොවදාළාවූ මේ ධර්මයාගේ අර්ථ විස්තර

වශයෙන් කවරෙක් නම් දෙශනා කරන්නේද යනුවෙනි. ඇවැත් කෘත්‍යායන ස්ථවිරය, අපට මෙබඳු සිතෙක්වී. මේ ආයුෂ්මත් මහා කෘත්‍යායන ස්ථවිර තෙමේ ශාස්තෘන් වහන්සේ විසින්ද වර්ණනා කරණ ලද්දේය. නුවණැති සබ්‍රහ්මචාරීන් විසින්ද බුහුමන් කරණ ලද්දේ වේ. ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාළාවූ විස්තර වශයෙන් නොවදාළාවූ මේ ධර්මයාගේ අර්ථ විස්තර වශයෙන් දෙශනා කිරීමට සමර්ථ වන්නේය. අපි ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එතැනට යමු. ගොස්, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් අතින් මෙපවත් විචාරන්නෙමු නම් යෙහෙකැයි කියායි. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ විස්තර වශයෙන් බෙදා වදාරණසේක්වායි (කීහු.)"

10. "ඇවැත්නි, යම්සේ වනාහි හරයෙන් (අරටුවෙන්) ප්‍රයොජන ඇත්තාවූ, හරය සොයන්නාවූ පුරුෂයෙක් තෙමේ යම්සේ හරය සොයා ඇවිදින්නේ, හරය ඇත්තාවූ මහ ගසක මුල අත්හැර, කඳ අත්හැර, කොළ අතුවල හරය සෙවිය යුතුයයි සිතන්නේද, එපරිද්දෙන්ම ආයුෂ්මත්වරුන් විසින් ශාස්තෘන් වහන්සේ හමුවූ කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා අප මේ කාරණය ඇසිය යුත්තකු කොට සිතන්නාහුද? ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දතයුත්ත දන්නේය, දැක්කයුතු දෙය දක්නේය, ප්‍රඥා චක්ෂුසින් යුක්ත වූයේය, සම්‍යක් ඥානයෙන් යුක්ත වූයේය, ධර්මඥානයෙන් යුක්ත වූයේය, ශ්‍රෙෂ්ඨ වූයේය, චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශ කරන්නේය, පවත්වන්නේය, අර්ථයට පමුණුවන්නේය, අමෘතය දෙන්නේය, ධර්මස්වාමි වූයේය, තථාගත වූයේය. මේ වනාහි ඒ භාග්‍යවතුන් වහන්සේ ගෙන්ම එය ඇසීමට සුදුසු කාලය විය. තොපට භාග්‍යවතුන් වහන්සේ යම් ආකාරයකින් ප්‍රකාශ කරන්නාහුද එපරිද්දෙන්ම එය දරාගනිව්යයි," (කී).

11. "ඇවැත් කාත්‍යායනස්ථවිරය, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දන්නේය. දැක්කයුත්ත දක්නේය.

ප්‍රඥා චක්ෂුසින් යුක්තවූයේ, ඥාන චක්ෂුසින් යුක්තවූයේ, ධර්ම චක්ෂුසින් යුක්තවූයේ, ශ්‍රෙෂ්ඨවූයේ, දෙශනා කරන්නේය, පවත්වන්නේ, අර්ථය කරා පමුණුවන්නේ අමෘතය දෙන්නේ, ධර්මස්වාමී වූයේය, තථාගත වූයේය. භාග්‍යවතුන් වහන්සේ ගෙන්ම එය ඇසීමට කාලය විය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ අතින්ම මෙපවත් විචාරන්නෙමුද අපට භාග්‍යවතුන් වහන්සේ යම්සේ ප්‍රකාශ කරන්නේද, එය එසේ දරාගන්නෙමු. එතකුදු වුවත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ ශාස්තෘන් වහන්සේ විසින්ද වර්ණනා කරණ ලද්දේය. නුවණැති සබ්‍රහ්මචාරී භික්ෂූන් විසින්ද බුහුමන් කරණ ලද්දේය. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාළාවූ විස්තර වශයෙන් නොවදාළාවූ මේ ධර්මයාගේ අර්ථ විස්තර වශයෙන් දෙශනා කිරීමට සමර්ථ වන්නේය. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ බරක් වශයෙන් නොසලකා විස්තර කරන සේක්වායි කීහ.

12. "ඇවැත්නි, එසේවී නම් අසව්. මොනවට මෙනෙහි කරව්. කියන්නෙමියි" (කීහ.) "ඇවැත්නි, එසේයයි" ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ මෙසේ ප්‍රකාශ කෙළේය.

(1) "ඇවැත්නි, "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව නොයන්නේය. නොපැමිණියාවූ පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිත නොකොට පණ්ඩිත භික්ෂුතෙම වඩන්නේය.

(3) "අදම කෙළෙස් තවන වීර්‍ය්‍යය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති ඒ මාරයා සමග ගිවිසුම්කොට, නැවතීමක් නොවන්නේය.

(4) "මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යහපත් එක් රැයක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධ මුනි තෙම වදාළේය"යි

13. "භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ධර්මයක් සංක්ෂෙපයෙන් දෙශනාකොට විස්තර වශයෙන් විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද,

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ සංක්ෂෙපයෙන් වදාළ විස්තර වශයෙන් අර්ථ බෙදා නොවදාළාවූ මේ ධර්මයාගේ අර්ථ විස්තර වශයෙන් මම මේ ආකාරයෙන් දනිමි.

"ඇවැත්නි, කෙසේ නම් අතීත ස්කන්ධයන් අනුව යන්නේද? අතීත කාලයෙහි මාගේ ඇස මෙසේ වීය. මෙසේ රූපය වීයයි, එහි විඤ්ඤාණය ඡන්දරාගයෙන් බැඳුනේවෙයි. විඤ්ඤාණය තමා ඡන්දරාගයෙන් බැඳුනු බැවින් එහි ඇලෙයි. එහි ඇලෙන්නේ ඉකුත් පඤ්චස්කන්ධය අනුව යන්නේය.

"අතීත කාලයෙහි මාගේ කණ මෙසේවීය. ශබ්දයෝ මෙසේ වූවහුයයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ වෙයි. විඤ්ඤාණය තමා ඡන්දරාගය හා යෙදීම හෙතුකොටගෙන එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ ඉකුත් ස්කන්ධයන් අනුව යන්නේය.

"අතීත කාලයෙහි මාගේ නාසය මෙසේ වීය. ගන්ධයෝ මෙසේ වූවාහුයයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදීම හෙතුකොටගෙන එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ ඉකුත් ස්කන්ධයන් අනුව යන්නේය.

"අතීත කාලයෙහි මාගේ දිව මෙසේ වීය, රසයෝ මෙසේ වූවාහුයයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ වෙයි. විඤ්ඤාණය තමා ඡන්දරාගය හා යෙදීම හෙතුකොටගෙන එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ ඉකුත් ස්කන්ධයන් අනුව යන්නේය.

"අතීත කාලයෙහි මාගේ කය මෙසේ වීය. මාගේ ස්පර්ශයෝ මෙසේ වූවාහුයයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ වෙයි. විඤ්ඤාණය තමා ඡන්දරාගය හා යෙදීම හෙතුකොටගෙන එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ ඉකුත් ස්කන්ධයන් අනුව යන්නේය.

"අතීත කාලයෙහි මාගේ සිත මෙසේ වීය. ධර්මයෝ මෙසේ වූවාහුයයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේවෙයි. විඤ්ඤාණය තමා ඡන්දරාගය හා යෙදුනු හෙයින් එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ අතීත ස්කන්ධය අනුව යන්නේය. ඇවැත්නි, මෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව යන්නේය.

14. "ඇවැත්නි, කෙසේ වනාහි අතීත ස්කන්ධයන් අනුව නොයේද, අතීත කාලයෙහි මාගේ චක්ෂුව (ඇස) මෙසේ වීය. රූපයෝ මෙසේ වූහයි, එහි ඡන්දරාගය හා යෙදුනු විඤ්ඤාණය නොවේද, විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින්, එහි නොඇලෙන්නේය. නොඇලෙන්නේ අතීත ස්කන්ධයන් අනුව නොයන්නේය. අතීත කාලයෙහි මාගේ කණ මෙසේ වීය. ශබ්දයෝ මෙසේ වූහයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි නොඇලෙන්නේය. එහි නොඇලීම හේතුකොට ගෙන අතීත ස්කන්ධයන් අනුව (තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන්) නොයන්නේය.

"අතීත කාලයෙහි මාගේ නාසය මෙසේ වීය. ගන්ධයෝ මෙසේ වූහයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි

නොඇලෙන්නේය. එහි නොඇලීම හේතුකොටගෙන අතීත ස්කන්ධයන් අනුව (තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන්) නොයන්නේය.

"අතීත කාලයෙහි මාගේ දිව මෙසේ වීය. රසයෝ මෙසේ වූහයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි නොඇලෙන්නේය. එහි නොඇලීම හේතුකොටගෙන අතීත ස්කන්ධයන් අනුව (තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන්) නොයන්නේය.

"අතීත කාලයෙහි මාගේ කය මෙසේ වීය. ස්පර්ශයෝ මෙසේ වූහයි එහි විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි නොඇලෙන්නේය. එහි නොඇලීම හේතුකොටගෙන අතීත ස්කන්ධයන් අනුව (තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන්) යන්නේය.

"අතීත කාලයෙහි මාගේ සිත මෙසේ වීය. ධර්මයෝ මෙසේ වූහයි එහි ඡන්දරාගය හා යෙදුනු විඤ්ඤාණය නොවන්නේය. විඤ්ඤාණය තමා ඡන්දරාගය හා නොයෙදුනු හෙයින් එහි නොඇලෙන්නේය. එහි නොඇලෙන්නේ ස්කන්ධයන් අනුව නොයන්නේය. ඇවැත්නි, මෙසේ අතීත ස්කන්ධයන් අනුව නොයන්නේය.

15. "ඇවැත්නි, කෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කෙරේද? අනාගත කාලයෙහි මාගේ කණ මෙසේ වන්නේය. රූපයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ චක්ඛු රූපයන් ලැබීම පිණිස සිත පිහිටුවන්නේය. සිත පිහිටුවීම හේතුකොටගෙන එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ අනාගත පඤ්චස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය. අනාගත කාලයෙහි මාගේ කණ මෙසේ වන්නේය. ශබ්දයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ දෙයක් ලැබීම පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම හේතුකොටගෙන, එහි ඇලෙයි. එහි ඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ නාසය මෙසේ වන්නේය. ගන්ධයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ දෙයක් ලැබීම පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම හේතුකොටගෙන, එහි ඇලෙයි. එහි ඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ දිව මෙසේ වන්නේය, රසයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ දෙයක් ලැබීම පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම හේතුකොටගෙන, එහි ඇලෙයි. එහි ඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ කය මෙසේ වන්නේය, ස්පර්ශයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ දෙයක් ලැබීම පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම හේතුකොටගෙන, එහි ඇලෙයි. එහි ඇලෙන්නේ අනාගත ස්කන්ධය ප්‍රාර්ථනා කරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ සිත මෙසේ වන්නේය, ධර්මයෝ මෙසේ වන්නාහුයයි නොලද්දහුගේ ලැබීම පිණිස සිත පිහිටුවන්නේය. සිත පිහිටුවීම හේතුකොට ගෙන, එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේ නම් වෙයි. ඇවැත්නි, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා කරන්නේය.

**16.** "ඇවැත්නි, කෙසේ නම් අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකෙරේද? අනාගත කාලයෙහි මාගේ ඇස මෙසේ වන්නේය. රූපයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ චක්ඛු රූපයන් ලැබීම පිණිස සිත නොපිහිටුවන්නේය. සිත නොපිහිටුවීම හේතුකොටගෙන, එහි නොඇලෙයි. එහි නොඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ කණ මෙසේ වන්නේය. ශබ්දයෝ මෙසේ වන්නාහුයයි මෙසේ නොලැබූ සොත ශබ්දයන් ලබනු සඳහා සිත නොපිහිටුවන්නේය. සිත නොපිහිටුවීම හේතුකොටගෙන, එහි නොඇලෙන්නේය. එහි නොඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ නාසය මෙසේ වන්නේය. ගන්ධයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ දෙයක් ලැබීම පිණිස සිත නොපිහිටුවන්නේය. සිත නොපිහිටුවීම හේතුකොට ගෙන, එහි නොඇලෙන්නේය. එහි නොඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ දිව මෙසේ වන්නේය, රසයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ ජිව්හා රසයන් ලැබීම පිණිස සිත නොපිහිටුවන්නේය. සිත නොපිහිටුවීම හේතුකොට ගෙන, එහි නොඇලෙන්නේය. එහි නොඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ කය මෙසේ වන්නේය. ස්පර්ශයෝ මෙසේ වන්නාහුයයි නොලැබූ කාය ස්පර්ශයන් ලැබීම පිණිස සිත නොපිහිටු වන්නේය. සිත නොපිහිටුවීම හේතුකොටගෙන, එහි නොඇලෙන්නේය. එහි නොඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය.

"අනාගත කාලයෙහි මාගේ සිත මෙසේ වන්නේය. ධර්මයෝ මෙසේ වන්නාහුයයි, නොලැබූ සිත හා ධර්මයන්ගේ ලැබීම පිණිස සිත නොපිහිටුවයි. සිත නොපිහිටුවීම හේතු කොටගෙන, එහි නොඇලෙයි. එහි නොඇලෙන්නේ අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේය. ඇවැත්නි, මෙසේ වනාහි අනාගත ස්කන්ධයන් ප්‍රාර්ථනා නොකරන්නේ නම් වෙයි.

17. "ඇවැත්නි, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගනීද? ඇවැත්නි, යම්බඳු චක්ෂු ප්‍රසාදයක් වේද, යම්බඳු රූපායතනයෝ වෙත්ද, මේ දෙකම වර්තමාන වන්නේය. ඒ වර්තමාන චක්ඛු රූප දෙක්හි ඡන්දරාගය හා යෙදුණු විඤ්ඤාණය වෙයි. ඡන්දරාගය හා යෙදුනු බැවින් එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගන්නේය.

"ඇවැත්නි, යම්බඳුවූ සෝතායතනයක් වේද, යම්බඳුවූ ශබ්දායතනයෝ වෙත්ද, මේ දෙක වර්තමාන වෙයි. ඒ වර්තමාන

ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය යෙදුනේ වෙයි. ඡන්දරාගය හා යෙදුන බැවින් එහි ඇලෙන්නේය. එහි ඇලුනේ වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇදගැනීම කෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ ඝාණායතනයක් වේද, යම්බඳුවූ ගන්ධායතනයෝ වෙත්ද, මේ දෙක වර්තමාන වෙයි. ඒ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය යෙදුනේ වෙයි. ඡන්දරාගය හා යෙදුන බැවින් එහි ඇලෙන්නේය. එහි ඇලුනේ වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇදගැනීම කෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ ජිව්හායතනයෙක් වේද, යම්බඳුවූ රසායතනයෝ වෙත්ද, මේ දෙක වර්තමාන වෙයි. ඒ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුන බැවින් එහි ඇලෙන්නේය. එහි ඇලුනේ වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ඇදගැනීම කෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ කායායතනයෙක් වේද, යම්බඳුවූ ස්පර්ශයතනයෝ වෙත්ද, මේ දෙක වර්තමාන වෙයි. ඒ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුන බැවින් එහි ඇලෙන්නේය. එහි ඇලුනේ වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇදගැනීම කෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ මනායතනයෙක් වේද, යම්බඳුවූ ධර්මායතනයෝ වෙත්ද, මේ දෙකම වර්තමාන වන්නේය. ඒ වර්තමාන මනායතන ධර්මායතනයෙහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනු බැවින් එහි ඇලෙන්නේය. එහි ඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන්හි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ඇදගැනීම කෙරේ. ඇවැත්නි, මෙසේ වනාහි වර්තමාන ධර්මයන් කෙරෙහි ඇද ගැනීම කෙරේ.

18. "ඇවැත්නි, කෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණාදෘෂ්ටීන්ගේ වශයෙන් ඇදීම නොකෙරේද,

ඇවැත්නි, යම්බඳුවූ චක්ඛායතනයක් වේද, යම්බඳුවූ රූපායතනයෝ වෙත්ද, මේ දෙකම වර්තමාන වන්නේය. ඒ වර්තමාන චක්ඛායතන රූපායතනයන්හි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ නොවේද, විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදීම හේතුකොටගෙන එහි නොඇලෙන්නේය. එහි නොඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටින්ගෙන් ඇදීම නොකෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ සොතායතනයක් වේද, යම්බඳු ශබ්දායතනයෝ වෙත්ද, මේ දෙක වර්තමාන වෙයි. ඒ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය හා යෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි නොඇලෙයි. එහි නොඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගැනීම නොකෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ ඝානායතනයක් වේද, යම්බඳුවූ ගන්ධායතනයෝ වෙත්ද, මේ දෙක වර්තමාන වෙයි. ඒ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි නොඇලෙයි. එහි නොඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගැනීම නොකෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ ජිව්හායතනයෙක් වේද, යම්බඳුවූ රසායතනයෝ වෙත්ද, මේ දෙක වර්තමානයයි. ඒ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි නොඇලෙයි. එහි නොඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගැනීම නොකෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ කායායතනයෙක් වේද, යම්බඳුවූ ස්පර්ශායතනයෝ වෙත්ද, මේ දෙක වර්තමානයයි. ඒ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනේ වෙයි. විඤ්ඤාණය ඡන්දරාගය හා නොයෙදුනු බැවින් එහි

නොඇලෙයි. එහි නොඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගැනීම නොකෙරේ.

"ඇවැත්නි, යම්බඳුවූ මනායතනයෙක් වේද, යම්බඳුවූ ධර්මායතනයෝ වෙත්ද, මේ දෙකම වර්තමාන වන්නේය. ඒ වර්තමාන මනායතන ධර්මායතනයන්හි විඥ්ඥාණය ඡන්දරාගය හා යෙදුනේ නොවේද, විඥ්ඥාණය ඡන්දරාගය හා නොයෙදීම හේතුකොටගෙන එහි නොඇලෙන්නේය. එහි නොඇලෙන්නේ වර්තමාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගැනීම නොකෙරේ. ඇවැත්නි, මෙසේ වනාහි වර්තමාන ස්කන්ධයන් කෙරෙහි ඇදීම නොකෙරේ.

**19.** (1) "ඇවැත්නි, ඉකුත් පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණාදෘෂ්ටීන්ගේ වශයෙන් අනුව නොයන්නේය. නොපැමිණියාවූ පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණා වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ, යම් ස්කන්ධයක් වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනා වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට, කුපිත නොකොට, පණ්ඩිත භික්ෂු තෙමේ වඩන්නේය.

(3) "අදම කෙලෙස් තවන වීර්‍ය්‍යය කළයුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති, ඒ මාරයා සමග ගිවිසුම් කොට, නැවතීමක් නොවන්නේමය.

(4) "මෙසේ වාසය කරන්නාවූ, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යහපත් රාත්‍රියක් ඇති තැනැත්තේයයි ශාන්තවූ බුද්ධමුනි තෙමේ වදාළේයයි යම් ධර්මයක් භාග්‍යවතුන් වහන්සේ සංක්ෂෙප වශයෙන් වදාරා විස්තර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වශයෙන් අර්ථවිභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩමවූ සේක්ද,

**20.** "ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙප වශයෙන් වදාළාවූ විස්තර වශයෙන් අර්ථ විභාග නොකළාවූ මේ ධර්මයාගේ අර්ථ විස්තර වශයෙන් මෙසේ දැනගණිමි. ආයුෂ්මත්නි, නුඹ වහන්සේලා කැමති වන්නාහු නම් භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණ මේ කාරණය නැවත විචාරනු මැනවි. භාග්‍යවතුන් වහන්සේ අපට යම්සේ ප්‍රකාශ කෙරෙද්ද, එය එසේ දරාගත මැනවයි (කීහ.) එකල්හි වනාහි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන්ගේ දේශනාවට විශේෂයෙන් සතුටුව අනුමෝදන්ව හුනස්නෙන් නැගිටියාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට ගියාහුය. ගොස් භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසක හුන්නාහුය. එකත්පසක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අපට යම් ධර්මයක් සංක්ෂෙපයෙන් වදාරා විස්තර වශයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩි සේක්ද.

(1) ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව නොයන්නේය. නොපැමිණියාවූ පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණා වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්ම ගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) වර්තමානවූ යම් ස්කන්ධයක් වේද එය උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදි වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට, කුපිත නොකොට, පණ්ඩිත භික්ෂුතෙම වඩන්නේය.

(3) අදම කෙලෙස් තවන වීර්‍ය්‍ය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති ඒ මාරයා සමග ගිවිසුම්කොට, නැවතීමක් නොවන්නේමය.

(4) මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යහපත් එක් රැයක් ඇත්තේයයි ශාන්තවූ බුද්ධ මුනිතෙමේ වදාළේය (යනුය)

**21.** "ස්වාමීනි, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩමවා නොබෝ වේලාවකින් මෙබඳු සිතෙක් වී. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ ධර්මය වනාහි සංක්ෂෙප වශයෙන් වදාරා විස්තර වශයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩමවූසේක.

(1) "ඉකුත් පඤ්චස්කන්ධය අනුව නොයන්නේය. අනාගත පඤ්චස්කන්ධය ගැන තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් නොපතන්නේය. යම් ස්කන්ධයක් ඉක්මගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) වර්තමානවූ යම් ස්කන්ධයක් වේද එය උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට, කුපිත නොකොට, පණ්ඩිත භික්ෂුතෙම වඩන්නේය.

(3) අදම කෙළෙස් තවන වීර්‍ය්‍ය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති ඒ මාරයා සමග ගිවිසුම්කොට, නැවතීමක් නොවන්නේමය.

(4) මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යහපත් එක් රැයක් ඇත්තේ යයි, ශාන්තවූ බුද්ධ මුනි තෙමේ වදාළේය.

"භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාළවූ විස්තර වශයෙන් අර්ථ විභාග නොකළාවූ මේ ධර්මයාගේ අර්ථ කවරෙක් වනාහි විස්තර වශයෙන් විභාග කරන්නේද යනුයි.

ස්වාමීනි, ඒ අපට වනාහි මෙබඳු සිතෙක්වී. ඇවැත්නි, මේ මහා කාත්‍යායන ස්ථවිරතෙමේ වනාහි ශාස්තෘන් වහන්සේ විසින්ද වර්ණනා කරණ ලද්දේය. නුවණැති සබ්‍රහ්මචාරීන් විසින්ද, ගරු කරණ ලද්දේවේ. ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණ ලද විස්තර වශයෙන් අර්ථ විභාග නොකළ මේ ධර්මයාගේ අර්ථ විස්තර වශයෙන් විභාග කිරීමට සමර්ථ වන්නේය. අපි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ යම් තැනෙක් හිද එහි යන්නෙමු. ගොස් ආයුෂ්මත් මහාකත්‍යායන ස්ථවිරයන් වහන්සේගෙන් මේ කාරණය විචාරන්නෙමු නම් යෙහෙකැයි කියායි.

**22.** "ස්වාමීනි, එකල්හි වනාහි අපි ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරතෙමේ යම් තැනෙක්හිද, එතැනට ගියෙමු. ගොස් ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ ගෙන් මේ කාරණය ඇසීමු. ස්වාමීනි, ඒ අපට ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන්වහන්සේ විසින් මේ ආකාරයන්ගෙන් මේ පදයන්ගෙන් මේ ව්‍යඤ්ජනයන්ගෙන් අර්ථ විභාගකොට ප්‍රකාශකරණ ලද්දේයයි සැලකළාහුය."

"මහණෙනි, මහා කාත්‍යායනතෙමේ පණ්ඩිතයෙකි. මහණෙනි, මහාකත්‍යායනතෙමේ මහත් ප්‍රඥා ඇත්තෙකි. මහණෙනි, තෙපි මා අතින්ද මේ කාරණය විචාළාහු නම් මමද එය මහාකාත්‍යයනයන් විසින් යම් පරිද්දෙකින් ප්‍රකාශකරණ ලද්දේ නම් ඒ ආකාරයෙන්ම ප්‍රකාශ කරමි. ඒ අර්ථය එසේමය. එසේම එය දරා ගනිව්යයි වදාළේය."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. සතුටු සිත් ඇති එහි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තාහුය.

**මහා කච්චායන භද්දෙකරත්ත සූත්‍රය නිමි. (4-3)**

---

## 34. ලොමසකඞ්ගිය භද්දෙකරත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක.

එකල්හි වනාහි ආයුෂ්මත් "ලොමසකඞ්ගිය" ස්ථවිරතෙම ශාක්‍ය ජනපදයන්හි කපිලවස්තු පුරයෙහිවූ නිග්‍රොධාරාමයෙහි වාසය කෙරෙයි. එකල්හි චන්දන නම් දිව්‍යපුත්‍ර තෙම මධ්‍යම රාත්‍රියෙහි බබළන ශරීර වර්ණයෙන් යුක්තව සියලු නිග්‍රොධරාමය ආලොක කොට ආයුෂ්මත් ලොමසකඞ්ගිය ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, එක් පසෙක සිටියේය. එක් පසෙක සිටියාවූ චන්දන දිව්‍යපුත්‍ර තෙම ආයුෂ්මත් ලොමසකඞ්ගිය ස්ථවිරයන්ට මෙසේ කීයේය.

2. "භික්ෂූන් වහන්ස, නුඹවහන්සේ භද්දෙකරත්ත නම්, ධර්මයාගේ උදෙසීමද (මාතෘකාවද) විභාගයද (විස්තරයද) දරන්නෙහිද?" යනුය.

"ඇවැත්නි, මම භද්දෙකරත්ත නම් ධර්මයාගේ මාතෘකාවද විස්තරයද නොදරමි. ඇවැත්නි, නුඹ වනාහි භද්දෙකරත්ත නම් ධර්මයාගේ මාතෘකාවද විස්තරයද දරන්නෙහිද?

"භික්ෂූන්වහන්ස, මමද භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද නොදරමි. භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ වනාහි භද්දෙකරත්ත නම් ගාථා දරන්නෙහිද?

"ඇවැත්නි, මම වනාහි භද්දෙකරත්ත නම් ගාථා නොදරමි. ඇවැත්නි, නුඹ වනාහි භද්දෙකරත්ත නම් ගාථා දරන්නෙහිද?"

"භික්ෂූන්වහන්ස, මම වනාහි භද්දෙකරත්ත නම් ගාථා දරමියි කීය. ඇවැත්නි, නුඹ වනාහි කෙසේ නම් භද්දෙකරත්ත ගාථා දරන්නෙහිදැ?"යි ඇසී.

3. "භික්ෂූන්වහන්ස, එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ තව්තිසා දෙවියන් අතර පරසතු ගසමුල පඬු'ඹුල් සලස්නෙහි

(පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි) වැඩ වාසය කරණසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තව්තිසා වැසි දෙවියන්ට භද්දෙකරත්ත නම් ධර්මයාගේ මාතෘකාවද විස්තරයද වදාළසේක.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් නොයන්නේය. අනාගතවූ පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන්ගේවශයෙන් නොපතන්නේය. යම් ස්කන්ධයක් ඉක්මගියේද, එය ප්‍රහීණ විය. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "ප්‍රත්‍යුත්පන්නවූ යම් ස්කන්ධයක් වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යාදි වශයෙන් බලන්නේය. නුවණැති පුද්ගල තෙමේ නොවිසිරෙන්නාවූ නොකිපෙන්නාවූ ඒ විදර්ශනා ඥානය වඩන්නේය.

(3) "කෙලෙස් තවන වීර්‍ය්‍යය වැඩිය යුතුයි මරණය අද හෙටම පැමිණේදැයි කවරෙක් දන්නේද? ඒ මහා සේනාවක් ඇති මරුවා සමග අපගේ ගිවිසුමක් නැත්තේය. රෑ දාවල් අනලස්ව වීර්‍ය්‍යය ඇතිව මෙසේ වාසය කරන්නාවූ ඔහු ඒකාන්තයෙන් ශාන්තවූ සර්වඥ මුනිතෙම භද්දෙකරත්තයයි කියන්නේය" (යනුවෙනි.)

"භික්ෂූන් වහන්ස, මම වනාහි මෙසේ භද්දෙකරත්ත ගාථාවන් දරමි. භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද, විස්තරයද, ඉගෙණගනු මැනවි. භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද පුරුදු කරනු මැනවි. භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද දරණු මැනවි. භික්ෂූන් වහන්ස, භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද අර්ථයෙන් යුක්තය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවේ ආදිය වන්නේයයි" මෙසේ චන්දන නම් දිව්‍යපුත්‍ර තෙම කීයේය. මෙසේ කියා එහිම අතුරුදහන්වූයේය.

4. "ඉක්බිති ආයුෂ්මත් ලොමසකඞ්ගිය ස්ථවිරතෙම ඒ රාත්‍රියගේ ඇවෑමෙන් සේනාසනය තැන්පත්කොට පාත්‍රසිවුරු

ගෙණ සැවැත් නුවර යම් තැනකද, එතැන්හි චාරිකා පිණිස ගියේය. පිළිවෙළින් ගමන් කරන්නේ සැවැත් නුවර යම් තැනකද, ජේතවනය යම් තැනකද, අනේපිඩු මහ සිටුහුගේ ආරාමය යම් තැනකද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසක හුන්නේය. එක් පසක හුන්නාවූ ආයුෂ්මත් ලොමසකඞ්ගිය ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

5. "ස්වාමීනි, මම එක් කලෙක්හි ශාක්‍ය ජනපදයන්හි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වාසය කරමි. ස්වාමීනි, එකල්හි එක්තරා දිව්‍යපුත්‍රයෙක් මධ්‍යම රාත්‍රියෙහි බබළන වර්ණයෙන් යුක්තව නිග්‍රොධාරාමය හාත්පස බබුළුවා මම යම් යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, එක්පසක සිටියේය. ස්වාමීනි, එක් පසක සිටියාවූ ඒ දිව්‍යපුත්‍ර තෙම මට මෙසේ කීයේය. 'භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද දරන්නෙහිද? යනුයි. මෙසේ කී කල්හි, ස්වාමීනි, මම ඒ දිව්‍යපුත්‍රයාට, 'ඇවැත්නි, මම වනාහි භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද නොදරමියි, කියෙමි. 'ඇවැත්නි, නුඹ වනාහි භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද දරන්නෙහි දැයි, මම ඇසීමි. 'භික්ෂූන්වහන්ස, මමද භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද නොදරමියි, කීය. භික්ෂූන් වහන්ස, නුඹවහන්සේ වනාහි භද්දෙකරත්ත නම් ගාථාවන් දරන්නෙහිදැයි, දිව්‍යපුත්‍ර තෙම ඇසීය.

"ඇවැත්නි, මම වනාහි භද්දෙකරත්ත නම් ගාථාවන් නොදරමියි, කීයෙමි. 'ඇවැත්නි, නුඹ වනාහි භද්දෙකරත්ත නම් ගාථාවන් දරන්නෙහිදැයි, ඇසීමි. 'භික්ෂූන්වහන්ස, මම වනාහි භද්දෙකරත්ත නම් ගාථාවන් දරමියි කීය. 'ඇවැත්නි, නුඹ වනාහි කෙසේ නම්, භද්දෙකරත්ත නම් ගාථාවන් දරන්නෙහිදැයි, ඇසීමි.

'භික්ෂූන් වහන්ස, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ තව්තිසා වැසි දෙවියන් අතර පරසතු ගසමුල පඬු'ඹුල් සලස්නෙහි වාසය කරණසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ

තව්තිසා වැසි දෙවියන්ට භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද වදාළසේක.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව ගමන් නොකරන්නේය. නොපැමිණියාවූ පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණා වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්මගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක්වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට, කුපිත නොකොට, පණ්ඩිත භික්ෂුතෙමේ වඩන්නේය.

(3) "අදම කෙලෙස් තවන වීර්‍ය්‍යය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනා ඇති, ඒ මාරයා සමග ගිවිසුම්කොට, නැවතීමක් නොවන්නේමය.

(4) මෙසේ වාසය කරන්නාවූ, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඒ ඒකාන්තයෙන් භද්දෙකරත්තයයි ශාන්තවූ සර්වඥ මුනි තෙම ප්‍රකාශ කෙරේය යනුවෙනි.

භික්ෂූන් වහන්ස, මෙසේ වනාහි මම භද්දෙකරත්ත ගාථාවන් දරමි. භික්ෂූන්වහන්ස, නුඹවහන්සේ භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද උගනු මැනව. භික්ෂූන් වහන්ස, නුඹවහන්සේ භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද පුරුදු කරනු මැනව. භික්ෂූන් වහන්ස, නුඹ වහන්සේ භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද දරණු මැනව. භික්ෂූන්වහන්ස, භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද අර්ථයෙන් යුක්තය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වේයයි කීය. ස්වාමීනි, ඒ දිව්‍යපුත්‍රතෙම මෙසේ කියා එහිම අතුරුදහන් වූයේය.

**5.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට භද්දෙකරත්ත ධර්මයාගේ මාතෘකාවද විස්තරයද දෙශනා කරන්නේ නම්

මැනවැයි" කීය. "මහණ, නුඹ ඒ දිව්‍යපුත්‍රයා කවරෙක්දැයි දන්නෙහිදැයි, ඇසුහ. "ස්වාමීනි, මම ඒ දිව්‍යපුත්‍රයා නොදනිමියි" කීය. "මහණ, මේ චන්දන නම් දිව්‍යපුත්‍රයාවෙයි. මහණ, චන්දන දිවපුත්‍ර තෙම කැමැත්ත ඇතුව සිත්හි කොට සියල්ල සිතට එලවා යොමුකරණලද කන් ඇතිව ධර්මය අසයි. මහණ, එසේවී නම් අසව. යහපත්කොට මෙනෙහි කරව, කියන්නෙමියි" වදාළේය. "එසේය, ස්වාමීන් වහන්සැයි," ආයුෂ්මත් ලොමසකඞ්ගිය ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය.

**6.** භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව ගමන් නොකරන්නේය. අනාගතවූ පඤ්චස්කන්ධය නොපතන්නේය. යම් ස්කන්ධයක් ඉක්මගියේද, එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිත නොකොට, පණ්ඩිත භික්ෂුතෙමේ වඩන්නේය.

(3) "අදම කෙළෙස් තවන වීය්‍ය්‍ය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති, ඒ මාරයා සමග ගිවිසුම්කොට නැවතීමක් නොවන්නේමය.

(4) "මෙසේ වාසය කරන්නාවූ, කෙළෙස් තවන වීය්‍ය්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඔහු ඒකාන්තයෙන් යහපත්වූ රාත්‍රියක් ඇති භික්ෂුවයයි ශාන්තවූ සර්වඥ මුනි තෙම ප්‍රකාශ කෙරේ.

**7.** "මහණ, කෙසේ නම් ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව යේද, ඉකුත් කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වීමියි, එය අනුව

තෘෂ්ණාව පවත්වයි. මෙබඳු වේදනා ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව පවත්වයි. මෙබඳු සංඥා ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව පවත්වයි. මෙබඳු සංස්කාර ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව පවත්වයි. ඉකුත් කාලයෙහි මෙබඳු විඥානය ඇත්තෙක් වීමියි, එය අනුව තෘෂ්ණාව පවත්වයි, මහණ, මෙසේ වනාහි අතීත පඤ්චස්කන්ධය අනුව යයි.

8. "මහණ, කෙසේ නම් අතීතවූ පඤ්චස්කන්ධය අනුව නොයාද? ඉකුත්වූ කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව නොපවත්වයි. මෙබඳු වේදනා ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව නොපවත්වයි. මෙබඳු සංඥා ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව නොපවත්වයි. මෙබඳු සංස්කාර ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව නොපවත්වයි. ඉකුත්වූ කාලයෙහි මෙබඳු විඤ්ඤාණ ඇත්තෙක් වීමියි එය අනුව තෘෂ්ණාව නොපවත්වයි. මහණ, මෙසේ වනාහි අතීත පඤ්චස්කන්ධය අනුව නොයයි.

9. "මහණ, කෙසේ නම් අනාගතවූ පඤ්චස්කන්ධය ප්‍රාර්ථනා කෙරේද, අනාගත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වයි. මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙමියි, එහි තෘෂ්ණාව පවත්වයි. මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වයි. මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වයි. අනාගත කාලයෙහි මෙබඳු විඤ්ඤාණ ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව පවත්වයි. මහණ, මෙසේ වනාහි අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණාවෙන් බලාපොරොත්තු වන්නේය.

10. "මහණ, කෙසේ නම් අනාගත පඤ්චස්කන්ධය බලාපොරොත්තු නොවේද, අනාගත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වයි. මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වයි. මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වයි. මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමියි එහි

තෘෂ්ණාව නොපවත්වයි. අනාගත කාලයෙහි මෙබඳු විඥ්ඥාණ ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාව නොපවත්වයි. මහණ මෙසේ වනාහි අනාගත පඤ්චස්කන්ධය බලාපොරොත්තු නොවෙයි.

11. "මහණ, කෙසේ නම් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයන්හි (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) ඇදගැණීම වේද, මහණ, මේ ශාසනයෙහි අශ්‍රැතවත්වූ පෘථග්ජන තෙම ආර්‍ය්‍යයන් නොදක්නේ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ නොවූයේ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනේ සත්පුරුෂයන් නොදක්නේ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූයේ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනේ රූපය තමා වශයෙන් දකී. තමා රූපය ඇත්තෙකැයි කියා හෝ දකියි. රූපය තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකියි. රූපය කෙරෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. වේදනාව තමා වශයෙන් දකියි. තමා වේදනාව ඇත්තෙකැයි කියා හෝ දකියි. වේදනාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකියි. තමා වේදනාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකියි. සංඥාව තමා වශයෙන් දකියි. තමා සංඥාව ඇත්තෙකැයි කියා හෝ දකියි. සංඥාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකියි. තමා සංඥාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකියි. සංස්කාරයන් තමා වශයෙන් දකියි. තමා සංස්කාර ඇත්තෙකැයි කියා හෝ දකියි. සංස්කාර තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ දකියි. විඥ්ඥාණය තමා වශයෙන් දකියි. තමා විඥ්ඥාණය ඇත්තෙකැයි කියා හෝ දකියි. තමා කෙරෙහි විඥ්ඥාණය ඇත්තේයයි කියා හෝ දකියි. විඥ්ඥාණය කෙරෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. මහණ, මෙසේ වනාහි ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයන්හි ඇදගැනීම වේ.

12. "මහණ, කෙසේ නම් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයන්හි ඇදගැනීම නොවේද, මහණ, මේ ශාසනයෙහි ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යයන් දක්නාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහිද දක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුනාවූ, සත්පුරුෂයන් දක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ,

සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූපය තමා වශයෙන් නොදකියි. තමා රූපය ඇත්තෙකැයි හෝ (නොදකියි.) තමා කෙරෙහි රූපය ඇත්තේයයි කියා හෝ නොදකියි. රූපය කෙරෙහි තමා ඇත්තේයයි කියා හෝ නොදකියි. වේදනාව තමා වශයෙන් නොදකියි. තමා වේදනාව ඇත්තෙකැයි කියා හෝ නොදකියි. වේදනාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකියි. තමා වේදනාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකියි. සංඥාව තමා වශයෙන් නොදකියි. තමා සංඥාව ඇත්තෙකැයි කියා හෝ නොදකියි සංඥාව තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකියි. තමා සංඥාව කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකියි. සංස්කාරයන් තමා වශයෙන් නොදකියි. තමා සංස්කාර ඇත්තෙකැයි කියා හෝ නොදකියි. සංස්කාර තමා කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකියි. තමා සංස්කාර කෙරෙහි ඇත්තේයයි කියා හෝ නොදකියි. විඥ්ඥාණය තමා වශයෙන් නොදකියි. තමා විඥ්ඥාණය ඇත්තෙකැයි කියා හෝ නොදකියි. තමා කෙරෙහි විඥ්ඥාණය ඇත්තේයයි කියා හෝ නොදකියි. විඥ්ඥාණය කෙරෙහි තමා ඇත්තේයයි කියා නොදකියි. මහණ, මෙසේ වනාහි ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ඇදගැණීම නොකෙරේ.

(1) "ඉකුත්වූ පඤ්චස්කන්ධය අනුව ගමන් නොකරන්නේය. එහි තෘෂ්ණාව නොපවත්නේය. නොපැමිණියාවූ පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණා වශයෙන් ප්‍රාර්ථනා නොකරන්නේය. යම් ස්කන්ධයක් ඉක්මගියේද එය ප්‍රහීණවූයේ වෙයි. යම් ස්කන්ධයක් අනාගතද එය නොපැමිණියේය.

(2) "වර්තමානවූ යම් ස්කන්ධයක් වේද, එය ඒ උපන් උපන් තන්හි අනිත්‍යානුපස්සනාදී වශයෙන් විදර්ශනා වඩන්නේය. ඒ විදර්ශනාව රාගාදීන්ගෙන් විසිරීමක් නොකොට කුපිත නොකොට, පණ්ඩිත භික්ෂු තෙමේ වඩන්නේය.

(3) "අදම කෙලෙස් තවන වීර්‍යය කළ යුත්තේය. හෙට මරණය සිදුවේදැයි කවරෙක් දන්නේද, මහා සේනාවක් ඇති, ඒ මාරයා සමග ගිවිසුම්කොට, නැවතීමක් නොවන්නේමය.

(4) "මෙසේ වාසය කරන්නාවූ, කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්තවූ, රෑ දාවල් දෙක්හි අනලස්වූ, ඔහු ඒකාන්තයෙන් භද්දෙකරත්තයයි, ශාන්තවූ සර්වඥ මුනි තෙම ප්‍රකාශ කෙරේයයි, භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

සතුටු සිත් ඇත්තාවූ ආයුෂ්මත් ලොමසකඞ්ගිය ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේයි.

**සතරවැනිවූ ලොමසකඞ්ගිය භද්දෙකරත්ත සූත්‍රය නිමි. (4-4)**

---

## 35. චූලකම්ම විභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි තොදෙය්‍ය බ්‍රහ්මණයාගේ පුත්‍රවූ සුභ නම් මානවක තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථා කොට නිමවා, එක් පසක හුන්නේය. එක් පසක හුන්නාවූම තොදෙය්‍ය පුත්‍රවූ සුභ නම් මානවක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

2. "භවත් ගෞතමයන් වහන්ස, යම්හෙයකින් මිනිස්ව උපන්නාවූ මනුෂ්‍යයන්ගේම උස් පහත් කම් දක්නා ලැබෙත්ද, එයට හේතු කවරේද? එයට කරුණු කවරේද? භවත් ගෞතමයන් වහන්ස, ස්වල්ප ආයුෂ ඇත්තාවූ මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. දීර්ඝායුෂ ඇත්තාවූ මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. බොහෝ

රෝගාබාධ ඇති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. ස්වල්ප රෝගාබාධ ඇති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. අවලක්ෂණ මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. ලක්ෂණ මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. ස්වල්ප පිරිස් ඇත්තාවූ මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. බොහෝ පිරිස් ඇත්තාවූ මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. ස්වල්ප සම්පත් ඇති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. බොහෝ සම්පත් ඇති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. පහත් කුල ඇති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. උසස් කුල ඇති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. නුවණැති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. නුවණ නැති මනුෂ්‍යයෝ දක්නා ලැබෙත්. භවත් ගෞතමයන් වහන්ස, යම්හෙයකින් මිනිස්ව උපන්නාවූ මනුෂ්‍යයන්ගේම මෙසේ උස් පහත් කම් බැව් දක්නා ලැබෙත්ද, ඊට හේතු කවරේද, කරුණු කවරේද” යනුයි.

3. “මානවකය, සත්වයෝ කර්මයම තමා අයත් දෙය කොට ඇත්තාහ. කර්මය දායාදය (වස්තුව) කොට ඇත්තාහ. කර්මයම කාරණය කොට ඇත්තාහ. කර්මයම නෑයන් කොට ඇත්තාහ. කර්මය පිළිසරණ කොට ඇත්තාහ. කර්මය ඒ මේ උස් පහත් බැව් පිණිස සත්වයන් බෙදන්නේය.”

4. “මම, භවත් ගෞතමයන් වහන්සේ විසින් කොටින් කියන ලද විස්තර වශයෙන් අර්ථ බෙදා නොදක්වන ලද මේ ධර්මයාගේ අර්ථය විස්තර වශයෙන් නොදනිමි. යම්සේ මම භවත් ගෞතමයන් වහන්සේ විසින් කොටින් කියන ලද විස්තර වශයෙන් අර්ථ බෙදා නොදක්වන ලද ධර්මයාගේ, අර්ථය විස්තර වශයෙන් දැන ගන්නෙම්ද, එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ මට දෙශනා කළහොත් මැනවැයි” කීය.

5. “මානවකය, එසේ වීනම් අසව, යහපත්කොට මෙනෙහි කරව, කියන්නෙමියි” (වදාළේය.) “එසේය, පින්වතුන් වහන්සැයි” කියා, තොදෙය්‍ය පුත්‍රවූ සුභ නම් මානවක තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

“මානවකය, මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ රෞද්‍රවූයේ ලේ තැවරුණු අත් ඇත්තේ

නැසීමෙහි වැනසීමෙහි යෙදුනේ, සියලු ප්‍රාණීන් කෙරෙහි කරුණා නැති බවට පැමිණියේ සතුන් මරන්නේ වේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ මෙසේ සමාදන්වූ, ඒ මේ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට ස්ථානවූ නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට ස්ථානවූ නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි නූපදීද, ඉදින් මිනිසත් බවට පැමිණේද, යම් යම් තැනක පසුව උපදීද, ස්වල්ප ආයුෂ ඇත්තෙක් වෙයි. මානවකය, රෞද්‍රවූයේ ලේ තැවරුණු අත් ඇත්තේ සතුන් නැසීමෙහි වැනසීමෙහි යෙදුනේ සියලු ප්‍රාණීන් කෙරෙහි කරුණාවක් නැති බවට පැමිණියේ සතුන් මරන්නේ වේනම්, මේ පැවැත්ම අල්පායුෂ බව පිණිස පවත්නේ වෙයි.

6 "මානවකය, මේ ලොකයෙහි වනාහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළකුනේ වේද, බහා තබන ලද දඬු මුගුරු ඇත්තේ බහා තබන ලද ආයුධ ඇත්තේ, ලජ්ජා ඇත්තේ, කරුණාවට පැමිණියේ, සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ වාසය කෙරේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කරණ ලද මෙසේ සමාදන් වන ලද ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති සැපයෙන් යුක්තවූ දිව්‍යලොකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියවූ දිව්‍යලොකයෙහි නූපදීද, ඉදින් මිනිසත් බවට පැමිණේද, යම් යම් තැනෙක්හි පසුව උපදීද, දීර්ඝායුෂ ඇත්තේ වේ. මානවකය, ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළකුනේ බහා තබනලද දඬු ඇත්තේ බහා තබනලද ආයුධ ඇත්තේ ලජ්ජා ඇත්තේ දයාවට පැමිණියේ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කෙරේ නම් මේ පැවැත්ම දීර්ඝායුෂ පිණිස පවත්නේ වෙයි.

7. "මානවකය, මේ ලොකයෙහි වනාහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අතින් හෝ කැටකින් හෝ දණ්ඩෙන්

හෝ ආයුධයෙන් හෝ සතුන්ට හිංසා කරණ ස්වභාව ඇත්තේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කරණ ලද මෙසේ සමාදන්වන ලද ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුකෙන් යුක්තවූ නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුකින් යුක්තවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම් යම් යම් තැනක පසුව උපදීද, බොහෝ රෝග ඇත්තේ වෙයි. මානවකය, සත්වයන්ට අතින් හෝ කැටින් හෝ දඬුයෙන් හෝ ආයුධයෙන් හෝ හිංසා කරණ ස්වභාව ඇත්තේ වෙයි නම්, මේ පැවැත්ම බොහෝ රෝග සහිත වීම පිණිස පවත්නේය.

8. "මානවකය, මේ ලෝකයෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ සතුන්ට අතින් හෝ කැටකින් හෝ දණ්ඩෙන් හෝ ආයුධයෙන් හෝ හිංසා නොකරණ ස්වභාව ඇත්තේ වේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ මෙසේ සමාදන්වූ ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි නූපදීනම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම් යම් යම් තැනක පසුව උපදීද, ස්වල්ප රෝග ඇත්තේ වේ. මානවකය, සතුන්ට අතින් හෝ කැටයෙන් හෝ දණ්ඩෙන් හෝ ශස්ත්‍රයෙන් හෝ හිංසා නොකරණ ස්වභාව ඇත්තේ නම් මේ පැවැත්ම අඩු රෝග ඇති බව පිණිස පවත්නේය.

9. "මානවකය, මේ ලෝකයෙහි වනාහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ද්වෙෂය බහුලකොට ඇත්තේ කිපෙන සුළු වේද, සුලු දෙයක් කියන ලදුවත් ගැටේද, කිපේද, විරුද්ධ බවට පැමිණේද, කෝපයත් ද්වෙෂයත් නොසතුටු බවත් පහළ කෙරේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ මෙසේ සමාදන්වූ, ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ, දුකට ස්ථානවූ නොකැමැත්තෙන් වැටෙන්නාවූ, නිරයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ භේදයෙන්

මරණින් මතු සැප නැත්තාවූ, දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ, නිරයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම්, යම් යම් තැනක පසුව උපදීද, ඒ කර්මය හේතුකොටගෙන අවලක්ෂණ වූවෙක් වේ. මානවකය, කිපෙන සුළුවූයේ ද්වෙෂය බහුල කොට ඇත්තේ වේද, ස්වල්ප දෙයක් කියනලදුවත් ගැටේද, කිපේද, විරුද්ධ බවට පැමිණේද, නොසතුටු වේද, කෝපයත්, ද්වෙෂයත්, නොසතුටත් ප්‍රකාශ කෙරේ නම් මේ පැවැත්ම අවලක්ෂණවීම පිණිස පවත්නේය.

10. "මානවකය, මේ ලොකයෙහි වනාහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ද්වෙෂය බහුලකොට නැත්තේ, නොකිපෙන ස්වභාව ඇත්තේ වේද, බොහෝ දෙයක් කියන ලදුවද නොගැටේද, නොකිපේද, විරුද්ධ බවට නොපැමිණේද, නොසතුටට නොපැමිණේද, කෝපයත් ද්වෙෂයත් නොසතුටු බවත් පහළ නොකෙරේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ මෙසේ සමාදන්වූ ඒ කර්මය හේතුකොට ගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම් යම් යම් තැනක පසුව උපදීද, ප්‍රසාදය එළවන ලක්ෂණ වූවෙක් වෙයි. මානවකය, නොකිපෙන ස්වභාව ඇත්තේ ද්වෙෂය බහුල කොට නැත්තේ වේද, බොහෝ කොට කියන ලදුවත් නොගැටේද, නොකිපේද විරුද්ධ බවට නොපැමිණේද, නොසතුටට නොපැමිණේද, කෝපයත් ද්වෙෂයත් නොසතුටත් පහළ නොකෙරේ නම් මේ පැවැත්ම ලක්ෂණ වීම පිණිස පවත්නේය.

11. "මානවකය, මේ ලෝකයෙහි වනාහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඊර්ෂ්‍යා සහගත සිත් ඇත්තේ වේද, අනුන්ගේ ලැබීමය, සත්කාරය, ගරුකිරීමය, බුහුමන් කිරීමය, වැඳීමය, පිදීමය යන මොවුන් කෙරෙහි ඊර්ෂ්‍යා කෙරේද, ඊර්ෂ්‍යාවෙන් කිපෙයිද, ඊර්ෂ්‍යාව බැඳගනීද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ මෙසේ සමාදන්වූ, ඒ කර්මය හේතු කොටගෙන ශරීරයාගේ බිඳීමෙන්

මරණින් මත්තෙහි සැප නැත්තාවූ, දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සැප නැත්තාවූ, දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම්, යම් යම් තැනක පසුව උපදීද, අල්පෙශාක්‍ය (මද පිරිවර ඇත්තේ) වෙයි. මානවකය, ඊර්ෂ්‍යා සහගත සිත් ඇත්තේද, අනුන්ගේ ලාභයෙහි, සත්කාරයෙහි, ගරුකාරයෙහි, බුහුමන් කිරීමෙහි, වැඳීමෙහි සහ පිදීමෙහි, ඊර්ෂ්‍යා නොකෙරේද, ඊර්ෂ්‍යාවෙන් ක්‍රොධ නොකෙරේද, ඊර්ෂ්‍යාව බැඳගනියි නම්, මේ පැවැත්ම අල්පෙශාක්‍ය වීම පිණිස පවත්නේය.

12. "මානවකය, මේ ලෝකයෙහි වනාහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඊර්ෂ්‍යා සහගත සිත් ඇත්තේ නොවේද, අනුන්ගේ ලාභය, සත්කාරය, ගෞරව කිරීමය, බුහුමන් කිරීමය, වැඳීමය, පිදීමය යන මොවුන් කෙරෙහි ඊර්ෂ්‍යා නොකෙරේද, ඊර්ෂ්‍යාවෙන් නොකිපේද, ඊර්ෂ්‍යාව නොබැඳ ගනීද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ, මෙසේ සමාදන්වූ, ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලොකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම් යම් යම් තැනක පසුව උපදීද, මහෙශාක්‍ය වේ. (බොහෝ පිරිවර ඇත්තේ) වේ. මානවකය, ඊර්ෂ්‍යා සහගත සිත් ඇත්තේ නොවෙයි නම්, අනුන්ගේ ලාභය, සත්කාරය, ගරු කිරීමය, බුහුමන් කිරීමය, වැඳීමය, පිදීමය යන මොවුන් කෙරෙහි ඊර්ෂ්‍යා නොකෙරේ නම්, ඊර්ෂ්‍යාවෙන් නොකිපේ නම්, ඊර්ෂ්‍යාව නොබැඳ ගනියි නම් මේ පැවැත්ම මහෙශාක්‍ය වීම පිණිස පවත්නේය.

13. "මානවකය, මේ ලෝකයෙහි වනාහි, ඇතැම් ස්ත්‍රීයක් හෝ පුරුෂයෙක් හෝ ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාරය, පානවර්ගය, වස්ත්‍රය, යානය, මල්ගඳ විලවුන්ය, සයනය, ආවාසය, පහන්ය යන මෙය, නොදෙන්නේ වේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ, මෙසේ සමාදන්වූ, ඒ කර්මය

හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ, දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සැප නැත්තාවූ, දුකට ස්ථානවූ නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම්, යම් යම් තැනක පසුව උපදීද, ස්වල්ප සම්පත් ඇත්තේ වේ. මානවකය, ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය මල්ගඳ විලවුන්ය, සයනය, ආවාසය, පහන්ය යන මෙය නොදෙන්නේ නම් මේ පැවැත්ම ස්වල්ප සම්පත් ඇතිවීම පිණිස පවත්නේය.

14. "මානවකය, මේ ලෝකයෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල්ගඳවිලවුන්ය, සයනය, ආවාසය, පහන්ය, යන මෙය දෙන්නේ වේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ, මෙසේ සමාදන්වූ, ඒ කර්මය හේතු කොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණෙත් නම් යම් යම් තැනක පසුව උපදීද, මහත් සම්පත් ඇත්තේ වේ. මානවකය, ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාරය, පානය, වස්ත්‍රය, යානය, මල්ගඳවිලවුන්ය, සයනය, ආවාසය, පහන්ය යන මෙය, දෙන්නේ වේ නම් මේ පැවැත්ම බොහෝ සම්පත් ඇතිවීම පිණිස පවත්නේය.

15. "මානවකය, මේ ලෝකයෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තදවූයේ අධික මානය ඇත්තේ වේද, වැඳිය යුත්තාට නොවඳීද, දැක හුනස්නෙන් නැගිටිය යුත්තාට නොනැගිටියිද, ආසනය දියයුත්තාට ආසනය නොදේද, මාර්ගය දියයුත්තාට මාර්ගය නොදේද, සත්කාර කළයුත්තාට සත්කාර නොකෙරේද, ගෞරව කළ යුත්තාට ගෞරව නොකෙරේද, බුහුමන් කළ යුත්තාට බුහුමන් නොකෙරේද, පිදිය යුත්තාට

නොපුදාද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම්, යම් යම් තැනක පසුව උපදීද, මෙසේ සමාදන්වූ, ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපනැත්තාවූ, දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ, නිරයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සැප නැත්තාවූ, දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ නිරයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම්, යම් යම් තැනක පසුව උපදීද. හීනකුල ඇත්තෙක් වේ.

"මානවකය, තදසිත් ඇත්තේ අධික මාන ඇත්තේ වැඳිය යුත්තාට නොවඳියි නම් දැක හුනස්නෙන් නැගිටිය යුත්තාට නොනැගිටියි නම්, ආසනය දිය යුත්තාට ආසනය නොදෙයි නම්, මාර්ගය දියයුත්තාට මාර්ගය නොදෙයි නම්, සත්කාර කළයුත්තාට සත්කාර නොකරයි නම්, ගෞරව කළ යුත්තාට ගෞරව නොකරයි නම්, බුහුමන් කළ යුත්තාට බුහුමන් නොකරයි නම්, පිදිය යුත්තාට නොපුදයි නම්, මේ පැවැත්ම හීන කුල ඇති බව පිණිස පවත්නේ වෙයි.

**16.** "මානවකය මේ ලෝකයෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තද සිත් නැත්තේ අධික මාන නැත්තේ වේද, වැඳිය යුත්තාට වඳීද, දැක හුනස්නෙන් නැගිටිය යුත්තාට නැගිටීද, ආසනය දියයුත්තාට ආසනය දෙයිද, මාර්ගය දිය යුත්තාට මාර්ගය දේද, සත්කාර කළ යුත්තාට සත්කාර කෙරේද, ගෞරව කළ යුත්තාට ගෞරව කෙරේද, බුහුමන් කළ යුත්තාට බුහුමන් කෙරේද, පිදිය යුත්තාට පුදාද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි නූපදීනම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම් යම් යම් තැනක පසුව උපදීද, උසස් කුල ඇත්තෙක්වේ.

මාණවකය, තද සිත් නැත්තේ අධික මානය නැත්තේ වැඳිය යුත්තාට වඳියි නම් දැක හුනස්නෙන් නැගිටිය යුත්තාට නැගිටීයි නම් ආසනය දිය යුත්තාට ආසනය දෙයි නම්, මාර්ගය දියයුත්තාට මාර්ගය දෙයි නම්, සත්කාර කළ යුත්තාට සත්කාර කරයි නම්, ගෞරව කළ යුත්තාට ගෞරව කරයි නම්, බුහුමන් කළ යුත්තාට බුහුමන් කරයි නම්, පිදිය යුත්තාට පුදායයි නම්, මේ පැවැත්ම උසස් කුල ඇති බව පිණිස පවත්නේය.

17. "මාණවකය, මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ වෙත පැමිණ, 'ස්වාමීනි, කුසල් කවරේද, අකුසල් කවරේද, වරද සහිත දෙය කවරේද, වරද රහිත දෙය කවරේද, සේවනය කටයුත්ත කවරේද, සේවනය නොකටයුත්ත කවරේද, කරනු ලබන්නාවූ කවර දෙයක් මට බොහෝ කලක් අවැඩ පිණිස දුක් පිණිස වේද, කරනු ලබන්නාවූ කිනම් දෙයක් මට බොහෝ කලක් වැඩ පිණිස සැප පිණිස වේදැ' යි නොඅසන්නේ වේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ, මෙසේ සමාදන්වූ, ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍ය ලෝකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍ය ලෝකයෙහි නූපදීනම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම් යම් යම් තැනක පසුව උපදීද, මෙසේ සමාදන්වූ, ඒ කර්මය හේතු කොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ, දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ, නිරයෙහි උපදියි. ඉදින් ශරීරයගේ භේදයෙන් මරණින් මතු සැප නැත්තාවූ දුකට ස්ථානවූ, නොකැමැත්තෙන් වැටෙන්නාවූ, නිරයෙහි නූපදී නම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම්, යම් යම් තැනක පසුව උපදීද, අඥානයෙක් වෙයි.

මාණවකය, ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ වෙත පැමිණ, ස්වාමීනි, කුසල් කවරක්ද? අකුසල් කවරක්ද? වරද සහිත දෙය කවරක්ද? වරද රහිත දෙය කවරක්ද? සේවනය කළයුත්ත කවරක්ද? සේවනය නොකළයුත්ත කවරක්ද? කරනු

ලබන්නාවූ කවර දෙයක් මට බොහෝ කලක් අවැඩ පිණිස, දුක් පිණිස වේද? කරනු ලබන්නාවූ කවර නම් දෙයක් හෝ මට බොහෝ කලක් වැඩ පිණිස, සැප පිණිස වේදැයි නොඅසන්නේ වේනම්, මේ පැවැත්ම අඥානවීම පිණිස පවත්නේය.

18. "මානවකය, මේ ලෝකයෙහි වනාහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ වෙත එළඹ, 'ස්වාමීනි, කුසලය කවරක්ද? අකුසලය කවරක්ද? වරද සහිත දෙය කවරක්ද? වරද රහිත දෙය කවරක්ද? සේවය කළ යුත්ත කවරක්ද? සේවය නොකළ යුත්ත කවරක්ද? කරනු ලබන්නාවූ කවරක් මට බොහෝ කලක් අවැඩ පිණිස, දුක් පිණිස වේද? කරනු ලබන්නාවූ කවර දෙයක් මට බොහෝ කලක් වැඩ පිණිස, සැප පිණිස වේදැයි අසන්නේ වේද, හෙතෙම මෙසේ සම්පූර්ණ කළාවූ, මෙසේ සමාදන්වූ ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍ය ලෝකයෙහි උපදියි. ඉදින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍ය ලෝකයෙහි නූපදීනම්, ඉදින් මිනිසත් බවට පැමිණේ නම් යම් යම් තැනක පසුව උපදීද,

මානවකය, ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ වෙතට පැමිණ, 'ස්වාමීනි, කුසල කවරක්ද? අකුසල් කවරක්ද? වරද සහිත දෙය කවරක්ද? වරද රහිත දෙය කවරක්ද? සේවනය කළ යුත්ත කවරක්ද? සේවනය නොකළ යුත්ත කවරක්ද? කරනු ලබන්නාවූ කවරක් මට බොහෝ කලක් අවැඩ පිණිස, දුක් පිණිස වේද? කරනු ලබන්නාවූ කවර දෙයක් හෝ මට බොහෝ කලක් වැඩ පිණිස, සැප පිණිස වේදැයි අසන්නේ වේනම් මේ පැවැත්ම මහත් නුවණැති බව පිණිස පවත්නේය.

19. "මහණෙනි, මේ ලෝකයෙහි ස්වල්ප ආයුෂ පිණිස පවත්නාවූ ප්‍රතිපදාව ස්වල්ප ආයුෂ ඇති බවට පමුණුවයි. දීර්ඝායුෂ පිණිස පවත්නාවූ ප්‍රතිපදාව දීර්ඝායුෂ ඇති බවට පමුණුවයි බොහෝ ආබාධ ඇතිවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව,

බොහෝ ආබාධ ඇති බවට පමුණුවයි. ස්වල්පවූ ආබාධ ඇතිවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව ස්වල්පවූ ආබාධ ඇති බවට පමුණුවයි. අවලක්ෂණවීම පිණිස පවත්නා ප්‍රතිපදාව අවලක්ෂණවීම පමුණුවයි. ලක්ෂණවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව ලක්ෂණ ඇති බවට පමුණුවයි. අල්පෙශාක්‍ය බව පිණිස පවත්නාවූ ප්‍රතිපදාව අල්පෙශාක්‍ය බවට පමුණුවයි. මහෙශාක්‍ය බව පිණිස පවත්නාවූ ප්‍රතිපදාව මහෙශාක්‍ය බවට පමුණුවයි. ස්වල්ප සම්පත් ඇතිවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව ස්වල්පවූ සම්පත් ඇති බවට පමුණුවයි. මහත්වූ සම්පත් ඇතිවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව මහත් සම්පත් ඇති බවට පමුණුවයි. පහත් කුලවල ඉපදීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව පහත් කුල ඇති බවට පමුණුවයි. උසස් කුලවල ඉපදීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව උසස් කුල ඇති බවට පමුණුවයි. අඥානභාවය පිණිස පවත්නාවූ ප්‍රතිපදාව අඥාන බවට පමුණුවයි. මහත්වූ ප්‍රඥාව ඇතිවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව මහත්වූ ප්‍රඥා ඇති බවට පමුණුවයි.

**20.** "මානවකය, සත්වයෝ කර්මය තමන් අයත් දෙය කොට ඇත්තාහ. කර්මය උරුමකොට ඇත්තාහ. කර්මය කාරණයකොට ඇත්තාහ. කර්මය නෑයන්කොට ඇත්තාහ. කර්මය පිහිටකොට ඇත්තාහ. කර්මයතෙම සත්වයන් උස් පහත් කොට බෙදන්නේයයි වදාළේය. මෙසේ වදාළ කල්හි තෝදෙය්‍යපුත්‍රවූ සුභ නම් මානවක තෙම භාග්‍යවතුන් වහන්සේටමෙසේ කීයේය.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් අරින්නේ හෝ වේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. ඒ මම භාග්‍යවත්වූ ගෞතමයන් වහන්සේ සරණ කොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණ කොට යමි.)

භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිම් කොට සරණගියාවූ උපාසකයෙකැයි මා දරණසේක්වා.

**පස්වැනිවූ චූලකර්ම විභංග සූත්‍රය නිමි. (4-5)**

---

## 36. මහාකම්ම විභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරතෙම අරණ්‍ය කුටියෙක්හි වාසය කරයි. එකල්හි පොතලිපුත්ත නම් පරිව්‍රාජක තෙම ජංඝාවිහරණයෙන් (පා ගමනින්) සක්මන් කරන්නේ ගමන් කරන්නේ ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැනට එළඹියේය. එළඹ, ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන් සමග සතුටු වූයේය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේය.

2. එකත්පසෙක හුන්නාවූ "පොතලිපුත්ත" නම් පරිව්‍රාජක තෙම ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන්ට මෙය කීයේය. "ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයෙනි, කාය කර්මය හිස්ය. ඵල රහිතය. වාග් කර්මය හිස්ය, ඵල රහිතය. මනො කර්මයම සත්‍යය යන මෙය මා විසින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගෙන් අසනලදී. උන්වහන්සේගේ හමුවෙහි පිළිගන්නා ලදී. යම් සමාපත්තියකට පැමිණියේ කිසි වේදනාවක් නොවිඳීද, එබඳු සමාපත්තියක් ඇත්තේදැ"යි ඇසීය.

"ඇවැත් පොතලිපුත්‍රය, එසේ නොකියව, ඇවැත් පොතලිපුත්‍රය, එසේ නොකියව, භාග්‍යවතුන් වහන්සේට නින්දා නොකරව. භාග්‍යවතුන් වහන්සේට නින්දා කිරීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ කාය කර්මය හිස්ය, ඵල රහිතය. වචී කර්මය හිස්ය, ඵල රහිතය. මනො කර්මය සත්‍යයයි මෙසේ නොවදාරන්නේය. ඇවැත්නි, යම් සමාපත්තියකට පැමිණියේ කිසි වේදනාවක් නොවිඳීද, එබඳු සමාපත්තියක් ඇත්තේමැයි."

3. "ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයෙනි, ඔබ පැවිදිව කෙතෙක් කල් වූයෙහිදැ"යි (ඇසී.)

"ඇවැත්නි, බොහෝ කල් නොවේ. තුන් අවුරුද්දකැ"යි කීය.

"යම් තැනෙක්හි (යම් සස්නෙක්හි) මෙසේ නවක භික්ෂු තෙම ශාස්තෘන් වහන්සේ ආරක්ෂා කළයුත්තෙකු කොට හඟින්නේ නම් මෙහිදී අපි ස්ථවිර භික්ෂූන් ගැන කුමක් කියන්නෙමුද?

"ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයෙනි, දැන දැන කයින්, වචනයෙන්, සිතින් කර්ම කොට ඒ පුද්ගලතෙමේ කිනම් වේදනාවක් විඳීද?"

"ඇවැත් පොතලිපුත්‍රය, දැන දැන කයින්, වචනයෙන්, සිතින් කර්ම කොට, ඒ පුද්ගල තෙමේ වේදනාව විඳින්නේය."

4. ඉක්බිති පොතලිපුත්‍ර නම් පරිව්‍රාජක තෙම ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන්ගේ කීම නොපිළිගත්තේය. ප්‍රතික්ෂෙපද නොකෙළේය. නොසතුටුවී, ප්‍රතික්ෂෙපද නොකොට හුනස්නෙන් නැගිට ගියේය.

ඉක්බිති ආයුෂ්මත් සමිද්ධි ස්ථවිර තෙම පොතලිපුත්‍ර නම් පරිව්‍රාජකයා බැහැර ගිය නොබෝ වේලාවකින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැනට එළඹියේය. එළඹ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසක හුන්නාවූ ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරතෙම පොතලිපුත්‍ර නම් පරිව්‍රාජකයා සමගවූ කථා සල්ලාපය යම් පමණක්වීද, ඒ සියල්ල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කීයේය. එසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන්ට මෙය කීයේය. "ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයෙනි, මේ කථා පඬුර භාග්‍යවතුන් වහන්සේ දැකීමට ඇත්තේමය. ආයුෂ්මත් සමිද්ධි

ස්ථවිරයෙනි, යමු, භාග්‍යවතුන් වහන්සේ, යම් තැනෙක්හිද එතැනට එළඹෙන්නෙමු. එළඹ, මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැල කරන්නෙමු. යම්සේ අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන්නේද, එසේ එය දරන්නෙමු" යනුය. "ඇවැත්නි, එසේය," ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට පිළිතුරු දුන්නේය.

**5.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන් වහන්සේද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට එළඹියාහුය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසක හුන්නාහුය. එකත්පසක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන් පොතලිපුත්‍ර නම් පරිව්‍රාජකයා සමග කළ කතාබහ යම් පමණක් වීද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැලකෙළේය. එසේ සැලකළ කල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ වදාළේය. 'ආනන්දය, මම පොතලිපුත්‍ර නම් පරිව්‍රාජකයා දුටු බවක්වත් නොදනිමි. මෙබඳු කථා බහක් කෙසේ ඇති වන්නේද? ආනන්දය, මේ සමිද්ධි නම් හිස් පුරුෂයා විසින් පොතලිපුත්‍ර නම් පරිව්‍රාජකයාට බෙදා ප්‍රකාශ කටයුතුවූ ප්‍රශ්නය එක් අංශයකින් ප්‍රකාශ කෙළේය."

**6.** මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් උදායී ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට "ස්වාමීනි, ආයුෂ්මත් සමිද්ධි ස්ථවිරයන් විසින් 'යම්කිසි විඳීමක් වෙයි නම් එය දුකය' යන මෙය සඳහා කියන ලද්දක් විය හැකිය" යි කීය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණය කළසේක. "ආනන්දය, මේ උදායී නම් මොඝ පුරුෂයාගේ නොමඟ යාම නුඹ, බලව. ආනන්දය, මම වනාහි දැන්ම මේ උදායී නම් හිස් පුරුෂතෙම කාරණානුකූලව නොගෙන හිස ඔසවන්නේ යයි දැනගතිමි.

"ආනන්දය, මුලදීම පොතලීපුත්‍ර නම් පරිව්‍රාජකයා විසින් වේදනා තුන අසන ලද්දාහ. ආනන්දය, ඉදින් මේ සමිද්ධිනම්

හිස් පුරුෂතෙම පොතලිපුත්‍ර නම් පරිව්‍රාජකයාට මෙසේ අසන ලද්දේ මෙසේ ප්‍රකාශ කෙළේ නම්, (කෙසේද?) ‘ඇවැත් පොතලිපුත්‍රය, කයින්, වචනයෙන්, සිතින් දැන දැන සැප විඳිය යුතුවූ කර්මයක් කොට හෙතෙම සැප විඳියි. ඇවැත් පොතලිපුත්‍රය, කයින්, වචනයෙන්, සිතින් දැන දැන දුක් විඳිය යුතුවූ කර්මයක් කොට හෙතෙම දුක් විඳියි. ඇවැත් පොතලිපුත්‍රය කයින්, වචනයෙන්, සිතින් දැන දැන දුක්ද නොවූ සැපද නොවූ වේදනා විඳිය යුතුවූ කර්මයක් කොට හෙතෙම දුක්ද නොවූ සැපද නොවූ වේදනාව විඳියයි’ ආනන්දය, මෙසේ ප්‍රකාශ කරන්නාවූම සමිද්ධි නම් හිස් පුරුෂතෙම පොතලිපුත්‍ර නම් පරිව්‍රාජකයාට මනාකොට ප්‍රකාශ කරන්නේය.

7. “ආනන්දය, එතකුදුවුවත් අව්‍යක්තවූ බාලවූ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයෝ කවරහුද? තථාගතයන්ගේ මහාකර්ම විභාගය කවරහු දන්නාහුද? ආනන්දය, ඉදින් තෙපි මහා කර්ම විභාගය, බෙදා දක්වන්නාවූ තථාගතයන්ගේ (ඒ ධර්මය) අසන්නහුදැයි” (ඇසූහ.)

‘භාග්‍යවතුන් වහන්සේ යම් මහා කර්ම විභංගයක් බෙදා වදාරන්නේ නම්, භාග්‍යවතුන් වහන්ස, ඊට මේ සුදුසු කාලය වේ. සුගතයන් වහන්ස, ඊට මේ සුදුසු කාලය වේ. භාග්‍යවතුන් වහන්සේගේ (සමීපයෙන්) අසා භික්ෂූහු දරන්නාහුයයි” (කීය.)

8. “ආනන්දය, එසේ වීනම්, අසව, යහපත් කොට මෙනෙහි කරව, කියන්නෙමියි” වදාළේය. “ස්වාමීනි, එසේයයි” කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. “ආනන්දය, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමාන වන්නාහුය. කවර සතර දෙනෙක්ද යත්, ආනන්දය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් මෙහි ප්‍රාණඝාත කරන්නේ වේද, සොරකම් කරන්නේ වේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වේද, බොරු කියන්නේ වේද, කේලාම් කියන්නේ වේද, රළු බස් කියන්නේ වේද, හිස්වූ කථා ඇත්තේ වේද, දැඩි

ලොභය බහුලකොට ඇත්තේ වේද, ක්‍රොධ සිත් ඇත්තේ වේද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුක් සහිතවූ නොකැමැත්තෙන් වැටෙන්නාවූ නරකයෙහි උපදියි.

9. "ආනන්දය, මේ ලොකයෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් මෙහි සතුන් නොමරන්නේ වේද, සොරකම් නොකරන්නේ වේද, කාමයන්හී වරදවා නොහැසිරෙන්නේ වේද, බොරු නොකියන්නේ වේද, කේළාම් නොකියන්නේ වේද, රළුබස් නොකියන්නේ වේද, හිස්බස් නොකියන්නේ වේද, දැඩි ලෝභය බහුලකොට නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, මිථ්‍යාදෘෂ්ටික නොවේද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි.

10. "ආනන්දය, ඇතැම් පුද්ගලයෙක් මෙහි සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේළාම් කීමෙන් වැළකුනේ වේද, රළු වචන කීමෙන් වැළකුනේ වේද, හිස් කථා කීමෙන් වැළකුනේ වේද, දැඩි ලොභය බහුලකොට නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, සම්‍යක් දෘෂ්ටික වේද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති සවර්ගලොකයෙහි උපදියි.

11. "ආනන්දය, මේ ලොකයෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේළාම් කීමෙන් වැළකුනේ වේද, රළු වචන කීමෙන් වැළකුනේ වේද, හිස් කථා කීමෙන් වැළකුනේ වේද, දැඩි ලොභය බහුලකොට නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, සම්‍යක් දෘෂ්ටික වේද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුක් සහිතවූ අකැමැත්තෙන් වැටෙන්නාවූ නරකයෙහි උපදියි.

12. "ආනන්දය, මේ ලොකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙලෙස් තවන වීයර්‍යයට පැමිණ ප්‍රධාන

වීර්‍ය්‍යයට පැමිණ අනුයොග වීර්‍ය්‍යයට පැමිණ අප්‍රමාද වීර්‍ය්‍යයට පැමිණ මනාකොට මෙනෙහි කිරීමට පැමිණ දිව්‍යස පිළිබඳ සමාධියක් ලබයි. යම්සේ එකඟවූ සිත ඇතිකල්හි දිව්‍යවූ මිනි'සැස ඉක්ම පවත්නාවූ පිරිසිදුවූ ඇසින් මේ ලෝකයෙහි ප්‍රාණඝාත කළාවූද, සොරකම් කළාවූද, කාමයන්හි වරදවා හැසුරුණාවූද, බොරු කීවාවූද, කේලාම් කීවාවූද, රළු වචන කීවාවූද, හිස් බස් කීවාවූද, දැඩි ලොභ ඇත්තාවූද, ව්‍යාපාද සිත් ඇත්තාවූද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූද, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුක් සහිතවූ නොකැමැත්තෙන් වැටෙන්නාවූ නරකයෙහි උපන් මේ පුද්ගලයා දකියිද, හෙතෙම මෙසේ කියයි. 'පින්වත, ලාමකවූ කර්ම ඇත්තාහ. දුශ්චරිතයනට විපාක ඇත්තේය. මම මේ ලොකයෙහි සතුන් මරා සොරකම් කොට, කාමයෙහි වරදවා හැසිරී, බොරු කියා කේලාම් කියා, රළු බස් කියා, හිස් බස් කියා, දැඩි ලෝභ බහුලකොට ඇත්තාහු, ව්‍යාපාද සිත් උපදවා, මිථ්‍යාදෘෂ්ටිගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුර්ගති නම්වූ, විනිපාත නම්වූ, නරකයෙහි උපන් මේ පුද්ගලයා දකිමි' යනුයි.

13. "හෙතෙම මෙසේ කියයි, 'පින්වත, යමෙක් වනාහි සතුන් මරන්නේද, සොරකම් කරන්නේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ රළුබස් කියන්නේ, හිස් බස් කියන්නේ, විෂම ලෝභය බහුලකොට ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද, ඒ සියලුදෙන ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ, දුර්ගති නම්වූ වීනිපාත නම් නරකයෙහි උපදියි. යම් කෙනෙක් මෙසේ දනිත් නම් ඔව්හු මනාකොට දනිත්. යම් කෙනෙක් අන් ප්‍රකාරයකින් දනිත්ද, ඔවුන්ගේ දැනීම මිථ්‍යා දැනීමයි.' මෙසේ හෙතෙම යමක් ඔහු විසින් තමා විසින්ම දන්නා ලද්දක්ද, තමා විසින්ම දක්නා ලද්දක්ද, තමා විසින්ම ප්‍රකට කරණ ලද්දේද, එයම ඔහු දෘෂ්ටියෙන් තදින් අල්වා ගෙන එය ඇතුළත් කොටගෙන මෙයම සත්‍යය, මෙයින් අන්‍යය හිස්යයි ව්‍යවහාර කරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

14. "ආනන්දය, මේ ලොකයෙහි වනාහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙළෙස් තවන වීර්‍ය්‍යයට පැමිණ ප්‍රධාන වීර්‍ය්‍යයට පැමිණ අනුයොගයට පැමිණ අප්‍රමාදයට පැමිණ මනාකොට මෙනෙහි කිරීමට පැමිණ දිවැස පිණිස පවත්නාවූ සමාධියක් ලබයි. යම්සේ එකඟවූ සිත ඇතිකල්හි පිරිසිදුවූ මිනි'සැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් මේ ලොකයෙහි සතුන් මරා, සොරකම් කොට, කාමයන්හි වරදවා හැසිරෙන්නහු, බොරු කියන්නහු, කේළාම් කියන්නහු, රළු බස් කියන්නහු, හිස් බස් කියන්නහු, විෂම ලොභය බහුල කොට ඇත්තහු, ව්‍යාපාද සිත් ඇත්තහු, මිථ්‍යාදෘෂ්ටි ගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපන් මේ පුද්ගලයා දකියි.

15. "හෙතෙම මෙසේ කියයි. 'පින්වත, ලාමකවූ කර්ම නැත්තාහ. දුශ්චරිතයට විපාකයෙක් නැත්තේය. මම මේ ලොකයෙහි ප්‍රාණඝාත කළ, සොරකම් කළ, කාමයන්හි වරදවා හැසුරුණු, බොරු කී, කේළාම් කී, රළු බස් කී, හිස් බස් කී, විෂම ලොභය බහුලකොට ඇති, ව්‍යාපාද සිත් ඇති, මිසදිටු ගත් පුද්ගලයාද, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපන් මේ පුද්ගලයා දකිමි' යනුයි. හෙතෙම මෙසේ කියයි. 'පින්වත, යමෙක් වනාහි සතුන් මරන්නේද, සොරකම් කරන්නේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේළාම් කියන්නේ, රළුබස් කියන්නේ, හිස් බස් කියන්නේ, විෂම ලෝභය බහුලකොට ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද, ඒ සියලුදෙන ශරීරයාගෙ බිඳීමෙන් මරණින් මත්තෙහි සුගතියවූ දිව්‍යලෝකයෙහි උපදියි. යම් කෙනෙක් මේ ආකාරයෙන් දනිත් නම් ඔව්හු මනාකොට දනිත්. යම් කෙනෙක් අන් පරිද්දෙකින් දනිත් නම් ඔවුන්ගේ දැනීම මිථ්‍යා දැනීමයි.' මෙසේ හෙතෙම යමක් ඔහු විසින් තමන්ම දන්නා ලද්දේද, තමන්ම දක්නා ලද්දේද, තමන්ට ප්‍රකට කෙළේද, එයම දැඩි දෘෂ්ටි අල්වාගෙන ඇතුළත් කොටගෙන මෙයම සත්‍යය, අනික හිස්යයි ව්‍යවහාර කරයි.

16. "ආනන්දය, මේ ලොකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙලෙස් තවන වීර්‍ය්‍යයට පැමිණ, ප්‍රධාන වීර්‍ය්‍යයට පැමිණ, භාවනා වීර්‍ය්‍යයට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාකොට මෙනෙහි කිරීමට පැමිණ, යම් ආකාරයකින් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ මිනි'සැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් මේ පුද්ගලයා දකීද, එබඳු චිත්තසමාධියක් ලබයිද, හෙතෙමේ මේ ලොකයෙහි ප්‍රාණඝාතයෙන් වැළකුනාවූ, සොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, කේලාම් කීමෙන් වැළකුනාවූ, රළු බස් කීමෙන් වැළකුනාවූ, හිස් බස් කීමෙන් වැළකුනාවූ, විෂම ලෝභය නැත්තාවූ, ව්‍යාපාද සිත් නැත්තාවූ, සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූ, (පුද්ගලයා) ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත දිව්‍යලොකයෙහි ඉපද සිටිනුයි. හෙතෙම 'පින්වත, කුසලකර්මයෝ ඇත්තාහුමය. සුචරිතයට විපාකයෙක් ඇත්තේය. මම මේ ලොකයෙහි සතුන් මැරීමෙන් වැළකුනාවූ, සොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, කේළාම් කීමෙන් වැළකුනාවූ, රළු බස් කීමෙන් වැළකුනාවූ, හිස් බස් කීමෙන් වැළකුනාවූ, විෂම ලොභය නැත්තාවූ, ව්‍යාපාද සිත් නැත්තාවූ, සම්‍යක් දෘෂ්ටි ඇති පුද්ගලයා ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත දිව්‍යලොකයෙහි ඉපද සිටිනු දකිමියි' කියයි. හෙතෙම 'පින්වත, යමෙක් වනාහි සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේලාම් කීමෙන් වැළකුනේ වේද, රළුබස් කීමෙන් වැළකුනේ වේද, හිස් බස් කීමෙන් වැළකුනේ වේද, විෂම ලොභය නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද, ඒ සියලු දෙන ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සුගති සංඛ්‍යාත දිව්‍ය ලොකයෙහි උපදිත්යයි යම් කෙනෙක් මෙසේ දනිත්ද, ඔව්හු මනාකොට දනිත්. යම් කෙනෙක් අන් පරිද්දෙන් දනිත්ද, ඔවුන්ගේ දැනීම මිථ්‍යාදැනීමයි.' මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

හෙතෙම යමක්ම තමා විසින්ම දන්නා ලද්දේද, තමා විසින්ම දක්නා ලද්දේද, තමන් විසින්ම ප්‍රකට කරන ලද්දේද, එයම දෘෂ්ටියෙන් තදින් අල්වාගෙන ඇතුළත් කොටගෙන මෙයම සත්‍යයයි මෙයින් අන්‍යය සිස්යයි ව්‍යවහාර කරයි.

17 "ආනන්දය, මේ ලොකයෙහි එනාහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙලෙස් තවන වීර්‍ය්‍යයට පැමිණ, ප්‍රධාන වීර්‍ය්‍යයට පැමිණ, භාවනා වීර්‍ය්‍යයට පැමිණ, අප්‍රමාදයට පැමිණ, මනාකොට මෙනෙහි කිරීමට පැමිණ, යම් ආකාරයකින් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ ඉක්මවනලද මිනි'සැස ඇත්තාවූ දිව්‍යවූ ඇසින් මේ පුද්ගලයා දකීද, එවැනි චිත්තසමාධියක් ලබයිද, හෙතෙමේ මේ ලොකයෙහි ප්‍රාණඝාතයෙන් වැළකුනාවූ, සොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, කේලාම් කීමෙන් වැළකුනාවූ, රළුබස් කීමෙන් වැළකුනාවූ, හිස් බස් කීමෙන් වැළකුනාවූ, විෂම ලෝභය නැත්තාවූ, ව්‍යාපාද සිත් නැත්තාවූ, සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූ, පුද්ගලයා ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සැප නැත්තාවූ, දුර්ගතියවූ විනිපාත නම් නරකයෙහි ඉපිද සිටිනු දකී. හෙතෙම පින්වත, කුසලකර්මයෝ නැත්තාහුමය. සුචරිතයට විපාකයෙක් නැත්තේය. මම මේ ලෝකයෙහි සතුන් මැරීමෙන් වැළකුනාවූ, හොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, කේළාම් කීමෙන් වැළකුනාවූ, රළුබස් කීමෙන් වැළකුනාවූ, හිස්බස් කීමෙන් වැළකුනාවූ, විෂමලෝභය නැත්තාවූ, ව්‍යාපාද සිත් නැත්තාවූ, සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූ පුද්ගලයා ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සැප නැත්තාවූ දුර්ගතියවූ විනිපාත නම් නරකයෙහි ඉපද සිටිනු දකිමියි, කියයි. හෙතෙම පින්වත, යමෙක් එනාහි ප්‍රාණඝාතයෙන් වැළකුනේ වේද, නොදුන් දෙය ගැනීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේලාම් කීමෙන් වැළකුනේ වේද, රළු බස් කීමෙන් වැළකුනේ වේද, හිස්බස් කීමෙන් වැළකුනේ වේද, විෂම ලෝභය

නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද, ඒ සියලුදෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි උපදිත්යයි' යම් කෙනෙක් මෙසේ දනිත්ද, ඔව්හු මනාකොට දනිත්. යම් කෙනෙක් අන් පරිද්දකින් දනිත්ද ඔවුන්ගේ දැනීම මිථ්‍යාදැනීමයයි, මෙසේ හෙතෙම යමක්ම තමා විසින් දන්නා ලද්දේද, තමා විසින් දක්නා ලද්දේද, තමා විසින් ප්‍රකට කරන ලද්දේද, එයම එහි දෘෂ්ටියෙන් තදින් අල්වාගෙන ඇතුළත් කොටගෙන මෙයම සත්‍යයයි මෙයින් අන්‍යය සිස්යයි, ව්‍යවහාර කරයි.

18. "ආනන්දය, ඒ මහණ බමුණන් අතර යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'පින්වත, ලාමකවූ කර්මයෝ ඇත්තාහුමය. දුශ්චරිතයට විපාකයෙක් ඇත්තේයයි කියයි නම් ඔහුගේ ඒ කීම අනුදනිමි. යමෙක් වනාහි මම මේ ලොකයෙහි සතුන් මරන්නාවූ, සොරකම් කරන්නාවූ කාමයන්හි වරදවා හැසිරෙන්නාවූ, බොරු කියන්නාවූ, කේලාම් කියන්නාවූ, රළුබස් කියන්නාවූ, හිස්බස් කියන්නාවූ, විෂම ලෝභය බහුල කොට ඇත්තාවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ පුද්ගලයාද, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි ඉපද සිටිනු දකිමි'යි කියා නම් ඔහුගේ ඒ කීමද අනුදනිමි. යමෙක් වනාහි 'පින්වත, මේ ලොකයෙහි යමෙක් සතුන් මරන්නේ වේද, සොරකම් කරන්නේ වේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වේද, බොරු කියන්නේ වේද, කේලාම් කියන්නේ වේද, රළුබස් කියන්නේ වේද, හිස්බස් කියන්නේ වේද, දැඩි ලෝභය බහුලකොට ඇත්තේ වේද, ව්‍යාපාද සිත් ඇත්තේ වේද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද, ඒ සියලුදෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි උපදිත්ය'යි කියයි නම් ඔහුගේ ඒ කීමද නොඅනුදනිමි. යම් කෙනෙක් මෙසේ දනිත් නම් ඔව්හුම මනාකොට දනිත්. යම් කෙනෙක් අන් පරිද්දෙකින් දනිත් නම් ඔවුන්ගේ දැනීම මිථ්‍යා දැනීමයයි කියයි නම් ඔහුගේ කීමද නොඅනුදනිමි. යමෙක් තමා විසින් දන්නා ලද්දම තමන් විසින්

දක්නා ලද්දක්ම තමන් විසින් ප්‍රකට කරන ලද්දම සත්‍යයි, එයින් අන්‍යය හිස්යයි දෘෂ්ටියෙන් තදින් අල්වාගෙන ඇතුළත් කොටගෙන ව්‍යවහාර කෙරේ නම් ඔහුගේ ඒ කීමද නොඅනුදනිමි. ඊට හේතු කවරේද? ආනන්දය; තථාගතයන්ගේ මහාකර්ම බෙදා දැක්වීමෙහි ඥානය අන් ආකාරයකින්ම වෙයි.

19. "ආනන්දය, ඔවුන් අතරෙහි යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'පින්වත, පාප කර්මයෝ නැත්තාහුමය. දුශ්චරිතයට විපාකයෙක් නැත්තේයයි' කියයි, නම් ඔහුගේ ඒ කීම නොඅනුදනිමි. හෙතෙම 'මම මෙහි සතුන් මරන්නාවූ, සොරකම් කරන්නාවූ, කාමයන්හි වරදවා හැසිරෙන්නාවූ, බොරු කියන්නාවූ, කේලාම් කියන්නාවූ, රළු බස් කියන්නාවූ, හිස් බස් කියන්නාවූ, විෂම ලෝභය බහුල කොට ඇත්තාවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු පුද්ගලයාද, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත දිව්‍යලොකයෙහි ඉපද සිටිනු දකිමි'යි යන යමක්, කියයි නම් ඔහුගේ ඒ කීම අනුදනිමි. හෙතෙම 'පින්වත, යමෙක් වනාහි සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේළාම් කියන්නේ, රළුබස් කියන්නේ, හිස් බස් කියන්නේ, විෂමලෝභය බහුලකොට ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේවේද, ඒ සියලුදෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත දිව්‍යලෝකයෙහි උපදී යන යමක් කියයි නම් ඔහුගේ ඒ කීම නොඅනුදනිමි. හෙතෙම යම් කෙනෙක් මේ ආකාරයෙන් දනිත් නම් ඔව්හු මනාකොට දනිත්, යම් කෙනෙක් අන්පරිද්දෙකින් දනිත් නම් ඔවුන්ගේ දැනීම මිථ්‍යා දැනීමයයි යමෙක් කියයි නම් ඔහුගේ ඒ කීමද නොඅනුදනිමි. හෙතෙම තමන් විසින් දන්නා ලද්දම, තමන් විසින් දක්නා ලද්දම, තමන් විසින් ප්‍රකට කරන ලද්දම දෘෂ්ටියෙන් තදින් අල්වාගෙන, ඇතුළත් කොටගෙන සත්‍යයයි, එයින් අන්‍යය හිස්යයි ව්‍යවහාර කෙරේද, ඔහුගේ ඒ කීමද නොඅනුදනිමි.

20. "ඊට හේතු කවරේද, ආනන්දය, තථාගතයන්ගේ මහාකර්මය බෙදා දැක්වීම අන් ආකාරයකින්ම වේ. ආනන්දය,

ඔවුන් අතර යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'පින්වත, කුසල කර්මයෝ ඇත්තාහුය. සුචරිතයට විපාකයෙක් ඇත්තේයයි, යමක් කියයිද, ඔහුගේ මේ කීම අනුදනිමි. හෙතෙම මම මෙහි සතුන් මැරීමෙන් වැළකුනාවූ, හොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, කේලාම් කීමෙන් වැළකුනාවූ, රළු බස් කීමෙන් වැළකුනාවූ, හිස් බස් කීමෙන් වැළකුනාවූ, විෂම ලෝභය නැත්තාවූ, ව්‍යාපාද සිත් නැත්තාවූ, සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූ, පුද්ගලයා ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සුගති සංඛ්‍යාත දිව්‍ය ලොකයෙහි ඉපද සිටිනු දකිමි' යන යමක් කියයිද, ඔහුගේ මේ කීමද අනුදනිමි. හෙතෙම පින්වත, යමෙක් වනාහි සතුන් මැරීමෙන් වැළකුනේ වේද, හොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේලාම් කීමෙන් වැළකුනේ වේද, රළු බස් කීමෙන් වැළකුනේ වේද, හිස් බස් කීමෙන් වැළකුනේ වේද, විෂම ලෝභය නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද, ඒ සියලුදෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත දිව්‍යලොකයෙහි උපදීය' යන යමක් කියයි නම් ඔහුගේ ඒ කීම නොඅනුදනිමි. හෙතෙම යම් කෙනෙක් මේ ආකාරයෙන් දනිත් නම් ඔව්හු මනාකොට දනිත්. යම් කෙනෙක් අන් පරිද්දෙකින් දනිත් නම් ඔවුන්ගේ දැනීම මිථ්‍යා දැනීමයයි යමෙක් කියා නම් ඔහුගේ ඒ කීමද නොඅනුදනිමි. හෙතෙම යමක් තමන් විසින් දන්නා ලද්දේද, තමන් විසින් දක්නා ලද්දේද, තමා විසින් ප්‍රකට කරන ලද්දේද, එයම දෘෂ්ටියෙන් තදින් අල්වාගෙන ඇතුළත් කොට ගෙන මෙයම සත්‍යයි, මෙයින් අන්‍ය හිස්යයි ව්‍යවහාර කෙරේද, ඔහුගේ ඒ කීමද නොඅනුදනිමි. ඊට හේතු කවරේද, ආනන්දය, තථාගතයන්ගේ මහා කර්මය බෙදා දැක්වීමෙහි ඥානය අන් පරිද්දෙකින්ම වේ.

21. "ආනන්දය, ඔවුන් අතර යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'පින්වත, කුසල කර්මයෝ නැත්තාහුමය.

සුචරිතයට විපාකයෙක් නැත්තේයයි' යමක් කියයිද, ඔහුගේ ඒ කීම නොඅනුදනිමි. හෙතෙම 'මම මෙහි ප්‍රාණඝාතයෙන් වැළකුනාවූ, හොරකම් කිරීමෙන් වැළකුනාවූ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනාවූ, බොරු කීමෙන් වැළකුනාවූ, කේලාම් කීමෙන් වැළකුනාවූ, රළු බස් කීමෙන් වැළකුනාවූ, හිස් බස් කීමෙන් වැළකුනාවූ, විෂම ලෝභය නැත්තාවූ, ව්‍යාපාද සිත් නැත්තාවූ, සම්‍යක් දෘෂ්ටි ඇති පුද්ගලයාද ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි ඉපද සිටිනු දකිමියි' යමක් කියයිද ඔහුගේ ඒ කීමද අනුදනිමි. හෙතෙම 'පින්වත යමෙක් වනාහි සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේලාම් කීමෙන් වැළකුනේ වේද, රළු බස් කීමෙන් වැළකුනේ වේද, හිස් බස් කීමෙන් වැළකුනේ වේද, විෂම ලෝභය නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද, ඒ සියලුදෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි උපදීයයි,' යමක් කියයි නම් ඔහුගේ ඒ කීම නොඅනු දනිමි. හෙතෙම 'යම් කෙනෙක් මේ ආකාරයෙන් දනිත් නම් ඔව්හු මනාකොට දනිත්. යම් කෙනෙක් අන් පරිද්දෙකින් දනිත් නම් ඔවුන්ගේ දැනීම මිථ්‍යා දැනීමයයි' යමක් කියයි නම් ඔහුගේ ඒ කීමද නොඅනු දනිමි. හෙතෙම යමක් තමා විසින් දන්නා ලද්දේද, තමා විසින් දක්නා ලද්දේද, තමා විසින් ප්‍රකට කරන ලද්දේද, එයම දෘෂ්ටියෙන් තදින් අල්වා ගෙන ඇතුළත්කොට ගෙන 'මෙයම සත්‍යයයි මෙයින් අන්‍යය සිස්යයි' ව්‍යවහාර කෙරේ නම් ඔහුගේ ඒ කීමද නොඅනු දනිමි. ඊට හේතු කවරේද, ආනන්දය, තථාගතයන්ගේ මහා කර්ම බෙදා දැක්වීමෙහි ඥානය අන්පරිද්දකින්ම වේ.

**22.** "ආනන්දය, ඔවුන් අතුරෙන් යම් මේ පුද්ගලයෙක් තෙම මේ ලොකයෙහි සතුන් මරන්නේ, සොරකම් කරන්නේ කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම්

කියන්නේ, රළු බස් කියන්නේ, හිස්බස් කියන්නේ, විෂම ලෝභය බහුලකොට ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද, හෙතෙම ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි උපදීද, ඔහුගේ දුක් විඳීම පිණිස පවත්නා ඒ පාපකර්මය ඊට පළමු කරන ලද්දක් හෝ වෙයි. ඔහුගේ දුක් විඳීම පිණිස පවත්නාවූ ඒ පාපකර්මය ඊට පසුව කරන ලද්දක් හෝ වෙයි. මොහුගේ මරණ කාලයෙහි හෝ සම්පූර්ණ කරණ ලද සමාදන්වන ලද මිථ්‍යා දෘෂ්ටිය හෝ වෙයි. හෙතෙම ඒ කර්මය හේතුකොටගෙන ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි උපදියි. හෙතෙම මේ ලොකයෙහි සතුන් මරන්නේ හෝ සොරකම් කරන්නේ හෝ කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළු බස් කියන්නේ, හිස් බස් කියන්නේ, විෂම ලෝභය බහුලකොට ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ හෝ වෙයිද, ඒ කර්මයාගේ විපාක මේ ආත්මයෙහිම හෝ විඳියි. අනතුරු ආත්මයෙහි හෝ විඳියි. අනික් අනික් භවයන්හි හෝ විඳියි.

23. 'ආනන්දය, ඔවුන් අතුරෙන් යම් මේ පුද්ගලයෙක් තෙම මෙලොව සතුන් මරන්නේ, සොරකම් කරන්නේ කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළුබස් කියන්නේ, හිස් බස් කියන්නේ, විෂම ලෝභය බහුලකොට ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, මිථ්‍යා දෘෂ්ටි වූයේ වේද, හෙතෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලොකයෙහි උපදී නම්, ඔහුගේ ඒ සැපට කරුණුවූ කුසල කර්මය ඊට පළමු කරණ ලද්දක් හෝ වෙයි. ඔහුගේ ඒ සැපට කරුණුවූ කුසල කර්මය ඊට පසුව කරණ ලද්දක් හෝ වේ. ඔහුගේ මරණ කාලයෙහි සම්පූර්ණ කරන ලද සමාදන්වන ලද සම්‍යක් දෘෂ්ටිය හෝ වෙයි. ඒ කර්මයෙන් හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලොකයෙහි උපදියි. ඉදින් වනාහි හෙතෙම මෙහි ප්‍රාණඝාත කරන්නේ සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ,

කේලාම් කියන්නේ, රළු බස් කියන්නේ, හිස් බස් කියන්නේ, විෂම ලෝභය බහුලකොට ඇත්තේ ව්‍යාපාද සිත් ඇත්තේ, මිථ්‍යාදෘෂ්ටි වූයේ හෝ වේද, ඒ කර්මයාගේ විපාක මේ ආත්මයෙහිම හෝ විඳියි. අනතුරු ආත්මයෙහි හෝ විඳියි අනික් අනික් ආත්මවල හෝ විඳියි.

24. "ආනන්දය, ඔවුන් අතුරෙන් යම් මේ පුද්ගලයෙක් තෙම මෙහි සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේලාම් කීමෙන් වැළකුනේ වේද, රළු බස් කීමෙන් වැළකුනේ වේද, හිස් බස් කීමෙන් වැළකුනේ වේද, විෂම ලෝභය නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, සම්‍යක් දෘෂ්ටි වූයේ වේද, හෙතෙම ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍යලොකයෙහි උපදී නම්, සැප විඳීමට හේතුවූ ඒ කුශල කර්මය ඊට පළමු කරණ ලද්දක් හෝ වෙයි. ඔහුගේ ඒ සැප විඳීමට හේතුවූ කුශල කර්මය ඊට පසුව කරණ ලද්දක් හෝ වෙයි. මරණ කාලයෙහි හෝ සම්පූර්ණ කරණ ලද සමාදන් වන ලද සම්‍යක් දෘෂ්ටිය හෝ වෙයි. ඒ කර්මයෙන් හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලොකයෙහි උපදියි. හෙතෙම මෙලොව සතුන් මැරීමෙන් වැළකුනේ හෝ වෙයිද, සොරකම් කිරීමෙන් වැළකුනේ හෝ වෙයිද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වෙයි. බොරු කීමෙන් වැළකුනේ වෙයි. කේලාම් කීමෙන් වැළකුනේ වෙයි. රළුබස් කීමෙන් වැළකුනේ වෙයි. හිස් බස් කීමෙන් වැළකුනේ වෙයි. විෂම ලොභය නැත්තේ වෙයි. ව්‍යාපාද සිත් නැත්තේ වෙයි. සම්‍යක් දෘෂ්ටි වූයේ හෝ වෙයිද, ඔහුගේ ඒ කර්මයාගේ විපාක මේ ආත්මයෙහිම හෝ විඳියි. අනතුරු ආත්මයෙහි හෝ විඳියි. අනික් අනික් ආත්මයක හෝ විඳියි.

25. "ආනන්දය, ඔවුන් අතුරෙන් යම් යම් පුද්ගලයෙක් තෙම මෙලොව සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ

වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, කේලාම් කීමෙන් වැළකුනේ වේද, රළු බස් කීමෙන් වැළකුනේ වේද, හිස් බස් කීමෙන් වැළකුනේ වේද, විෂම ලෝභය නැත්තේ වේද, ව්‍යාපාද සිත් නැත්තේ වේද, සම්‍යක් දෘෂ්ටි වූයේ වේද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ දුර්ගතිවූ විනිපාත නම් නරකයෙහි දුක් විඳීමට හේතුවූ ඒ අකුශල කර්මය ඊට පළමු කරණ ලද්දක් හෝ වෙයි. දුක් විඳීමට හේතුවූ ඒ අකුශල කර්මය ඊට පසුව කරණ ලද්දක් වෙයි. මරණ කාලයෙහි කරන ලද සමාදන් වන ලද මිථ්‍යාදෘෂ්ටිය හෝ වෙයි. ඒ කර්මයෙන් හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් තොරවූ දුක් ඇත්තාවූ විනිපාත නම් නිරයෙහි උපදියි. හෙතෙම මෙලොව සතුන් මැරීමෙන් වැළකුනේ හෝ වෙයිද, සොරකම් කිරීමෙන් වැළකුනේ හෝ වෙයිද, සම්‍යක් දෘෂ්ටි වූයේ වෙයිද, ඒ කර්මයාගේ විපාකය මේ ආත්මයෙහිම හෝ විඳියි. අනතුරු ආත්මයෙහි හෝ විඳියි. අපරපරියායෙහි හෝ විපාකය විඳියි.

**26.** "ආනන්දය, මෙසේ වනාහි අභව්‍යාකාරවූ (අකුසලයෙන් වැළකුනාවූ) අභව්‍ය කර්මයක් (අකුසල කර්මයක්) ඇත්තේය. භව්‍යාකාරවූ (කුසල කර්මයෙන් වළකන්නාවූ) අභව්‍ය (අකුසල) කර්මයක් ඇත්තේය. භව්‍යාකාරවූද (කුසලයෙන් වළකන්නාවූද) භව්‍යවූම (කුසල්වූම) කර්මයක් ඇත්තේය. අභව්‍යාකාරවූ (අකුසලයෙන් වළකන්නාවූ) භව්‍ය (කුසල) කර්මයක් ඇත්තේයයි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තේයයි.

**මහා කම්ම විභංග සූත්‍රය නිමි (4-6)**

## 37. සළායතන විභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට "මහණෙනි" කියා ආමන්ත්‍රණය කළසේක. "පින්වතුන් වහන්සැයි," ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. "මහණෙනි, ෂඩායතනයන්ගේ විස්තර තොපට දෙශනා කරන්නෙමි. එය අසව් යහපත්කොට මෙනෙහි කරව්. කියන්නෙමි" යනුයි. "එසේය ස්වාමීනියි" ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

2. "ආධ්‍යාත්මික ආයතන සයක් (විදර්ශනා සහිත මාර්ග ඥානයෙන්) දතයුතුය. බාහිර ආයතන සයක් දතයුතුය විඤ්ඤාණ කාය සයක් දතයුතුය. ස්පර්ශ කාය සයක් දතයුතුය. මනොපවිචාර (විතර්ක විචාර) අටළොසක් දත යුතුය. සත්ව පද සතිසක් දතයුතුය. එහි මෙය නිසා මෙය දුරුකරව්. ආය්‍ය්‍යීතෙම යම් සතිපට්ඨාන තුනක් සේවනය කෙරේද, යම් සතිපට්ඨාන තුනක් සේවනය කරන්නාවූ ආය්‍ය්‍යීවූ ශාස්තෘතෙම සමූහයාට අනුශාසනා කරන්ට සුදුසුවෙයි. හෙතෙම දමනය කළයුත්තවුන් දමනය කරන්නවුන් අතුරෙන් නිරුත්තරවූ පුරිසදම්මසාරථී යයි කියනු ලැබේ. මෙය සළායතන විභංගයාගේ උද්දේස යයි. (මාතෘකාවයි.)

3. "ආධ්‍යාත්මිකවූ ආයතන සයක් දතයුතුයයි, මෙසේ වනාහි මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? චක්ඛායතනය, සොතායතනය, ඝානායතනය, ජිව්හායතනය කායායතනය, මනායතනය, යන මොහුයි. ආධ්‍යාත්මිකවූ ආයතන සයක් දතයුතුයයි. මෙසේ ඒ යමක් කියන ලද නම් එය මේ සඳහා කියන ලදී. බාහිර ආයතන සයක් දත යුතුයයි, මෙසේ වනාහි මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? රූපායතනය

සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, පොට්ඨබ්බායතනය, ධම්මායතනය, යන මොහුයි. බාහිරවූ ආයතන සයක් දතයුතුයයි, මෙසේ ඒ යමක් කියනලද නම් එය මේ සඳහා කියනලදී. විඤ්ඤාණ කාය සයක් දතයුතුයයි, මෙසේ වනාහි මේ කියනලදී. කුමක් සඳහා මෙය කියනලදද? චක්ඛු විඤ්ඤාණය, සොත විඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනො විඤ්ඤාණය, යන මොහුයි. විඤ්ඤාණ කාය සයක් දතයුතුයයි, මෙසේ ඒ යමක් කියන ලදද? එය මේ සඳහා කියනලදී.

4. "පොට්ඨබ්බකාය සයක් දතයුතුයයි, මෙසේ වනාහි මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියනලදද? චක්ඛුසම්ඵස්සය, සොත සම්ඵස්සය, ඝාන සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය, කාය සම්ඵස්සය මනො සම්ඵස්සය, යන මොහුය. ඵස්ස කාය සයක් දත යුතුයයි මෙසේ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

"මනොපවිචාර (විතර්කවිචාරයෝ) අටළොසක් දතයුතු යයි, මෙසේ වනාහි මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියනලදද? ඇසින් රූපයක් දැක සොම්නසට කරුණුවූ රූපය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ රූපය අනුව හැසිරෙයි. උපෙක්ෂාවට කරුණුවූ රූපය අනුව හැසිරෙයි. කණින් ශබ්දය අසා සොම්නසට කරුණුවූ, ශබ්දය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ, ශබ්දය අනුව හැසිරෙයි. මැදහත් බවට කරුණුවූ, ශබ්දය අනුව හැසිරෙයි. නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කොට සොම්නසට කරුණුවූ, ගන්ධය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ, ගන්ධය අනුව හැසිරෙයි. මැදහත් බවට කරුණුවූ, ගන්ධය අනුව හැසිරෙයි. දිවෙන් රසය විඳ සොම්නසට කරුණුවූ, රසය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ, රසය අනුව හැසිරෙයි. මැදහත් බවට කරුණුවූ, රසය අනුව හැසිරෙයි. කයින් ස්පර්ශ කළයුත්ත ස්පර්ශකොට සොම්නසට කරුණුවූ ධර්මාරමුණ අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ, ධර්මාරමුණ අනුව හැසිරෙයි. මැදහත් බවට කරුණුවූ ධර්මාරමුණ අනුව

හැසිරෙයි. සිතින් ධර්මය දැන සොම්නසට කරුණුවූ ධර්මය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ, ධර්මය අනුව හැසිරෙයි. උපෙක්ෂාවට කරුණුවූ, ධර්මය අනුව හැසිරෙයි. මෙසේ සොමනස්සුපවිචාරයෝ සයක්ද, දොමනස්සුප විචාරයෝ සයක්ද, උපෙක්ෂොපවිචාරයෝ සයක්ද යන මනොපවිචාරයෝ අටළොසක් දතයුතුයයි. මෙසේ ඒ යමක් කියන ලද නම් එය මේ සඳහා කියනලදී.

5. "සත්වයන්ගේ පදයෝ (වට්ටවිවට්ට වශයෙන් සත්වයන්ගේ පැවැත්මට හෙතු) සතිසක් දත යුතුයයි, මෙසේ වනාහි මේ කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෙහසිතවූ (පස්කම්ගුණ ඇසුරු කළාවූ) සොමනස්සයෝ සයක් වෙත්. නෛෂ්ක්‍රම්‍ය ඇසුරුකළාවූ (විදර්ශනාව ඇසුරු කළාවූ) සොමනස්සයෝ සයක් වෙත්. ගෙහසිතවූ දොමනස්සයෝ සයක් වෙත්. නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළාවූ දොමනස්සයෝ සයක් වෙත්. කාම ගුණයන් ඇසුරු කළාවූ උපෙක්ෂා සයක් වෙත්. නෛෂක්‍රම්‍යය ඇසුරු කළාවූ උපෙක්ෂා සයක් වෙත්. එහි කාම ගුණයන් ඇසුරු කළාවූ සොම්නස් හය කවරහුද? චක්ෂුර්විඥානයෙන් දතයුතුවූ කැමතිවූ මනාපවූ සිත සතුටු කරන්නාවූ තෘෂ්ණාවෙන් යුක්තවූ රූපයන්ගේ ලැබීම ලාභයක් වශයෙන් සලකන්නාහටද පූර්වයෙහි ලබන ලද ඉකුත්වූ නිරුද්ධවූ වෙනස්වූ (රූපය) සිහි කරන්නහුටද සොම්නසක් උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය ගෙහසිත (කාම ගුණයන් ඇසුරු කළාවූ) සොම්නසයයි කියනු ලැබේ. සොත විඥානයෙන් දතයුතුවූ කැමැති වන්නාවූ, මන වඩන්නාවූ, සතුටු වන්නාවූ, ලෝකාමිෂ සංඛ්‍යාත තෘෂ්ණාවෙන් යුක්තවූ, ශබ්දයන්ගේ ලැබීම හෝ ලැබීම් වශයෙන් දක්නහුටද පූර්වයෙහි හෝ ලබන ලද ඉකුත්වූ, නිරුද්ධවූ, වෙනස්වූ, (ශබ්දය) සිහි කරන්නහුටද සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය කාම ගුණයන් ඇසුරු කළාවූ, සොම්නසයයි කියනු ලැබේ. ඝාණවිඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයන්ගේ (ගන්ධය) කැමැති වන්නාවූ, මන වඩන්නාවූ, සතුටු වන්නාවූ ලෝකාමිෂ සංඛ්‍යාත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තෘෂ්ණාවෙන් යුක්තවූ, ගන්ධයන්ගේ ලැබීම හෝ ලැබීම් වශයෙන් දක්නහුටද පූර්වයෙහි හෝ ලබනලද ඉකුත්වූ, නිරුද්ධවූ, වෙනස්වූ, (ගන්ධය) සිහිකරන්නහුටද, සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය කාම ගුණයන් ඇසුරු කළාවූ, සොම්නසයයි කියනු ලැබේ. ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතුවූ, "රසයන්ගේ" (රසය) කැමති වන්නාවූ, මන වඩන්නාවූ, සතුටු වන්නාවූ, ලෝකාමිෂ සංඛ්‍යාත තෘෂ්ණාවෙන් යුක්තවූ, රසයන්ගේ ලැබීම හෝ ලැබීම් වශයෙන් දක්නහුටද පූර්වයෙහි හෝ ලබනලද ඉකුත්වූ, නිරුද්ධවූ, වෙනස්වූ, (ගන්ධය) සිහිකරන්නහුටද, සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය කාම ගුණයන් ඇසුරු කළාවූ, සොම්නසයයි කියනු ලැබේ. කාය විඥානයෙන් දතයුතුවූ, "ස්පර්ශ කළයුත්තවුන්ගේ" (ස්පර්ශ කළයුත්ත) කැමති වන්නාවූ, මන වඩන්නාවූ, සතුටු වන්නාවූ, ලෝකාමිෂ සංඛ්‍යාත තෘෂ්ණාවෙන් යුක්තවූ, ස්පර්ශයන්ගේ ලැබීම හෝ ලැබීම් වශයෙන් දක්නහුටද පූර්වයෙහි හෝ ලබනලද, ඉකුත්වූ, නිරුද්ධවූ, වෙනස්වූ, ස්පර්ශය සිහිකරන්නහුටද සොම්නස උපදියි, මෙබඳු යම් සොම්නසක් වේද, මෙය කාම ගුණයන් ඇසුරු කළාවූ, සොම්නසයයි කියනු ලැබේ. මනො විඥානයෙන් දතයුතුවූ කැමතිවූ, මන වඩන්නාවූ, සතුටු වන්නාවූ, සිත පිනවන්නාවූ, තෘෂ්ණාවන්ගෙන් යුක්තවූ, ධර්මයන්ගේ ලැබීම ලැබීම් වශයෙන් සලකන්නහුටද පූර්වයෙහි ලබනලද, ඉකුත්වූ නිරුද්ධවූ වෙනස්වූ (ධර්මාරමුණ) සිහිකරන්නහුටද සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය කාම ගුණයන් ඇසුරු කළාවූ සොම්නසයයි කියනු ලැබේ. මොහු ගේහසිත (කාම ගුණයන් ඇසුරු කළාවූ) සොම්නස් හය වෙත්.

**6.** 'එහි නෙක්ඛම්මසිත (නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ) සොම්නස් හය කවරහුදයත්? රූපයන්ගේම අනිත්‍ය බව වෙනස්වීම, නොඇල්ම, නිරුද්ධවීම, දැන පූර්වයෙහි යම් රූපයෝ වූවාහුද දැන් යම් රූපයෝ වෙත්ද, ඒ සියලු රූපයෝ අනිත්‍යයහ, දුක්යහ, විපරිනාම ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය

තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නහුට සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ සොම්නසයයි කියනු ලැබේ. ශබ්දයන්ගේම අනිත්‍යබව, වෙනස්වීම, විරාගය, නිරෝධය දැන පූර්වයෙහිවූද, මේ කාලයෙහිවූද, ශබ්දයෝ වෙත්ද, සියලු ඒ ශබ්දයෝ අනිත්‍යයහ, දුක්යහ, විපරිනාම ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නහුට සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ, සොම්නසයයි කියනු ලැබේ. ගන්ධයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, විරාගය, නිරෝධය, දැන, පූර්වයෙහිවූද, මේ කාලයෙහි වූද, ගන්ධයෝ වෙත්ද, සියලු ඒ ගන්ධයෝ අනිත්‍යයහ, දුක්යහ, විපරිනාම ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නහුටද සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ, සොම්නසයයි කියනු ලැබේ. රසයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, විරාගය, නිරෝධය දැන, පූර්වයෙහිවූද, මේ කාලයෙහිවූද, රසයෝ වෙත්ද, සියලු ඒ රසයෝ අනිත්‍යයහ, දුක්යහ, විපරිනාම ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නහුට සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ, සොම්නසයයි කියනු ලැබේ. ස්පර්ශ කටයුත්තන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, විරාගය, නිරෝධය දැන, පූර්වයෙහිවූද, මේ කාලයෙහිවූද, ස්පර්ශයෝ වෙත්ද, සියලු ඒ ස්පර්ශයෝ අනිත්‍යයහ, දුක්යහ, විපරිනාම ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නහුට සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ, සොම්නස යයි කියනු ලැබේ. ධර්මයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, විරාගය, නිරොධය, දැන පූර්වයෙහි යම් ධර්මායතනයෝ වූවාහුද, දැන යම් ධර්මායතනයෝ වෙත්ද, ඒ සියලු ධර්මයෝ අනිත්‍යයෝය, දුක්ඛයෝය, විපරිනාම ස්වභාව ඇත්තාහුයයි, මෙසේ තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නහුට

සොම්නස උපදියි. මෙබඳු යම් සොම්නසක් වේද, මෙය නෙක්ඛම්ම සිත (නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ) සොම්නස යයි කියනු ලැබේ. මොහු නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ සොම්නස් හය වෙත්.

7. "එහි කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නස් හය කවරහුද? චක්ෂුර්විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ මනොරම්‍යවූ ලොකාමිෂයන්ගෙන් යුක්තවූ රූපයන්ගේ නොලැබීම හෝ නොලැබීම් වශයෙන් දක්නහුට පූර්වයෙහි හෝ නොලැබූ ඉක්ම ගියාවූ නිරුද්ධවූ වෙනස්වූ (රූපය) සිහිකරන්නහුට දොම්නස උපදියි. මෙබඳු යම් දොම්නසක් වේද, මෙය කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. සොත විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, සතුටු වන්නාවූ, තෘෂ්ණාවෙන් යුක්තවූ, ශබ්දයන්ගේ නොලැබීම හෝ නොලැබීම් වශයෙන් දක්නහුටද, පූර්වයෙහි හෝ නොලද්දාවූ, ඉක්ම ගියාවූ, නිරුද්ධවූ, වෙනස්වූ, (රූපය) සිහිකරන්නහුටද දොම්නස උපදියි. මෙබඳුවූ යම් දොම්නසක් වේද, මෙය කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. ඝ්‍රාණවිඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, සතුටු වන්නාවූ, තෘෂ්ණාවෙන් යුක්තවූ, ගන්ධයන්ගේ නොලැබීම හෝ නොලැබීම් වශයෙන් දක්නහුටද, පූර්වයෙහි හෝ නොලද්දාවූ, ඉක්ම ගියාවූ, නිරුද්ධවූ, වෙනස්වූ, (ගන්ධය) සිහිකරන්නහුටද දොම්නස උපදියි. මෙබඳුවූ යම් දොම්නසක් වේද, මෙය කාමගුණයන් ඇසුරු කළාවූ, දොම්නසයයි කියනු ලැබේ. ජිව්හා විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, සතුටුවන්නාවූ, තෘෂ්ණාවෙන් යුක්තවූ, රසයන්ගේ නොලැබීම හෝ නොලැබීම් වශයෙන් දක්නහුටද, පූර්වයෙහි හෝ නොලද්දාවූ, ඉක්ම ගියාවූ, නිරුද්ධවූ, වෙනස්වූ, (රසය) සිහිකරන්නහුටද, දොම්නස උපදියි. මෙබඳුවූ යම් දොම්නසක් වේද, මෙය කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. කාය විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, සතුටු වන්නාවූ, තෘෂ්ණාවෙන් යුක්තවූ, ස්පර්ශයන්ගේ නොලැබීම

හෝ නොලැබීම් වශයෙන් දක්නහුටද, පූර්වයෙහි හෝ නොලද්දාවූ, ඉක්ම ගියාවූ, නිරුද්ධවූ, වෙනස්වූ, (ස්පර්ශය) සිහිකරන්නහුටද දොම්නස උපදියි. මෙබඳුවූ යම් දොම්නසක් වේද, මෙය කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. මනො විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවන්නාවූ, මනාපවූ, සතුටු වන්නාවූ, තෘෂ්ණාවෙන් යුක්තවූ, ධර්මායතනයන්ගේ නොලැබීම හෝ නොලැබීම් වශයෙන් දක්නහුටද, පූර්වයෙහි හෝ නොලද විරූ ඉකුත්වූ, නිරුද්ධවූ, වෙනස්වූ, (ධර්මය) දක්නහුට දොම්නස උපදියි. මෙබඳුවූ යම් දොම්නසක් වේද, මෙය කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. මොහු සදෙන කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නස් වෙත්.

8. "එහි නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ දොම්නස් හය කවරහුද? රූපයන්ගේම අනිත්‍ය බව වෙනස්වීම නොඇල්ම වැළැක්ම දැන, පූර්වයෙහිද මේ කාලයෙහිද, යම් රූපයෝ වෙත්ද, ඒ සියලු රූපයෝ අනිත්‍යයහ, දුක්යහ, පෙරළෙන ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දැක නිරුත්තරවූ විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව තබයි. මේ කාලයෙහි ආර්‍ය්‍යයෝ යම් රහත් බවකට පැමිණ වාසය කරත්ද, කවර කලෙක්හි නම් මම ඒ රහත් බවට පැමිණ වාසය කරන්නෙම් දැයි, මෙසේ නිරුත්තරවූ විමොක්ෂයන්හි (රහත්බැව්හි) ප්‍රාර්ථනාව පිහිටු වන්නහුට ඒ ප්‍රාර්ථනා හේතුවෙන් දොම්නස උපදියි. මෙබඳු යම් දොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. ශබ්දයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නැතිවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, යම් ශබ්දයෝ වෙත්ද, ඒ සියලු ශබ්දයෝ අනිත්‍යයහ, දුක්යහ, පෙරළෙන ස්වභාව ඇත්තාහයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දැක, නිරුත්තරවූ විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව තබයි. මේ කාලයෙහි ආර්‍ය්‍යයෝ යම් රහත් බවකට පැමිණ වාසය කරත්ද, කවර කලෙක්හි නම් මම ඒ රහත් බවට පැමිණ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වාසය කරන්නෙම් දැයි, මෙසේ නිරුත්තරවූ විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව පිහිටුවන්නහුට ප්‍රාර්ථනා හේතුවෙන් දොම්නස උපදියි. මෙබඳු යම් දොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. ගන්ධයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නැතිවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, යම් ගන්ධයෝ වෙත්ද, ඒ සියලු ගන්ධයෝ අනිත්‍යයහ, දුක්යහ, පෙරළෙන ස්වභාව ඇත්තාහයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දැක, නිරුත්තරවූ, විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව තබයි. මේ කාලයෙහි ආයසීයෝ යම් රහත් බවකට පැමිණ වාසය කරත්ද, කවර කලෙක්හි නම් මම ඒ රහත් බවට පැමිණ වාසය කරන්නෙම් දැයි, මෙසේ නිරුත්තරවූ, විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව පිහිටුවන්නහුට ප්‍රාර්ථනාව හේතුවෙන් දොම්නස උපදියි. මෙබඳු යම් දොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. රසයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නැතිවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, යම් රසයෝ වෙත්ද, ඒ සියලු රසයෝ අනිත්‍යයහ, දුක්යහ, පෙරළෙන ස්වභාව ඇත්තාහයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන්, යහපත් ප්‍රඥාවෙන් දැක, නිරුත්තරවූ, විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව තබයි. මේ කාලයෙහි ආයසීයෝ යම් රහත් බවකට පැමිණ වාසය කරත්ද, කවර කලෙහි නම් මම ඒ රහත් බවට පැමිණ වාසය කරන්නෙම් දැයි, මෙසේ නිරුත්තරවූ, විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව පිහිටුවන්නහුට ප්‍රාර්ථනා හේතුවෙන් දොම්නස උපදියි. මෙබඳු යම් දොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. ස්පර්ශ කළ යුත්තන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නැතිවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, යම් ස්පර්ශයෝ වෙත්ද, ඒ සියලු ස්පර්ශයෝ අනිත්‍යයහ, දුක්යහ, පෙරළෙන ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන්, යහපත් ප්‍රඥාවෙන් දැක, නිරුත්තරවූ, විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තබයි. මේ කාලයෙහි ආයර්‍ය්‍යයෝ යම් රහත් බවකට පැමිණ වාසය කරත්ද, කවර කලෙක්හි නම් මම ඒ රහත් බවට පැමිණ වාසය කරන්නෙම් දැයි මෙසේ නිරුත්තරවූ, විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව පිහිටු වන්නහුට ප්‍රාර්ථනා හේතුවෙන් දොම්නස උපදියි. මෙබඳු යම් දොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. ධර්මයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නැසීම, දැන පූර්වයෙහිද, මේ කාලයෙහිද, ධර්මායතනයෝ වෙත්ද, ඒ සියලු ධර්මායතනයෝ අනිත්‍යයහ, දුක්යහ, පෙරළෙන ස්වභාව ඇත්තාහයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දැක, නිරුත්තරවූ විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව පිහිටුවයි. ආයර්‍ය්‍යයෝ මේ කාලයෙහි යම් රහත් බවකට පැමිණ වාසය කෙරෙත්ද, කවර කලෙක්හි නම්, මම ඒ රහත් බවට පැමිණ වාසය කරන්නෙම් දැයි, මෙසේ නිරුත්තරවූ විමොක්ෂයන්හි (රහත් බැව්හි) ප්‍රාර්ථනාව තබන්නහුට ප්‍රාර්ථනාව නිසා දොම්නස උපදියි. මෙබඳු යම් දොම්නසක් වේද, මෙය නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ දොම්නසයයි කියනු ලැබේ. මොහු සදෙන නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළාවූ දොම්නස් වෙත්.

**9.** "එහි කාමගුණයන් ඇසුරු කළාවූ උපෙක්ෂා සය කවරහුද යත්? ඇසින් රූපය දැක බාලවූ මූඪවූ පෘථග්ජනවූ ක්ෂීණාශ්‍රව නොවූ, රහත් නොවූ ආදිනව නොදක්නා සුළුවූ අශ්‍රැතවත් පෘථග්ජනයාහට අඥානකම නිසා උපදනා උපෙක්ෂාව උපදියි. මෙබඳු යම් උපෙක්ෂාවක් වේද, ඕතොමෝ රූපය නොඉක්මවයි. එහෙයින් ඒ උපෙක්ෂාව කාමගුණ නිශ්‍රිත උපෙක්ෂායයි කියනු ලැබේ. කණින් ශබ්දය අසා බාලවූ, මූඪවූ, පෘථග්ජනවූ, ක්ෂීණාශ්‍රව නොවූ, රහත් නොවූ, ආදීනව නොදන්නාවූ, ඇසූපිරූතැන් නැති, පෘථග්ජනයා හට නොදැනීමෙන් උපදනා මැදහත් බව උපදියි. මෙබඳුවූ යම් උපෙක්ෂාවක් වේද, ඒ උපෙක්ෂාව ශබ්දය නොයික්මවයි. එහෙයින් ඒ උපෙක්ෂාව කාමගුණ ඇසුරු කළාවූ, උපේක්ෂාව යයි කියනු ලැබේ. නාසයෙන් ගඳ දැන බාලවූ, මූඪවූ, පෘථග්ජනවූ, ක්ෂීණාශ්‍රව නොවූ, රහත් නොවූ, ආදීනව

නොදන්නාවූ, ඇසූපිරූ තැන් නැති, පෘථග්ජනයාහට නොදැනීමෙන් උපදනා මැදහත් බව උපදියි. මෙබඳුවූ යම් උපෙක්ෂාවක් වේද, ඒ උපෙක්ෂාව ශබ්දය නොයික්මවයි. එහෙයින් ඒ උපෙක්ෂාව කාමගුණ ඇසුරු කළාවූ, උපෙක්ෂාව යයි කියනු ලැබේ. දිවෙන් රසවිඳ බාලවූ, මූඪවූ, පෘථග්ජනවූ, ක්ෂීණාශ්‍රව නොවූ, රහත් නොවූ, ආදීනව නොදන්නාවූ, ඇසූපිරූතැන් නැති පෘථග්ජනයාහට නොදැනීමෙන් උපදනා මැදහත් බව උපදියි. මෙබඳුවූ යම් උපෙක්ෂාවක් වේද, ඒ උපෙක්ෂාව රසය නොයික්මවයි. එහෙයින් ඒ උපෙක්ෂාව කාමගුණ ඇසුරු කළාවූ, උපෙක්ෂාවයි කියනු ලැබේ. කයින් ස්පර්ශ කටයුත්ත ස්පර්ශකොට බාලවූ, මූඪවූ, පෘථග්ජනවූ, ක්ෂීණාශ්‍රව නොවූ, රහත් නොවූ, ආදීනව නොදන්නාවූ, ඇසූපිරූතැන් නැති පෘථග්ජනයාහට නොදැනීමෙන් උපදනා මැදහත් බව උපදියි. මෙබඳුවූ යම් උපෙක්ෂාවක් වේද, ඒ උපෙක්ෂාව ස්පර්ශය නොයික්මවයි. එහෙයින් ඒ උපෙක්ෂාව කාමගුණ ඇසුරු කළාවූ උපෙක්ෂාවයයි කියනු ලැබේ. සිතින් ධර්මාරම්මණය දැන බාලවූ, මූඪවූ, පෘථග්ජනවූ, ක්ෂීණාශ්‍රව නොවූ, රහත් නොවූ, ආදීනව නොදන්නා සුළුවූ, ඇසූපිරූතැන් නැති පෘථග්ජනයාහට අඥානකමින් හටගන්නා උපෙක්ෂාව උපදියි. මෙබඳු යම් උපෙක්ෂාවක් වේද, ඕතොමෝ ධර්මාරම්මණය නොඉක්මවයි. එහෙයින් ඕතොමෝ කාමගුණ නිශ්‍රිත උපෙක්ෂායයි කියනු ලැබේ. මොහු සදෙන කාමගුණ නිශ්‍රිත උපෙක්ෂාවෝ වෙත්.

10. "එහි නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂාවෝ සදෙන කවරහුදයත්? රූපයන්ගේම අනිත්‍ය බව, වෙනස් වීම, නොඇලීම, නිරුද්ධවීම, දැන පූර්වයෙහිද, මේ කාලයෙහිද රූපයෝ වෙත්ද, ඒ සියලු රූපයෝ අනිත්‍යයෝය, දුක්ඛයෝය, විපරිනාම ස්වභාව ඇත්තාහුයයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් බලන්නහුට උපෙක්ෂාව උපදියි. ඒ උපෙක්ෂාව රූපය ඉක්මවයි. එහෙයින් ඒ උපෙක්ෂාව නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂායයි කියනු ලැබේ.

ශබ්දයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නිරුද්ධවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, ශබ්දයෝ වෙත්ද, ඒ සියලු ශබ්දයෝ අනිත්‍යයෝය, දුක්ඛයෝය, විපරිනාම ස්වභාවය ඇත්තාහුයයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නහුට (විදර්ශනා ඥාන සම්ප්‍රයුක්තවූ) උපෙක්ෂාව උපදියි. මෙබඳු යම් උපෙක්ෂාවක් වේද, ඕතොමෝ නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂාවයයි කියනු ලැබේ. ගන්ධයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නිරුද්ධවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, ගන්ධයෝ වෙත්ද, ඒ සියලු ගන්ධයෝ අනිත්‍යයෝය, දුක්ඛයෝය, විපරිනාම ස්වභාවය ඇත්තාහුයයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන්, යහපත් නුවණින් දක්නහුට (විදර්ශනා ඥාන සම්ප්‍රයුක්තවූ) උපෙක්ෂාව උපදියි. මෙබඳු යම් උපෙක්ෂාවක් වේද, ඕතොමෝ නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂාවයයි කියනු ලැබේ. රසයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නිරුද්ධවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, රසයෝ වෙත්ද, ඒ සියලු රසයෝ අනිත්‍යයෝය, දුක්ඛයෝය, විපරිනාම ස්වභාවය ඇත්තාහුයයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන්, යහපත් නුවණින් දක්නහුට (විදර්ශනා ඥාන සම්ප්‍රයුක්තවූ) උපෙක්ෂාව උපදියි. මෙබඳු යම් උපෙක්ෂාවක් වේද, ඕතොමෝ නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂාවයයි කියනු ලැබේ. ස්පර්ශකළ යුත්තන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නිරුද්ධවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, ස්පර්ශයෝ වෙත්ද, ඒ සියලු ස්පර්ශයෝ අනිත්‍යයෝය, දුක්ඛයෝය, විපරිනාම ස්වභාවය ඇත්තාහුයයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන්, යහපත් නුවණින් දක්නහුට (විදර්ශනා ඥාන සම්ප්‍රයුක්තවූ) උපෙක්ෂාව උපදියි. මෙබඳු යම් උපෙක්ෂාවක් වේද, ඕතොමෝ නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂාවයයි කියනු ලැබේ. ධර්මාරම්මණයන්ගේම අනිත්‍ය බව, වෙනස්වීම, නොඇලීම, නිරුද්ධවීම දැන, පූර්වයෙහිද, මේ කාලයෙහිද, ධර්මාරම්මණයෝ වෙත්ද, ඒ සියලු ධර්මාරම්මණයෝ අනිත්‍යයෝය, දුක්ඛයෝය, විපරිනාම ස්වභාව

ඇත්තාහුයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නහුට (විදර්ශනා ඥාන සම්ප්‍රයුක්තවූ) උපෙක්ෂාව උපදියි. මෙබඳු යම් උපෙක්ෂාවක් වේද, ඒ උපෙක්ෂාව ධර්මාරම්මණ ඉක්මවයි. එහෙයින් ඒ උපෙක්ෂාව නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂායයි කියනු ලැබේ. මොහු සදෙන නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ උපෙක්ෂාවෝ වෙත්.

11. "සත්වයන්ගේ පදයෝ සතිස දතයුත්තාහුයයි, මෙසේ ඒ යමක් කියන ලදද, මෙය මේ සඳහා කියන ලදී.

"එහි මෙය නිසා මෙය දුරුකරව් යයි මෙසේ කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? මහණෙනි, එහි යම් නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ සොම්නස් හයක් වෙත්ද, ඔවුන් නිසා ඔවුන්ට පැමිණ, යම් කාමගුණ නිශ්‍රිත සොම්නස් හයක් වෙත්ද ඔවුන් දුරුකරව්. ඔවුන් ඉක්මවව්. මෙසේ මොවුන්ගේ දුරුකිරීම වේ. මෙසේ මොවුන්ගේ ඉක්මවීම වේ. මහණෙනි, එහි නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ දොම්නස් සයක් වෙත්ද, ඔවුන් නිසා ඔවුන්ට පැමිණ යම් කාමගුණයන් ඇසුරු කළාවූ දොම්නස් සයක් වෙත්ද ඔවුන් දුරුකරව්. ඔවුන් ඉක්මවව්. මෙසේ මොවුන්ගේ දුරුකිරීම වේ. මෙසේ මොවුන්ගේ ඉක්මවීම වේ. මහණෙනි, එහි නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ යම් උපෙක්ෂා සයක් වෙත්ද, ඔවුන් නිසා ඔවුන්ට පැමිණ යම් කාමගුණයන් ඇසුරු කළාවූ උපෙක්ෂා සයක් වෙත්ද, ඔවුන් දුරුකරව්. ඔවුන් ඉක්මවව්. මෙසේ මොවුන්ගේ දුරුකිරීම වේ. මෙසේ මොවුන්ගේ ඉක්මවීම වේ.

12. "මහණෙනි, එහි නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ යම් සොම්නස් සයක් වෙත්ද, ඔවුන් නිසා ඔවුන්ට පැමිණ නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ යම් දොම්නස් සයක් වෙත්ද, ඔවුන් දුරුකරව්, ඔවුන් ඉක්මවව්. මෙසේ මොවුන්ගේ දුරුකිරීම වේ. මෙසේ මොවුන්ගේ ඉක්මවීම වේ. මහණෙනි, එහි නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ යම් උපෙක්ෂා සයක් වෙත්ද, ඔවුන් නිසා ඔවුන්ට පැමිණ නෛෂ්ක්‍රම්‍යයන් ඇසුරු කළාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම් සොම්නස් සයක් වෙත්ද, ඔවුන් දුරු කරව්. ඔවුන් ඉක්මවව්. මෙසේ මොවුන්ගේ දුරුකිරීම වේ. මෙසේ මොවුන්ගේ ඉක්මවීම වේ. මහණෙනි, නානාත්වවූ (අනෙකප්‍රකාරවූ) නොයෙක් අරමුණු ඇසුරු කළාවූ උපෙක්ෂාවක් ඇත්තේය. එකත්වවූ එක් අරමුණක් ඇසුරු කළාවූ උපෙක්ෂාවක් ඇත්තේය. මහණෙනි, නානාත්වවූ නොයෙක් අරමුණු ඇසුරු කළාවූ උපෙක්ෂාව කවරද? මහණෙනි, රූපයන්හි උපෙක්ෂාව ඇත්තේය. ශබ්දයන්හි ඇත්තේය. ගන්ධයන්හි ඇත්තේය. රසයන්හි ඇත්තේය. ස්පර්ශයන්හි ඇත්තේය. මහණෙනි, මේ උපෙක්ෂාව නානාත්වවූ නොයෙක් අරමුණු ඇසුරු කළාවූ උපෙක්ෂාව වේ.

13. "මහණෙනි, ඒකත්වවූ එක අරමුණක් ඇසුරු කළාවූ උපෙක්ෂා කවරීද? මහණෙනි, ආකාසානඤ්චායතනය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් ඇත්තේය. විඤ්ඤාණඤ්චායතනය ඇසුරුකළාවූ උපෙක්ෂාවක් ඇත්තේය. ආකිඤ්චඤ්ඤායතනය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් ඇත්තේය. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් ඇත්තේය. මහණෙනි, මේ උපෙක්ෂාව එකත්වවූ එක අරමුණක් ඇසුරු කළාවූ උපෙක්ෂාව වේ. මහණෙනි, එහි යම් මේ එකත්වවූ එක අරමුණක් ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, ඒ නිසා එයට පැමිණ යම් මේ නානාත්වවූ නොයෙක් අරමුණු ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, එය දුරුකරව්. එය ඉක්මවව්. මෙසේ මේ උපෙක්ෂාවගේ දුරුකිරීම වේ. මෙසේ මේ උපෙක්ෂාවගේ ඉක්මවීම වේ. මහණෙනි, තෘෂ්ණා රහිත බව නිසා තෘෂ්ණා රහිත බවට පැමිණ යම් මේ එකත්වවූ එක අරමුණක් ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, එය දුරු කරව්. එය ඉක්මවව්. මෙසේ මේ උපෙක්ෂාවෙන් දුරුකිරීම වේ. මෙසේ මේ උපෙක්ෂාවගේ ඉක්මවීම වේ. එහි මෙය නිසා මෙය දුරුකරව්යයි මෙසේ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

14. "ආර්‍ය්‍ය පුද්ගල තෙමෙ යම් සතිපට්ඨාන තුනක් සේවනය කෙරේද, ආර්‍ය්‍යවූ ශාස්තෘතෙම යම් සතිපට්ඨාන තුනක් සේවනය කරන්නේ සමූහයාට අනුශාසනා කරන්ට සුදුසු වේයයි මෙසේ

වනාහි මේ කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? මහණෙනි, මේ ශාසනයෙහි ශාස්තෘතෙම ශ්‍රාවකයන්ට අනුකම්පා ඇත්තේ වැඩ කැමැත්තේ අනුකම්පා පිණිස, මෙය තොපට වැඩ පිණිස, මෙය තොපට සැප පිණිස වේයයි ධර්මය දෙශනා කරයි.

15. "උන්වහන්සේගේ ඒ ධර්මය ශ්‍රාවකයෝ අසනු නොකැමැති වෙත්ද, කන් නොඑලවත්ද, දැනගැණීම පිණිස සිත නොපිහිටුවත්ද, ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාවෙන් ඉක්ම පවතිත්ද, මහණෙනි, එහි තථාගත තෙම නොම සතුටු සිත් ඇත්තේ වෙයි. සතුටු සිත් ඇති බව ප්‍රකාශ නොකරයි. ද්වෙෂය වැස්සීමක් නැතිව සිහියෙන් යුක්තව නුවණින් යුක්තව වාසය කරයි. මහණෙනි, ආයර්‍ය්‍යවූ සම්‍යක් සම්බුද්ධ තෙම යම් සතිපට්ඨානයක් සේවනය කරයිද, යම් සතිපට්ඨානයක් සේවනය කරන්නාවූ ආයර්‍ය්‍යවූ ශාස්තෘතෙම සමූහයාට අනුශාසනා කරන්ට සුදුසුවූ මේ පළමු වැනි සතිපට්ඨානයයි කියනු ලැබේ.

16. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ශාස්තෘතෙම අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ, අනුකම්පා පිණිස මෙය තොපට වැඩ පිණිස මෙය තොපට සැප පිණිසයයි, ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කරයි. උන්වහන්සේගේ ධර්මය ඇතැම් ශ්‍රාවකයෝ අසනු කැමැති නොවෙත්. කන් නොඑලවත්. දැන ගැණීමට සිත නොපිහිටුවත්. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාවෙන් වෙන්ව පවතිත්. ඇතැම් ශ්‍රාවකයෝ අසනු කැමැති වෙත්. කන් එලවත්. දැනගැණීම පිණිස සිත පිහිටුවත්. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනා වෙන් වෙන්ව නොපවතිත්. මහණෙනි, එහි තථාගතතෙම සතුටු සිත් ඇත්තේද නොමවේ. සතුටු සිත් ඇති බවද ප්‍රකාශ නොකරයි. නොසතුටු සිත් ඇත්තේද නොවෙයි. නොසතුටු සිත් ඇති බවද ප්‍රකාශ නොකරයි. සතුටු සිත් ඇති බවද නොසතුටු සිත් ඇති බවද යන ඒ දෙකම දුරු කොට හෙතෙම මධ්‍යස්ථවූයේ සිහියෙන් යුක්තව නුවණින් යුක්තව වාසය කරයි. මහණෙනි, ආයර්‍ය්‍යතෙම යම් සතිපට්ඨානයක් සේවනය කරයිද, ආයර්‍ය්‍යවූ ශාස්තෘතෙම යම් සතිපට්ඨානයක්

සේවනය කරන්නේ සමූහයාට අනුශාසනා කරන්ට සුදුසුවූ මේ දෙවැනි සතිපට්ඨානයයි කියනු ලැබේ.

17. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ශාස්තෘ තෙම අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ, අනුකම්පා පිණිස මෙය තොපට හිත පිණිසය, මෙය තොපට සැප පිණිසයයි, ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කරයි. උන්වහන්සේගේ ධර්මය ශ්‍රාවකයෝ අසනු කැමැති වෙත්. කන් එලවත්. දැන ගැණීමට සිත පිහිටුවත්. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාවෙන් බැහැරවද නොපවතිත්. මහණෙනි, එහි තථාගත තෙම සතුටු සිත් ඇත්තේද වෙයි. සතුටු සිත් ඇති බවද ප්‍රකාශ කරයි. ආශාව වැස්සීමෙන් තොරව සිහියෙන් යුක්තව, නුවණින් යුක්තව වාසය කරයි. මහණෙනි, ආර්‍ය්‍ය තෙම යම් සතිපට්ඨානයක් සේවනය කරයිද, ආර්‍ය්‍යවූ ශාස්තෘතෙම යම් සතිපට්ඨානයක් සේවනය කරන්නේ සමූහයාට අනුශාසනා කරන්ට සුදුසු තුන්වැනි සතිපට්ඨානයයි කියනු ලැබේ.

18. "ආර්‍ය්‍යවූ සම්‍යක් සම්බුද්ධ තෙම යම් සතිපට්ඨාන තුනක් සේවනය කෙරේද, ආර්‍ය්‍යවූ ශාස්තෘතෙම යමක් සේවනය කරන්නේ, සමූහයාට අනුශාසනා කරන්ට සුදුසුවේයයි, මෙසේ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

"හෙතෙම දමනය කළ යුත්තන් දමනය කරන්නවුන් අතුරෙන් නිරුත්තරවූ පුරුෂයන් දමනය කිරීමෙහි සාරථි වාහකයෙකු බඳුයි කියනු ලැබේයයි, මෙසේ වනාහි මේ කියන ලදී. කුමක් සඳහා මේ කියන ලදද? මහණෙනි, ඇතුන් දමනය කරන්නෙකු විසින් දමනය කළාවූ ඇතා මෙහෙයවන ලද්දේ එකම දිසාවකට දුවයි-පූර්ව දිසාවට හෝ පශ්චිම දිසාවට හෝ උතුරු දිසාවට හෝ දකුණු දිසාවට හෝ (දුවයි). මහණෙනි, අසුන් දමනය කරන්නෙකු විසින් දමනය කළාවූ අසු මෙහෙයවන ලද්දේ, එකම දිසාවකට පූර්ව දිසාවට හෝ පශ්චිම දිසාවට හෝ උතුරු දිසාවට හෝ දකුණු දිසාවට හෝ දුවයි. මහණෙනි, ගවයන් දමනය කරන්නෙකු විසින් දමනය කළාවූ ගවයා මෙහෙයවන ලද්දේ එකම දිසාවකට පූර්වදිසාවට හෝ පශ්චිම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දිසාවට හෝ උතුරු දිසාවට හෝ දකුණු දිසාවට හෝ දුවයි. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් විසින් දමනය කළාවූ පුරුෂතෙම මෙහෙයවන ලද්දේ අටදිසාවන්ටම දුවයි. රූපී පුද්ගල තෙම රූපයන් දකියි. මේ පළමුවන දිසාවයි. තමා කෙරෙහි අරූප සංඥා ඇත්තේ පිටත්හි රූපයන් දකියි. මේ දෙවන දිසාවයි. සුභයයිම අදහස් ඇත්තේ වෙයි. මේ තුන් වන දිසාවයි සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාවන් නැසීමෙන් නානාත්ම සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ සතරවන දිසාවයි. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ පස්වන දිසාවයි. සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැත්තේයයි, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ සවන දිසාවයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ සත්වන දිසාවයි සියලු ආකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ අටවන දිසාවයි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් දමනය කරණලද පුරුෂතෙම මෙහෙයවන ලද්දේ මේ අට දිසාවන්ට විශෙෂයෙන් දිවීම කරයි. හෙතෙම දමනය කළයුත්තන් දමනය කරන්නවුන් අතුරෙන් නිරුත්තරවූ පුරිසදම්ම සාරථී, යි කියනු ලැබෙයයි, මෙසේ ඒ යමක් කියන ලදද එය මේ සඳහා කියන ලදී.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය.

**සත්වැනි සළායතන විභංග සූත්‍රය නිමි. (4-7)**

# 38. උද්දෙස විභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි, භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඩු මහසිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට "මහණෙනි" කියා ආමන්ත්‍රණය කළ සේක. "පින්වතුන් වහන්සැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

2. "මහණෙනි, තොපට උද්දෙසයත් විභංගයත් (මාතෘකාවද විස්තරයද) දෙශනා කරන්නෙමි. එය අසව්. යහපත්කොට මෙනෙහිකරව්. කියන්නෙමි" යනුයි. "එසේය, ස්වාමීනි," කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

3. "මහණෙනි, භික්ෂුතෙම යම් යම් ආකාරයකින් නුවණින් පිරිසිඳ බලන්නෙකුට පිටත් අරමුණුවල සිත නොවිසිරයන්නේද ධ්‍යාන අරමුණෙහි ඇලීම් වශයෙන් නොපිහිටියේද, විඤ්ඤාණය තමායයි නොගැනීම නිසා ආශාවෙන් තැතිනොගන්නේද? ඒ ඒ ආකාරයෙන් පිරිසිඳ බලන්නේය. මහණෙනි, සිත පිටත් අරමුණුවලැ නොවිසිර ගිය කල්හි භාවනා අරමුණෙහි ඇලීම් වශයෙන් නොපිහිටි කල්හි විඤ්ඤාණය තමා වශයෙන් නොගැනීම නිසා තැති නොගන්නාහට මත්තෙහි ජාති ජරා මරණ දුක්ඛ සමුදයන්ගේ හටගැණීමෙක් නොවන්නේය." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගිට විහාරයට ඇතුල්වූසේක.

4. "ඉක්බිති ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ බැහැර ගිය නොබෝ කල්හි මෙබඳු සිතක් විය. ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ සංක්ෂෙපයෙන් මේ උද්දෙසය වදාරා විස්තර වශයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට ඇතුල්වූසේක. පිරිසිඳ බලන්නහුට පිටත් අරමුණුවල සිත නොවිසිර යන්නේද, ධ්‍යාන අරමුණෙහි ඇලීම් වශයෙන් සිත නොපිහිටයිද විඤ්ඤාණය තමායයි නොගැනීම නිසා තැති

නොගන්නේද, ඒ ඒ පරිද්දෙන් මහණ තෙම පිරිසිඳ බලන්නේය. මහණෙනි, පිටත් අරමුණුවල සිත විසිර නොගිය කල්හි, නොවිසිරීම ඇති කල්හි, ධ්‍යාන අරමුණෙහි ඇලීමෙන් නොපිහිටි කල්හි, විඤ්ඤාණය තමායයි නොගැනීම නිසා තැති නොගන්නා කල්හි, මත්තෙහි ජාති, ජරා, මරණ දුක්ඛයන්ගේ හටගැණීමක් නොවන්නේයයි වදාළේය. කවරෙක් නම් භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් උදෙසනලද විස්තර වශයෙන් අර්ථ විභාග නොකරනලද මේ උද්දෙසයාගේ අර්ථය විස්තර වශයෙන් විභාග කරන්නේදැයි" කියායි.

5. "එකල්හි ඒ භික්ෂූන්ට මෙබඳු අදහසක් විය. මේ ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙමේ වනාහි ශාස්තෲන් වහන්සේ විසින්ද මනාව වර්ණනා කරණ ලද්දේය. නුවණැති භික්ෂූන් විසින්ද ගරු කරණ ලද්දේය ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් උදෙසනලද විස්තර වශයෙන් අර්ථ විභාග නොකරණලද මේ උද්දෙසයාගේ අර්ථය විස්තර වශයෙන් විභාග කරන්ට සමර්ථ වන්නේය. අපි ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැනට යමු. ගොස්, ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන්ගෙන් මේ කාරණය විචාරන්නෙමු නම් යහපතැයි යනුයි.

6. "ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙම යම් තැනෙක්හිද, එතැනට ගියාහුය. ගොස්, ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන් සමග සතුටු වූවාහුය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පසක හුන්නාහුය. එකත්පසක හුන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන්ට මෙය කීවාහුය. "ආයුෂ්මත් කච්චායන ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දෙසය කොටින් වදාරා විස්තර වශයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට ඇතුල්වූසේක.

'මහණෙනි, යම් යම් ආකාරයකින් පිරිසිඳ බලන්නහුගේ සිත පිටත් අරමුණුවල නොවිසිර යන්නේද, ධ්‍යාන අරමුණෙහි

ඇලීම් වශයෙන් නොපිහිටන්නේද, විඤ්ඤාණය තමා වශයෙන් නොගැනීම නිසා තැති නොගන්නේද, ඒ ඒ ආකාරයෙන් මහණතෙම පිරිසිඳ බලන්නේය. මහණෙනි, පිටත් අරමුණුවල නොවිසිරගිය කල්හි නොවිසිරීම ඇති කල්හි, ධ්‍යාන අරමුණෙහි ඇලීම් වශයෙන් නොපිහිටි කල්හි, විඤ්ඤාණය තමා වශයෙන් නොගැනීම නිසා තැතිගැන්මක් නැත්තහුට මත්තෙහි ජරා, ජරා, මරණය දුක්ඛයන්ගේ හටගැණීමක් නොවන්නේය යනුයි, ආයුෂ්මත්වූ කච්චායන ස්ථවිරයන් වහන්ස, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ බැහැරගිය නොබෝ කල්හි මෙබඳු සිතක් විය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දෙසය වනාහි සංක්ෂෙපයෙන් උදෙසා විස්තර වශයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට ඇතුල්වූසේක.

'යම් යම් ආකාරයකින් පිරිසිඳ බලන්නෙකුට සිත පිටත් විසිර නොයන්නේද, ධ්‍යාන අරමුණෙහි ඇලීම් වශයෙන් නොපිහිටන්නේද, තමා වශයෙන් නොගැනීම නිසා තැති නොගන්නේද, ඒ ඒ ආකාරයෙන් මහණතෙම පිරිසිඳ බලන්නේය. මහණෙනි, පිටත් අරමුණුවල සිත නොවිසිර ගිය කල්හි, නොවිසිරීම ඇති කල්හි, ධ්‍යාන අරමුණෙහි ඇලීමෙන් නොපිහිටි කල්හි, තමායයි නොගැනීම නිසා තැති නොගන්නාහට මත්තෙහි ජාති, ජරා, මරණ දුක්ඛයන්ගේ හට ගැනීමක් නොවන්නේය' යනුයි. කවරෙක් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් උදෙසනලද විස්තර වශයෙන් අර්ථ විභාග නොකරන ලද මේ උද්දෙසයාගේ විස්තර වශයෙන් අර්ථය විභාග කරන්නේදැයි කියායි.

7. "ආයුෂ්මත් කච්චායන ස්ථවිරයෙනි, ඒ අපට මෙබඳු සිතක් විය. මේ ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරතෙම ශාස්තෘන් වහන්සේ විසින්ද වර්ණනා කරණ ලද්දේය. නුවණැති භික්ෂූන් විසින්ද ගරු කරණ ලද්දේය ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් උදෙසනලද විස්තර වශයෙන් අර්ථය විභාග නොකරණලද මේ උද්දෙසයාගේ විස්තර වශයෙන් අර්ථය විභාග කරන්ට සමර්ථ

වේ. අපි ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට එළඹෙන්නෙමු. එළඹ, ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන්ගෙන් මේ කරුණ අසන්නෙමු නම්, යහපතැයි කියායි. ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙමේ එය විස්තර කෙරේවා" යි කීවාහුය.

8. "ඇවැත්නි, යම්සේ හරයෙන් ප්‍රයෝජන ඇති, හරය සොයන්නාවූ පුරුෂයෙක් තෙම හර සෙවීමෙහි හැසිරෙන්නේ පිහිටියාවූ, හර ඇත්තාවූ, මහත් ගසක්හුගේ මුල ඉක්මවා, කඳ ඉක්මවා, අතු රිකිලිවල හරය සෙවිය යුතුයයි හඟින්නේද, මෙයත් එසේය. ආයුෂ්මතුන්ලාට ශාස්තෘන් වහන්සේ සම්මුඛවූ කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා අපගෙන් මේ කරුණ ඇසිය යුතුයයි හඟින්නහුය. ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දතයුත්ත දන්නාහ. දැක්ක යුත්ත දක්නාහ. ඇසක්ම වූයේ, ඤාණයක්ම වූයේ, ධර්මයක්ම වූයේ, ශ්‍රෙෂ්ඨ වූයේ, කියන්නෙක් වූයේ, පවත්වන්නෙක් වූයේ, අර්ථයට පමුණුවන්නෙක් වූයේ, අමෘතය දෙන්නෙක් වූයේ, ධර්මස්වාමී වූයේ, තථාගතවූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගෙන්ම මේ කාරණය ඇසිය යුත්තේය. යම්සේ අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන්නේද, එසේ එය දරන්නහුය. මෙය ඊට සුදුසු කාලයද වූයේයයි" කීය.

9. "ආයුෂ්මත් කච්චායන ස්ථවිරයන් වහන්ස, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දන්නේය. දැක්ක යුත්ත දක්නේය. ඇසක්ම වූයේ, ඤාණයක්ම වූයේ, ධර්මයක්ම වූයේ, ශ්‍රෙෂ්ඨ වූයේ, කියන්නෙක් වූයේ, පවත්වන්නෙක් වූයේ, අර්ථයට පමුණුවන්නේ, අමෘතය දෙන්නේ, ධර්මස්වාමි වූයේ, තථාගත වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගෙන්ම මේ කාරණය අසන්නෙමු. යම්සේ අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන්නේද, එසේ එය දරන්නෙමු, යන යමක් වේද, මෙය ඊට සුදුසු කාලයද වූයේය. එතකුදු වුවත් ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙමේ ශාස්තෘන් වහන්සේ විසින්මද වර්ණනා කරණ ලද්දේය. නුවණැත්තාවූ භික්ෂූන් විසින්ද ගරු කරණ ලද්දේය ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ

විසින් කොටින් උදෙසනලද විස්තර වශයෙන් අර්ථය විභාග නොකරණලද මේ උද්දෙසයාගේ අර්ථය විස්තර වශයෙන් විභාගකරන්ට සමර්ථ වේ. ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙමේ මෙය බරක් වශයෙන් විස්තර කරන සේක්වා”යි කීවාහුය.

10. “ඇවැත්නි, එසේවී නම්, අසව්. යහපත්කොට මෙනෙහි කරව්. කියන්නෙමියි” කීය. “ඇවැත්නි, එසේයයි,” ඒ භික්ෂූහු, ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන්ට උත්තර දුන්හ. ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරතෙම මෙය ප්‍රකාශ කළේය. “ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට කොටින් යම් උද්දෙසයක් උදෙසා විස්තර වශයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද? මහණෙනි, ‘යම් යම් ආකාරයකින් පිරිසිඳ බලන්නහුගේ සිත පිටත් අරමුණුවල නොවිසිර පවත්නේද, ධ්‍යාන අරමුණෙහි ඇලීමෙන් නොපිහිටන්නේද, විඥ්ඥාණය තමා වශයෙන් නොගැනීම නිසා තැති නොගන්නේද, ඒ ආකාරයෙන් මහණ තෙම පිරිසිඳ බලන්නේය. මහණෙනි, සිත පිටත් අරමුණුවල නොවිසිරීම ඇති කල්හි, ධ්‍යාන අරමුණෙහි ඇලී නොසිටි කල්හි, තමා වශයෙන් නොගැනීම නිසා තැති නොගන්නහුට මත්තෙහි ජාති, ජරා, මරණය දුක්ඛයන්ගේ හටගැනීමක් නොවන්නේය’ යනුයි. ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කොටින් උදෙසන ලද විස්තර වශයෙන් අර්ථය විභාග නොකරණලද මේ උද්දෙසයාගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දනිමි.

11. “ඇවැත්නි, කෙසේ නම් සිත පිටත් අරමුණුවල විසිර ගියේයයි කියනු ලැබේද, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුහුගේ සිත ඇසින් රූපය දැක ඒ රූපාරමුණට අනුව ගමන් කරන්නේ වේද, රූපාරමුණු රස විඳීමෙහි බැඳුණාවූද, රූපාරමුණු රස විඳීමෙහි වෙළුණාවූද, රූපාරමුණු රස විඳීමෙහි බැඳෙන රැහැණින් යුක්තවූද සිත පිටත් අරමුණුවල විසිර ගිය පැතිර ගියේයයි කියනු ලැබේ.

“කණින් ශබ්දය අසා සිත ශබ්ද අනුව ගමන් කරන්නේ වෙයිද, සිත ශබ්දාරමුණු රස විඳීමෙන් බැඳුණාවූ ශබ්දාරමුණු

රස විඳීමෙහි වෙළුණාවූ ශබ්දාරමුණු රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්තවූ සිත පිටත් අරමුණුවල විසිරගිය සිතයයි කියනු ලැබේ.

"නැහැයෙන් සුවඳ ආඝ්‍රාණයකොට සිත ගන්ධ අරමුණ අනුව ගමන්කරන්නේ වෙයිද, ගන්ධාරමුණු රස විඳීමෙහි බැඳුණාවූ, ගන්ධාරමුණු රස විඳීමෙහි වෙළුණාවූ, ගන්ධාරමුණු රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්තවූ සිත පිටත් අරමුණුවල විසිරගිය සිතයයි කියනු ලැබේ.

"දිවෙන් රසය විඳ සිත රසාරමුණු අනුව ගමන්කරන්නේ වෙයිද, රස අරමුණ රස විඳීමෙහි බැඳුනාවූ, රස අරමුණු රස විඳීමෙහි වෙළුනාවූ, රස අරමුණු රස විඳීමෙහි බැඳුණ රැහැණින් යුක්තවූ සිත පිටත් අරමුණුවල විසිරගිය සිතයයි කියනු ලැබේ.

"කයින් ස්පර්ශයන් ස්පර්ශකොට සිත ප්‍රෂ්ටව්‍ය අරමුණ අනුව ගමන් කරන්නේ වෙයිද, ප්‍රෂ්ටව්‍ය අරමුණු රස විඳීමෙහි බැඳුණාවූ, ප්‍රෂ්ටව්‍ය අරමුණ රස විඳීමෙහි වෙළුණාවූ, ප්‍රෂ්ටව්‍ය අරමුණු රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්තවූ සිත පිටත්හි අරමුණුවල විසිරගිය සිතයයි කියනු ලැබේ.

"සිතින් ධර්මාරමුණු දැන සිත ධර්මාරමුණ අනුව ගමන් කරන්නේ ධර්මාරම්මණයෙහි රස විඳීමෙහි, බැඳුණාවූද, ධර්මාරම්මණ රස විඳීමෙහි වෙළුණාවූද, ධර්මාරම්මණ රස විඳීමෙහි රැහැණින් යුක්තවූද සිත පිටත් අරමුණුවල විසිර ගියේ පැතිරගියේයයි කියනු ලැබේ.

"ඇවැත්නි, මෙසේ වනාහි සිත පිටත් අරමුණුවල විසිර ගියේයයි කියනු ලැබේ.

12. "ඇවැත්නි, කෙසේ නම් සිත පිටත් අරමුණුවල නොවිසුරුණේයයි කියනු ලැබේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුහුගේ සිත ඇසින් රූපයක් දැක, රූප අරමුණ අනුව ගමන් නොකරන්නේ වේද, රූපාරමුණෙහි රස විඳීමෙහි නොබැඳුණාවූ, රූප අරමුණෙහි රස විඳීමෙහි නොවෙළුණාවූ, රූප අරමුණෙහි

රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්ත නොවූ, සිත පිටත් අරමුණුවල නොවිසිරුණු සිතයයි කියනු ලැබේ.

13 "කණින් ශබ්දය අසා සිත ශබ්ද අරමුණ අනුව ගමන් නොකරන්නෙ වෙයිද, සිත අරමුණු රස විඳීමෙහි නොබැඳුණාවූ, ශබ්ද අරමුණු රස විඳීමෙහි නොවෙළුනාවූ, ශබ්ද අරමුණු රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්ත නොවූ සිත පිටත් අරමුණුවල නොවිසුරුණු සිතයයි කියනු ලැබේ.

"නාසයෙන් ආඝ්‍රාණයකොට සිත ගන්ධ අරමුණ අනුව ගමන් නොකරන්නේ වේද, ගන්ධාරම්මණ රස විඳීමෙහි නොබැඳුණාවූ, ගන්ධාරම්මණ රස විඳීමෙහි නොවෙළුණාවූ, ගන්ධාරම්මණ රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්ත නොවූ සිත පිටත් අරමුණුවල නොවිසුරුණ සිතයයි කියනු ලැබේ.

"දිවෙන් රසය විඳ සිත රසාරම්මණය අනුව ගමන් නොකරන්නේ වේද, රසාරම්මණ රස විඳීමෙහි නොබැඳුණාවූ, රසාරම්මණ රස විඳීමෙහි නොවෙළුණාවූ, රසාරම්මණ රස විඳීමෙහි නොබැඳුණ රැහැණින් යුක්ත නොවූ, සිත පිටත් අරමුණුවල නොවිසුරුණ සිතයයි කියනු ලැබේ.

"කයින් ස්පර්ශයන් ස්පර්ශකොට සිත ප්‍රෂ්ටව්‍ය අරමුණ අනුව ගමන් නොකරන්නේ වෙයිද, ප්‍රෂ්ටව්‍ය අරමුණ රස විඳීමෙහි නොබැඳුණාවූ, ප්‍රෂ්ටව්‍ය අරමුණු රස විඳීමෙහි නොවෙළුණාවූ, ප්‍රෂ්ටව්‍ය අරමුණු රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්ත නොවූ සිත පිටත් අරමුණුවල නොවිසුරුණු සිතයයි කියනු ලැබේ.

"සිතින් ධර්මාරමුණු දැන ධර්මාරම්මණය අනුව සිත ගමන් නොකරන්නේ වේද, ධර්මාරමුණෙහි රස විඳීමෙහි නොබැඳුණාවූ ධර්මාරමුණේ රස විඳීමෙහි නොවෙළුණාවූ, ධර්මාරමුණු රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්ත නොවූ සිත පිටත් අරමුණුවලට නොවිසුරුණු සිතයයි කියනු ලැබේ.

"ඇවැත්නි, මෙසේ වනාහි පිටත් අරමුණුවල නොවිසිර ගිය නොපැතිරගිය සිතයයි කියනු ලැබේ.

14. "ඇවැත්නි, කෙසේ නම් ධ්‍යානාරම්මණයෙහි සිත ඇලී පිහිටියේයයි කියනු ලැබේද, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත ඒ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය අනුව ගමන්කරන්නේ වෙයිද, විවේකයෙන් හටගත් ප්‍රීතියෙහි හා සැපයෙහි රස විඳීමෙහි බැඳුණාවූ විවේකයක් හටගත් ප්‍රීතිය හා සැපයෙහි රස විඳීමෙහි වෙළුණාවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපයෙහි රසවිඳීමෙහි බැඳුණු රැහැණින් යුක්තවූ සිත ධ්‍යානාරම්මණයෙහි ඇලීසිටින සිතයයි කියනු ලැබේ.

15. "ඇවැත්නි, නැවතද, භික්ෂුතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇත්තාවූ සිත සම්බන්ධ එකඟ බැව් ඇති, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය අනුව ගමන්කරන්නේ වේද, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපයෙහි රස විඳීමෙහි බැඳුණාවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපයෙහි රසවිඳීමෙහි වෙළුණාවූ, සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙහි රස විඳීමෙහි රැහැණින් යුක්තවූ සිත ධ්‍යානාරම්මණයෙහි ඇලී සිටියේයයි කියනු ලැබේ.

16. "ඇවැත්නි, නැවතද භික්ෂුතෙම ප්‍රීතියගේද, නොඇල්මෙන් උපෙක්ෂා ඇත්තේද, සිහි නුවණ ඇත්තේද, වාසය කරයි. සැපයද කයින් විඳියි. ආර්‍ය්‍යයෝ ඒ යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහි ඇත්තේ, සැපවිහරණ ඇත්තේයයි කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත ඒ උපෙක්ෂාව අනුව ගමන්කරන්නේ වේද, උපෙක්ෂා සැපයෙහි රස විඳීමෙහි බැඳුණු, උපෙක්ෂා සැපයෙහි රසවිඳීමෙහි වෙළුණු උපෙක්ෂා සැපයෙහි රස විඳීමෙහි රැහැණින් යුක්තවූ සිත ධ්‍යානාරම්මණයෙහි ඇලීසිටියේයයි කියනු ලැබේ.

17. "ඇවැත්නි, නැවතද භික්ෂුතෙම සැපයද දුරු කිරීමෙන්, දුකද දුරු කිරීමෙන් පළමුකොටම සොම්නස්, දොම්නස් දෙක නැසීමෙන් නිදුක්වූ, නොසැපවූ, උපෙක්ෂා ස්මෘතීන්ගේ පිරිසිදු බැව් ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත දුක් නැතිවීම, සැප නැතිවීම අනුව ගමන් කරන්නේ වේද, නිදුක් නොසැපයෙහි රස විඳීමෙහි බැඳුණු, නිදුක් නොසැපයෙහි රස විඳීමෙහි වෙළුණු, නිදුක් නොසැප රස විඳීමෙහි රැහැණින් යුක්තවූ සිත ධ්‍යානාරම්මණයෙහි ඇලී සිටියේයයි කියනු ලැබේ.

"ඇවැත්නි, මෙසේ වනාහි ධ්‍යානාරම්මණයෙහි සිත ඇලී සිටියේයයි කියනු ලැබේ.

18. "ඇවැත්නි, කෙසේ නම් ධ්‍යානාරම්මණයෙහි සිත ඇලී නොසිටියේයයි කියනු ලැබේද, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වම සියලු අකුශලයන්ගෙන් වෙන්වම, විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති, ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය අනුව ගමන් නොකරන්නේ වේද, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය පිළිබඳ රස විඳීමෙහි නොබැඳුණු විවේකයෙන් හටගත් ප්‍රීතියෙහි හා සැපය පිළිබඳ රස විඳීමෙහි නොවෙළුණු විවේකයෙන් හටගත් ප්‍රීතියෙහි හා සැපය පිළිබඳ රස විඳීමෙහි බැඳුණු රැහැණින් යුක්ත නොවූ සිත ධ්‍යානාරම්මණයෙහි ඇලී නොසිටි සිතයයි කියනු ලැබේ.

19. "ඇවැත්නි, නැවත භික්ෂුතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇති කරන්නාවූ, සිතේ එකඟ බව ඇතිකරන්නාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති, ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය අනුව ගමන් නොකරන්නේ වේද, සමාධියෙන් හටගත් ප්‍රීතියෙහි හා සැපය පිළිබඳ රසවිඳීමෙහි නොබැඳුණාවූ සමාධියෙන් හටගත් ප්‍රීතියෙහි හා සැපය පිළිබඳ රසවිඳීමෙහි නොවෙළුණාවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය පිළිබඳ රස විඳීමෙහි බැඳුණු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

රැහැණින් යුක්ත නොවූ, සිත ධ්‍යානාරම්මණයෙහි ඇලී නොපිහිටියේයයි කියනු ලැබේ.

20. "ඇවැත්නි, නැවතද භික්ෂුතෙම ප්‍රීතියගේද නොඇල්මෙන් උපෙක්ෂා ඇත්තේ, වාසය කෙරෙයි. සිහියෙන් යුක්තවූයේ කයින් සැප විඳියි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහියෙන් යුක්තවූයේ, සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත උපෙක්ෂාව අනුව ගමන් නොකරන්නේ වේද, උපෙක්ෂා සැපය පිළිබඳ රස විඳීමෙහි නොබැඳුණු, උපෙක්ෂා සැපය පිළිබඳ රස විඳීමෙහි නොවෙළුණ, උපෙක්ෂා සැපය පිළිබඳ රස විඳීමෙහි බැඳුණ රැහැණින් යුක්ත නොවූ සිත ධ්‍යානාරම්මණයෙහි ඇලී නොපිහිටියේයයි කියනු ලැබේ.

21. ඇවැත්නි, නැවතද භික්ෂුතෙම සැපයද දුරු කිරීමෙන් දුක නැතිකිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූද, සැප නැත්තාවූද උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති, චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. ඔහුගේ සිත නිදුක් නොසැපය අනුව ගමන් නොකරයි. නිදුක් නොසැපය පිළිබඳ රසවිඳීමෙහි බැඳීමක් නැති, නිදුක් නොසැපය පිළිබඳ රස විඳීමෙහි වෙළීමක් නැති, නිදුක් නොසැප පිළිබඳ රසවිඳීමෙහි බැඳුණු, ආස්වාදනය හා සංයොජනයෙන් රැහැණින් යුක්ත නොවූ සිත ධ්‍යානාරම්මණයෙහි ඇලී නොපිහිටියේයයි කියනු ලැබේ. ඇවැත්නි, මෙසේ වනාහි ධ්‍යානාරම්මණයෙහි සිත ඇලී නොපිහිටියේයයි කියනු ලැබේ.

22. "ඇවැත්නි, කෙසේ නම් තමායයි ගැනීමට දෙයක් නැතිවීම නිසා තැතිගැනීම වේද, ඇවැත්නි, මේ ලොකයෙහි ඇසූපිරූ තැන් නැත්තාවූ පෘථග්ජන තෙම ආර්‍ය්‍යයන් නොදක්නේ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ නුවූයේ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනේ, සත්පුරුෂයන් නොදක්නේ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූයේ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනේ, රූපය තමා

වශයෙන් දකියි. රූපය ඇත්තකු තමා වශයෙන් හෝ දකියි. තමා කෙරෙහි රූපය ඇත්තේයයි කියා හෝ දකියි. රූපය කෙරෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. ඔහුගේ ඒ රූපය වෙනස් වෙයි. අන් පරිද්දකින් වෙයි. රූපයාගේ වෙනස්වීමෙන් හා අන්පරිදි වීමෙන් රූපයාගේ වෙනස්වීමට අනුව ඔහුගේ සිතද වෙනස් වෙයි. රූපයන්ගේ වෙනස්වීමට අනුව වෙනස්වූ ඔහුගේ සිතින් හටගත් තෘෂ්ණා තැතිගැන්මවූ අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත විනාශ කරත්. කුසල් සිත විනාශවීමෙන් තෘෂ්ණා තැතිගැන්මෙන්ද භය තැති ගැන්මෙන්ද තැතිගැනීම් සහිත වෙයි. දුක් සහිත වෙයි. ආලය සහිත වෙයි. මමයයි ගතයුත්තක් නැති කල්හි තැතිගනියි.

"වේදනාව තමා වශයෙන් දකියි. වේදනාව ඇත්තකු තමාය කියා හෝ තමා කෙරෙහි වේදනාව ඇත්තේ යයි කියා හෝ වේදනාවෙහි තමා ඇත්තේයයි කියා හෝ තමා කෙරෙහි වේදනාව ඇත්තේයයි කියා හෝ දකියි. ඔහුගේ ඒ වේදනාව වෙනස් වෙයි. අන් පරිද්දෙකින් වෙයි. වේදනාව වෙනස් වීමෙන් හා අන්පරිදි වීමෙන් වේදනාවේ වෙනස්වීම අනුව ඔහුගේ සිතද වෙනස් වෙයි. වේදනාවන්ගේ වෙනස්වීමට අනුව වෙනස්වූ ඔහුගේ සිතින් හටගත් තෘෂ්ණා තැතිගැන්මවූ අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත විනාශ කරත්. කුසල් සිත විනාශවීමෙන් තැතිගැනීම් සහිත වෙයි. දුක් සහිත වෙයි. ආලය සහිත වෙයි. මමයයි ගතයුත්තක් නැති කල්හි තැතිගනියි.

"සංඥාව තමා වශයෙන් දකියි. සංඥාව ඇත්තෙකු තමාය කියා හෝ තමා කෙරෙහි සංඥාව ඇත්තේයයි කියා හෝ සංඥාවෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. ඔහුගේ ඒ සංඥාව වෙනස් වෙයි. අන් පරිද්දෙකින් වෙයි. සංඥාව වෙනස් වීමෙන් හා අන් පරිදි වීමෙන් සංඥාවේ වෙනස්වීම අනුව ඔහුගේ සිත වෙනස් වෙයි. සංඥාවන්ගේ වෙනස්වීමට අනුව වෙනස්වූ සිතින් හටගත් තෘෂ්ණා තැතිගැන්මවූ අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත විනාශ කරත්. කුසල් සිත විනාශ වීමෙන් තැතිගැනීම් සහිත

වෙයි. දුක් සහිත වෙයි. ආලය සහිත වෙයි. මමයයි ගතයුත්තක් නැතිකල්හි තැති ගනියි.

"සංස්කාරයන් තමා වශයෙන් දකියි. සංස්කාර ඇත්තකු තමායයි කියා හෝ තමා කෙරෙහි සංස්කාර ඇත්තේ යයි කියා හෝ සංස්කාරයෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. ඔහුගේ ඒ සංස්කාර වෙනස් වෙයි. අන් පරිද්දෙකින් වෙයි. සංස්කාර වෙනස් වීමෙන් හා අන්පරිදි වීමෙන් සංස්කාරයන්ගේ වෙනස්වීම අනුව ඔහුගේ සිත වෙනස්වෙයි. සංස්කාරයන්ගේ වෙනස් වීමට අනුව වෙනස්වූ සිතින් හට ගත් තෘෂ්ණා තැතිගැන්මවූ අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත විනාශ කරත්. කුසල් සිත විනාශ වීමෙන් තැතිගැනීම් සහිත වෙයි. දුක් සහිත වෙයි. ආලය සහිත වෙයි. මම යයි ගතයුත්තක් නැතිකල්හි තැතිගනියි.

"විඤ්ඤාණය තමා වශයෙන් දකියි. විඤ්ඤාණය ඇත්තකු තමායයි කියා හෝ ගනියි. විඤ්ඤාණය කෙරෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. තමා කෙරෙහි විඤ්ඤාණය ඇත්තේයයි කියා හෝ දකියි. ඔහුගේ ඒ විඤ්ඤාණය වෙනස් වෙයි. අන් පරිද්දෙකින් වෙයි. ඔහුගේ විඤ්ඤාණය වෙනස් වීමෙන් හා අන්පරිදි වීමෙන් විඤ්ඤාණයාගේ වෙනස්වීම අනුව සිතද වෙනස් වේ. ඔහුගේ විඤ්ඤාණය වෙනස්වීම අනුව වෙනස්වූ සිතින් හටගත් තෘෂ්ණා තැතිගැනීම වන අකුසල ධර්මයෝ කුසල් සිත විනාශ කරත්. කුසල් සිත විනාශ වීමෙන් තැති ගැනීම් සහිත වෙයි. දුක් සහිත වෙයි. ආලය සහිත වෙයි. තමායයි ගැනීමට දෙයක් නැතිවීම නිසා තැතිගනියි. මෙසේ වනාහි තමායයි නොගැනීම නිසා තැති ගැනීම වෙයි.

23. "ඇවැත්නි, කෙසේ නම් මමයයි නොගැනීම නිසා තැති නොකොට පරිත්‍රාශ ගැනීම නොවේද? ඇවැත්නි, මේ ලෝකයෙහි ඇසූපිරූතැන් ඇති ආර්‍ය්‍යයන් දක්නාවූ ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුනාවූ සත්පුරුෂයන් දක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම රූපය තමා වශයෙන් නොදකියි.

රූපය ඇත්තෙකු තමා වශයෙන් හෝ නොදකියි. තමා කෙරෙහි රූපය ඇත්තේයයි කියා හෝ නොදකියි. රූපයෙහි තමා ඇත්තේයයි කියා හෝ නොදකියි. ඔහුගේ ඒ රූපය වෙනස් වේ. අන් පරිද්දෙකින් වෙයි. ඔහුගේ රූපය වෙනස් වීමෙන් අන්පරිදි වීමෙන් රූපය වෙනස්වීම අනුව සිත වෙනස් නොවේ. ඔහුගේ රූපය වෙනස්වීම අනුව වෙනස් වන සිතින් හටගන්නා තැතිගැනීම වන අකුශල ධර්මයෝ කුසල් සිත විනාශ නොකරත්. කුසල් සිත විනාශ නොවීම නිසා තැති ගැනීම් සහිත නොවෙයි. දුක් සහිත නොවෙයි. ආලය සහිත නොවෙයි. තමායයි ගැනීමට දෙයක් නැති නිසා තැති නොගනියි. වේදනාව තමා වශයෙන් නොදකියි. වේදනාව ඇත්තෙකු තමා කියා හෝ නොදකියි. තමා කෙරෙහි වේදනාව ඇත්තේයයි කියා හෝ නොදකියි. වේදනාවෙහි තමා ඇත්තේයයි කියා නොදකියි. ඔහුගේ ඒ වේදනාව වෙනස් වෙයි. අන් පරිද්දෙකින් වෙයි. වේදනාව පෙරළීමෙන් අන් පරිදි වීමෙන් වේදනාව පෙරළීම අනුව ඔහුගේ සිත වෙනස් නොවේ. ඔහුගේ වේදනාව පෙරළීම අනුව වෙනස් වන සිතින් හට ගත් තැති ගැනීම වන අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත විනාශ නොකරත්. කුසල් සිත විනාශ නොවීම නිසා තැති ගැනීම් සහිත නොවෙයි. දුක් සහිත නොවෙයි. ආලය සහිත නොවෙයි. තමායයි නොගැනීම නිසාද තැති නොගනියි. සංඥාව ආත්මය වශයෙන් නොදකියි. සංඥාව ඇත්තෙකු තමායයි කියා හෝ නොදකියි. තමා කෙරෙහි සංඥාව ඇත්තේයයි කියා හෝ නොදකියි. සංඥාවෙහි තමා ඇත්තේයයි කියා හෝ නොදකියි. ඒ සංඥාව විපරිනාම වෙයි. අන් පරිද්දෙකින් වෙයි. ඔහු සංඥාව පෙරළීමෙන් අන් පරිදි වීමෙන් සංඥාව පෙරළීම අනුව ඔහුගේ සිත වෙනස් නොවේ. ඔහුගේ සංඥාව පෙරළීම අනුව වෙනස්වූ සිතින් හටගත් තැතිගැනීම් වන අකුශල ධර්මයෝ ඔහුගේ සිත විනාශ නොකරත්. කුසල් විනාශ නොවීම නිසා තැති ගැනීම් සහිත නොවෙයි. දුක් සහිත නොවෙයි. ආලය සහිත නොවෙයි. තමායයි ගතයුත්තක් නැති නිසා තැති නොගනියි. සංස්කාරයන් ආත්ම වශයෙන් නොදකියි.

සංස්කාර ඇත්තෙකු තමාය කියා හෝ නොදකියි. තමා කෙරෙහි සංස්කාර ඇත්තේය කියා හෝ නොදකියි. සංස්කාරයෙහි තමා ඇත්තේය කියා හෝ නොදකියි. ඔහුගේ ඒ සංස්කාර වෙනස්වෙයි. අන් පරිද්දෙකින් වෙයි. ඔහුගේ සංස්කාර පෙරලීමෙන් අන් පරිදිවීමෙන් සංස්කාර පෙරළීම අනුව ඔහුගේ සිත වෙනස් නොවෙයි සංස්කාර පෙරළීම අනුව වෙනස්වූ සිතින් හටගත් තැතිගැනීම් අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත විනාශ නොකරත්. කුසල් සිත විනාශ නොවීමෙන් තැතිගැනීම් සහිත නොවෙයි දුක් සහිත නොවෙයි. ආලය සහිත නොවෙයි. තමා වශයෙන් ගතයුත්තක් නැති නිසා තැති නොගනියි. විඥානය තමා වශයෙන් නොදකියි. විඥානය ඇත්තෙකු තමා වශයෙන් හෝ නොදකියි. තමා කෙරෙහි විඥානය ඇත්තේ කියා හෝ නොදකියි. විඥානයෙහි තමා ඇත්තේය කියා හෝ නොදකියි. ඔහුගේ ඒ විඥානය වෙනස් වෙයි. අන් පරිද්දෙකින් වෙයි. ඔහුගේ විඤ්ඤාණ වෙනස්වීමට අනුව සිත වෙනස් නොවෙයි. ඔහුගේ විඤ්ඤාණය වෙනස් වීමට අනුව වෙනස්වූ සිතින් හටගත් තැතිගැනීම් තෘෂ්ණා පරිතස්සනා අකුසල ධර්ම කුසල් සිත විනාශ නොකරත්. කුසල් සිත විනාශ නොවීමෙන් තැතිගැනීමක් නොවෙයි. දුක් සහිත නෙවෙයි. ආලය සහිත නොවෙයි. තමායයි ගැනීමට දෙයක් නැති නිසා තැති නොගනියි. ඇවැත්නි, මෙසේ වනාහි තමායයි නොගැනීම නිසා තැති ගැනීම නොවන්නේය.

24. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට යම් උදෙසීමක් සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද, මහණෙනි, යම් යම් පරිද්දකින් පිරිසිඳ බලන්නහුගේ සිත පිටත් අරමුණුවල නොවිසුරුනේද, ධ්‍යානාරම්මණයෙහි ඇලී නොසිටියේද, තමායයි ගැනීමට දෙයක් නැතිවීම නිසා තැති නොගන්නේද, ඒ ඒ පරිද්දෙන් මහණතෙම පිරිසිඳ බලන්නේය මහණෙනි, පිටත් අරමුණුවල සිත් නොවිසිරීම ඇති කල්හි ධ්‍යානාරම්මණයෙහි ඇලී තමායයි අල්වා නොසිටි කල්හි ගතයුත්තක් නැතිවීම නිසා

තැති නොගන්නහුට මත්තෙහි ජාති ජරා මරණය දුක්ඛසමුදය හටගැණීමක් නොවේය යනුයි.

**26.** "ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථය විභාග නොකරණ ලද මේ උද්දෙසයාගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දනිමි. ආයුෂ්මත්නි, කැමති වන්නහු නම් තෙපි භාග්‍යවතුන් වහන්සේ වෙතම එළඹ මේ කාරණය අසව්. යම්සේ තොපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කෙරේද එසේ එය දරා ගනිව්ය" කීය.

**26.** ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන්ගේ කීම සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එතැනට ගියාහුය. ගොස් භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව උන්හ. එකත්පස්ව උන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළාහුය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අපට සැකෙවින් යම් උද්දේසයක් වනාහි උදෙසා විස්තර වශයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට පිවිසි සේක්ද, 'මහණෙනි, යම් යම් පරිද්දෙකින් පිරිසිඳ බලන්නහුගේ සිත පිටත් අරමුණුවල නොවිසුරුනේද ධ්‍යානාරම්මණයෙහි ඇලී නොසිටියේ තමායයි නොගැනීම නිසා තැති නොගන්නේද, ඒ ඒ පරිද්දෙන් මහණතෙම පිරිසිඳ බලන්නේය. මහණෙනි, පිටත් අරමුණුවල විඥානය වික්ෂිප්ත නොවූ කල්හි නොවිසිරීම ඇති කල්හි ධ්‍යානාරම්මණයෙහි ඇලී නොසිටි කල්හි තමා වශයෙන් නොගැනීම නිසා තැති නොගන්නහුට මත්තෙහි ජාති ජරා මරණය දුක්ඛ හටගැනීමක් නොවේය යනුයි' ස්වාමීනි, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ කල්හි මෙබඳු අදහසක් විය.

**27.** 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දෙසය වනාහි සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට පිවිසි සේක. මහණෙනි, යම් යම් පරිද්දෙකින් පිරිසිඳ බලන්නහුගේ සිත පිටත් අරමුණුවල වික්ෂිප්ත

නොවූයේ විසිර නොගියේ වෙයිද, ධ්‍යානාරම්මණයෙහි ඇලී නොසිටියේ තමායයි නොගැනීම නිසා තැතිගැනීමක් නොවන්නේද? ඒ ඒ පරිද්දෙන් මහණතෙම පිරිසිඳ බලන්නේය. මහණෙනි, පිටත්හි අරමුණුවල සිත වික්ෂිප්ත නොවූ කල්හි නොවිසිරීම ඇති කල්හි ධ්‍යානාරම්මණයෙහි ඇලී නොසිටි කල්හි තමා වශයෙන් නොගැනීම නිසා තැති නොගන්නහුට ජාති ජරා මරණ දුක්ඛයන්ගේ හටගැනීමෙක් නොවේය' යනුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථය විභාග නොකරණ ලද මේ උද්දෙසයාගේ අර්ථය කවරෙක් නම් විස්තරයෙන් විභාග කරන්නේදැයි කියායි ස්වාමීනි, ඒ මේ අපට මෙබඳු අදහසක් විය. 'මේ ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙමේ වනාහි ශාස්තෲන් වහන්සේ විසින්ද වර්ණනා කරණ ලද්දෙක් වේ. නුවණැති භික්ෂූන් විසින්ද ගරු කරණ ලද්දෙක් වේ. ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථ විභාග නොකරණලද මේ උද්දෙසයාගේ අර්ථය විස්තරයෙන් විභාග කරන්ට සමර්ථද වේ. අපි ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිර තෙම යම් තැනෙක්හිද එතැනට යමු. ගොස් ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් ගෙන් මේ කාරණය පිළිවිසින්නෙමු නම් යහපතැයි'කියායි.

"ස්වාමීනි, ඉක්බිති අපි ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිර තෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියෙමු. පැමිණ ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන්ගෙන් මේ කාරණය ඇසුවෙමු. ස්වාමීනි, ඒ අපට ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේ විසින් මේ අක්ෂරවලින්, මේ පදවලින් මේ ව්‍යඤ්ජනවලින් අර්ථය විභාග කරණ ලද්දේය"යි කීවාහුය.

28. "මහණෙනි, මහාකච්චායන තෙම පණ්ඩිත වේ. මහණෙනි, මහාකච්චායන තෙම මහත් ප්‍රඥා ඇත්තෙක් වේ. මහණෙනි, තෙපි මාගෙන්ද ඉදින් මේ කාරණය ඇසුවහු නම්, යම්සේ මහාකච්චායනයන් විසින් ප්‍රකාශ කරණ ලද්දේද මමද මෙහි මේ කාරණය එසේම ප්‍රකාශ කරන්නෙමි. අර්ථය මෙයම

වේ. මෙසේම එය දරව් යයි” භාග්‍යවතුන් වහන්සේ වදාළේය. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුයි.

අටවැනි උද්දේස විභංග සූත්‍රය නිමි. (4-8)

---

## 39. අරණ විභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඩු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ‘මහණෙනි,’ කියා ආමන්ත්‍රණය කළසේක. “පින්වතුන් වහන්සැයි,” ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. “මහණෙනි, තොපට අරණ විභංගය දෙශනා කරන්නෙමි. එය අසව්. යහපත් කොට මෙනෙහි කරව්, කියන්නෙමි” යනුයි. “එසේය, ස්වාමීනි” යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “ලාමකවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ පිණිස පවත්නාවූ, පස්කම් සැපයෙහි නොයෙදෙන්නේය. දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ පිණිස පවත්නාවූ ආත්මයට දුක් දෙන පිළිවෙතෙහි නොයෙදෙන්නේය. මේ අන්ත (කොටස්) දෙකට වනාහි නොපැමිණ, ප්‍රඥා චක්ෂුස ඇති කරන්නාවූ, නුවණ ඇති කරන්නාවූ, තථාගතයන් වහන්සේ විසින් මනාව අවබොධ කරණ ලද්දාවූ, මධ්‍යම ප්‍රතිපදා තොමෝ සංසිඳීම පිණිස, විශිෂ්ට ඥානය පිණිස, අවබොධ කිරීම පිණිස, නිර්වාණය පිණිස පවතියි. (ස්තුතිකොට) ඔසවා තැබීමද දන්නේය. (නිග්‍රහකොට) පහත් කිරීමද දන්නේය. ඔසවා තැබීමද දැන පහත් කිරීමද දැන නොමඋසස් කරන්නේය. නොම පහත් කරන්නේය. ධර්මයම දෙශනා කරන්නේය. සුඛ විනිශ්චය (විනිශ්චය කරණ ලද සැපය) දන්නේය. සුඛ විනිශ්චය දැන අධ්‍යාත්මයෙහි සැපය අනුව

යෙදෙන්නේය. රහසි (නැති තැන) අගුණ නොකියන්නේය. හමුවෙහිද ගුණ නසන කථා (කිලුටු වචන) නොකියන්නේය. ඉක්මනින් නොකියා හෙමිහිට කියන්නේය. ලෝක ව්‍යවහාරය දැඩි කොට අල්වා නොගන්නේය. ලෝක ව්‍යවහාරය නොඉක්ම වන්නේය. මේ අරණ විභංගයාගේ උද්දේසය වේ.

3. "ලාමකවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ පිණිස පවත්නාවූ, පස්කම් සැපයෙහි නොයෙදෙන්නේය. දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ පිණිස පවත්නාවූ, ශරීරයට දුක් දීමෙහි නොයෙදෙන්නේයයි, මේ වනාහි මෙසේ කියන ලදී. මෙය කුමක් සඳහා කියන ලදද? කාමාවචර ප්‍රතිසන්ධිය හේතුකොටගෙන කාමයෙන් යුක්තවූ සැප ඇත්තහුගේ ලාමකවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ අවැඩ ගෙන දෙන්නාවූ, යම් සොම්නස හා යෙදීමක් වේද, මේ ධර්මය තෙම දුක් සහිත වෙයි. විනාශ සහිත වෙයි. දැඩිවූ වෙහෙස සහිත වෙයි. දැවීම් සහිත වෙයි. වරදවා පිළිපැදීම වේ. කාමාවචර ප්‍රතිසන්ධි ඇත්තහුගේ හීනවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණ දෙන්නාවූ සොම්නස හා යම් නොයෙදීමක් වේද, මේ ධර්මය තෙම දුක් රහිත වේ විනාශ රහිත වේ. දැඩි වෙහෙස රහිත වේ. දැඩි වෙහෙස රහිත වේ. දැවීම් රහිත වේ. යහපත් පිළිපැදීම වේ. දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණ දෙන්නාවූ යම් ශරීරයට දුක් දීමෙහි යෙදීමක් වේද, මේ ධර්මය තෙම දුක් සහිතවූ, විනාශ සහිතවූ, වෙහෙස සහිතවූ, දැවීම් සහිතවූ, වරදවා පිළිපැදීම වේ. දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණ දෙන්නාවූ, ශරීරයට දුක් දෙන පිළිවෙතෙහි යම් නොයෙදීමක් වේද, මේ ධර්මයතෙම දුක් නැත්තාවූ, විනාශ නැත්තාවූ, වෙහෙස රහිතවූ, දැවීම් නැත්තාවූ යහපත් ප්‍රතිපදාව වේ.

4. "ලාමකවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණ දෙන්නාවූ, පස්කම් සැපයෙහි නොයෙදෙන්නේය. දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණ දෙන්නාවූ, ශරීරයට දුක් දෙන පිළිවෙතෙහි නොයෙදෙන්නේයයි මෙසේ ඒ යමක් කියනලද නම් එය මේ සඳහා කියනලදී. මේ අන්ත දෙකට (කොටස්

දෙකට) නොඑළඹ තථාගතයන් වහන්සේ විසින් ප්‍රඥා චක්ෂුස ඇති කරන්නාවූ, නුවණ ඇති කරන්නාවූ, මනාකොට අවබොධ කරණ ලද්දාවූ, මධ්‍යම ප්‍රතිපදාව සංසිඳීම පිණිස, විශිෂ්ට ඥානය පිණිස, අවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතීයයි මෙසේ කියනලදී. මෙය කුමක් සඳහා කියන ලදද? මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයමවේ. එනම් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මෙයයි. මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් මනාව අවබොධ කළාවූ ප්‍රඥා චක්ෂුස ඇති කරන්නාවූ, නුවණ ඇති කරන්නාවූ, මධ්‍යම ප්‍රතිපදා තොමෝ සංසිඳීම පිණිස, විශිෂ්ට ඥානය පිණිස, අවබොධ කිරීම පිණිස, නිර්වාණය පිණිස පවතියි. මෙසේ යමක් කියනලද නම් එය මේ සඳහා කියනලදී.

5. 'ඔසවාලීමද දන්නේය. පහත හෙලීමද දන්නේය. ඔසවාලීමද දැන පහත හෙලීමද දැන නොම ඔසවාලන්නේය. නොම පහත හෙලන්නේය. ධර්මයම දෙශනා කරන්නේයයි, මෙසේ කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? මහණෙනි, කෙසේ නම් ඔසවාලීමත්, පහත හෙලීමත් වේද, ධර්මදෙශනා කිරීමත් නොවේද, කාමාවචර ප්‍රතිසන්ධිය හේතුකොටගෙන කාම සැප ඇත්තහුගේ හීනවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ සොම්නසෙහි යෙදී වාසය කරන්නෝ වෙත්ද, ඒ සියල්ලෝ දුක් සහිතවූ, විනාශ සහිතවූ, වෙහෙස සහිතවූ, දැවිලි සහිතවූ වරදවා පිළිපන්නෝයයි කියත් නම්, මෙසේ කියන තැනැත්තේ මේ ආකාරයෙන් සමහරුන් පහත්කොට කථා කරයි. කාමාවචර ප්‍රතිසන්ධිය හෙතුකොටගෙන සැප ඇත්තහුගේ කාමයෙන් යුක්තවූ, හිනවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණදෙන්නාවූ, සොම්නසෙහි නොයෙදෙන්නෝ වෙයිද, ඒ සියල්ලෝ දුක් නැත්තාවූ, විනාශ රහිතවූ, වෙහෙස නැත්තාවූ, දැවිලි නැත්තාවූ, මනාව පිළිපන්නෝයයි කියත් නම්, මෙසේ කියන තැනැත්තේ මේ ආකාරයෙන් සමහරුන් ඔසවා කථා කරන්නේය.

6 "යම් කෙනෙක් දුක්වූ, අනායයීවූ, අවැඩ ගෙණ දෙන්නාවූ, ශරීරයට දුක් දෙන පිළිවෙතෙහි යෙදෙන්නාහු වෙත්ද, ඒ සියල්ලෝ දුක් සහිතවූ, විනාශ සහිතවූ, වෙහෙස සහිතවූ දැවීම් සහිතවූ, වරදවා පිළිපන්නෝයයි කියයි නම්, මෙසේ කියන්නේ මේ ආකාරයෙන් සමහරුන් පහත් කොට කථා කරයි. යම් කෙනෙක් දුක්වූ, අනායයීවූ, අවැඩ ගෙණ දෙන්නාවූ, ශරීරයට දුක් දෙන පිළිවෙතෙහි නොයෙදෙන්නාහුද, ඒ සියල්ලෝ දුක් නැත්තාහු, විනාශ නැත්තාහු, වෙහෙසීම් නැත්තාහු, දැවීම් නැත්තාහු, මනාව පිළිපන්නාහු යයි මෙසේ කියන්නේ මේ ආකාරයෙන් ඇතැමුන් ඔසවා කථා කරයි. යම්කිසි කෙනෙකුන්ගේත් භවසංයොජනය (භව තෘෂ්ණාව) ප්‍රහීණ නොවූයේද, ඒ සියල්ලෝ දුක් සහිත වූවාහු, විනාශ සහිත වූවාහු, වෙහෙස සහිත වූවාහු, දැවීම් සහිත වූවාහු, වරදවා පිළිපන්නාහුයයි කියයි, නම් මෙසේ කියන්නේ මේ ආකාරයෙන් ඇතමුන් පහත හෙලා කථා කරයි. යම්කිසි කෙනෙකුන්ගේත් විභව සංයොජනය ප්‍රහීණ වූයේද, ඒ සියල්ලෝ දුක් නැත්තාහු, විනාශ නැත්තාහු, වෙහෙස නැත්තාහු, දැවීම් නැත්තාහු, මනාව පිළිපන්නාහුයයි මෙසේ කියන්නේ මේ ආකාරයෙන් ඇතමුන් ඔසවා කථා කරයි. මහණෙනි, මෙසේ වනාහි ඔසවාලීමද, පහත හෙලීමද වෙයි. ධර්මදෙශනා කිරීම නොවෙයි.

7. "මහණෙනි, කෙසේ නම් ඔසවාලීමත්, පහත නොහෙලීමත් නොවේද, ධර්මදෙශනා කිරීමක්වේද? කාමාවචර ප්‍රතිසන්ධිය නිසා සැප ඇත්තහුගේ ලාමකවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනායයීවූ, අවැඩ ගෙණ දෙන්නාවූ, සොම්නසෙහි යෙදී වාසය කරන්නෝ වෙත්ද, ඒ සියල්ලෝ දුක් සහිත වූවාහු, විනාශ සහිත වූවාහු, වෙහෙස සහිත වූවාහු, දැවිලි සහිත වූවාහු, වරදවා පිළිපන්නාහුයයි මෙසේ නොකියයි. මේ කම් සැපෙහි යෙදීමම දුක් සහිත වේ. විනාශ සහිතවේ. වෙහෙස සහිත වේ. දැවීම් සහිත වේ. මිථ්‍යා ප්‍රතිපදාවයයි, මෙසේ කියන්නේ ධර්මයම දෙශනා කරයි.

'කාම ප්‍රතිසන්ධිය නිසා කම්සැප ඇත්තහුගේ ලාමකවූ ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණ දෙන්නාවූ, සොම්නසෙහි යෙදී වාසය කරන්නෝ වෙත්ද. ඒ සියල්ලෝ දුක් නැත්තාහු, විනාශ නැත්තාහු වෙහෙස නැත්තාහු, දැවීම් නැත්තාහු, මනාව පිළිපන්නාහුයයි මෙසේ නොකියයි. කම් සැපෙහි නොයෙදීමම දුක් නැති, විනාශ නැති, වෙහෙස නැති, දැවීම් නැති, යහපත් ප්‍රතිපදාව යයි, මෙසේ කියන්නේ ධර්මයම දෙශනා කරයි.

"යම් කෙනෙක් දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙණදෙන්නාවූ තමහට දුක් දීමෙහි යෙදෙන්නෝ වෙත්ද, ඒ සියල්ලෝ දුක් සහිත වූවාහු, විනාශ සහිත වූවාහු, වෙහෙස සහිත වූවාහු, දැවීම් සහිත වූවාහු, වරදවා පිළිපදින්නෝයයි මෙසේ නොකියයි. මේ අත්තකිලමථානුයොගයෙහි යෙදීමම දුක් සහිත වේ. විනාශ සහිත වේ. වෙහෙස සහිත වේ. දැවිලි සහිත වේ. වරදවා පිළිපැදීම වේයයි, මෙසේ කියන්නේ ධර්මයම දෙශනා කරයි.

"දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙනදෙන්නාවූ, තමහට දුක් දෙන පිළිවෙතෙහි යෙදෙන්නෝ වෙත්ද, ඒ සියල්ලෝ දුක් නැත්තාවූ, විනාශ නැත්තාවූ, වෙහෙස නැත්තාවූ දැවිලි නැත්තාවූ, යහපත් ප්‍රතිපත්ති ඇත්තාහුයයි මෙසේ නොකියයි. එහි නොයෙදීමම දුක් නැති විනාශ නැති, වෙහෙස නැති, දැවිලි නැති, යහපත් පිළිවෙත වේයයි මෙසේ කියන්නේ ධර්මයම දෙශනා කරයි.

"යම්කිසි කෙනෙකුගේ භවසංයොජනය ප්‍රහීණ නොවූයේ නම් ඒ සියල්ලෝ දුක් සහිතවූ, විනාශ සහිතවූ, වෙහෙස සහිතවූ, දැවිලි සහිතවූ, ප්‍රතිපදා වරදවා පිළිපන්නෝයයි මෙසේ නොකියයි. භවසංයොජනය ප්‍රහීණ නොවූ කල්හි භවය ප්‍රහීණ නොවේයයි, මෙසේ කියන්නේ ධර්මයම දෙශනා කරයි.

"යම්කිසි කෙනෙකුන්ගේත් භවසංයොජනය ප්‍රහීණ වූයේද, ඒ සියල්ලෝ දුක් නැත්තාවූ, විනාශ නැත්තාවූ, වෙහෙස නැත්තාවූ, දැවිලි නැත්තාවූ, යහපත් පිළිපැදීම ඇත්තෝයයි

මෙසේ නොකියයි. භව සංයොජනය ප්‍රහීණවූ කල්හි භවය ප්‍රහීණ වේයයි මෙසේ කියන්නේ ධර්මයම දෙශනා කරයි.

"මහණෙනි, මෙසේ වනාහි ඔසවාලීමද, පහත නොහෙලීමද නොවෙයි. ධර්ම දෙශනාව වෙයි.

8. "උසස් කිරීමද දන්නේය, පහත් කිරීමද දන්නේය, උසස් කිරීමද දැන පහත් කිරීමද දැන නොම උසස් කරන්නේය, නොම පහත් කරන්නේය. ධර්මයම දෙශනා කරන්නේයයි, මෙසේ යමක් කියන ලද නම් එය මේ සඳහා කියන ලදී. සැප විනිශ්චය දන්නේය, සැප විනිශ්චය දැන තමා ඇතුළත සැපය අනුව යෙදෙන්නේයයි, මෙසේ මෙය කියන ලදී. මෙය කුමක් සඳහා කියන ලදද? මහණෙනි, මේ කාමගුණ පසක් වෙත්. කවර පසක්ද යත්? ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ, ඇල්ම කරන්නාවූ රූපයෝ වෙත්. කණින් දත යුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇළුම් කටයුතුවූ, ශබ්දයෝ වෙත්.

"නාසයෙන් දතයුතුවූ, ගන්ධයෝ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කටයුතුවූ ගන්ධයෝ වෙත්.

'දිවෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කටයුතුවූ රසයෝ වෙත්.

"කයින් දතයුතුවූ, ඉෂ්ටවූ, කැමැතිවන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ වෙත්. මහණෙනි, මොහු වනාහි පඤ්ච කාම ගුණයෝ වෙත්.

"මහණෙනි, මේ පස්කම් ගුණයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ වනාහි සේවනය නොකටයුතු, නොවැඩියයුතු, බහුල නොකටයුතු කාම සැපයයිද, අසුචියක්

වැනි සැපයයිද, පෘථග්ජන සැපයයිද, අනාර්‍ය්‍ය සැපයයිද කියනු ලැබේ. කම්සැපයට භයවිය යුතුයයි කියමි.

**9.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන් ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇති සිත පිළිබඳ එකඟ බැව් ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කෙරෙයි. සිහියෙන් යුක්තවූයේ, කයින් සැප විඳියි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහියෙන් යුක්තවූයේ, සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. සැපය නැතිකිරීමෙන් දුක නැතිකිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූද, සැප නැත්තාවූද, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති, චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද, මෙය සේවනය කටයුතු, වැඩියයුතු, බහුල වශයෙන් කළයුතු, කාමයෙන් වෙන්වූ සැපයයිද, විවේක සැපයයිද, සංසිඳීම් සැපයයිද, සම්බොධි සැපයයිද කියනු ලැබේ. මේ සැපයට නොබිය විය යුතුයයි කියමි. විනිශ්චය කරණ ලද සැපය දන්නේය. විනිශ්චය කරණලද සැපය දැන තමා ඇතුළත සැපයෙහි යෙදෙන්නේයයි, මෙසේ ඒ යමක් කියන ලද නම් එය මේ සඳහා කියන ලදී.

**10.** "රහස් නොකියන්නේය, (අනභි මුඛයෙහි අගුණ නොකියන්නේය) ඉදිරියෙහි ගුණමකා කථා නොකරන්නේයයි මෙසේ වනාහි මේ කියනලදී. එය කුමක් සඳහා කියන ලදද? මහණෙනි, යම් රහසක් නොවූවක්ය, අසත්‍යයක්ය, අවැඩ ඵලවන්නක්යයි දන්නේද, ඒ අසත්‍යවූ රහසද, නොකියන්නේය. යම් රහසක් වනාහි වූවක්ය, සත්‍යය, අනර්ථ ඵලවන්නක්යයි දන්නේද, එයද නොකීම පිණිස හික්මෙන්නේය. යම් රහසක්

වූවක්ය, සත්‍යයක්ය, වැඩ ගෙන දෙන්නක්යයි දන්නේද, එයද කීමට සුදුසු කාලය දන්නෙක් වන්නේය. මහණෙනි, යම් ඉදිරියෙහි ගුණ නසා කීමක් නොවූවක්ය, අසත්‍යයක්ය, අවැඩ ගෙනදෙන්නක් යයි දන්නේද, අවැඩ සහිතවූ ඒ ඉදිරියෙහි ගුණ නසාකීම නොකියන්නේය. ඉදිරියෙහි යම් ගුණනසා කීමක් සිදුවූවක්ය, සත්‍යය, අනර්ථය ගෙන දෙන්නක්යයි දන්නේද, එයද නොකීම පිණිස හික්මෙන්නේය. ඉදිරියෙහි යම් ගුණ නසා කීමක් වූවක්ය, සත්‍යය වැඩගෙන දෙන්නක්යයි, දන්නේද, ඒ ඉදිරියෙහි ගුණමකා කීමටද සුදුසු කල් දෙන්නෙක් වන්නේය. රහස් නොකියන්නේය. ඉදිරියෙහි ගුණමකා කීම නොකියන්නේයයි මෙසේ ඒ යමක් කියන ලද නම් මේ මෙය සඳහා කියන ලදී.

11. "නවත්වා හෙම්හිට කියන්නේය. ඉක්මනින් නොකියන්නේය. මෙසේ වනාහි මෙය කියන ලදී. මෙය කුමක් සඳහා කියන ලදද? මහණෙනි, එහි ඉක්මනින් කියන්නහුගේ සිරුරද වෙහෙසෙයි. සිතද පීඩාවෙයි. ස්වරයද බිඳෙයි. උගුරද ලෙඩවෙයි. ඉක්මනින් කියන්නහුගේ වචනය නොපැහැදිලි වෙයි. නොදත හැකි වේ. මහණෙනි, හෙම්හිට කියන්නහුගේ කයද නොවෙහෙසෙයි, සිතද නොපෙළෙයි, ස්වරයද නොබිඳෙයි, උගුරද ලෙඩ නොවෙයි. හෙම්හිට කියන්නහුගේ වචනය පැහැදිලි වෙයි, දතහැකිද වෙයි, හෙම්හිට කියන්නේය, ඉක්මනින් නොකියන්නේයයි මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

12. "ලෝකයෙහි කථා ව්‍යවහාරය තදින් නොගන්නේය, ලෝක ව්‍යවහාරය නොඉක්මවන්නේයයි මෙසේ වනාහි මෙය කියන ලදී. මෙය කුමක් සඳහා කියන ලදද? මහණෙනි, කෙසේ නම් ව්‍යවහාර කථා තරයේ ගන්නේද ලෝක ව්‍යවහාර ඉක්මවන්නේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පළාත්වල තලිය යයි කියත්, ඇතැම් පළාත්වල පාත්‍රයයි කියත්. ඇතැම් පළාත්වල විත්තයයි කියත්, සරාව යයි කියත්, ඇතැම් පළාත්වල ධාරොපයයි කියත්, පොණ යයි කියත්. පිසීලයයි කියත්. මෙසේ

ඒ ඒ පළාත්වල යම් යම් පරිද්දෙන් ව්‍යවහාර කරද්ද, ඒ ඒ ආකාරයෙන් තදින් අල්වාගෙන මේ වචනයම සත්‍යයි අනික සිස්යයි ව්‍යවහාර කරයි. මහණෙනි, මෙසේ වනාහි කථා ව්‍යවහාරය දැඩිකොට අල්වා ගැනීමද, ලෝක ව්‍යවහාරය ඉක්මවා යාමදවේ.

13. "මහණෙනි, කෙසේ නම් කථා ව්‍යවහාරය තරයේ නොගනීද? ලෝක ව්‍යවහාරය නොඉක්මවාද, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පළාත්වල එයම පාතිය යයි කියත්, පත්තයයි කියත්. විත්තයයි කියත්, සරාවයයි කියත්, ධාරොපයයි කියත්, පොණයයි කියත්, පිසීලයයි කියත්. මෙසේ යම් යම් පරිද්දෙකින් එය ඒ ඒ පළාත්වල හඳුනත්ද, ආයුෂ්මත්නි, මෙය වනාහි මේ දෙය සඳහා ව්‍යවහාර කෙරෙත් යයි, ඒ ඒ පරිද්දෙන් ව්‍යවහාර කෙරේයයි අල්වා නොගනියි. මහණෙනි, මෙසේ වනාහි කථා ව්‍යවහාරය තදින් අල්වා නොගැනීමද, ලෝක ව්‍යවහාරය නොඉක්මවීමද වේ. කථා ව්‍යවහාරය තදින් අල්වා නොගන්නේය. ලෝක ව්‍යවහාරය ඉක්මවන්නේයයි මෙසේ ඒ යමක් කියන ලදද, මෙය මේ සඳහා කියන ලදී.

14. "මහණෙනි, එහි කාම ප්‍රතිසන්ධිය හේතුකොට ගෙන සැප ඇත්තහුගේ ලාමකවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩගෙන දෙන්නාවූ යම් සොම්නසෙහි යෙදීමක් වේද, මේ ධර්මය තෙමේ දුක් සහිතවූ, විනාශ සහිතවූ, වෙහෙසීම් සහිතවූ, දැවීම් සහිතවූ වැරදි පිළිවෙත වෙයි. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් සහිත වේ.

15. "මහණෙනි, එහි කාම ප්‍රතිසන්ධි ඇත්තහුගේ හීනවූ, ලාමකවූ, ග්‍රාම්‍යවූ, පෘථග්ජනයන් අයත්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙන දෙන්නාවූ සොම්නසෙහි යම් නොයෙදීමක් වේද, මේ ධර්මය තෙම දුක් නැත්තාවූ, විනාශ නැත්තාවූ, වෙහෙස නැත්තාවූ, දැවීම් නැත්තාවූ යහපත් පිළිවෙත වේ. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් රහිතවේ.

16. "මහණෙනි, එහි දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ පිණිස පවත්නාවූ, යම් ශරීරයට දුක් දීමෙහි යෙදීමක් වේද, මේ ධර්මය

තෙම දුක් සහිතවූ, විනාශ සහිතවූ, වෙහෙස සහිතවූ, දැවීම් සහිතවූ වැරදි පිළිවෙත වේ. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් සහිත වේ.

"මහණෙනි, එහි දුක්වූ, අනාර්‍ය්‍යවූ, අවැඩ ගෙන දෙන්නාවූ, ශරීරයට දුක් දීමෙහි යම් නොයෙදීමක් වේද, මේ ධර්මයතෙම දුක් නැත්තාවූ, විනාශ නැත්තාවූ, වෙහෙස නැත්තාවූ, දැවීම් නැත්තාවූ, යහපත් පිළිවෙත වේ. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් රහිතවේ.

17. "මහණෙනි, එහි තථාගතයන් විසින් මනාකොට අවබොධ කරණ ලද්දාවූ, ප්‍රඥාචක්ෂුස ඇතිකරන්නාවූ යම් මේ මධ්‍යම ප්‍රතිපදාවක් තොමෝ සංසිඳීම පිණිස, විශෙෂ ඥානය පිණිස, අවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතීද, මේ ධර්මය තෙම දුක් නැත්තාවූ, විනාශ නැත්තාවූ, වෙහෙස නැත්තාවූ, දැවීම් නැත්තාවූ යහපත් පිළිවෙත වේ. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් රහිතවේ.

18. "මහණෙනි, එහි යම් මේ ඔසවාලීමකුත් පහත් කිරීමකුත් වේද, ධර්මදෙශනා කිරීමක් නොවේ. මේ ධර්මය තෙම දුක් සහිතවූ, විනාශ සහිතවූ, වෙහෙස සහිතවූ, දැවීම් සහිතවූ වැරදි පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් සහිතවේ. මහණෙනි, එහි යම් මේ ඔසවාලීමකුත් පහත් කිරීමකුත් නොවේද, ධර්මදෙශනාවක් වේද, මේ ධර්මය තෙම දුක් නැත්තාවූ, විනාශ නැත්තාවූ, වෙහෙස නැත්තාවූ, දැවීම් නැත්තාවූ, යහපත් පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් රහිතවේ.

19. 'මහණෙනි, එහි අපවිත්‍ර සැපයවූ පෘථග්ජන සැපයවූ අනාර්‍ය්‍ය සැපයවූ, යම් මේ කාම සැපයක් වේද, මේ ධර්මය තෙම දුක් සහිතවූ විනාශ සහිතවූ දැවීම් සහිතවූ වෙහෙස සහිතවූ වැරදි පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් සහිතවේ. මහණෙනි, එහි විවේක සැපයවූ සංසිඳීම් සැපයවූ අවබොධ සැපයවූ යම් මේ නෛෂ්ක්‍රම්‍ය කාමයන්ගෙන් වෙන්වීමේ සැපයක්වේද, මේ ධර්මයතෙම දුක් නැත්තාවූ විනාශ

නැත්තාවූ වෙහෙස නැත්තාවූ දැවීම් නැත්තාවූ යහපත් පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මතෙම කෙලෙස් රහිතවේ.

**20.** "මහණෙනි, එහි අභූතවූ අසත්‍යවූ අවැඩ ගෙණ දෙන්නාවූ යම් මේ රහස් කීමක් වේද, මේ ධර්මතෙම දුක් සහිතවූ විනාශ සහිතවූ වෙහෙස සහිතවූ දැවීම් සහිතවූ වැරදි පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් සහිතවේ. මහණෙනි, එහි ඇතිවූ සත්‍යවූ අවැඩ ගෙණ දෙන්නාවූ යම් මේ රහස් කීමක්වේද, මේ ධර්මයතෙම දුක් සහිතවූ විනාශ සහිතවූ වෙහෙස සහිතවූ දැවීම් සහිතවූ වැරදි පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් සහිතවේ. මහණෙනි, එහි සිදුවූ සත්‍යවූ වැඩ පිණිස පවත්නාවූ යම් රහස් කීමක් වේද, මේ ධර්මයතෙම දුක් නැත්තාවූ විනාශ නැත්තාවූ වෙහෙස නැත්තාවූ දැවීම් නැත්තාවූ යහපත් පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මය තෙම කෙලෙස් රහිතවේ. මහණෙනි, එහි සිදු නොවූ අසත්‍යවූ අවැඩ පිණිස පවත්නාවූ යම් මේ ඉදිරියෙහි ගුණ නසා කීමක් වේද, මේ ධර්මයතෙම දුක් සහිතවූ විනාශ සහිතවූ වෙහෙස සහිතවූ දැවීම් සහිතවූ වැරදි පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් සහිතවේ.

**21.** "මහණෙනි, එහි සිදුවූ සත්‍යවූ අවැඩ පිණිස පවත්නාවූ යම් මේ ඉදිරියෙහි ගුණ නසා කීමක් වේද, මේ ධර්මයතෙම දුක් සහිතවූ විනාශ සහිතවූ වෙහෙස සහිතවූ දැවීම් සහිතවූ වැරදි පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් සහිතවේ. මහණෙනි, එහි සිදුවූ සත්‍යවූ වැඩ පිණිස පවත්නාවූ යම් මේ ඉදිරියෙහි ගුණ නසා කීමක් වේද, මේ ධර්මයතෙම දුක් නැත්තාවූ විනාශ නැත්තාවූ වෙහෙස නැත්තාවූ දැවීම් නැත්තාවූ යහපත් පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් රහිතවේ. මහණෙනි, එහි යම් මේ ඉක්මණින් කියන්නහුගේ යම් කීමක්වේද, මේ ධර්මයතෙම දුක් සහිතවූ විනාශ සහිතවූ වෙහෙසීම් සහිතවූ දැවීම් සහිතවූ වැරදි පිළිවෙත වේ. එහෙයින් මෙ ධර්මය තෙම කෙලෙස් සහිතවේ. මහණෙනි, එහි යම් මේ හෙමිහිට කියන්නහුගේ යම් කීමක් වේද, මේ

ධර්මයතෙම දුක් නැත්තාවූ විනාශ නැත්තාවූ වෙහෙස නැත්තාවූ දැවීම් නැත්තාවූ යහපත් පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් රහිතවේ.

22. "මහණෙනි, එහි යම් මේ කථා ව්‍යවහාර දැඩි කොට ගැනීමක් වේද, ලොක ව්‍යවහාරය ඉක්මවා යාමක් වේද, මේ ධර්මයතෙම දුක් සහිතවූ විනාශ සහිතවූ වෙහෙසීම් සහිතවූ දැවීම් සහිතවූ වැරදි පිළිවෙතවේ. එහෙයින් මේ ධර්මයතෙම කෙලෙස් සහිතවේ. මහණෙනි, එහි යම් මේ කථා ව්‍යවහාරයක් දැඩිකොට නොගැනීමක් වේද, ලොක ව්‍යවහාරය ඉක්මවා නොයාමක් වේද, මේ ධර්මයතෙම දුක් නැත්තාවූ විනාශ නැත්තාවූ වෙහෙස නැත්තාවූ දැවීම් නැත්තාවූ යහපත් පිළිවෙතවේ. එහෙයින් මේ මේ ධර්මයතෙම කෙලෙස් රහිතවේ.

23. "මහණෙනි, එහෙයින් මෙහි කෙලෙස් සහිතවූ ධර්මයද දැනගන්නෙමු. කෙලෙස් රහිතවූ ධර්මයද දැන ගන්නෙමු. කෙලෙස් සහිතවූ ධර්මයද දැන කෙලෙස් රහිතවූ ධර්මයද දැන කෙලෙස් රහිත ප්‍රතිපදාවෙහි පිළිපදින්නෙමුයි, මහණෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. මහණෙනි, සුභූති කුලපුත්‍ර තෙමේ කෙලෙස් රහිත ප්‍රතිපදාවෙහි පිළිපන්නේයයි, වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තාහුයි.

**අරණ විභංග සූත්‍රය නිමි. (4-9)**

---

## 40. ධාතු විභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ මගධ දනව්වල සැරිසරණසේක් රජගහනුවර යම් තැනෙක්හිද එතැනට වැඩිසේක. භග්ගව නම් කුම්භකාර තෙම යම්තැනෙක්හිද එතැනට එළඹිසේක එළඹ, භග්ගව නම් කුම්භකාරයාට මෙය වදාළේය. "භග්ගවය, ඉදින් තොපට බරක්

නොවේ නම් කුම්භකාර ශාලාවෙහි එක් රැයක් වාසය කරමි" යනුයි. "ස්වාමීනි, මට නම් බරක් නොවේ. මෙහි පළමුකොට වාසයට එළඹියාවූ පැවිදිවූ තැනැත්තෙක්ද ඇත්තේය. ඉදින් හෙතෙම අවසර දෙයි නම් ස්වාමීනි, සැපසේ වාසය කරනු මැනවැ' යි කීය.

2. "එකල්හි වනාහි පුක්කුසාති නම් කුලපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූයේ වෙයි. හෙතෙම ඒ කුම්භකාර ශාලාවෙහි පළමු වාසයට එළඹියේ වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් පුක්කුසාති තෙමේ යම් තැනෙක්හිද එතැනට එළඹිසේක. එළඹ, ආයුෂ්මත් පුක්කුසාතිහට මෙය වදාළේය. "මහණ, ඉදින් තොපට බරක් නොවේ නම්, කුම්භකාර ශාලාවෙහි එක් රැයක් වාසය කරමි"යි "ඇවැත්නි, කුම්භකාර ශාලාව ඉඩ ඇත්තේය. ආයුෂ්මත් තෙමේ සැපසේ වාසය කෙරේවා"යි කීය.

3. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කුම්භකාර ශාලාවට ඇතුල්ව එක්පසක තණ ඇතිරියක් පනවා පළඟ බැඳගෙණ කය ඍජුකොට පිහිටුවා සිහිය ඉදිරිපත්කොට එළවා වැඩහුන්සේක ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියෙහි වැඩිකාලයක් හිඳීමෙන් ඉක්මවූ සේක. පුස්කුසාති ආයුෂ්මත් තෙමේද රාත්‍රියෙහි වැඩි කාලයක් හිඳගැණීමෙන් ඉක්ම වූයේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් විය. 'මේ කුලපුත්‍ර තෙමේ වනාහි ප්‍රසාද එලවන පරිද්දෙන්ම ඉරියව් පවත්වයි. මම අසන්නෙම් නම්, යෙහෙකැයි, කියායි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පුක්කුසාති ආයුෂ්මතුන්ට මෙය වදාළේය. "මහණ, නුඹ කවරෙකු උදෙසා පැවිදිවූයේ වෙහිද? නුඹගේ ශාස්තෘ තෙමේ හෝ කවරෙක්ද, නුඹ කවරෙකුගේ හෝ ධර්මයක් කැමැති වන්නෙහිදැ?"යි ඇසූහ.

4. "ඇවැත්නි, ශාක්‍යපුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ගෞතම නම් ශ්‍රමණ කෙනෙක් ඇත්තේය. ඒ භාග්‍යවත් ගෞතමයන්ගේ මෙබඳු යහපත්වූ කීර්ති ශබ්දයෙක් පැන

නැංගේය. ඒ භාග්‍යවත් තෙමේ මේ කාරණයෙනුත් අර්හත්ය. සම්‍යක් සම්බුද්ධය, විද්‍යාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය, පුරුෂයන් දමනය කිරීමෙහි නිරුත්තරවූ සාර්ථවාහකයෙකු බඳුය, දෙවි මිනිසුන්ට අනුශාසනා කරන්නෙකි, බුද්ධය, භාග්‍යවත්ය, යනුවෙනි. මම ඒ භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වූයේ වෙමි. ඒ භාග්‍යවත් තෙමේ මාගේ ශාස්තෘ වෙයි. මම ඒ භාග්‍යවත්හුගේ ධර්මය කැමති වෙමියි'යි කීය.

**5.** "මහණ, මේ කාලයෙහි ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ කොතැන්හි වාසය කරණසේක්දැ?"යි ඇසූහ. "ඇවැත්නි, උතුරු දනව්වල සැවැත් නම් නුවරක් ඇත්තේය. එහි මේ කාලයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ වාසය කරණසේකැයි" කීය.

"මහණ, තොප විසින් ඒ භාග්‍යවත් තෙමේ දක්නා ලද්දේද, දැක, දැන, හඳුනන්නෙහිදැ"යි ඇසූහ. "ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ මා විසින් නොදක්නා ලදි. මම දැක නොහඳුනන්නෙමි"යි කීය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් විය. 'මේ කුලපුත්‍ර තෙමේ වනාහි මා උදෙසා පැවිදිවූයේය. මොහුට මම ධර්මය දෙශනා කරන්නෙම් නම් යෙහෙකැ'යි කියායි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් පුක්කුසාති තවුසන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණ, තොපට ධර්මය දෙශනා කරන්නෙමි. එය අසව. යහපත් කොට මෙනෙහි කරව. කියන්නෙමියි" වදාළේය. "ඇවැත්නි, එසේයයි" කියා භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**6.** 'මහණ, මේ පුරුෂ තෙම ධාතු සයකින් යුක්ත වන්නේය, ස්පර්ශ ආයතන සයකින් යුක්ත වන්නේය සිතේ හැසිරීම් දහඅටකින් යුක්ත යම් තැනෙක්හි සිටියහුට වැරදි හැඟීම් නොපවතිත්ද, එවැනි පිහිටීම් සතරක් ඇත්තාහුය. වැරදි හැඟීම් නොපවත් වන්නාවූ ක්ෂිණාශ්‍රව මුනිතෙම සංසිඳුනේයයි කියනු

ලැබේ. (අර්හත් ඵල) ප්‍රඥාවට ප්‍රමාද නොවන්නේය. වාග් සත්‍යය ආරක්ෂා කරන්නේය. කෙලෙස් දුරු කිරීම වඩන්නේය. හෙතෙම කෙලෙස් සංසිඳීමෙහිම හික්මෙන්නේය. මේ වනාහි සවැදෑරුම් ධාතු විභංගයාගේ උද්දෙසය වේ.

7. "මහණ, මේ පුරුෂ තෙම ධාතු සයකින් යුක්තයයි, මෙසේ වනාහි මේ කියනලදී. මෙය කුමක් සඳහා කියන ලදද? පඨවි ධාතුය, අපො ධාතුය, තෙජො ධාතුය, වායො ධාතුය, ආකාශ ධාතුය, විඤ්ඤාණ ධාතුය, (යන සයයි). මහණ, මේ පුරුෂ තෙම ධාතු සයකින් යුක්තයයි මෙසේ යමක් කියනලද නම් එය මේ සඳහා කියනලදී.

8 "මහණ, මේ පුරුෂ තෙම ස්පර්ශ ආයතන සයකින් යුක්තයයි, මෙසේ වනාහි මෙය කියන ලදී. මෙය කුමක් සඳහා කියන ලදද? චක්ඛුසම්ඵස්ස ආයතනය, සොත සම්ඵස්ස ආයතනය, ඝාණ සම්ඵස්ස ආයතනය, ජිව්හා සම්ඵස්ස ආයතනය, කාය සම්ඵස්ස ආයතනය, මනො සම්ඵස්ස ආයතනය (යන සයයි) මහණ, මේ පුරුෂ තෙම ස්පර්ශ ආයතන සයකින් යුක්තව ඇත්තේයයි, මෙසේ ඒ යමක් කියන ලදද, මෙය මේ සඳහා කියන ලදී.

9. "මහණ, මේ පුරුෂ තෙම දහඅටක්වූ සිතේ හැසිරීම්වලින් යුක්තයයි, මෙසේ වනාහි මෙය කියන ලදී. මෙය කුමක් සඳහා කියන ලදද? ඇසින් රූපය දැක සොම්නසට කරුණුවූ රූපය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ රූපය අනුව හැසිරෙයි. උපෙක්ෂාවට කරුණුවූ රූපය අනුව හැසිරෙයි කණින් ශබ්දය අසා සොම්නසට කරුණුවූ ශබ්දය අනුව හැසිරෙයි, දොම්නසට කරුණුවූ ශබ්දය අනුව හැසිරෙයි, උපෙක්ෂාවට කරුණුවූ ශබ්දය අනුව හැසිරෙයි. නාසයෙන් සුවඳ ආඝ්‍රාණය කොට සොම්නසට කරුණුවූ ගන්ධය අනුව හැසිරෙයි, දොම්නසට කරුණුවූ ගන්ධය අනුව හැසිරෙයි, උපෙක්ෂාවට කරුණුවූ ගන්ධය අනුව හැසිරෙයි. දිවෙන් රසය විඳ සොම්නසට කරුණුවූ රසය අනුව හැසිරෙයි, දොම්නසට කරුණුවූ රසය අනුව හැසිරෙයි, උපෙක්ෂාවට

කරුණුවූ රසය අනුව හැසිරෙයි. කයින් ස්පර්ශ කළයුත්ත ස්පර්ශ කොට සොම්නසට කරුණුවූ ස්පර්ශය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ රූපය අනුව හැසිරෙයි, උපෙක්ෂාවට කරුණුවූ ස්පර්ශය අනුව හැසිරෙයි. සිතින් ධර්මය දැන සොම්නසට කරුණුවූ, ධර්මය අනුව හැසිරෙයි. දොම්නසට කරුණුවූ ධර්මය අනුව හැසිරෙයි. උපෙක්ෂාවට කරුණුවූ ධර්මය අනුව හැසිරෙයි. මෙසේ සොම්නසයෙහි හැසිරීම් සයක්ය, දොම්නසයෙහි හැසිරීම් සයක්ය, උපෙක්ෂාවෙහි හැසිරීම් සයක්යයි, (දහඅටක් වෙත්) මහණ, මේ පුරුෂ තෙම අටළොස් සිත් හැසිරීමකින් යුක්ත යයි, මෙසේ ඒ යමක් කියනලදද නම් ඒ මේ සඳහා කියන ලදී.

10. "මහණ, මේ පුරුෂ තෙම පිහිටීම් සතරක් ඇත්තේ යයි, මෙසේ වනාහි කියනලදී. එය කුමක් සඳහා කියන ලදද, ප්‍රඥාව පිහිටීම කොට ඇත්තේය. සත්‍යය පිහිටීම කොට ඇත්තේය. ත්‍යාගය පිහිටීම කොට ඇත්තේය. සංසිඳීම පිහිටීම කොට ඇත්තේය. (යන සතරයි). මහණ, මේ පුරුෂ තෙම පිහිටීම් සතරක් ඇත්තේයයි, මෙසේ ඒ යමක් කියන ලදද, ඒ මෙය සඳහා කියන ලදී.

11. "ප්‍රඥාව සඳහා ප්‍රමාද නොවන්නේය, සත්‍යය ආරක්ෂා කරන්නේය, ත්‍යාගය වඩන්නේය, හෙතෙම සංසිඳීමෙහිම හික්මෙන්නේ යයි, මෙසේ වනාහි මේ කියන ලදී. එය කුමක් සඳහා කියන ලදද? මහණ, කෙසේ නම් ප්‍රඥාව ප්‍රඥාව සඳහා ප්‍රමාද නොවේද, මහණ, මේ ධාතු සයක් වෙත්. පඨවි ධාතුය, ආපො ධාතුය, තෙජො ධාතුය, වායො ධාතුය, ආකාස ධාතුය, විඤ්ඤාණ ධාතුය, (යන සයයි).

12. "මහණ, පඨවි ධාතුව කවරීද? පඨවි ධාතුව අධ්‍යාත්මිකද වන්නීය, බාහිරද වන්නීය. මහණ, අධ්‍යාත්මිකවූ පෘථිවි ධාතුව නම් කවරීද, අධ්‍යාත්මිකවූද, තමන් තුළ පවත්නාවූද, යම් තද බවක් රළු බවක් තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, එනම්: කෙස්ය, ලොම්ය, නියය, දත්ය, සමය, මස්ය, නහරය, ඇටය,

ඇට මිදුලුය, වකුගඩුවය, හෘදය මාංශය, අක්මාවය, දලබුවය, බඩදිවය, පපුවය, අතුනුය, අතුනු බහන්ය, නොපැසුණු ආහාරය, මළය, (යන මොහුයි).

"අන්‍යවූද, කිසියම් අධ්‍යාත්මිකවූ තමා පිළිබඳවූ තද බවක් රළු බවක් තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, මහණ, මෝ තොමෝ අධ්‍යාත්මිකවූ පඨවි ධාතුයයි කියනු ලැබේ. යම් අධ්‍යාත්මිකවූ පඨවි ධාතුවක් වන්නීද, යම් බාහිරවූ පඨවි ධාතුවකුත් වන්නීද, මෝ තොමෝ පඨවි ධාතුම වන්නීය. 'එය මගේ නොවෙයි, එය මම නොවෙමි, එය මාගේ ආත්මය නොවේයයි' මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක්ක යුතුයි. මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක පඨවි ධාතුව කෙරෙහි කලකිරෙයි. පඨවි ධාතුවෙහි සිත නොඇලවයි.

13 "මහණ, අපොධාතුව කවරීද? ආපොධාතුව අධ්‍යාත්මිකද වන්නීය, බාහිරද වන්නීය. මහණ, අධ්‍යාත්මිකවූ ආපොධාතුව කවරීද, අධ්‍යාත්මිකව තමන් තුළ පවත්නාවූ යම් වැගිරීමක්, වැගිරීම් ගතියක් තමා වශයෙන් ගන්නාලද්දක් වේද, එනම්: පිතය, සෙමය, සැරවය, ලේය, ඩහදියය, මේද තෙලය, කඳුලුය, වුරුණු තෙලය, කෙලය, සොටුය, සඳමිදුලුය, මූත්‍රය යන මොහුද මෙයින් අන්‍යවූද යම් කිසිවක් හෝ අධ්‍යාත්මිකවූ, තමන් පිළිබඳවූ වැගිරීමක්, වැගිරෙන බවට පැමිණි දෙයක් තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, මහණ, මෙය අධ්‍යාත්මිකවූ ආපොධාතුවයයි කියනු ලැබේ. යම් අධ්‍යාත්මිකවූ ආපොධාතුවක් වන්නීද, යම් බාහිරවූ ආපෝ ධාතුවකුත් වන්නීද, එය ආපොධාතුවම වන්නීය. 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි,' මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක්ක යුතුයි. මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක, අපොධාතුව කෙරෙහි කලකිරෙයි. ආපොධාතුව කෙරෙහි සිත නොඇලවයි.

14. "මහණ, තෙජොධාතුව කවරීද, තෙජො ධාතුව අධ්‍යාත්මිකද වන්නීද, බාහිරද වන්නීය. මහණ, අධ්‍යාත්මිකවූ

තෙජොධාතුව කවරීද, යම් අධ්‍යාත්මිකවූ තමන් පිළිබඳවූ උණුසුමක්, උණුසුම් බවක්, තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, එනම්, යමකින් තැවේද, යමකින් දිරණු ලැබේද, යමකින් දවනු ලැබේද, යමකින් කනලද බොනලද කඩා කන ලද, දිවගාන ලද දේ, මනාකොට පැසීමට යේද, මෙයින් අන්‍යවූද, යම්කිසි අධ්‍යාත්මිකවූ තමන් පිළිබඳවූ, උණුසුමක්, උණුසුම් බවක් තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, මහණ, එය අධ්‍යාත්මිකවූ තෙජොධාතුවයයි කියනු ලැබේ. යම් අධ්‍යාත්මිකවූ තෙජොධාතුවකුත් වන්නීද, යම් බාහිරවූ තෙජොධාතුවකුත් වන්නීද, එය තෙජොධාතුවම වන්නීය. 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි,' මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක්ක යුතුයි. මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක, තෙජොධාතුව කෙරෙහි කලකිරෙයි. තෙජොධාතුව කෙරෙහි සිත නොඇලවයි.

15. "මහණ, වායොධාතුව කවරීද, වායොධාතුව අධ්‍යාත්මිකද වන්නීය. බාහිරද වන්නීය. මහණ, අධ්‍යාත්මිකවූ වායොධාතුව කවරීද? යම් අධ්‍යාත්මිකවූ තමන් පිළිබඳවූ හැමීමක් වාතයක් තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, එනම්, උඩට ගමන් කරන්නාවූ වාතයෝය, යටට ගමන් කරන්නාවූ වාතයෝය, ආමාශය තුළ පවත්නා වාතයෝය, ආමාශයෙන් පිටත පවත්නා වාතයෝය, අවයව අනුව ගමන් කරන්නාවූ වාතයෝය, ආශ්වාස ප්‍රශ්වාස වාතය (යනුයි.) මෙයින් අන්‍යවූද, යම්කිසි අධ්‍යාත්මිකවූ තමා පිළිබඳවූ වාතයක්, හැමීම් ගතියක්, තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, මහණ, එය අධ්‍යාත්මිකවූ වායොධාතුයයි කියනු ලැබේ. අධ්‍යාත්මිකවූ යම් වායොධාතුවකුත් වන්නීද, බාහිරවූ යම් වායොධාතුවකුත් වන්නීද, එය වායොධාතුවම වන්නීය. 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමියි, එය මාගේ ආත්මය නොවේයයි,' මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක්ක යුතුයි. මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක, වායොධාතුව කෙරෙහි කලකිරෙයි. වායොධාතුව කෙරෙහි සිත නොඇලවයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

16. "මහණ, ආකාශධාතු තොමෝ කවරීද? ආකාශ ධාතුව අධ්‍යාත්මිකද වන්නීය, බාහිරද වන්නීය. මහණ, අධ්‍යාත්මිකවූ ආකාශධාතුව කවරීද, අධ්‍යාත්මිකවූ තමන් පිළිබඳවූ අවකාශයක්, හිස් බවක්, තමා වශයෙන් ගන්නාලද්දක් වේද, එනම්, කන් සිදුරද, නාස් සිදුරද, මුවදොරද, යමකිනුත් කනලද, බොනලද කඩා කනලද, දිවගාන ලද දෙය ගිලෙයිද, යම් තැනෙක් හිත් කනලද, බොනලද, කඩා කනලද, දිවගාන ලද දෙය දරා සිටීද, යමකිනුත් කනලද බොනලද, කඩා කන ලද, දිවගාන ලද දෙය යටහාගයෙන් නික්මේද, මෙයින් අන්‍යවූද, යම්කිසි අධ්‍යාත්මිකවූ තමන් පිළිබඳවූ අවකාශයක් හිස්බවක් තමා වශයෙන් ගන්නා ලද්දක් වේද, මහණ, එය අධ්‍යාත්මිකවූ ආකාශධාතුවයයි කියනු ලැබේ. යම් අධ්‍යාත්මිකවූ ආකාශධාතුවකුත් වන්නීද, යම් බාහිරවූ ආකාශ ධාතුවකුත් වන්නීද, එය ආකාශධාතුව වන්නීය. 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක්ක යුතුයි. මෙසේ එය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක, ආකාශධාතුව කෙරෙහි කලකිරෙයි. ආකාශධාතුව කෙරෙහි සිත නොඇලවයි.

17. "ඉන්පසු පිරිසිදුවූ නිර්මලවූ විඤ්ඤාණයම ඉතිරිවේ. ඒ විඤ්ඤාණයෙන් කිසිවක් දැනගනී. සැපයයිද දනී. දුකයයිද දනී. සැපත් නොවේය දුකත් නොවේයයි දනී. මහණ, සැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා සැප වේදනාව උපදියි හෙතෙම සැප වේදනාව විඳින්නේ, සැප වේදනාව විඳිමියි දැනගනියි. ඒ සැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිරුද්ධ වීමෙන් ඒ සැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා හටගත් යම් සැප වේදනාවක් වීද එයද නිරුද්ධ වෙයි. එය සංසිඳේයයි දැනගනියි. මහණ, දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්වූ වේදනාව උපදියි. දුක් වේදනාව විඳින්නාවූ හෙතෙම දුක්වූ වේදනාව විඳිමියි දැනගනියි. ඒ දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශය නිරුද්ධවීමෙන් දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා උපන්නාවූ යම් දුක් වේදනාවක් වේද, එය නිරුද්ධ වෙයි.

එය සංසිඳේයයි දැනගනියි. මහණ, දුක්ද නොවූ සැපද නොවූ වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වේදනාව උපදියි. දුක්ද නොවූ සැපද නොවූ වේදනාව විඳින්නාවූ හෙතෙම දුක්ද නොවූ සැපද නොවූ වේදනාව විඳිමියි දැනගනියි. ඒ දුක්ද නොවූ සැපද නොවූ වේදනාවට කරුණුවූ ස්පර්ශය නිරුද්ධවීමෙන් ඒ දුක්ද නොවූ සැපද නොවූ වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා උපන්නාවූ යම් දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් වේද එය නිරුද්ධ වෙයි. එය සංසිඳේයයි දැනගනියි.

18. "මහණ, යම්සේ ලීදඬු දෙකක් එකට ගැටීමෙන් උණුසුම හටගණීද, ගින්න උපදීද, ඒ ලීදඬු දෙක වෙන්වීමෙන් වෙන්කොට තැබීමෙන් යම් එයින් හටගත් යම් උණුසුමක් වේද, නිරුද්ධ වේද, එය සංසිඳේද, මහණ මෙපරිද්දෙන්ම සැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා සැප වේදනාව උපදියි. හෙතෙම සැප වේදනාව විඳින්නේ සැප වේදනාව විඳිමියි දැනගනියි. ඒ සැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිරුද්ධ වීමෙන් ඒ සැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා උපන්නාවූ යම් සැප වේදනාවක් වේද, එය නිරුද්ධ වේ. එය සංසිඳේයයි දැනගනියි. මහණ, දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක් වේදනාව උපදියි. හෙතෙම දුක් වේදනාව විඳින්නේ දුක් වේදනාව විඳිමියි දැනගනියි. ඒ දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශය නිරුද්ධවීමෙන් ඒ දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා උපන්නාවූ යම් දුක් වේදනාවක් වේද එය නිරුද්ධ වේ. සංසිඳේයයි දැනගනියි. මහණ, නිදුක් නොසැප වේදනාවට (උපෙක්ෂා වේදනාවට) කරුණුවූ ස්පර්ය නිසා උපෙක්ෂා වේදනාව උපදියි. හෙතෙම නිදුක් නොසැප වේදනාව විඳින්නේ නිදුක් නොසැප වේදනාව විඳිමියි දැනගනියි. ඒ නිදුක් නොසැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිරුද්ධවීමෙන් ඒ නිදුක් නොසැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා උපන්නාවූ යම් නිදුක් නොසැප වේදනාවක් වේද එය නිරුද්ධ වේ. එය සංසිඳේයයි දැන ගනියි.

19. "ඉන්පසු පිරිසිදුවූ නිර්මලවූ මෘදුවූ කර්මන්‍යවූ බැබළීම් සහිතවූ උපෙක්ෂාවම ඉතිරිවේ. මහණ, යම්සේ දක්ෂවූ

රන්කරුවෙක් හෝ රන්කරු අතවැස්සෙක් හෝ කඹුරු උදුනක් (කෝවක්) බඳින්නේද, උදුන බැඳ උදුන් මුවවිට ආලේප කරන්නේය. උදුන් මුවවිට ආලේප කොට අඬුවෙන් රත්‍රන් ගෙන, උදුන් මුඛයෙහි බහා ලන්නේය. ඊට කලින් කල ගිනි පිඹින්නේය. කලින් කල ජලයෙන් තෙමන්නේය. කලින් කල මැදහත්ව බලන්නේය. ඒ රත්රන් සුද්ධවූවක්, ඉතා පිරිසිදුවූවක්, නිර්මලවූවක් (පහවගිය මළ ඇත්තක්) පහවගිය කසට ඇත්තක්, මෘදුවූවක්, කර්මන්‍ය වූවක්, බැබළීම් සහිත වූවක් වෙයි. යම් යම් පළඳනා විකෘතියක් කැමැති වේද, ඉදින් පවඬිකා නම් ආභරණයක් කිරීමටද, ඉදින් කුණ්ඩලාභරණයක් කිරීමටද, ඉදින් ග්‍රීවයෙහි පළඳන ආභරණයක් කිරීමටද, ඉදින් රන් මාලයක් කිරීමටද කැමැති වෙයිද, මොහුගේ ඒ අදහස සම්පූර්ණ වන්නේය. මහණ, එපරිද්දෙන්ම ඉන්පසු පිරිසිදුවූ, නිර්මලවූ, මෘදුවූ, කර්මන්‍යවූ බැබළීම් සහිතවූ උපෙක්ෂාවම ඉතිරිවේ.

**20.** "හෙතෙම මෙසේ දැනගනියි. ඉදින් මම මෙසේ පිරිසිදු වූ මෙසේ නිර්මලවූ මේ උපෙක්ෂාව ආකාසානඤ්චායතනය වෙත එලවන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද, එසේවූ කල මාගේ මේ උපෙක්ෂාව එය ඇසුරුකොට එය කරුණුකොට ඉතා බොහෝ කලක් පවත්නේය. ඉදින් මම මෙසේ පිරිසිදුවූ, මෙසේ නිර්මලවූ, මේ උපෙක්ෂාව විඤ්ඤානඤ්චායතනය වෙත එලවන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද, එසේවූ කල මාගේ මේ උපෙක්ෂාව එය ඇසුරු කොට, එය කරුණු කොට ඉතා දීර්ඝ කාලයක් පවතින්නේය. ඉදින් මම මෙසේ පිරිසිදුවූ මෙසේ නිර්මලවූ මේ උපෙක්ෂාව ආකිඤ්චඤ්ඤායතනය කරා පමුණුවන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද, එසේවූ කල මාගේ මේ උපෙක්ෂාව එය ඇසුරුකොට, එය කරුණුකොට බොහෝ දීර්ඝ කාලයක් සිටින්නේය. ඉදින් මම මෙසේ පිරිසිදුවූ, මෙසේ නිර්මලවූ, මේ උපෙක්ෂාව නෙවසඤ්ඤානාසඤ්ඤායතනය කරා පමුණු වන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද එසේවූ කල මාගේ මේ උපෙක්ෂාව එය

ඇසුරුකොට එය කරුණු කොට බොහෝ දීර්ඝ කාලයක් පවතින්නේය යනුවෙනි.

21. "හෙතෙම මෙසේ දැනගනියි. ඉදින් මම මෙසේ පිරිසිදුවූ මෙසේ නිර්මලවූ මේ උපෙක්ෂාව ආකාසානඤ්චායතනය කරා පමුණුවන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද, මෙය හේතුප්‍රත්‍යයෙන් ඇතිවන ලද්දකි. ඉදින් මම මෙසේ පිරිසිදුවූ මෙසේ නිර්මලවූ මේ උපෙක්ෂාව විඤ්ඤාණඤ්චායතනය කරා පමුණුවන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද, එය හේතුප්‍රත්‍යයෙන් උපදින ලද්දකි. ඉදින් මම මෙසේ පිරිසිදුවූ, මෙසේ නිර්මලවූ මේ උපෙක්ෂාව ආකිඤ්චඤ්ඤායතනය කරා පමුණු වන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද, එය හේතුප්‍රත්‍යයෙන් හටගන්නා ලද්දකි. ඉදින් මම මෙසේ පිරිසිදුවූ, මෙසේ නිර්මලවූ මේ උපෙක්ෂාව නෙවසඤ්ඤානාසඤ්ඤායතනය කරා පමුණුවන්නෙම්ද, එයට අනුකූල ධර්මයෙහි සිත වඩන්නෙම්ද, එය හේතුප්‍රත්‍යයෙන් හටගන්නා ලද්දකි කියායි. හෙතෙම එය රැස් නොකරන්නේය, සදාකාලික භවය පිණිස හෝ භවයේ සිඳීම පිණිස හෝ කල්පනා නොකරයි. හෙතෙම රැස් නොකරන්නේ සදාකාලික භවය පිණිස හෝ භවයේ සිඳීම පිණිස හෝ කල්පනා නොකරන්නේ, ලෝකයෙහි කිසිවක් මම යයි (අල්වා නොගනියි) මම යයි අල්වා නොගන්නේ නොඇලෙයි නොඇල්ලෙන්නේ තමාම පිරිනිවෙයි. ජාතිය ක්ෂය කරණ ලද්දීය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුතු දෙය කරණ ලද්දේය. මේ ආත්මය පිණිස අනිකක් නැතැයි දැනගනියි. හෙතෙම ඉදින් සැපවූ වේදනාවක් විඳීද, එය අනිත්‍යයයි දැනගනියි. වැද්ද ගැනීමට නුසුදුසුයයි දැනගනියි. ඇලීමෙන් සතුටුවීමට සුදුසු නැතැයි දැනගනියි. ඉදින් දුක්වූ වෙදනාවක් විඳීද, එය අනිත්‍යයයි දැනගනියි. නොවැදගත්යයි දැනගනියි. තණ්හාවෙන් සතුටු නොවිය යුතු යයි දැනගනියි. ඉදින් නිදුක් නොසැපවූ වේදනාවක් විඳීද, එය අනිත්‍යයයි දැනගනියි. නොවැදගන්නා ලද්දීයයි දැනගනියි. නොසතුටුවන

ලද්දීයයි දැන ගනියි. හෙතෙම, ඉදින් සැපවූ වේදනාවක් විඳීද, කෙලෙස් ඉපදීමෙන් වෙන්වූයේ එය නොවිඳියි. හෙතෙම ඉදින් දුක්වූ වේදනාවක් විඳීද, කෙලෙස් ඉපදීමෙන් වෙන්වූයේ එය නොවිඳියි. ඉදින් නිදුක් නොසැපවූ වේදනාවක් විඳීද කෙලෙස් ඉපදීමෙන් වෙන්වූයේ එය නොවිඳියි. හෙතෙම මේ කය කෙළවර කොට ඇති වේදනාව විඳිනු ලබන්නේ කායපරියන්තික වේදනාව විඳිමියි දැනගනියි. ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳිනු ලබන්නේ ජීවිත පරියන්තික වේදනාව විඳිමියි දැනගනියි. ශරීරයාගේ බිඳීමෙන් ජීවිතය කෙළවර වීමෙන් මෙහි පසු විඳිනලද සතුටුවන ලද සියලු වේදනා සංසිඳෙන්නාහුයයි දැනගනියි.

22. "මහණෙ, යම්සේ තෙලද නිසා වැටියද නිසා තෙල් පහන ඇවිලේද, ඒ තෙල්ද වැටියද කෙළවර වීමෙන් අනික් තෙල් වැටි නොඑළවීමෙන් හේතුරහිත වූයේ නිවේද මහණෙ, මෙපරිද්දෙන්ම මේ කය කෙළවර කොට ඇති වේදනාව විඳිනු ලබන්නේ කය කෙළවරකොට ඇති වේදනාව විඳිමියි, දැනගනියි. ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳිනු ලබන්නේ ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳිමියි දැනගනියි. ශරීරයාගේ භේදයෙන් ජීවිතයාගේ කෙළවර වීමෙන් මෙහි සතුටු වන්නාවූ සියලු වේදනා සංසිඳෙන්නාහුයයි දැනගනියි. එහෙයින් මෙයින් යුක්තවූ භික්ෂුතෙම මේ උතුම්වූ අර්හත්ඵල ප්‍රඥාව නමැති පිහිටීමෙන් යුක්තවූයේ වෙයි. මහණෙ, මේ වනාහි උතුම්වූ ආර්‍ය්‍ය ප්‍රඥාවයි. එනම්, සියලු දුක් නැති කිරීමෙහි ඤාණයවේ. ඔහුගේ ඒ අර්හත් ඵල විමුක්තිය පරමාර්ථ සත්‍යයෙහි පිහිටියා කැළඹියනොහැකි වූවා වේ. මහණෙ, එයද වෙනස්වන ස්වභාවය ඇත්තේය. නැසෙන ස්වභාවය ඇත්තේය, නොනැසෙන ස්වභාවයවූ නිර්වාණයක් වේද එයම සත්‍යයි. එහෙයින් මෙයින් යුක්තවූ භික්ෂුතෙම මේ උතුම්වූ පරමාර්ථ සත්‍ය නමැති පිහිටීමෙන් යුක්තවූයේ වෙයි. මහණෙ, නොනැසෙන ස්වභාව ඇත්තාවූ, මේ නිවණම උතුම් ආර්‍ය්‍ය සත්‍යවේ. එය වනාහි, පෙර (පෘථග්ජන කාලයෙහි) නොදන්නාහුගේ සම්පූර්ණ

කරණලද ගන්නා ලද ස්කන්ධාදී උපාධීහු (ආසා) වෙත්ද, මොහුගේ ඒ උපාධීහු ප්‍රහීණවූවාහු සිඳිනලද මුල් ඇත්තාහු කරටිය සිඳි තල්ගසක් මෙන් කරණ ලද්දාහු නැවත ඇතිවීම නැතිකරණ ලද්දාහු මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත්.

23. "එහෙයින් මෙයින් යුක්තවූ මහණතෙම මේ උතුම්වූ ක්ලෙශ පරිත්‍යාගය නමැති පිහිටීමෙන් යුක්තවූයේ වෙයි. මහණ මේ තෙමේ වනාහි උතුම්වූ ආයර්‍ය්‍යවූ ත්‍යාගය වේ. එනම්, සියලු උපාධීන්ගේ දුරලීමයි. ඒ නොදන්නහුගේම වනාහි පෙර (පෘථග්ජන කාලයෙහි) අභිධ්‍යාව (ආලය) රාග සහිත වීමක් වේද, මොහුගේ එය ප්‍රහීණවූයේ වෙයි. උදුරන ලද මුල් ඇත්තේ සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ නැවත ඇතිවීම නැතිකරණ ලද්දේ මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තේ වෙයි. ඒ අඥානවූ, ඔහුගේම වනාහි පෙර ක්‍රොධයෙක් ව්‍යාපාදයෙක් ද්වෙෂයක්වේද, එය මොහුගේ ප්‍රහීණවූයේ වෙයි. උදුරණ ලද මුල් ඇත්තේ සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ නැවත ඇතිවීම නැති කරණ ලද්දේ, මතු නූපදනා ස්වභාව ඇත්තේවේ. ඒ අඥානවූවහුගේම වනාහි පෙර අවිද්‍යාවක් සම්මොහයක් ද්වෙෂයක්වේද, එය මොහුගේ ප්‍රහීණවූයේ වෙයි. සිඳින ලද මුල් ඇත්තේ සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේ නැවත ඇතිවීම කරණ ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වෙයි. එහෙයින් මෙයින් යුක්තවූ මහණ තෙම මේ උතුම්වූ ක්ලෙශයන් සංසිඳීම නමැති පිහිටීමෙන් යුක්තවූයේ වෙයි. මහණ මෙතෙම වනාහි උතුම්වූ ආයර්‍ය්‍යවූ උපසමයවේ. එනම්, රාග දොස මොහයන්ගේ සංසිඳීමයි.

24. "ප්‍රඥාව සඳහා ප්‍රමාද නොවන්නේය. සත්‍යය ආරක්ෂා කරන්නේය. ත්‍යාගය වඩන්නේය, හෙතෙම සංසිඳීමෙහිම හික්මෙන්නේයයි, මෙසේ ඒ යමක් කියන ලදද එය මේ සඳහා කියන ලදී.

යම් තැනෙක්හි සිටියහුට උත්සන්නවූ හැඟීම් (තෘෂ්ණාදී ත්‍රිවිධ මඤ්ඤනාවන්ගේ උත්සන්න භාවයෝ) නොපවතිත්ද,

මඤ්ඤනාවන්ගේ උත්සන්න භාවය වනාහි නොපවත්නා කල්හි මුනිතෙම සංසිඳුනේයයි කියනු ලැබේ යයි. මෙසේ වනාහි මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? මහණ, මේ ස්කන්ධය මම වෙමියි හඟින ලදී. මෙතෙම මම වෙමියි හඟින ලදී. වන්නෙමියි හඟින ලදී. නොවන්නෙමියි, හඟින ලදී. රූප ඇත්තෙක් වන්නෙමියි හඟින ලදී. රූප නැත්තෙක් වන්නෙමියි හඟින ලදී. සංඥා ඇත්තෙක් වන්නෙමියි, හඟින ලදී. සංඥා නැත්තෙක් වන්නෙමියි හඟින ලදී. නොම සංඥා ඇත්තෙක් නොම අසංඥා ඇත්තෙක් වන්නෙමියි හඟින ලදී. මහණ, හැඟීම රොගයකි. හැඟීම ගඩකි. හැඟීම හුලකි. මහණ, සියලු හැඟීම් ඉක්ම වීමෙන් මුනිතෙම සංසිඳුනේයයි කියනු ලැබේ. මහණ, මුනිතෙම වනාහි සංසිඳුනේ නූපදියි. නොදිරයි, නොමියයි, නොකිපෙයි, නොවෙයි, මහණ, යමකින් උපදින්නේද එයද මොහුට නැත්තේය. නූපදිනු ලබන්නේ කිම දිරන්නේද? නොදිරනු ලබන්නේ කිම? මිය යන්නේද? නොමියනු ලබන්නේ කිම කිපෙන්නේද? නොකිපෙනු ලබන්නේ කුමකට කැමති වන්නේද? යම් තැනෙක්හි සිටියහුට මඤ්ඤනාවන්ගේ උත්සන්න භාවයෝ නොපවතිත්ද, මඤ්ඤනාවන්ගේ උත්සන්නවීම වනාහි නොපවත්නා කල්හි මුනිතෙම සංසිඳුනේයයි, කියනු ලැබේයයි. මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී. මහණ මාගේ මේ සැකෙවින් (කියන ලද) සවැදෑරුම් ධාතු විභාගය වනාහි නුඹ දරවයයි" වදාළේය.

25. "ඉක්බිති ආයුෂ්මත් පුක්කුසාති කුලපුත්‍රතෙම මාගේ ශාස්තෘතෙමේ වනාහි වැඩිසේක. මාගේ සුගතයන් වහන්සේ වනාහි වැඩිසේක. මාගේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වනාහි වැඩිසේකැයි හුනස්නෙන් නැගිට සිවුර ඒකංශකොට භාග්‍යවතුන් වහන්සේගේ පා ලඟ සිරසින් වැටී, භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේට 'ඇවැත්නි,' කියා කථා කළ යුතුයයි සිතුවෙමි. ඒ මාගේ වරද බාලයෙකු සේ අඥානයෙකු සේ අදක්ෂයෙකු සේ සලකා ඒ මාගේ වරද දුරු වේවා ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ

මතු සංවරය පිණිස වරද වරද වශයෙන් පිළිගන්නා සේක්වායි යනුයි.

**26.** "එසේනම් මහණ, නුඹ මට 'ඇවැත්නි,' කියා කථා කළ යුතුයයි සිතුවෙහිද? මහණ, බාලයෙකුසේ අඥානයකුසේ අදක්ෂයෙකුසේ මට ඔබ 'ඇවැත්නියි' ව්‍යවහාර කළයුතුයයි සැලකුවෙහිද? ඒ වරද කෙළෙහිද, යම් හෙයකිනුත් නුඹ වරද වශයෙන් දැක ධර්මයවූ පරිද්දෙන් ප්‍රතිකාර කෙරෙහිද, තොපගේ ඒ වරද අපි පිළිගනිමු. මහණ, ආර්‍ය්‍ය විනයෙහි යමෙක් වරද වරද වශයෙන් දැක ධර්මයවූ පරිද්දෙන් පිළියම් කෙරේද, මත්තෙහි සංවරයට පැමිණේද, එය වැඩි දියුණුව වේයයි" වදාළේය.

**27.** "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි උපසම්පදාව ලබන්නෙමියි, (කීයේය.)

"මහණ, නුඹගේ පාත්‍ර සිවුරු සම්පූර්ණ වේදැයි?" ඇසූහ.

"ස්වාමීනි, මාගේ පාත්‍ර සිවුරු වනාහි සම්පූර්ණ නොවේයයි කීය. "මහණ, තථාගතවරයෝ සම්පූර්ණ නොවූ පාත්‍ර සිවුරු ඇත්තහු උපසම්පදා නොකෙරෙත්යයි," (වදාළේය.) ඉක්බිති ආයුෂ්මත් පුක්කුසාති තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණාකොට පාත්‍ර සිවුරු සෙවීමට ගියේය. ඉක්බිති පාත්‍ර සිවුරු සෙවීමට යන්නාවූ ආයුෂ්මත් පුක්කුසාති කුලපුත්‍රයන් කුලප්පවූ එළදෙනක් දිවියෙන් තොරකෙළේය.

**28.** එකල්හි බොහෝවූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹුනාහුය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසක හුන්නාහුය. එකත්පසක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාහුය. "ස්වාමීනි, යම් ඒ පුක්කුසාති නම් කුලපුත්‍රයෙක් තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපවූ අවවාදයෙන් අවවාද කරණ ලද්දේද හෙතෙම කළුරිය කළේවෙයි. ඔහුගේ ගතිය කවරීද, පරලොව (උත්පත්තිය) කවරේද?" යනුයි.

"මහණෙනි, පුක්කුසාති කුලපුත්‍ර තෙම පණ්ඩිතවේ. ධර්මයට අනුධර්මවූ ප්‍රතිපදා ඇත්තේවේ. ධර්මාවබොධය පිණිස මා නොවෙහෙසුවේය. මහණෙනි, පුක්කුසාති කුලපුත්‍ර තෙමේ ඕරම්භාගිය සංයෝජන පස නැති කිරීමෙන් ඕපපාතිකවූයේ ඒ ලොකයෙන් පෙරළා එන ස්වභාව නැත්තේ එහි පිරිනිවන් පාන්නේයයි" වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුයි.

දසවැනිවූ ධාතුවිභංග සූත්‍රය නිමි.

---

## 41. සච්චවිභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි, භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට "මහණෙනි, කියා ආමන්ත්‍රණය කළ සේක. "පින්වතුන් වහන්සැයි," ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස්නුවර සමීපයෙහිවූ මිගදාය නම් ඉසිපතනාරාමයෙහිදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදී. එනම්, චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය, (යනුයි.) කවර චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේද? දුක්ඛ නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය,

පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය, දුක්ඛ සමුදය නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ නිරොධ නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය, දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදා නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය, (යන සතරයි). මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස් සමීපයෙහිවූ මිගදාය නම් ඉසිපතනාරාමයෙහි මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බඹෙකු විසින් හෝ ලොව කිසිකෙනෙකු විසිනුත් නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදී. එනම්, මේ සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමට, ප්‍රකට කිරීමය.

3. "මහණෙනි, ශාරීපුත්‍ර මොග්ගල්ලායනයන් සේවනය කරව්. මහණෙනි, ශාරීපුත්‍ර මොග්ගල්ලානයන් භජනය කරව්. පණ්ඩිතවූ (ඒ) භික්ෂූහු බඹසර ඇත්තවුන්ට අනුග්‍රහ කරන්නාහුය. මහණෙනි, වැදූ මව යම්සේද ශාරීපුත්‍ර තෙමේ එමෙනි. උපන්නහුගේ පොෂණය කරන්නාවූ මව යම්සේද, මොග්ගල්ලාන තෙමේ එවැනි වේ. මහණෙනි, ශාරීපුත්‍ර තෙමේ සෝවාන් ඵලයෙහි හික්මවයි. මොග්ගල්ලාන තෙමේ ඉහළ ඵලයන්හි හික්මවයි. මහණෙනි, ශාරීපුත්‍ර තෙම චතුරාර්‍ය්‍ය සත්‍යයන් විස්තර වශයෙන් කියන්ට දෙශනා කරන්ට පනවන්ට පිහිටුවන්ට විවරණය කරන්ට විභාග කරන්ට ප්‍රකට කරන්ට සමර්ථවේයයි." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

4. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ බැහැර ගිය නොබෝ කල්හි භික්ෂූන්ට "ඇවැත් මහණෙනියි" ආමන්ත්‍රණය කළ සේක. "ඇවැත්නි," කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ට උත්තර දුන්හ.

ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ මෙය ප්‍රකාශ කෙළේය. "ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස්නුවර මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බඹෙකු විසින් හෝ ලොව කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදී. එනම්, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ කීමයි, දෙසීමයි, පැනවීමයි, පිහිටුවීමයි, ප්‍රකාශ කිරීමයි, විභාග කිරීමයි, ප්‍රකට කිරීමයි. කවර සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේද? දුක්ඛ නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය, දුක්ඛ සමුදය නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ නිරොධ නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදා නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, විවරණය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය, (යනුයි).

5. "ඇවැත්නි, දුක්ඛ නම් ආර්‍ය්‍ය සත්‍යය කවරේද? ඉපදීමද දුක්වේ. දිරීමද දුක්වේ. මැරීමද දුක්වේ. සොක කිරීමය, වැලපීමය, කායික දුකය, දොම්නසය, දැඩි වෙහෙසය යන මොහුද දුක් වෙත්. කැමැති වන්නාවූ යමක් නොලැබේද, එයද දුක් වේ. කොටින්, පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයෝ දුක් වෙත්.

"ඇවැත්නි, ඉපදීම නම් කවරීද, ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයෙහි යම් ඉපදීමක්, හටගැනීමක්, පිළිසිඳීමක්, පහළවීමක්, ස්කන්ධයන්ගේ පහළවීමක්, ආයතනයන්ගේ ප්‍රතිලාභයක් වේද, ඇවැත්නි, මෙය ජාතියයි කියනු ලැබේ. (ඉපදීමයයි කියනු ලැබේ).

"ඇවැත්නි, ජරාව කවරීද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයෙහි යම් ජරාවක්, දිරණ බවක්, කැඩෙන බවක්, පැසෙන බවක්, රැලි වැටුනු සිවිය ඇති බවක්, ආයුෂයාගේ පිරිහීමක්,

ඉන්ද්‍රියන්ගේ මේරීමක් වේද, ඇවැත්නි, මෙය ජරාවයයි කියනු ලැබේ.

"ඇවැත්නි, මරණය කවරේද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයෙන් යම් චුතවීමක්, චුතවන බවක්, බිඳීමක්, අතුරුදන්වීමක්, මරණයක්, කළුරිය කිරීමක්, ස්කන්ධයන්ගේ බිඳීමක්, ශරීරයාගේ බහාතැබීමක් වේද, ඇවැත්නි, මේ මරණයයි කියනු ලැබේ.

"ඇවැත්නි, ශෝක කිරීම නම් කවරේද? ඇවැත්නි, එක්තරා එක්තරා විනාශයකින් යුක්තවූවහුට එක්තරා එක්තරා දුක් ස්වභාවයක් පැමිණියහුට යම් ශෝකයක්, තැවීමක්, තැවීම් ඇතිබවක්, ඇතුළත තැවීමක්, ඇතුළත අතිශයින් තැවීමක් වේද, ඇවැත්නි, මේ ශෝකයයි කියනු ලැබේ.

"ඇවැත්නි, වැළපීම කවරේද, ඇවැත්නි, එක්තරා එක්තරා විනාශයකින් යුක්තවූවහුගේ එක්තරා එක්තරා දුක් ස්වභාවයක් පැමිණියහුගේ යම් ආදෙවයක්, පරිදෙවයක්, හැඬීමක්, වැළපීමක්, හැඬීම ඇතිබවක්, වැළපෙන ස්වභාවයක් වේද, ඇවැත්නි, මේ වැළපීමයයි කියනු ලැබේ.

**6.** "ඇවැත්නි, දුක නම් කවරේද? ඇවැත්නි, යම් කයෙහි හටගන්නාවූ දුකක්, කයෙහි හටගන්නාවූ නොසැපයක්, කයේ වැදීමෙන් හටගන්නාවූ දුකක් නොසැපයක්, විඳ ගැනීමක් වේද, ඇවැත්නි, මේ දුකයයි කියනු ලැබේ.

"ඇවැත්නි, දොම්නස කවරේද? ඇවැත්නි, යම් සිතෙහි හටගන්නාවූ දුකක් වේද, සිතෙහි හටගන්නාවූ නොසැපවූ විඳ ගැනීමක් වේද, මනො සම්ඵස්සයෙන් හට ගන්නාවූ දුකක් නොසැපවූවක් විඳගැනීමක් වේද, ඇවැත්නි, මෙය දොම්නසයයි කියනු ලැබේ.

"ඇවැත්නි, දැඩිවූ වෙහෙස කවරේද? ඇවැත්නි, එක්තරා එක්තරා විනාශයකින් යුක්තවූවහුට එක්තරා එක්තරා දුක් ස්වභාවයක් පැමිණියාහුට යම් වෙහෙසක්, දැඩිවූ ශොකයක්,

වෙහෙසට පැමිණි බවක්, දැඩිවූ ශෝක ඇති බවක් වේද, ඇවැත්නි, මෙය උපායාසයයි කියනු ලැබේ.

"ඇවැත්නි, කැමතිවූ යමක් නොලබාද එයද දුක් වේ, යනු කවරේද? ඇවැත්නි, ඉපදීම ස්වභාවකොට ඇත්තාවූ සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළවේ. 'අපි ඉපදීම ස්වභාව කොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට ඉපදීම නොපැමිණෙන්නේ නම් යහපතැයි' කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි. මෙයද කැමති යමක් නොලබා නම්, එයද දුක්වේ. ඇවැත්නි, දිරීම ස්වභාව කොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළවේ. 'අපි දිරීම ස්වභාවකොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට දිරීම නොපැමිණෙන්නේ නම් ඉතා හොඳය' කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි මෙයද කැමති යමක් නොලබා නම් එයද දුක්වේ. ඇවැත්නි, ව්‍යාධිය ස්වභාවකොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළවේ. 'අපි ව්‍යාධිය ස්වභාවකොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට ව්‍යාධිය නොපැමිණෙන්නේ නම්, ඉතා හොඳයයි' කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි. මෙයද, කැමති යමක් නොලබානම් එයද දුක් වේ.

"ඇවැත්නි, මරණය ස්වභාවකොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළවේ. 'අපි මරණය ස්වභාවකොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට මරණය නොපැමිණෙන්නේ නම් ඉතා හොඳය' කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි මෙයද කැමති යමක් නොලබා නම් එයද දුක් වේ.

"ඇවැත්නි, ඇතුළත තැවීමය, වැළපීමය, කායික දුකය, චෛතසික දුකය, දැඩිවූ ආයාසය යන මොවුන් ස්වභාව කොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් උපදියි. 'අපි ඇතුළත තැවීමය, විලාප කීමය, කායික දුකය, චෛතසික දුකය, දැඩිවූ ආයාසය යන මොවුන් ස්වභාව කොට ඇත්තෝ නොවන්නෙමු

නම්, අපට ඒකාන්තයෙන් ශොක, පරිදෙව, දුක්, දොම්නස් යන මොහු නොපැමිණෙන්නාහු නම් යහපති, කියායි. මෙය වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුතුයි. මෙයද කැමැති යමක් නොලබයිද, එයද දුක් වේ.

7. "ඇවැත්නි, සැකෙවින් පඤ්ච උපාදාන ස්කන්ධයෝ දුක් වෙති, යනු කවරහුද, එනම් රූපොපාදාන ස්කන්ධය වේදනොපාදාන ස්කන්ධය, සංඥොපාදාන ස්කන්ධය, සංස්කාරොපාදාන ස්කන්ධය, විඥානොපාදන ස්කන්ධය යන මොහුයි. ඇවැත්නි, මොව්හු සැකෙවින් පඤ්චොපාදාන ස්කන්ධයෝ දුක් වෙත්යයි කියනු ලැබෙත්.

"ඇවැත්නි, මේ දුඃඛායඁසත්‍යයයි කියනු ලැබේ.

8. "ඇවැත්නි, දුක්ඛසමුදය නම් ආයඁසත්‍යය කවරේද? නැවත භවය ගෙණදෙන්නාවූ සතුටුවීමයයි කියනලද ඇල්මෙන් යුක්තවූ ඒ ඒ තන්හි ඇළුම් කරන්නාවූ යම් මේ තෘෂ්ණාවක් වේද, එනම්, කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය යන මොහුයි. ඇවැත්නි, මේ දුක්ඛසමුදය නම් ආයඁසත්‍යයයි කියනු ලැබේ.

9. "ඇවැත්නි, දුක්ඛ නිරොධ නම් ආයඁසත්‍යය කවරේද? ඒ තෘෂ්ණාවගේම ශෙෂ රහිතව (ඉතිරිවීමක් නැතිව) නොඇලීමෙන් යම් නිරොධයක්, ත්‍යාගයක්, දුරලීමක්, මිදීමක්, ඇළුම් රහිත බවක් වේද, ඇවැත්නි, මෙය දුක්ඛනිරොධ නම් ආයඁසත්‍යයයි කියනු ලැබේ.

10. "ඇවැත්නි, දුක් නිරුද්ධකිරීම පිණිස ගමන් කරන්නාවූ ප්‍රතිපදාව නම් ආයඁසත්‍යය කවරේද? මේ ආයඁ අෂ්ටාඞ්ගික මාර්ගය මැයි. එනම්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යනු මොහුයි.

11. "ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය කවරිද? ඇවැත්නි, දුක්ඛ සත්‍යයෙහි යම් දැනීමක් වේද, දුක්ඛ සමුදය සත්‍යයෙහි යම්

දැනීමක් වේද, දුක්ඛ නිරොධ සත්‍යයෙහි යම් දැනීමක් වේද, දුක් නිරුද්ධ කිරීම පිණිස පිළිපදින්නාවූ මාර්ග සත්‍යයෙහි යම් දැනීමක් වේද, ඇවැත්නි, මෙය සම්‍යක් දෘෂ්ටියයි කියනු ලැබේ.

12. "ඇවැත්නි, සම්‍යක් සංකල්පය නම් කවරීද? කාමයන්ගෙන් සිත බැහැර කිරීමෙහි සංකල්පනාවය. ක්‍රොධ නොකිරීම පිළිබඳ සංකල්පනාවය, හිංසා නොකිරීම පිළිබඳ සංකල්පනාවය යන මොහුයි. ඇවැත්නි, මේ සම්‍යක් සංකල්පයයි කියනු ලැබේ.

13. "ඇවැත්නි, සම්‍යක් වචනය කවරේද? බොරු කීමෙන් වැළකීමය, කේලාම් කීමෙන් වැළකීමය, ඵරුෂවචන කීමෙන් වැළකීමය, හිස් කථාවෙන් වැළකීමය යන මොහුයි ඇවැත්නි, මේ සම්‍යක් වචනයයි කියනු ලැබේ.

14. "ඇවැත්නි, සම්‍යක් කර්මාන්තය නම් කවරේද? සතුන් මැරීමෙන් වැළකීමය, සොරකම් කිරීමෙන් වැළකීමය, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීමය යන මොහුයි. ඇවැත්නි, මේ සම්‍යක් කර්මාන්තයයි කියනු ලැබේ

15. "ඇවැත්නි, සම්‍යක් ආජීවය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම වැරදිවූ ජීවිකාව හැර යහපත්වූ ජීවිකාවෙන් දිවි පැවැත්ම කෙරේද, ඇවැත්නි, මේ සම්‍යක් ආජීවයයි කියනු ලැබේ.

16. "ඇවැත්නි, සම්‍යක් ව්‍යායාමය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන්නාවූ ලාමකවූ අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි. ව්‍යායාම කරයි. වීර්‍ය්‍ය පටන්ගනියි. සිත දැඩිකර ගණියි, උත්සාහ කරයි. උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍යය පටන්ගනියි. සිත දැඩිකර ගනියි. උත්සාහ කරයි. නූපන්නාවූ කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍යය පටන්ගනියි. සිත දැඩිකර ගනියි. උත්සාහ කරයි. උපන්නාවූ කුසල කර්මයන්ගේ පැවැත්ම පිණිස, මුළා නොවීම පිණිස,

වැඩිවීම පිණිස, මහත්වීම පිණිස, භාවනාවෙන් සම්පූර්ණ කිරීම පිණිස ආලය උපදවයි වෑයම් කරයි. වීර්‍ය්‍යය පටන්ගනියි. සිත දැඩිකර ගනියි. උත්සාහ කරයි. ඇවැත්නි, මේ සම්‍යක් ව්‍යායාමයයි කියනු ලැබේ.

17. "ඇවැත්නි, සම්‍යක් ස්මෘතිය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ලෝකයෙහි ලොභය හා දොෂය දුරුකොට කයෙහි කය අනුව බලමින් වාසය කරයි. වේදනාවන්හි වේදනාවන් අනුව බලන්නේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ස්කන්ධ ලොකයෙහි ලොභය හා දොෂය දුරු කොට වාසය කරයි. සිතෙහි සිත අනුව බලන්නේ කෙළෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ලෝකයෙහි ලොභය හා දොෂය දුරුකොට වාසය කරයි. කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ලෝකයෙහි ලොභය හා දොෂය දුරුකොට ධර්මයන්හි ධර්මය අනුව දකිමින් වාසය කරයි. ඇවැත්නි, මෙය සම්‍යක් ස්මෘතියයි කියනු ලැබේ.

18. "ඇවැත්නි, සම්‍යක් සමාධිය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිත පිළිබඳ එකග බැව් ඇත්තාවූ, විතර්ක සහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කෙරෙයි. සිහියෙන් යුක්තවූයේ, කයින් සැප විඳියි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහියෙන් යුක්තවූයේ, සැප විහරණය ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපය නැතිකිරීමෙන් දුක් නැති කිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූද, සැප

නැත්තාවූද උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. ඇවැත්නි, මේ සම්‍යක් සමාධියයි කියනු ලැබේ. ඇවැත්නි, මේ දුක් නිරුද්ධකිරීම පිණිස ගමන් කරන්නාවූ මාර්ගය නම්, ආර්‍ය්‍යසත්‍යයයි කියනු ලැබේ.

19. "ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස් නුවර මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරුවෙකු විසින් හෝ බඹෙකු විසින් හෝ ලෝ කිසිවෙකු විසිනුත් නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වනලදී. එනම්, මේ සිව්වැදෑරුම්වූ ආර්‍ය්‍ය සත්‍යයන්ගෙන් කීම, දෙසීම, පැනවීම, පිහිටුවීම, විවරණය, විභජනය, ප්‍රකටකිරීම යනුයි.

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙමේ මෙය ප්‍රකාශ කෙළේය. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ගේ වචනය සතුටින් පිළිගත්තාහුයි.

**එකළොස් වැනිවූ සච්චවිභංග සූත්‍රය නිමි. (4-11)**

---

## 42. දක්ඛිණවිභංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි, භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයන්හි කිඹුල්වත් පුරයෙහිවූ නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ අළුත්වූ වස්ත්‍ර දෙකක් ගෙණ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියාය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසක හුන්නීය. එකත්පසක හුන්නාවූ මහාප්‍රජාපතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාය.

2. "ස්වාමීනි, මාගේ මේ අළුත්වූ වස්ත්‍ර යුවළ භාග්‍යවතුන් වහන්සේ උදෙසා තමන් විසින්ම කටින ලදී. තමන් විසින්ම

වියන ලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ ඒ වස්ත්‍ර යුවළ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා" යනුයි. මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාපතී ගෞතමියට මෙය වදාළේය. "ගෞතමිය, සංඝයාට දෙව. තී විසින් සංඝයාට දුන් කල්හි, මමද පුදනලද්දේ වන්නෙමි, සංඝයාද (පුදනලද්දේ) වන්නේය යනුයි. දෙවනුවද මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාය. "ස්වාමීනි, මාගේ මේ අළුත් වස්ත්‍ර යුවළ භාග්‍යවතුන් වහන්සේ උදෙසා තමන් විසින්ම කටිනලදී. තමන් විසින්ම වියනලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ මේ වස්ත්‍ර යුග්මය, අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා" යනුයි. දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාපතී ගෞතමියට මෙය වදාළේය. "ගෞතමිය, සංඝයාට දෙව, තී විසින් සංඝයාට දුන් කල්හි, මමද පුදනලද්දේ වන්නෙමියි, සංඝ තෙමේද පුදනලද්දේ වන්නේය" යනුයි. තුන්වෙනුවද මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාය. "ස්වාමීනි, මාගේ මේ අළුත්වූ වස්ත්‍ර යුවළ භාග්‍යවතුන් වහන්සේ උදෙසා තමන් විසින්ම කටින ලදී. තමන් විසින්ම වියනලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ මේ වස්ත්‍ර යුග්මය, අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා" යනුයි. තුන්වෙනුවද භාග්‍යවතුන් වහන්සේ මහා ප්‍රජාපතී ගෞතමියට මෙය වදාළේය. "ගෞතමිය, සංඝයාට දෙව, තී විසින් සංඝයාට දුන් කල්හි මමද පුදනලද්දේ වන්නෙමි, සංඝ තෙමේද පුදන ලද්දේ වන්නේයයි."

3. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාපතී ගෞතමියගේ අළුත්වූ වස්ත්‍ර යුවළ පිළිගන්නා සේක්වා. ස්වාමීනි, මහාප්‍රජාපතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේට බොහෝ උපකාර ඇත්තීය. මවගේ සහෝදරිය. අත් පා වැඩූ තැනැත්තීය, පොෂණය කළ තැනැත්තීය, කිරි දුන් තැනැත්තීය. භාග්‍යවතුන් වහන්සේට වැදූ මව කළුරිය කල කල්හි කිරි පෙව්වාය. ස්වාමීනි, භාග්‍යවතුන්

වහන්සේද මහාප්‍රජාපතී ගෞතමියට බොහෝ උපකාර ඇත්තේ වේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නිසා මහාප්‍රජාපතී ගෞතමී තොමෝ බුදුන් සරණ කොට ගියාය. ධර්මය සරණ කොට ගියාය. සංඝයා සරණ කොට ගියාය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නිසා මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ සතුන් මැරීමෙන් වැළකුනීය, සොරකම් කිරීමෙන් වැළකුනීය, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනීය, බොරු කීමෙන් වැළකුනීය, රහමෙර පානය කිරීමෙන් වැළකුනීය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නිසා මහාප්‍රජාපතී ගෞතමී තොමෝ බුදුන් කෙරෙහි අචලවූ ප්‍රසාදයෙන් යුක්තවූවාය. ධර්මය කෙරෙහි අචලවූ ප්‍රසාදයෙන් යුක්තවූවාය. සංඝයා කෙරෙහි අචලවූ ප්‍රසාදයෙන් යුක්ත වූවාය. ආයර්‍යයන් කැමැතිවූ සීලයෙන් යුක්තවූවාය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නිසා මහාප්‍රජාපතී ගෞතමී තොමෝ දුක්ඛ සත්‍යයෙහි සැක නැති වූවාය. දුක්ඛ සමුදය සත්‍යයෙහි සැකනැති වූවාය. දුක්ඛ නිරොධ සත්‍යයෙහි සැක නැති වූවාය. දුක් නිරුද්ධ කිරීමට පිළිපදින්නාවූ මාර්ග සත්‍යයෙහි සැක නැති වූවාය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේද මහා ප්‍රජාපතී ගෞතමියට බොහෝ උපකාර ඇති සේකැයි," (සැලකෙළේය.)

4. "ආනන්දය, එය එසේය, ආනන්දය, එය එසේය. ආනන්දය, යම් පුද්ගලයකු නිසා පුද්ගලයෙක් තෙම බුදුන් සරණ කොට ගියේ වේද, ධර්මය සරණ කොට ගියේ වේද, සංඝයා සරණ කොට ගියේ වේද, ආනන්දය, මේ ආචාර්‍යයවූ පුද්ගලයාහට මේ අතවැසිවූ පුද්ගලයා විසින් ප්‍රතිඋපකාර කළ නොහැක්කේයයි, කියමි. එනම්, වැඳීමය, දැක හුනස්නෙන් නැගිටීමය, ඇඳිලි කිරීමය, ගරු බුහුමන් කිරීමය, සිව්රුය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකරය, යන මොවුන් දීමෙනි. ආනන්දය, යම් පුද්ගලයකු නිසා පුද්ගලයෙක් තෙම සතුන් මැරීමෙන් වැළකුනේ වේද, සොරකම් කිරීමෙන් වැළකුනේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, බොරු කීමෙන් වැළකුනේ වේද, මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය කිරීමෙන් වැළකුනේ වේද, ආනන්දය,

මේ ආයර්‍ය්‍යවූ පුද්ගලයාහට මේ අතවැසිවූ පුද්ගලයා විසින් ප්‍රත්‍යුපකාර (උපකාරයට උපකාර) කළ නොහැකියයි කියමි.

"එනම්, වැඳීමය, දැක හුනස්නෙන් නැගිටීමය, ඇඳිලි කිරීමය, ගරුබුහුමන් කිරීමය, සිවුරුය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස, බෙහෙත්, පිරිකර දීමෙනි. ආනන්දය, යම් පුද්ගලයෙකු නිසා පුද්ගලයෙක් තෙම බුදුන් කෙරෙහි, අචල ප්‍රසාදයෙන් යුක්තවූයේ වේද, ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේ වේද, සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේ වේද, ආර්‍ය්‍යයන් කැමැතිවූ සීලයෙන් යුක්තවූයේ වේද, ආනන්දය, මේ ආචාර්‍ය්‍යවූ පුද්ගලයාහට මේ අතවැසිවූ පුද්ගලයා විසින් ප්‍රත්‍යුපකාර කළ නොහැකි යයි කියමි. එනම්, වැඳීමය, දැක හුනස්නෙන් නැගිටීමය, ඇඳිලි කිරීමය, ගරුබුහුමන් කිරීමය, සිවුරුය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකර දීමෙනි. ආනන්දය, යම් පුද්ගලයකු නිසා පුද්ගලයෙක් තෙම දුක්ඛ සත්‍යයෙහි සැක නැත්තේ වේද, දුක්ඛ සමුදය සත්‍යයෙහි සැක නැත්තේ වේද, දුක්ඛ නිරොධ සත්‍යයෙහි සැක නැත්තේ වේද, දුක් නිරුද්ධ කිරීමට පිළිපදින්නාවූ මාර්ග සත්‍යයෙහි සැක නැත්තේ වේද, ආනන්දය, මේ ආචාර්‍ය්‍යවූ පුද්ගලයාහට මේ අතවැසිවූ පුද්ගලයා විසින් ප්‍රත්‍යුපකාර කළ නොහැකියයි කියමි. එනම්, වැඳීම, දැක හුනස්නෙන් නැගිටීම, ඇඳිලි කිරීම, ගරුබුහුමන් කිරීම, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර දීම යන මෙයිනි.

5. "ආනන්දය, පුද්ගලික දාන මේ දහතරක් වෙත්. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ කෙරෙහි දානය දේද, මේ පළමුවන පුද්ගලික දානයයි. පසේ බුදුන් කෙරෙහි දානය දේද, මේ දෙවන පුද්ගලික දානයයි. තථාගත ශ්‍රාවකවූ රහතන් වහන්සේ කෙරෙහි දානය දේද, මේ තුන් වන පුද්ගලික දානයයි. අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන්නහු කෙරෙහි දානය දේද, මේ සතරවන පුද්ගලික දානයයි. අනාගාමි පුද්ගලයෙකුට දානය දේද, මේ පස්වන පුද්ගලික දානයයි. අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නහු කෙරෙහි දානය දේද, මේ සවන

පුද්ගලික දානයයි. සකෘදාගාමි පුද්ගලයෙකුට දානය දේද, මේ සත්වන පුද්ගලික දානයයි. සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නහු කෙරෙහි දානය දේද, මේ අටවන පුද්ගලික දානයයි. සෝවාන් පුද්ගලයෙකු කෙරෙහි දානය දේද, මේ නවවන පුද්ගලික දානයයි. සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නකු කෙරෙහි දානය දේද, මේ දසවන පුද්ගලික දානයයි. සස්නෙන් බැහැරවූ කාමයන්හි පහවූ රාග ඇත්තකු කෙරෙහි දානය දේද, මේ එකොළොස්වන පුද්ගලික දානයයි. පෘථග්ජන සීලවන්තයකු කෙරෙහි දානය දේද, මේ දොළොස්වන පුද්ගලික දානයයි. පෘථග්ජන දුශ්ශීලයෙකු කෙරෙහි දානය දේද, මේ දහතුන්වන පුද්ගලික දානයයි. තිරිසන් ගතවූවකු කෙරෙහි දානය දේද, මේ දහහතර වන පුද්ගලික දානයයි.

**6.** "ආනන්දය, ඔවුන් අතුරෙන් තිරිසන් ගතවූවකු කෙරෙහි දානයදී සියයක් අනුසස් ඇත්තාවූ දානය කැමැති විය යුත්තේය. පෘථග්ජන දුශ්ශීලයකු කෙරෙහි දානය දී, දහසක් අනුසස් ඇත්තාවූ දානය කැමැති විය යුත්තේය. පෘථග්ජන සීලවන්තයෙකු කෙරෙහි දානය දී ලක්ෂයක් අනුසස් ඇත්තාවූ දානය කැමැති විය යුත්තේය. ශාසනයෙන් පිටත්හිවූ කාමයන්හි පහවූ රාගය ඇත්තකු කෙරෙහි දානය දී කෝටිලක්ෂයක් අනුසස් ඇත්තාවූ දානය කැමැති විය යුත්තේය. සෝවාන්ඵලය ප්‍රත්‍යක්ෂකිරීම පිණිස පිළිපන්නකු කෙරෙහි දානය දී සංඛ්‍යාවක් නැත්තාවූ, ප්‍රමාණයක් නැත්තාවූ අනුසස් ඇති දානය කැමැති විය යුත්තේය. සෝවාන් පුද්ගලයෙකු කෙරෙහි කියනුම කවරේද? සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නකු කෙරෙහි කියනුම කවරේද? සකෘදාගාමි පුද්ගලයෙකුට කියනුම කවරේද? අනාගාමිඵලය ප්‍රත්‍යක්ෂකිරීමට පිළිපන්නකු කෙරෙහි කියනුම කවරේද? අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන්නකු කෙරෙහි කියනුම කවරේද? තථාගත ශ්‍රාවකවූ රහතන් වහන්සේ කෙරෙහි කියනුම කවරේද? පසේබුදුන් කෙරෙහි කියනුම කවරේද? අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ කෙරෙහි (දුන් දනෙහි අනුසස්) කියනුම කවරේද?

7. "ආනන්දය, මේ සංඝික දාන සතක් වෙත්. කවර සතක්දයත්? බුදුන් ප්‍රධාන (භික්ෂු භික්ෂුණී යන) උභතො සංඝයා විෂයෙහි දානය දේද, මෙය පළමුවන සංඝික දානයයි. තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි උභතො සංඝයා විෂයෙහි දානය දේද, මෙය දෙවන සංඝික දානයයි. භික්ෂු සංඝයා විෂයෙහි දානය දේද, මේ තුන්වන සංඝික දානයයි. භික්ෂුණී සංඝයා විෂයෙහි දානය දේද, මේ සතරවන සංඝික දානයයි. මෙතෙක් භික්ෂූහුද භික්ෂුණීහුද මට සංඝයා කෙරෙන් දෙනු මැනවැයි ලබාගෙන දානය දේද, මෙය පස්වන සංඝික දානයයි. මෙතෙක් භික්ෂූහු මට සංඝයා කෙරෙන් දෙනු මැනවැයි ලබාගෙන දානය දේද, මෙය සයවෙනි සංඝික දානයයි. මෙපමණ භික්ෂුණීහු මට සංඝයා කෙරෙන් දෙනු මැනවැයි ලබාගෙන දානය දේද, මෙය සත්වෙනි සංඝික දානයයි. ආනන්දය, මතු කාලයෙහි ශ්‍රමණ ගොත්‍රය පමණක් ඇත්තාවූ, ලාමක ස්වභාව ඇත්තාවූ, කාසාවකණ්ඨ නම් දුශ්ශීලයෝ වන්නාහුමය. ඒ දුශ්ශීලයන් කෙරෙහි සංඝයා උදෙසා දානය දෙන්නාහුය. ආනන්දය, එකල්හිද මම සංඝගත දානය සංඛ්‍යාවක් නැති, ප්‍රමාණයක් නැති අනුසස් ඇත්තකැයි කියමි. ආනන්දය, කිසියම් ආකාරයකින් සංඝික දානයට වඩා පුද්ගලික දානය අතිශයින් මහත්ඵල ඇත්තේයයි නොමකියමි.

8. "ආනන්දය, මේ දාන විසුද්ධිහු සතරක් වෙත්. කවර සතරක්දයත්? ආනන්දය, දායකයා කෙරෙන් පිරිසිදු වේද, (මහත්ඵල වේද) ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද, එබඳු දානයක් ඇත්තේය. ආනන්දය, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වේද, දායකයා කෙරෙන් පිරිසිදු නොවේද, එබඳු දානයක් ඇත්තේය. ආනන්දය, දායකයා කෙරෙන් පිරිසිදු නොවේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද, එබඳු දානයක් ඇත්තේය. ආනන්දය, දායකයා කෙරෙනුත් පිරිසිදු වේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු වේද, එබඳු දානයක් ඇත්තේය.

9. "ආනන්දය, කෙසේ නම් දානය දායකයා කෙරෙන් පිරිසිදු වේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද, ආනන්දය,

මේ ශාසනයෙහි දායකතෙම සිල්වත්වූ යහපත් ස්වභාව ඇත්තෙක් වේද, ප්‍රතිග්‍රාහකයෝ දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇත්තෝ වෙත්ද, ආනන්දය, මෙසේ වනාහි දානය දායකයා කෙරෙන් පිරිසිදු වේ. ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේ.

10. "ආනන්දය, කෙසේ නම් දානය ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වේද, දායකයා කෙරෙන් පිරිසිදු නොවේද, ආනන්දය, මේ ශාසනයෙහි දායකතෙම දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇත්තෙක් වේද, ප්‍රතිග්‍රාහකයෝ සිල්වත්වූ යහපත් ස්වභාව ඇත්තාහු වෙත්ද, ආනන්දය, මෙසේ වනාහි දානය ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වේ. දායකයා කෙරෙන් පිරිසිදු නොවේ.

11. "ආනන්දය, කෙසේ නම් දානය දායකයා කෙරෙනුත් පිරිසිදු නොවේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු නොවේද? ආනන්දය, මේ ශාසනයෙහි දායක තෙමේද? දුශ්ශීලවූ ලාමකවූ ස්වභාව ඇත්තෙක්වේ. ප්‍රතිග්‍රාහකයෝද දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇත්තාහු වෙත්. ආනන්දය, මෙසේ වනාහි දානය දායකයා කෙරෙහිද පිරිසිදු නොවේ. ප්‍රතිග්‍රාහකයා කෙරෙන්ද පිරිසිදු නොවේ.

12. "ආනන්දය, කෙසේ නම්, දානය දායකයා කෙරෙනුත් පිරිසිදු වේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු වේද? ආනන්දය, මේ ශාසනයෙහි දායක තෙමේත් සිල්වත් යහපත් ස්වභාව ඇත්තෙක් වේද, ප්‍රතිග්‍රාහකයෝත් සිල්වත්වූ යහපත් ස්වභාව ඇත්තාහු වෙත්ද, ආනන්දය, මෙසේ වනාහි දානය දායකයා කෙරෙනුත් පිරිසිදු වේ. හෙවත් මහත්ඵල වේ. ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු වේ.

13. "ආනන්දය, මොහු වනාහි දාන විසුද්ධිහු සතර වෙත්යයි" භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සුගතයන් වහන්සේ මෙය වදාරා, ශාස්තෲන් වහන්සේ නැවතද මෙසේ වදාළේය.

"1. සිල්වත්වූ යමෙක් දැහැමින් ලද දෙයින් මනා පහන් සිත් ඇත්තේ, මහත්වූ කර්මඵලය අදහමින් දුශ්ශීලයන් කෙරෙහි දානය දේද, ඒ දානය දායකයා කෙරෙන් පිරිසිදු වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"2. යම් දුශ්ශීලයෙක් අධර්මයෙක් ලද දෙයින් ප්‍රසන්නවූ සිත් නැත්තේ මහත්වූ කර්මඵලය නොඅදහමින් සීලවන්තයන් කෙරෙහි දානය දේද, ඒ දානය ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වේ.

"3. යම් දුශ්ශීලයෙක් තෙම අධර්මයෙන් ලදදෙයින් අප්‍රසන්න සිත් ඇත්තේ, මහත්වූ කර්මඵලය නොඅදහමින් දුස්සීලයන් කෙරෙහි දානය දේද, ඒ දානය දෙපසින්ම පිරිසිදු නොවේ.

4. "යම් සීලවන්තයෙක් තෙම දැහැමින් ලද දෙයින් ප්‍රසන්නවූ සිත් ඇත්තේ මහත්වූ කර්මඵලය අදහමින් සීලවන්තයන් කෙරෙහි දානය දේද, ඒකාන්තයෙන් ඒ දානය මහත්වූ විපාක ඇත්තේයයි කියමි.

5. "යම් පහවූ රාග ඇති පුද්ගලයෙක් දැහැමින් ලදදෙයින් යහපත් ප්‍රසන්නවූ සිත් ඇත්තේ මහත්වූ කර්මඵලය අදහමින් රහතුන් විෂයෙහි දානය දේද, ඒකාන්තයෙන් ඒ දානය ආමිෂ දාන අතුරෙන් අග්‍රයයි" කියමි.

**දක්ෂිණා විභංග සූත්‍රය නිමි. (4-12)**

---

## 43. අනාථ පිණ්ඩිකොවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරණසේක. ඒ කාලයෙහි වනාහි අනාථපිණ්ඩික නම් ගෘහපති තෙමේ දැඩි ගිලන් වූයේ, හටගත් ආබාධ ඇත්තේ, දුකින් පෙළුනේවේ.

2. එකල්හි වනාහි අනාථපිණ්ඩික නම් ගෘහපති තෙමේ එක්තරා පුරුෂයෙකුට ආමන්ත්‍රණය කෙළේය. "එම්බා පුරුෂය, නුඹ එව. භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට එළඹෙව. එළඹ, මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන්

සිරසින් වඳුව. 'ස්වාමීනි, අනාථපිණ්ඩික ගෘහපති තෙමේ හටගත් ආබාධ ඇත්තේ, දුකින් පෙළුනේ, දැඩි ගිලන්වූයේවේ. ඒ අනාථපිණ්ඩික ගෘහපති තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් සිරසින් වඳීයයි,' (වැඳ) මෙසේද කියව. 'ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේ අනාථපිණ්ඩික ගෘහපතියාගේ ගෘහය යම් තැනෙක්හිද, අනුකම්පාකර එහි වඩිනසේක් නම් මැනවැයි' (කියව.)

3. "එසේය, ස්වාමීනි" කියා ඒ පුරුෂතෙම අනාථපිණ්ඩික ගෘහපතියාට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි එළඹියේය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසක හුන්නේය. එකත්පසක හුන්නාවූ ඒ පුරුෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කෙළේය. "ස්වාමීනි, අනාථපිණ්ඩික ගෘහපති තෙමේ හටගත් ආබාධ ඇත්තේ, දුකින් පෙළුනේ, දැඩි ගිලන්වූයේ වේ. ඒ සිටුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් සිරසින් වඳින්නේය කියායි." ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට වැඳ, එකත්පසක හුන්නේය. එකත්පසක හුන්නාවූ ඒ පුරුෂතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේටද මෙපවත් සැළකෙළේය. "ස්වාමීනි, අනාථපිණ්ඩික ගෘහපති තෙමේ හටගත් ආබාධ ඇත්තේ, දුකින් පෙළුනේ, දැඩි ගිලන්වූයේ වේ. ඒ සිටුතෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ පාදයන් සිරසින් වඳින්නේය. මෙසේද කියයි. 'ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අනාථපිණ්ඩික ගෘහපතිහුගේ ගෘහය යම් තැනෙක්හිද අනුකම්පා කර එහි එළඹෙනසේක් නම් මැනවැයි කියායි.'

4. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ නිශ්ශබ්ද වීමෙන් ඉවසූසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ පශ්චාත් ශ්‍රමණයෙකු කොට (දෙවැන්නකු කොටගෙණ) අනාථපිණ්ඩික ගෘහපතිහුගේ ගෘහය යම් තැනෙක්හිද එතැන්හි එළඹියේය. එළඹ, පනවනලද අස්නෙහි

වැඩහුන්සේක. වැඩහිඳ වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ, අනේපිඩු සිටුහුගෙන් "කිමෙක්ද? ගෘහපතිය, නුඹට ඉවසිය හැක්කේද? කිමෙක්ද? යැපිය හැක්කේද? කිමෙක්ද? දුක් වේදනාවෝ අඩුවෙත්ද නැතහොත් වැඩිවෙත්ද, අඩුවීමක් පෙනේද, වැඩිවීමක් පෙනේදැ?යි" ඇසූහ.

5. "ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය නොහැක්කේය. යැපිය නොහැක්කේය. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩිවෙත්. අඩු නොවෙත්. අඩුවීමක් නොපෙනේ. වැඩිවීමම පෙනෙන්නේයයි" කීය. "ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, යම්සේ බලවත් පුරුෂයෙක් තෙමේ සියුම්වූ විදින කටුවකින් හිස විදින්නේ යම්සේද, ස්වාමීනි, ශාරීපුත්‍රයන් වහන්ස, එපරිද්දෙන්ම වනාහි ඉතා දැඩි වාතයෝ හිස විදින්නාහුය. ස්වාමීනි, මට ඉවසිය නොහැක්කේය. යැපිය නොහැක්කේය. මාගේ දැඩිවූ දුක් වේදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩීම පෙනෙන්නේය. අඩුවීම නොපෙනෙන්නේය.

"ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, යම්සේ බලවත් පුරුෂයෙක් තෙමේ දැඩිවූ වරපට කඩකින් හිසට හිස්වෙළුමක් දෙන්නේ යම්සේද, ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එපරිද්දෙන්ම වනාහි මාගේ හිස දැඩි වාතයෝ හාත්පස සිඳින්නාහුය. ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය නොහැක්කේය. යැපිය නොහැක්කේය. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩීම පෙනෙන්නේය. අඩුවීම නොපෙනෙන්නේය. ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, යම්සේ දක්ෂවූ ගවඝාතකයෙක් හෝ ගවඝාතක අතවැසියෙක් හෝ සියුම්වූ ගෙරි කපන කැත්තෙන් බඩ කපන්නේ වේද, ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එපරිද්දෙන්ම වනාහි දැඩි වාතයෝ කුස හාත්පස කපන්නාහුය. ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය නොහැක්කේය. යැපිය නොහැක්කේය. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙත් අඩු නොවෙත්. වැඩීම පෙනෙන්නේය. අඩුවීම නොපෙනෙන්නේය.

6. "ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, යම්සේ වනාහි බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඉතාදුර්වලවූ පුරුෂයෙකු වන වෙනම අත්වලින් අල්වාගෙණ අඟුරු වලෙක්හි තවන්නාහුද නැවත නැවත තවන්නාහුද, ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එපරිද්දෙන්ම ශරීරයෙහි දැඩි දාහය (දැවීම) වේ. ස්වාමීනි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය නොහැක්කේය. යැපිය නොහැක්කේය. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩීම පෙනෙන්නේය. අඩුවීම නොපෙනෙන්නේයයි" (කී.)

7. "ගෘහපතිය, එසේනම් මේ කාරණයෙහිලා ඔබ විසින් මෙසේ හික්මිය යුත්තේය. ඇස මමය මාගේයයි නොගන්නෙමි. මාගේ ඇස ඇසුරු කළාවූ විඥානයෙක් නොවන්නේයයි, ගෘහපතිය, නුඹ විසින් මේ ආකාරයෙන් හික්මිය යුත්තේය.' ගෘහපතිය, එහෙයින් නුඹ විසින් මේ කාරණයෙහිලා මෙසේ හික්මිය යුත්තේය. කණ මමය මාගේයයි නොගන්නෙමි. මාගේ කණ ඇසුරුකළාවූ විඥානයක් නොවන්නේයයි ගෘහපතිය, නුඹ විසින් මෙසේ හික්මිය යුත්තේය. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. නාසය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ නාසය ඇසුරු කළාවූ විඥානයක්ද නොවන්නේයයි, ගෘහපතිය මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. දිව මමය මාගේයයි නොගන්නෙමි. මාගේ දිව ඇසුරු කළාවූ, විඥ්ඥාණයක් නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. කය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ කය ඇසුරු කළාවූ විඥ්ඥාණයක් නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. සිත මමය මාගේයයි නොගන්නෙමි. මාගේ සිත ඇසුරු කළාවූ විඥ්ඥාණයක් නොවන්නේයයි ගෘහපතිය මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි.

"ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. රූපය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ රූපය ඇසුරු කළාවූ, විඤ්ඤාණයක් නොවන්නේයයි ගෘහපතිය, නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ශබ්දය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ ශබ්දය ඇසුරු කළාවූ විඤ්ඤාණයක් නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ගන්ධය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ ගන්ධය ඇසුරුකළාවූ, විඤ්ඤාණයක් නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. රසය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ 'රසය' ඇසුරු කළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ස්පර්ශය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ 'ස්පර්ශ කළයුත්ත' ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ධර්මාරමුණු මමය මාගේයයි නොගන්නෙමි. මාගේ ධර්මය ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි.

8 "ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ඇස පිළිබඳ විඤ්ඤාණය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ ඇස පිළිබඳ විඤ්ඤාණය ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. කණ පිළිබඳ විඤ්ඤාණය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ කණ පිළිබඳ විඤ්ඤාණය ඇසුරු කළාවූ විඤ්ඤාණය නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය

යුතුයි. නාසය පිළිබඳ විඤ්ඤාණය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ නාසය පිළිබඳ විඤ්ඤාණය ඇසුරුකළාවූ, විඤ්ඤාණය නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. දිව පිළිබඳ විඤ්ඤාණය මමය මගේයයි නොගන්නෙමි. මාගේ දිව පිළිබඳ විඤ්ඤාණය ඇසුරු කළාවූ විඤ්ඤාණය නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. කය පිළිබඳ විඤ්ඤාණය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ කය පිළිබඳ විඤ්ඤාණය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ කය පිළිබඳ විඤ්ඤාණය ඇසුරුකළාවූ, විඤ්ඤාණය නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. සිත පිළිබඳ විඤ්ඤාණය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ සිත පිළිබඳ විඤ්ඤාණය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ සිත සිත පිළිබඳ විඤ්ඤාණය ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි.

**9.** "ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ඇස පිළිබඳ ස්පර්ශය මමය මාගේයයි නොගන්නෙමි. මාගේ ඇස පිළිබඳ ස්පර්ශය ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. කණ පිළිබඳවූ ස්පර්ශය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ කණ පිළිබඳ ස්පර්ශය ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. නාසය පිළිබඳවූ ස්පර්ශය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ නාසය පිළිබඳ ස්පර්ශය ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය

යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. දිව පිළිබඳවූ ස්පර්ශය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ දිව පිළිබඳ ස්පර්ශය ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. කය පිළිබඳවූ ස්පර්ශය මමය. මාගේයයි නොගන්නෙමි. මාගේ කය පිළිබඳ ස්පර්ශය ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. සිත පිළිබඳවූ ස්පර්ශය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ සිත පිළිබඳවූ ස්පර්ශය ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි.

10. "ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ඇස පිළිබඳ ස්පර්ශයෙන් හටගත්තාවූ වේදනාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ ඇස පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. කණ පිළිබඳ ස්පර්ශයෙන් හටගත්තාවූ වේදනාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ කණ පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. නාසය පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ නාසය පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. දිව පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ දිව පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව ඇසුරු කළාවූ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. කය පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ කය පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. සිත පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ සිත පිළිබඳ ස්පර්ශයෙන් හටගත් වේදනාව ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි.

11 "එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි පඨවි ධාතුව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ පඨවි ධාතුව ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ආපො ධාතුව මමය මාගේයයි නොගන්නෙමි. මාගේ ආපොධාතුව ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. තෙජොධාතුව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ තෙජොධාතුව ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. වායොධාතුව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ වායොධාතුව ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. ආකාශ ධාතුව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ ආකාසධාතුව ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. විඤ්ඤාණධාතුව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ විඤ්ඤාණධාතුව ඇසුරු කළාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි.

12 "එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. රූපය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ රූපය ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. වේදනාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ වේදනාව ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. සංඥාව මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ සංඥාව ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. සංස්කාරයන් මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ සංස්කාරයන් ඇසුරුකළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. විඤ්ඤාණය මමය, මාගේයයි නොගන්නෙමි. මාගේ විඤ්ඤාණය ඇසුරුකළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි.

13. "ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මියයුතු ආකාශානඤ්චායතනය මමය මගේයයි නොගන්නෙමි. මාගේ ආකාසානඤ්චායතනය ඇසුරු කළාවූ විඥාණයද වෙන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. විඤ්ඤාණඤ්චායතනය මමය මගේයයි නොගන්නෙමි. මාගේ විඤ්ඤාණඤ්චායතනය ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මිය යුතුයි. ආකිඤ්චඤ්ඤායතනය, මමය මගේයයි

නොගන්නෙමි. මාගේ ආකිඤ්චඤ්ඤායතනය ඇසුරු කළාවූ, විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය මමය මගේයයි නොගන්නෙමි. මාගේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඇසුරු කළාවූ විඥානයද නොවන්නේයයි ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි.

14. "ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. මෙලොව කිසිවක් මමය මාගේයයි නොගන්නෙමි. මාගේ මෙලොව කිසිවක් ඇසුරු කළාවූ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයි. ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. පරලොව කිසිවක් මමය මාගේයයි නොගන්නෙමි. මාගේ පරලොව කිසිවක් ඇසුරු කළාවූ විඥානයද නොවන්නේයයි. ගෘහපතිය, නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි.

"ගෘහපතිය, එහෙයින් මෙහි නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. යම් මේ දක්නාලද අසනලද ආඝ්‍රාණය කරනලද රස විඳිනලද ස්පර්ශ කරනලද සිතින් දැනගන්නාලද සොයන ලද හැසිරෙනලද දෙයකුත් වේද, ඒ සියල්ලද මමය මාගේ යයි නොගන්නෙමි. එය ඇසුරු කළාවූ මාගේ විඤ්ඤාණයද නොවන්නේයයි, ගෘහපතිය, මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුයයි" වදාළේය.

15. මෙසේ කීකල්හි අනාථපිණ්ඩික ගෘහපතිතෙම හැඬුයේය. කඳුළු වැගිර වූයේය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම අනේපිඩු සිටුහුට "ගෘහපතිය, නුඹ වනාහි සම්පත්තීන්හි ඇලෙන්නෙහිද? ගෘහපතිය, නුඹ වනාහි සම්පත්තීන්හි ගැලෙන්නෙහි දැයි" ඇසීය.

"ස්වාමීනි, ආනන්දස්ථවිරයන් වහන්ස, මම සම්පත්තීන්හි නොඇලෙන්නෙමි, නොගැලෙන්නෙමි. එතකුදු වූවත් මා විසින් බොහෝ කලක් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලද්දේය.

සිත දියුණු කළාවූ භික්ෂූහුද ඇසුරු කරණ ලද්දාහ. මාවිසින් මෙබඳු ධර්ම කථාවක් නොඅසනලදැයි" (කීයේය).

16. "ගෘහපතිය, සුදුවත් හඳනාවූ ගිහිවූවන්ට මෙබඳු ධර්මකථා නොවැටහේ. ගෘහපතිය, පැවිද්දන්ට වනාහි මෙබඳු ධර්ම කථා වැටහේයයි" කීය.

"ස්වාමීනි, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එසේ වීනම් සුදුවත් හඳනාවූ ගිහිවූවන්ටද මෙබඳු ධර්ම කථා දෙශනා කෙරේවා. ස්වාමීනි, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ස්වල්ප කෙලෙස් සහගතවූ කුලපුත්‍රයෝ ඇත්තාහුමය, ධර්මය නොඇසීම හේතුකොටගෙන ඔව්හු පිරිහෙන්නාහුය. ධර්මය දැනගන්නාහු වන්නාහුයයි" කීය. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද, අනේපිඬු සිටුහට මේ අවවාදයෙන් අවවාද කොට හුනස්නෙන් නැගිට වැඩියාහුය. ඉක්බිති අනේපිඬු සිටුතෙම ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද, වැඩිය නොබෝ කලකින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු තුසිත දිව්‍යලෝකයට උත්පත්ති වශයෙන් පැමිණියේය.

17. "එකල්හි අනාථපිණ්ඩික දිව්‍ය පුත්‍රතෙම ඉක්ම ගියාවූ රාත්‍රියෙහි බබළන වර්ණ ඇත්තේ සියලු ජේතවනාරාමය ආලොක කොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසක සිටියේය. එකත් පසක සිටියාවූ අනාථපිණ්ඩික නම් දිව්‍ය පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවලින් (මෙය) කීයේය.

(1) "ඍෂි සමූහයා විසින් නිතර සේවනය කරණ ලද්දාවූ ධර්මරාජන්වූ භාග්‍යවතුන් වහන්සේ විසින් වැඩ වසන ලද්දාවූ ඒ මේ ජේතවනාරාමය මට ප්‍රීති උපද වන්නක් වේ.

(2) "(මාර්ග චේතනාවූ) කර්මයද (මාර්ග ප්‍රඥාවවූ) විද්‍යාවද (සමාධිය පාක්ෂිකවූ) කර්මයද ශීලයෙන් යුක්තවූ

උතුම් ජීවිතයද, යන මෙයින් සත්වයෝ පිරිසිදු වෙත්. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් හෝ පිරිසිදු නොවෙත්.

(3) "එහෙයින් තමහට වැඩ කැමැත්තාවූ නුවණැති පුරුෂතෙම ධර්මය නුවණින් සොයන්නේය. මෙසේ ඒ ආර්‍ය්‍ය මාර්ගයෙන් පිරිසිදුවේ.

(4) "ප්‍රඥාවෙන්ද, ශීලයෙන්ද, සංසිඳීමෙන්ද ශාරිපුත්‍ර ස්ථවිරතෙමේම ප්‍රධානවේ. යම් භික්ෂුවක් වනාහි පරතෙරට ගියේවේද (නිවණට ගියේවේද) ඒ සියල්ලන්ට වඩා මේ සැරියුත් තෙරුන් වහන්සේම උතුම් වන්නේය" යනුයි.

18. අනාථ පිණ්ඩික නම් දිව්‍යපුත්‍රතෙම මෙය ප්‍රකාශ කෙළේය. ශාස්තෲන් වහන්සේ අනුමත කළසේක. ඉක්බිති අනාථ පිණ්ඩික නම් දිව්‍යපුත්‍රතෙම "ශාස්තෲන් වහන්සේ මාගේ කීම අනුමත කළසේකැයි" භාග්‍යවතුන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණාකොට එහිම අතුරුදහන් වූයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිහුගේ ඉක්මීමෙන් භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, මේ රාත්‍රියෙහි එක්තරා දිව්‍යපුත්‍රයෙක් ඉක්ම ගියාවූ රාත්‍රිය ඇති කල්හි බබළන ශරීර වර්ණය ඇත්තේ සියලු ජේතවනාරාමය බබුළුවා මම යම් තැනෙක්හිද, එතැනට එළඹුණේය. එළඹ මට වැඳ එකත්පස්ව සිටියේය. මහණෙනි, එකත්පස්ව සිටියාවූ ඒ දිව්‍යපුත්‍ර තෙම මට ගාථාවලින් මෙසේ කීයේය,

(1) "ඍෂි සමූහයා විසින් නිතර සේවනය කරන ලද්දාවූ, ධර්මරාජන්වූ භාග්‍යවතුන් වහන්සේ විසින් වැඩ වසන ලද්දාවූ ඒ මේ ජේතවනාරාමය මට ප්‍රීති උපද වන්නක්වේ.

(2) "(මාර්ග චේතනාවූ) ධර්මයද, (මාර්ග ප්‍රඥාවවූ) විද්‍යාවද, (සමාධිපාක්ෂිකවූ) කර්මයද, ශීලයෙන් යුක්තවූ උතුම් ජීවිතයද යන මෙයින් සත්වයෝ පිරිසිදුවෙත්. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් හෝ පිරිසිදු නොවෙත්.

(3) "එහෙයින් තමහට වැඩ කැමැත්තාවූ, නුවණ ඇති පුරුෂතෙම ධර්මය නුවණින් සොයන්නේය. මෙසේ ආර්‍ය්‍ය මාර්ගයෙන් පිරිසිදුවේ.

(4) ප්‍රඥාවෙන්ද, ශීලයෙන්ද, සංසිඳීමෙන්ද ශාරිපුත්‍රයන්ම ප්‍රධානවේ. යම් භික්ෂුවක් වනාහි පරතෙරට ගියේ වේද මේ සැරියුත් තෙරුන් වහන්සේම ප්‍රධාන වන්නාහ.

19. "මහණෙනි, ඒ දිව්‍යපුත්‍රතෙම ශාස්තෲන් වහන්සේ මාගේ වචනය අනුමත කළසේකැයි මට වැඳ ප්‍රදක්ෂිණා කොට එහිම අතුරුදහන්වීයයි."

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. "ස්වාමීනි, ඒ මේ දිව්‍යපුත්‍රතෙමේ වනාහි ඒකාන්තයෙන් අනාථපිණ්ඩික නම් දිව්‍යපුත්‍රතෙම වන්නේය. ස්වාමිනි, අනාථපිණ්ඩික ගෘහපතිතෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් කෙරෙහි අචලවූ ප්‍රසාද ඇත්තෙක් වූයේය" කියායි.

20. "ආනන්දය, යහපත, යහපත, ආනන්දය, යම්තාක්ම කල්පනා කිරීමෙන් පැමිණිය යුතුද ඒතාක්ම නුඹ විසින් පැමිණෙන ලද්දේය. ආනන්දය, හෙතෙම අනාථපිණ්ඩික නම් දිව්‍යපුත්‍රයාවේ. අනිකෙක් නොවේයයි" වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටුවූ සිත් ඇති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය.

**අනාථ පිණ්ඩිකොවාදය සූත්‍රය නිමි. (5-1)**

---

## 44. ඡන්නොවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක, එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේද ගිජ්ඣකූට

පර්වතයෙහි වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙළුනේ දැඩි ගිලන්වූයේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් වේලෙහි පල සමවතින් නැගී සිටියේ, ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේට මෙය සැල කෙළේය. "ඇවැත්වූ චුන්දය, අපි ආයුෂ්මත් ඡන්න තෙම යම් තැනෙක්හිද එතැනට ඔහුගේ අසනීප විමසනු සඳහා යමුයයි" කීහ.

2. "ඇවැත්නි, එසේයයි' කියා ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිර තෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹුනාහුය. එළඹ ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසක හුන්නාහුය. එකත්පසක හුන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේගෙන් "ඇවැත්වූ ඡන්නය, කිමෙක්ද තොපට ඉවසිය හැකිද? කිම යැපිය හැකිද, කිම දුක් වේදනාවෝ අඩුවෙත්ද නොවැඩෙත්ද, අඩුවීමක් පැනේද වැඩිදියුණුවීම නොපැනේදැයි" ඇසූහ.

3. "ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. මාගේ දැඩිවූ දුක් වේදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩිවන බව පෙනේ. අඩුවන බවක් නොපෙනේයයි" ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, යම්සේ බලවත් පුරුෂයෙක් සියුම්වූ විදින කටුවකින් හිස විදින්නේද, ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස මෙපරිද්දෙන්ම මාගේ බලවත් වාතයෝ හිස විදින්නාහ. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ඉවසිය නොහැක. යැපිය නොහැක. දැඩිවූ මාගේ දුක් වේදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩිවන බව පෙනේ. අඩුවන බව නොපෙනේ. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම්සේ බලවත් පුරුෂයෙක් දැඩිවූ වරපටකින් හිසෙහි හිස් වෙළුමක් දෙන්නේද, ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එපරිද්දෙන්ම මාගේ බලවත්වූ වාතයෝ හිස සිඳින්නාහුය. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. දැඩිවූ මාගේ දුක්වේදනාවෝ වැඩෙත්. අඩුනොවෙත්. වැඩිවන බැව් පෙනේ, අඩුවන බවක් නොපෙනේ. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්ස, යම්සේත් දක්ෂවූ ගවඝාතකයෙක් හෝ ගවඝාතකයෙකුගේ අතවැසියෙක් හෝ සියුම් ගෙරිකපන කැත්තෙන් කුස කපන්නේද, ඇවැත්වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එපරිද්දෙන්ම බලවත්වූ වාතයෝ කුස කපන්නාහුය. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය හැකි නොවේ. යැපිය හැකි නොවේ. දැඩිවූ මාගේ දුක් වේදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩෙන බව පෙනේ. අඩුවන බවක් නොපෙනේ. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්ස, යම්සේ බලවත්වූ පුරුෂයෝ දෙදෙනෙක් ඉතා දුර්වල පුරුෂයෙකු වෙන වෙනම අත්වලින් අල්වාගෙණ අඟුරු වලෙක්හි ලා තවන්නාහුද, නැවත නැවත තවන්නාහුද, ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එපරිද්දෙන්ම මාගේ ශරීරයෙහි බලවත්වූ දාහයක්වේ. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට ඉවසිය හැකි නොවේ. යැපිය හැකි නොවේ. දැඩිවූ මාගේ දුක් වේදනා වැඩෙත්. අඩු නොවෙත්. වැඩිවන බව පැනේ. අඩුවන බව නොපැනේයයි" කීය. "ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ආයුධයකින් ගෙල සිඳින්නෙමි. ජීවිතය බලාපොරොත්තු නොවෙමියි, (කීයේය.)

4. "ආයුෂ්මත් ඡන්න තෙමේ ආයුධයකින් දිවි තොර කර නොගණීවා. ආයුෂ්මත් ඡන්න තෙමේ යැපේවා. ආයුෂ්මත් ඡන්නයන්ගේ යැපීම (ජීවත්වීම) අපි බලාපොරොත්තු වෙමු. ඉදින් ආයුෂ්මත් ඡන්නයන්ට සැපවූ ආහාර නැත්නම් මම ආයුෂ්මත් ඡන්නයන්ට සැපවූ ආහාර සපයන්නෙමි. ඉදින් ආයුෂ්මත් ඡන්නයන්ට සැපවූ බෙහෙත් නැතිනම් මම ආයුෂ්මත් ඡන්නයන්ට සැපවූ බෙහෙත් සපයන්නෙමි. ඉදින් ආයුෂ්මත්

ඡන්නයන්ට සුදුසුවූ උපස්ථානයෙක් නැතිනම් මම ආයුෂ්මත් ඡන්නයන්ට උපස්ථාන කරන්නෙමි. ආයුෂ්මත් ඡන්න තෙමේ ආයුධ ගෙන දිවි නසා නොගණීවා. ආයුෂ්මත් ඡන්න තෙමේ යැපේවා. ආයුෂ්මත් ඡන්නයන්ගේ යැපීම අපි අපෙක්ෂා කරමු."

**5.** "ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මට සැපවූ ආහාර නැත්තේද නොවෙයි. මට සැපවූ බෙහෙත් නැත්තේද නොවෙයි. මට සුදුසුවූ උපස්ථායකයෙක් නැත්තේද නොවෙයි. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, එතකුදු වුවත් මා විසින් ශාස්තෲන්වහන්සේ බොහෝකලක් මනාපයෙන්ම සේවනය කරනලදී. අමනාපයෙන් නොවේ. ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ශාස්තෲන්වහන්සේ මනාපයෙන්ම සේවනය කරන්නේය. අමනාපයෙන් නොවේය යන යමක් වේද, මෙය වනාහි ශ්‍රාවකයා හට සුදුසුය. ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්ස, ඡන්න භික්ෂුතෙම නැවත උත්පත්තියක් නැතුව ආයුධයකින් දිවි තොරකර ගන්නේයයි" දනු මැනවයි" කීය. "ඉදින් ආයුෂ්මත් ඡන්න තෙමේ ප්‍රශ්න ඇසීමට අවකාශ කෙරේනම්, අපි ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්ගෙන් කිසියම් කාරණයක් අසන්නෙමු" "ඇවැත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, අසනු මැනව. අසා දැනගන්නෙයි." (කීයේය.)

**6.** "ඇවැත්වූ ඡන්නය, ඇසය, ඇසෙහි උපදින විඥ්ඥාණය, ඇසෙහි උපදින විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන්ය යන මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි දක්නෙහිද, ඇවැත්වූ ඡන්නය, කණය, කණෙහි උපදින විඥ්ඥාණය කණ පිළිබඳවූ විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන්ය. (යන මොවුන්) මෙය මාගේය මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි දක්නෙහිද? ඇවැත්වූ ඡන්නය, නාසය, නාසයෙහි උපදින විඥ්ඥාණය, (නාසය පිළිබඳවූ විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි දක්නෙහිද, ඇවැත්වූ ඡන්නය, දිවය, දිවෙහි උපදින විඥ්ඥාණය දිව පිළිබඳවූ විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන්ය, (යන මොවුන්)

මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි දක්නෙහිද, ඇවැත්වූ ඡන්නය කයය, කයෙහි උපදින විඤ්ඤාණය, කය පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය, (යන මොවුන්) මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි දක්නෙහිද, ඇවැත්වූ ඡන්නය, මනොවිඤ්ඤාණය, මනො විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය යන මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි, දක්නෙහිදැයි?" (ඇසුවේය.)

7. "ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ඇසය, ඇස පිළිබඳවූ විඤ්ඤාණය ඇස පිළිබඳ විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන්ය යන මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මයයි නොදක්නෙමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, කණය කණ පිළිබඳවූ විඤ්ඤාණය කණ පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මයයි නොදකිමි. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස නාසය, නාසය පිළිබඳවූ විඥානය නාසය පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය. (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මයයි නොදකිමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, දිවය දිව පිළිබඳවූ විඥානය දිව පිළිබඳ වූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මයයි නොදකිමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, කයය කය පිළිබඳවූ විඤ්ඤාණය කය පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මයයි නොදකිමි. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්ස, මනසය මනස පිළිබඳවූ විඥානය මනස පිළිබඳ විඥානයෙන් දතයුතුවූ ධර්මයන්ය, යන මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දක්නෙමියි" (කීයේය.)

8. "ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයෙනි, ඇසෙහි ඇස පිළිබඳවූ විඥානයෙහි, ඇස පිළිබඳවූ විඥානයෙන් දතයුතු ධර්මයන් කෙරෙහි කුමක් දැක කුමක් දැන, ඇසය, ඇස පිළිබඳවූ විඥානය, ඇස පිළිබඳවූ විඥානයෙන් දතයුතු ධර්මයන්ය යන මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දක්නෙහිද, ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයෙනි, කණෙහිද කණ පිළිබඳවූ විඥානයෙහිද, කණ පිළිබඳ වූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දක්නෙහිද? ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයෙනි, නාසයෙහිද, නාසය පිළිබඳවූ විඥානයෙහිද, නාසය පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දක්නෙහිද? ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයෙනි, දිවෙහිද දිව පිළිබඳවූ විඥානයෙහිද, දිව පිළිබඳවූ, විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දක්නෙහිද? ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයෙනි, කයෙහිද කය පිළිබඳවූ විඥානයෙහිද, කය පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දක්නෙහිද? ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයෙනි, මනසෙහිද, මනස පිළිබඳවූ විඥානයෙහිද, මනස පිළිබඳ විඥානයෙන් දතයුතු ධර්මයන්කෙරෙහිද, කුමක් දැක, කුමක් දැන මනසය, මනස පිළිබඳවූ විඥානය, මනස පිළිබඳවූ විඥානයෙන් දතයුතු ධර්මයන්ය, යන මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දක්නෙහිදැයි," (ඇසීය.)

9. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ඇසෙහිද ඇස පිළිබඳවූ විඥානයෙහිද, ඇස පිළිබඳවූ විඥානයෙන් දතයුතු ධර්මයන් කෙරෙහිද, නිරුද්ධවීම දැක නිරුද්ධවීම දැන ඇසය ඇස පිළිබඳවූ විඥානය ඇස පිළිබඳවූ විඥානයෙන් දතයුතුවූ

ධර්මයන්ය යන මෙය මාගේ නොවෙයි, මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දකිමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්ස, කණෙහිද, කණ පිළිබඳවූ විඥානයෙහිද, කණ පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දකිමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, නාසයෙහිද, නාසය පිළිබඳවූ විඥානයෙහිද, නාසය පිළිබඳවූ, විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය යන මොවුන් මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දකිමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, දිවෙහිද දිව පිළිබඳවූ විඥානයෙහිද, දිව පිළිබඳවූ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි, මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දකිමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, කයෙහිද, කය පිළිබඳවූ විඥානයෙහිද, කය පිළිබඳවූ, විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්ය (යන මොවුන්) මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දකිමි. ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මනසෙහිද, මනස පිළිබඳවූ විඥානයෙහිද මනස පිළිබඳවූ විඥානයෙන් දතයුතු ධර්මයන් කෙරෙහිද නිරුද්ධවීම දැක, නිරුද්ධවීම දැන මනසය මනස පිළිබඳවූ විඥානය මනස පිළිබඳවූ විඥානයෙන් දතයුතු වූ ධර්මයන් යන මෙය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි දකිමියි" (කීයේය.)

10. මෙසේ කීකල්හි ආයුෂ්මත්වූ චුන්ද ස්ථවිර තෙම ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයන්ට මෙය කීයේය. "ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයෙනි, එහෙයින් මෙහි මේ ඒ භාග්‍යවතුන්වහන්සේගේ වචනය නිතර මෙනෙහි කටයුතුයි. තෘෂ්ණා දෘෂ්ටීන් ඇසුරුකළවුන්ට කම්පාවීම ඇත්තේය. තෘෂ්ණා දෘෂ්ටීන් ඇසුරු නොකළවුන්ට කම්පාවීමක් නැත්තේය. කම්පාවීමක් නැතිකල්හි කෙලෙසුන්ගේ සංසිඳීම ඇතිවෙයි.

සංසිඳීම ඇති කල්හි ඇලීම නැතිවෙයි, ඇලීම නැතිකල්හි ප්‍රතිසන්ධි වශයෙන් ඊමද චුතවීම් වශයෙන් යාමද නොවේ. යාම්ඊම් නැති කල්හි චුතවීම හා උත්පත්තිය නොවේ, චුතවීම හා උත්පත්තිය නැතිකල්හි මේ ලොකයෙහිද පරලොකයෙහිද ඒ දෙලොවෙහිම නොවේ. මෙයට දුක්ඛයාගේ කෙළවරවේය" (කියායි.)

11. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේද ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්වහන්සේට මේ අවවාදයෙන් අවවාදකොට, හුනස්නෙන් නැගිට වැඩියාහුය. ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් චුන්ද ස්ථවිරයන් වහන්සේද, බැහැර ගිය නොබෝ කල්හි ආයුධයකින් දිවි තොර කර ගත්තේය. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. "ස්වාමීනි, ආයුෂ්මත් ඡන්නයන් විසින් ආයුධයකින් දිවි තොරකරගන්නා ලදී. උන්වහන්සේගේ ගතිය කවරීද පරලොව කවරේදැයි" ඇසූහ. "ශාරීපුත්‍රය, ඡන්න භික්ෂුව විසින් තොප ඉදිරියෙහිදීම නැවත උත්පත්තියක් නැතියි ප්‍රකාශ කරනලද්දේ නොවේද?"

12. "ස්වාමීනි, පුබ්බජ්ජිර නම් වජ්ජිග්‍රාමයක් ඇත්තේය. එහි ආයුෂ්මත් ඡන්නයන්ගේ මිත්‍රවූ කුලගෙවල් යහලු කුලගෙවල් එළඹියයුතු ගෙවල් ඇත්තේයයි" කීයේය. "ශාරීපුත්‍රය ඡන්න නම් භික්ෂුහුගේ මේ මිත්‍රවූ කුලයෝ යහළු කුලයෝ එළඹියයුතු කුලයෝ වෙත්මය. ශාරීපුත්‍රය, මම මෙතෙක් එළඹිය යුත්තෙකැයි නොකියමි. ශාරීපුත්‍රය, යමෙක් වනාහි මේ කයත් බහා තබාද අන්‍යවූ කයකුත් ගනීද මම ඔහු එළඹිය යුත්තෙකැයි කියමි. ඡන්න නම් භික්ෂුවට එය නැත්තේය. ඡන්නනම් භික්ෂුතෙමේ නැවත උත්පත්තියක් නොගෙන ආයුධයෙන් දිවි නැති කෙළේය."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටුසිත් ඇත්තාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේ යි.

ඡන්නොවාද සූත්‍රය නිමි (5-2)

---

## 45. පුණ්ණොවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි ආයුෂ්මත්වූ පුණ්ණ ස්ථවිරතෙමේ සවස් වේලෙහි ඵලසමවතින් නැගීසිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූ ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය.

2. "ස්වාමීන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගෙන් යම් ධර්මයක් අසා හුදකලා වූයේ, ගණයාගෙන් වෙන් වූයේ, අප්‍රමාද වූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ එබඳු සංක්ෂෙප අවවාදයකින් මට අවවාද කරණසේක් නම් යහපතී" කියායි. "පුණ්ණ, එසේ වීනම් අසව, යහපත්කොට මෙනෙහි කරව, කියන්නෙමි"යි වදාළේය. "එසේය, ස්වාමීන් වහන්සැ"යි ආයුෂ්මත්වූ පුණ්ණ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

3. "පුණ්ණය, ඇසින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ (කම් සැප ගෙනදෙන්නාවූ) ඇලුම් කරන්නාවූ රූපයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටුවේද, එය හොඳය, හොඳයයි කියයිද, එයට බැසගෙන සිටීද, එයට සතුටුවන්නාවූ එය හොඳය හොඳයයි කියන්නාවූ, එයට බැසගෙන සිටින්නාවූ ඔහුට ආශාව

උපදියි. පුණ්ණය, ආශාව හටගැණීමෙන් දුක් හටගැණීම වේයයි කියමි.

"පුණ්ණය, කණින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, "ශබ්දයෝ" වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටුවේද, එය හොඳය හොඳයයි කියාද, එයට බැස ගෙන සිටීද, එයට සතුටුවන්නාවූ එය හොඳය හොඳයයි කියන්නාවූ, එයට බැසගෙන සිටින්නාවූ, ඔහුට ආශාව උපදියි. පුණ්ණය, ආශාව හටගැණීමෙන් දුක් හටගැණීම වේයයි කියමි.

"නාසයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ගන්ධයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටුවේද, එය හොඳය හොඳයයි කියාද, එයට බැසගෙන සිටීද, එයට සතුටු වන්නාවූ, එය හොඳය හොඳයයි කියන්නාවූ, එයට බැසගෙන සිටින්නාවූ ඔහුට ආශාව උපදියි. පුණ්ණය, ආශාව හටගැණීමෙන් දුක් හටගැණීම වේයයි කියමි.

"දිවෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, රසයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටුවේද, එය හොඳය හොඳයයි කියාද, එයට බැසගෙන සිටීද, එයට සතුටු වන්නාවූ, එය හොඳය හොඳයයි කියන්නාවූ, එයට බැසගෙන සිටින්නාවූ, ඔහුට ආශාව උපදියි. පුණ්ණය, ආශාව හටගැණීමෙන් දුක් හටගැණීම වේයයි කියමි.

"කයින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටු වේද එය හොඳය හොඳයයි කියාද, එයට බැසගෙන සිටීද, එයට සතුටු වන්නාවූ, එය හොඳය හොඳයයි කියන්නාවූ, එයට බැසගෙන සිටින්නාවූ, ඔහුට ආශාව උපදියි. පුණ්ණය, ආශාව හටගැණීමෙන් දුක් හටගැණීම වේයයි කියමි.

"සිතින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප පිණිස පවතින්නාවූ, ඇලුම් කටයුතුවූ, ධර්මයෝද වෙත්මය.

4. "ඉදින් මහණතෙම එයට සතුටු වෙයිද, එය හොඳය, හොඳයයි කියයිද, එයට බැසගෙන සිටීද, එයට සතුටු වන්නාවූ එය හොඳය හොඳයයි කියන්නාවූ එයට බැසගෙන සිටින්නාවූ, ඒ මහණහට ආශාව උපදියි. පුණ්ණය, ආශාව හටගැණීමෙන් දුක් හටගැණීම වේයයි කියමි. පුණ්ණ, ඇසින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇළුම් කරන්නාවූ, රූපයෝද වෙත්ද ඉදින් මහණතෙම එයට සතුටු නොවේද, එය හොඳය හොඳයයි නොකියාද, එයට බැසගෙන නොසිටීද, එයට සතුටු නොවන්නාවූ, එය හොඳය හොඳයයි නොකියන්නාවූ, එයට බැසගෙන නොසිටින්නාවූ ඔහුගේ ආශාව නිරුද්ධවේ. පුණ්ණ ආශාව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධවීම වේයයි කියමි.

"පුණ්ණ, කණින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ශබ්දයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටු නොවේද, එය හොඳය හොඳයයි නොකියාද, එයට බැස ගෙන නොසිටීද, එයට සතුටු නොවන්නාවූ, ඒ ගැන එය හොඳය හොඳයයි නොකියන්නාවූ, එයට බැසගෙන නොසිටින්නාවූ, ඔහුගේ ආශාව නැතිවේ. ආශාව නැතිවීමෙන් දුක් නැතිවීම වේයයි කියමි.

"නාසයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ ඇලුම් කටයුතුවූ, ගන්ධයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටු නොවේද, එය හොඳය හොඳයයි නොකියාද, එයට බැසගෙන නොසිටීද, එයට සතුටු නොවන්නාවූ, ඒ ගැන එය හොඳය හොඳයයි නොකියන්නාවූ, එයට බැසගෙන නොසිටින්නාවූ, ඔහුගේ ආශාව නැතිවේ. ආශාව නැතිවීමෙන් දුක් නැතිවීම වේයයි කියමි.

"දිවෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, රසයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටු නොවේද, එය හොඳය හොඳයයි නොකියාද, එයට බැසගෙන නොසිටීද, එයට සතුටු නොවන්නාවූ, ඒ ගැන එය හොඳය හොඳයයි නොකියන්නාවූ, එයට බැසගෙන නොසිටින්නාවූ, ඔහුගේ ආශාව නැතිවේ. ආශාව නැතිවීමෙන් දුක් නැතිවේයයි කියමි.

"කයින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ස්පර්ශයෝ වෙත්මය. ඉදින් මහණතෙම එයට සතුටු නොවේද, එය හොඳය හොඳයයි නොකියාද, එයට බැස ගෙන නොසිටීද, එයට සතුටු නොවන්නාවූ, ඒ ගැන එය හොඳය හොඳයයි නොකියන්නාවූ, එයට බැසගෙන නොසිටින්නාවූ, ඔහුගේ ආශාව නැතිවේ. ආශාව නැතිවීමෙන් දුක් නැතිවීම වේයයි කියමි.

"සිතින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇළුම් කටයුතුවූ ධර්මයෝ වෙත්මය.

**5.** "ඉදින් මහණතෙම එයට සතුටු නොවේද, එය හොඳය හොඳයයි නොකියාද, එයට බැසගෙන නොසිටීද, එයට සතුටු නොවන්නාවූ, එය නොකියන්නාවූ, එයට බැසගෙන නොසිටින්නාවූ, ඔහුගේ ආශාව නිරුද්ධවේ. පුණ්ණ, ආශාව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධවීම වේයයි කියමි.

**6.** "පුණ්ණ, මා විසින් මේ සංක්ෂෙප අවවාදයෙන් අවවාද කරණ ලද්දාවූ නුඹ, කිනම් ජනපදයක වාසය කරන්නෙහිද?"

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සංක්ෂෙප අවවාදයෙන් අවවාද කරනු ලැබූ මම සුනාපරන්ත නම් ජනපදයක් ඇත්තේය. එහි වාසය කරන්නෙමි."

**7.** පුණ්ණ, සුනාපරන්ත ජනපද වැසි මිනිස්සු චණ්ඩය. පුණ්ණ, සුනාපරන්ත ජනපද වැසි මිනිසුන් රෞද්‍රය. පුණ්ණ,

ඉදින් තොපට සුනාපරන්ත වැසි මිනිස්සු ආක්‍රොෂ කරන්නාහුද, පරිභව කරන්නාහුද? පුණ්ණය, එහිදී තට කෙබඳු සිතක් වන්නේද?"

"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්සු ආක්‍රොෂ කරන්නාහුද, පරිභව කරන්නාහුද, එහිදී මට මෙබඳු සිතක් වන්නේය. ඒකාන්තයෙන් යහපත්වෙත්. 'මේ සුනාපරන්ත වැසි මිනිස්සු ඒකාන්තයෙන් වඩා යහපත් වෙත්. යම් හෙයකින් මොවුහු මට අතින් පහර නොදෙත්ද, (එහෙයිනි.) භාග්‍යවතුන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය."

8. "පුණ්ණ, ඉදින් වනාහි තොපට සුනාපරන්ත වැසි මිනිස්සු අතින් පහර දෙන්නාහු නම්, පුණ්ණ, එහිදී වනාහි තොපට කෙබඳු සිතක් වන්නේද?"

"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත දනව් වැසි මිනිස්සු අතින් පහර දෙන්නාහු නම් එහිදී මට මෙබඳු සිතක් වන්නේය. 'මේ සුනාපරන්ත දනව්වැසි මිනිස්සු ඒකාන්තයෙන් යහපත්ය. මේ සුනාපරන්ත දනව් වැසි මිනිස්සු ඒකාන්තයෙන් ඉතා යහපත්ය. යම් හෙයකින් මොව්හු මට කැටකින් පහර නොදෙත්ද, එහෙයිනි, භාග්‍යවතුන් වහන්ස මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය."

9. "පුණ්ණ, ඉදින් වනාහි තොපට සුනාපරන්ත දනව් වැසි මිනිස්සු කැටයකින් පහර දෙන්නාහු නම්, පුණ්ණ, එහිදී වනාහි තොපට කෙබඳු සිතක් වන්නේද?"

"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත දනව් වැසි මිනිස්සු කැටකින් පහර දෙන්නාහු නම් එහිදී මට මෙබඳු සිතක් වන්නේය. 'ඒකාන්තයෙන් මේ සුනාපරන්ත දනව් වැසි මිනිස්සු යහපත්ය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත දනව් වැසි මිනිස්සු ඉතා යහපත්ය. යම් හෙයකින් මට මොව්හු දණ්ඩකින් පහර නොදෙත්ද, එහෙයිනි.' භාග්‍යවතුන් වහන්ස, මෙහිදී මට මෙබඳු

සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය."

10. "පුණ්ණ ඉදින් වනාහි තොපට සුනාපරන්ත දනව් වැසි මිනිස්සු දණ්ඩෙන් පහර දෙන්නාහු නම්, පුණ්ණ තොපට එහිදී වනාහි කෙබඳු සිතක් වන්නේද?"

"ස්වාමීනි, ඉදින් වනාහි මට සුනාපරන්ත දනව් වැසි මිනිස්සු දණ්ඩෙන් පහර දෙන්නාහු නම්, එහිදී මට මෙබඳු සිතක් වන්නේය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත දනව් වැසි මිනිස්සු යහපත්ය, ඒකාන්තයෙන් මේ සුනාපරන්ත දනව් වැසි මිනිස්සු ඉතා යහපත්ය. යම් හෙයකින් මට මේ මිනිස්සු ආයුධයකින් පහර නොදෙත්ද, එහෙයිනි' භාග්‍යවතුන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය"

11. "පුණ්ණ ඉදින් වනාහි තොපට සුනාපරන්ත දනව් වැසි මිනිස්සු ආයුධයෙන් පහර දෙන්නාහු නම්, පුණ්ණ එහි වනාහි තොපට කෙබඳු සිතක් වන්නේද?"

"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත දනව් වැසි මිනිස්සු ආයුධයෙන් පහර දෙන්නාහු නම් එහිදී මට මෙබඳු සිතක් වන්නේය. 'ඒකාන්තයෙන් මේ සුනාපරන්ත දනව් වැසි මිනිස්සු යහපත්ය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත දනව් වැසි මිනිස්සු ඉතා යහපත්ය. යම් හෙයකින් මට මේ මිනිස්සු සියුම් ආයුධයකින් මා ජීවිතයෙන් තොර නොකෙරෙත්ද, (එහෙයිනි.)' භාග්‍යවතුන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය."

12. "පුණ්ණ, ඉදින් වනාහි සුනාපරන්ත දනව් වැසි මිනිස්සු සියුම් ආයුධයකින් තා ජීවිතයෙන් තොර කරන්නාහු නම්, පුණ්ණ, එහිදී තොපට කෙබඳු සිතක් වන්නේද?"

"ස්වාමීනි, ඉදින් මා සුනාපරන්ත දනව් වැසි මිනිස්සු සියුම් ආයුධයකින් ජීවිතයෙන් තොර කෙරෙත්ද, එහිදී මට මෙබඳු

සිතක් වන්නේය. ශරීරයත් ජීවිතයත් පිළිකුල් කරනු ලබමින් දිවිනැසීම පිණිස ආයුධ තනන්නවුන් සොයන්නාවූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙත්මය. මා විසින් ඒ මේ ආයුධයෙන් දිවි තොර කරන්නෝ නොසොයාම ලදහ.' භාග්‍යවතුන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මෙහිදී මට මෙබඳු සිතක් වන්නේය."

13. "පුණ්ණ, යහපත යහපත පුණ්ණ, නුඹ මේ ඉන්ද්‍රිය දමනයෙන් හා සංසිඳීමෙන් යුක්තවූයේ සුනාපරන්ත නම් දනව්වෙහි වාසය කරන්ට හැකිවන්නෙහිමය. පුණ්ණ, දැන් නුඹ යම් අදහස් කෙළෙහි නම් ඊට සුදුසු කාලය දනුවයි" (වදාළේය.)

ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණා කොට සෙනස්න තැන්පත් කොට තබා පාත්‍ර සිව්රු ගෙණ සුනාපරන්ත ජනපදය යම් තැනෙක්හිද එහි චාරිකාවෙහි ගියේය. පිළිවෙළින් චාරිකා කරන්නේ සුනාපරන්ත නම් ජනපදය යම් තැනෙක්හිද එතැනට ගියේය.

14. 'එකල්හි ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන් වහන්සේ සුනාපරන්ත නම් ජනපදයෙහි වාසය කරත්. ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන් වහන්සේ ඒ වස්කාලය තුළම පන්සියයක් පමණ උපාසකවරු පිළියෙළ කළේය. ඒ වස්කාලය තුළම පන්සියයක් පමණ උපාසිකාවරු පිළියෙළ කෙළේය. ඒ වස්කාලය තුළම ත්‍රිවිද්‍යාව ප්‍රත්‍යක්ෂ කෙළේය. ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරතෙමේ මෑතකලෙක්හි පිරිනිව්යේය.

15. "එකල්හි බොහෝවූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එතැනට එළඹුනාහුය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පස්ව හුන්නාහුය. එකත් පස්ව හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළාහුය.

"ස්වාමීනි, යම් ඒ පුණ්ණ නම් කුලපුත්‍රයෙක් තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙප අවවාදයෙන් අවවාද කරණ ලද්දේද, හෙතෙම කළුරිය කළේය.

"ඔහුගේ ගතිය කුමක්ද? පරලොව කුමක්ද?"

"මහණෙනි පුණ්ණ නම් කුලපුත්‍ර තෙමේ පණ්ඩිතය ධර්මානුධර්ම ප්‍රතිපත්තියට පිළිපන්නේය. ධර්මාවබොධය කරුණු කොට මට වෙහෙස නොකෙළේය. මහණෙනි, පුණ්ණ නම් කුලපුත්‍ර තෙමේ, පිරිනිවියේයයි" භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

**තුන්වෙනි පුණ්ණොවාද සූත්‍රය නිමි. (5-3)**

---

## 46. නන්දකොවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඩු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ පන්සියයක් පමණවූ භික්ෂුණීන් සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියාය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පස්ව සිටියාය. එකත් පස්ව සිටියාවූ මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළාය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුණීන්ට අවවාද කරණ සේක්වා, ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ භික්ෂුණීන්ට අනුශාසනා කරණ සේක්වා. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ භික්ෂුණීන්ට ධර්ම කථාව කරණ සේක්වා" යනුයි.

2. "එකල්හි වනාහි ස්ථවිර භික්ෂූහු වාරවශයෙන් භික්ෂුණීන්ට අවවාද කරත්. ආයුෂ්මත් නන්දක ස්ථවිර තෙමේ වනාහි වාරවශයෙන් භික්ෂුණීන්ට අවවාද කරන්ට නොකැමැති වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්ට ආමන්ත්‍රණය කළසේක. "ආනන්දය, වාරවශයෙන් භික්ෂුණීන්ට අවවාද කිරීම සඳහා අද කවරෙකුගේ වාරය වේදැයි" ඇසූහ.

"ස්වාමීනි, වාරවශයෙන් භික්ෂුණීන්ට අවවාද කිරීම සඳහා අද නන්දක ස්ථවිරයන්ගේ වාරයවේ. ස්වාමීනි, මේ ආයුෂ්මත් නන්දකස්ථවිර තෙම වාරය වශයෙන් භික්ෂුණීන්ට අවවාද කරන්ට නොකැමැති වේයයි" කීය.

3. "එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ නන්දකස්ථවිරයන්ට ආමන්ත්‍රණය කළසේක. "නන්දකය, භික්ෂූණීන්ට අවවාද කරව, නන්දකය, භික්ෂුණීන්ට අනුශාසනා කරව. බ්‍රාහ්මණය, නුඹ භික්ෂුණීන්ට ධර්ම කථාව කරවයි" (වදාළේය.)

"එසේය ස්වාමීන් වහන්සැයි, ඒ ආයුෂ්මත්වූ නන්දක ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තරදී පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ සැවැත් නුවරට පිඬුපිණිස පිවිසියේය. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසු බත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ දෙවැන්නෙකු ඇතිව රාජකාරාමය යම් තැනෙක්හිද එතනට එළඹියේය.

4. "ඒ භික්ෂුණීහු දුරදීම එන්නාවූ ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් දුටුවාහුමය, දැක ආසනයක් පැනවූවාහුය, පා සේදීමට දියද එලෙව්වාහුය. ආයුෂ්මත් නන්දක ස්ථවිර තෙමේ පනවනලද ආසනයෙහි වැඩ හුන්නේමය. වැඩහිඳ පා සේදූයේය. ඒ භික්ෂුණීහුද ආයුෂ්මත්වූ නන්දක ස්ථවිරයන්ට වැඳ එකත් පස්ව හුන්නාහුය. එකත් පස්ව හුන්නාවූ ඒ භික්ෂුණීන්ට ආයුෂ්මත් නන්දක ස්ථවිර තෙමේ මෙය ප්‍රකාශ කෙළේය. "නැගණිවරුනි, ප්‍රශ්න කොට කීමක් වන්නේය. එහි දන්නවුන් විසින් දනිමුයි, කියයුතු වන්නේය. නොදන්නවුන් විසින් නොදනිමුයි කියයුතු වන්නේය. යම් භික්ෂුණියකට සැකයක් හෝ විමතියක් හෝ වන්නේද, එය 'ස්වාමීනි, මෙය කෙසේද මෙහි අර්ථය කවරේදැයි, මගෙන්ම ඇසිය යුත්තේය.' (ප්‍රකාශ කෙළේය.)

5. "ස්වාමීනි, ආයසීවූ නන්දක ස්ථවිරයන් වහන්සේ අපට යමක් පවරාද එපමණකින්ම අපි ආයසීවූ නන්දක ස්ථවිරයන් වහන්සේට සතුටු සිත් ඇත්තේ කැමැතිවූවෝ වෙමුයි" කීවාහුය.

"නැගණි වරුනි, ඒ කුමකැයි හඟිව්ද? ඇස නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය"

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැපවේද?"

"ස්වාමීනි, දුක්ය"

"යමක් වනාහි අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන ස්වභාව ඇත්තේ නම් එය, මාගේය එය මම වෙමියි, එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?"

"ස්වාමීනි, (සුදුසු) නොවේමය" "නැගණිවරුණි, කුමකැයි හඟිව්ද, කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය

"නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'

"ස්වාමීනි, අනිත්‍යය"

"කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යය නම් එය දුක හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුකය. 'යමක් වනාහි අනිත්‍යය නම්, දුක නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම් එය, මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?"

"ස්වාමීනි, එය (සුදුසු) නොවේමැයි"

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, මෙසේද මෙසේ මාගේ අධ්‍යාත්මික ආයතන සය අනිත්‍ය වෙත්යයි අප විසින් පළමු කොටම මෙය තත්වූ පරිදි මනා නුවණින් දක්නා ලදී"

"නැගණිවරුනි, යහපත, යහපත. නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නාවූ, ආයඖශ්‍රාවකයාහට ඒ කාරණය එසේමය.

**6.** "නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද, රූපයෝ නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍ය වෙත්."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම් වෙනස්වන ස්වභාව ඇත්තේ නම් එය, මාගේය, එය මම වෙමියි, එය මාගේ ආත්මයයි, දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද?" ශබ්දයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍ය වෙත්."

"ගන්ධයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍ය වෙත්."

"රසයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍ය වෙත්."

"ස්පර්ශයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍ය වෙත්."

"ධර්මයෝ නිත්‍ය හෝ අනිත්‍ය වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍ය වෙත්."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි, දකින්ට සුදුසුද?"

"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, මෙසේද, මෙසේ මේ බාහිරවූ ආයතනයෝ සදෙන අනිත්‍ය වෙත්යයි අප විසින් පළමුකොටම තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් මනාකොට දක්නාලදී."

"නැගණිවරුනි, යහපත, යහපත, නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නාවූ ආර්‍ය්‍යශ්‍රාවකයාහට ඒ කාරණය එසේමයි."

7. "නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද, චක්ඛු විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම්, එය දුක හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක නම්, පෙරළෙන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, එය නොවේමැයි."

"නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද? සොතවිඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"ඝාණවිඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද? ජිව්හා විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"ස්වාමීනි අනිත්‍යය"

"නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද? මනොවිඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම්, විපරිනාම ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දක්නට සුදුසුද?"

"ස්වාමීනි, මෙය නුසුදුසුමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, මෙසේද, මෙසේ මේ විඤ්ඤාණකායයෝ සදෙන අනිත්‍යයෝයයි අප විසින් පළමුකොටම තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් මනාකොට දක්නාලදී."

"නැගණිවරුනි, යහපත, යහපත. නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නාවූ ආය්‍යීශ්‍රාවකයාහට ඒ කාරණය එසේමැයි."

8. "නැගණිවරුනි, යම්සේත් ඇවිලෙන්නාවූ තෙල් පහණක්හුගේ තෙලද අනිත්‍යය. වෙනස්වන ස්වභාව ඇත්තේ වේද, පහන් වැටියද අනිත්‍යය. වෙනස්වන ස්වභාව ඇත්තීද, පහන් සිළුවද අනිත්‍යය. වෙනස්වන ස්වභාව ඇත්තීද, ආලොකයද අනිත්‍යය. වෙනස්වන ස්වභාව ඇත්තීද, නැගණිවරුනි, යමෙක් වනාහි මෙසේ කියන්නේද, 'ඇවිලෙන්නාවූ මේ තෙල් පහණෙහි තෙලද අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තේය. පහන්වැටියද අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තීය. පහන් සිලද අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තීය. ඒ පහණේ යම් ආලෝකයක් වේද, එය නිත්‍යය. ස්ථිරය, ශාස්වතය, වෙනස් නොවන ස්වභාව ඇත්තීයයි'

(කියන්නේද), නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම මනාකොට කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, මේ ඇවිලෙන්නාවූ තෙල් පහණේ තෙලද අනිත්‍ය නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, පහන්සිලද අනිත්‍ය නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, එහි ආලොකය අනිත්‍යය. වෙනස්වන ස්වභාව ඇත්තේයයි කියනුම කවරේද?"

**9.** "නැගණිවරුනි, මෙපරිද්දෙන්ම මේ අධ්‍යාත්මිකවූ ආයතනයෝ සදෙන වනාහි අනිත්‍යයෝය. 'අධ්‍යාත්මිකවූ ආයතනයන් සදෙන නිසා යම් සැපයක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, එය නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය. නොනැසෙන ස්වභාව ඇත්තේයයි' යමෙක් කියන්නේද, නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම එය මනාකොට කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ඒ ඒ වේදනා උපදින හේතූන් නිසා ඒ ඒ හේතුවෙන් හටගත්තාවූ වේදනාවෝ උපදිත්. ඒ ඒ වේදනා උපදින හේතූන්ගේ නිරුද්ධවීමෙන් ඒ ඒ හේතුවෙන් හටගත් වේදනාවෝ නිරුද්ධවෙත්, එහෙයිනි."

"නැගණිවරුනි, යහපත, යහපත. නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නාවූ ආර්‍ය්‍යශ්‍රාවකයෙකුට ඒ කාරණය එසේමැයි."

**10.** "නැගණිවරුනි, යම්සේත් පිහිටියාවූ හර ඇත්තාවූ මහත්වූ වෘක්ෂයක්හුගේ මුලත් අනිත්‍යය. වෙනස්වන ස්වභාව ඇත්තේ වේද, කඳත් අනිත්‍යවූයේ වෙනස්වන ස්වභාව ඇත්තේද, අතු හා කොළද අනිත්‍යවූයේ වෙනස්වන ස්වභාව ඇත්තේද,

සෙවනැල්ලද අනිත්‍යවූවා පෙරළෙන ස්වභාව ඇත්තීද, නැගණිවරුනි, යමෙක් වනාහි පිහිටියාවූ සාරවත්වූ මේ මහත්වූ වෘක්ෂයාගේ මුලත් අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය. කඳත් අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය. අතු හා කොළත් අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය. ගසේ යම් ඡායාවක් වන්නීද, එය නිත්‍යවූ ස්ථිරවූ සදාකාලිකවූ වෙනස් නොවන්නකැයි මෙසේ කියන්නේද, නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම වනාහි මනාකොට කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, පිහිටියාවූ සාරවත්වූ මේ මහත්වූ වෘක්ෂයාගේ වනාහි මුලත් අනිත්‍ය නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, කඳත් අනිත්‍ය නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, අතු හා කොළත් අනිත්‍ය නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, ගසේ ඡායාවත් අනිත්‍යවූ වෙනස්වන බවක් ඇත්තීයයි කියනුම කවරේද?"

11. 'නැගණිවරුනි, එපරිද්දෙන්ම යමෙක් වනාහි මේ බාහිරවූ ආයතනයෝ සදෙන වනාහි අනිත්‍යයෝය, වෙනස්වන ස්වභාව ඇත්තෝය. බාහිරවූ ආයතනයෝ සදෙන නිසා යම් සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳිම්ද, එය නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, වෙනස් නොවන ස්වභාව ඇත්තේයයි මෙසේ කියන්නේද, නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම වනාහි මනාකොට කියන්නේද?"

"එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, ඒ ඒ වේදනාව උපදින හේතූන් ඒ ඒ හේතුවෙන් හටගන්නාවූ වේදනාවෝ උපදිත්. ඒ ඒ වේදනා උපදින හේතූන්ගේ නිරුද්ධවීමෙන් ඒ ඒ හේතුවෙන් උපදින වේදනාවෝ නිරුද්ධවෙත්, එහෙයිනි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"නැගණිවරුනි, යහපත, යහපත. නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නාවූ ආර්‍ය්‍යශ්‍රාවකයෙකුට ඒ කාරණය එසේමැයි."

12. "නැගණිවරුනි, යම්සේ දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ දෙනක් මරා සියුම්වූ ගෙරි කපන කැත්තෙන් ගවදෙන මසටද තුවාල නොකොට, සමටද තුවාල නොකොට, සමත් මසත් අතර බැඳුණු යම් නහර වැදලි ඇත්නම් ඒ ඒ නහරවැදලි පමණක් තියුණු ආයුධයෙන් කපන්නේද, සිඳින්නේද, කපා සිඳ සමගසා ඒ පිට සමින්ම ඒ ගවදෙන වසා පෙරසේම ඒ ගවදෙන ඒ සමින් යුක්තවූවායයි කියන්නේ නම්, නැගණිවරුනි, එසේ කියන තැනැත්තේ මනාකොට කියන්නේවේද?"

"ස්වාමීනි, එසේ නොවේය."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, ඒ දක්ෂවූ ගවයන් මරන්නාවූ හෝ ගවයන් මරන්නෙකුගේ අතවැස්සෙක් හෝ ගවදෙනක් මරා සියුම්වූ ගෙරිකපන කැත්තෙන් ඇතුළත මසටද තුවාළ නොකොට පිටත සමටද තුවාල නොකොට, සමටත් මසටත් අතර බැඳුණ යම් නහර ආදියක් වෙත්ද, ඒ නහර ආදියම සියුම්වූ ගෙරිකපන කැත්තෙන් කපන්නේද, සිඳින්නේද, මනාව කපන්නේද කපා සිඳ පිටසම ගසාදමා, ඒ සමින්ම ඒ ගවදෙන වසාදමා පෙර සේම, මේ දෙන මේ සමින් යුක්ත වූවායයි කියන්නේ වේද, එතකුදු වුවත් ඒ සමින්ම යුක්ත නොවන්නීය."

13. "නැගණිවරුනි, මා විසින් මේ උපමාව වනාහි අර්ථ හැඟවීමට දක්වන ලදී. මෙය මෙහි අර්ථයවේ. නැගණිවරුනි, ඇතුළත මස යනු අධ්‍යාත්මිකවූ ආයතනයන් සදෙනාට මේ නමකි. නැගණිවරුනි, පිට සම යනු බාහිර ආයතන සයට මේ නමකි. නැගණිවරුනි, අතර බැඳුණු නහර ආදිය යනු නන්දිරාගයයි කියනලද තෘෂ්ණාවට මෙය නමකි. නැගණිවරුනි, සියුම්වූ ගෙරිකපන කැත්තය යනු ආර්‍ය්‍යවූ ප්‍රඥාවට මේ නමකි.

යම් මේ ආයසීවූ ප්‍රඥාවක් වේද, ඕතොමෝ අධ්‍යාත්මික බාහිර ආයතනයන් අතර ඇති කෙලෙස් මනාව සිඳියි. අතර ඇති සංයොජන අතර ඇති බන්ධන සිඳියි, කපයි.

14. "නැගණිවරුනි, යම් ධර්මකෙනෙකුන් වැඩූ බැවින් බහුල වශයෙන් කළ බැවින් භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියටද, අර්හත්ඵල ප්‍රඥාවටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන පැමිණ වාසය කෙරේද, ඒ මේ බොධ්‍යංග ධර්ම සතක් වෙත්. කවර සතක්ද යත්? නැගණිවරුනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය, ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, කෙලෙස් දුරලීම පිණිස පවත්නාවූ සතිසම්බොජ්ඣංගය වඩයිද, ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, විරියසම්බොජ්ඣංගය වඩයිද, පීතිසම්බොජ්ඣංගය වඩයිද, පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, සමාධි සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, කෙලෙසුන් දුරලීම පිණිස පවත්නාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩයිද, නැගණිවරුනි, යම් ධර්මකෙනෙකුන් වඩනලද බැවින්, බහුල කරනලද බැවින් භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීමෙන්, ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියට අර්හත්ඵල ප්‍රඥාවට මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද, ඒ මේ බොධ්‍යංගධර්ම සත වෙත්ය"යි ප්‍රකාශ කෙළේය.

15. ඉක්බිති ආයුෂ්මත් නන්ද ස්ථවිරතෙම ඒ භික්ෂුණීන්ට මේ අවවාදයෙන් අවවාදකොට "නැගණිවරුනි, යව්. මේ සුදුසු කාලයයි යෙදවීය." (පිටත්කෙළේය.)

ඉක්බිති ඒ භික්ෂුණීහු ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට ආයුෂ්මත්වූ නන්දක ස්ථවිරයන්ට වැඳ, ප්‍රදක්ෂිණාකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට එළඹුනාහුය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පස්ව සිටියාහුය. එකත්පස්ව සිටියාවූම ඒ භික්ෂුණීන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

"මෙහෙණිනි, යව්. යාමට සුදුසු කාලයයි" වදාළේය.

16. "ඉක්බිති ඒ භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේට වැඳ, ප්‍රදක්ෂිණා කොට ගියාහුය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ භික්ෂුණීන් බැහැරගිය නොබෝ වේලාවකින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, යම්සේ තුදුස්වක් පොහෝ දිනයෙක සඳ අඩුද සම්පූර්ණදැයි බොහෝදෙනාට සැකයක් හෝ විමතියක් හෝ නැත. 'සඳ අඩු වූයේම වෙයි. මහණෙනි, එපරිද්දෙන්ම ඒ භික්ෂුණීහු නන්දකගේ ධර්මදෙශනාවෙන් සතුටු වූවාහුම වෙත්. එහෙත් සම්පූර්ණවූ අදහස් ඇත්තෝ නුවූවාහුමය."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දක ස්ථවිරයන්ට ආමන්ත්‍රණය කළසේක. "නන්දක, එසේවීනම් නුඹ හෙටද ඒ භික්ෂුණීන්ට ඒ අවවාදයෙන්ම අවවාද කරන්නෙහි යයි" වදාළේය. "එසේය, ස්වාමීනියයි" ආයුෂ්මත්වූ නන්දක ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය.

17. ඉක්බිති ආයුෂ්මත් නන්දක ස්ථවිරතෙමේ ඒ රාත්‍රිහුගේ ඇවෑමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිව්රුගෙණ සැවැත්නුවරට පිඬු පිණිස වැඩිසේක. සැවැත් නුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ දෙවැන්නෙකු සමග රාජකාරාමය යම් තැනෙක්හිද එතැනට එළඹියේය. ඒ භික්ෂුණීහු වඩින්නාවූ ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේ දුරදීම දුටුවාහුය. දැක, ආසනයක් පැනවූවාහුය. ජලයද පාදයන් ධොවනයට එළවූවාහුය. ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේ වනාහි පනවනලද අස්නෙහි වැඩහුන්සේක. වැඩහිඳ, පාදයන් සේදූසේක. ඒ භික්ෂුණීහුද ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේට වැඳ, එකත්පස්ව උන්නාහුය. එකත්පස්ව උන්නාවූ ඒ භික්ෂුණීන්ට ආයුෂ්මත් නන්දක ස්ථවිරතෙම මෙය වදාළේය.

18. "නැගණිවරුනි, ප්‍රශ්නකර කිරීමක් වන්නේය. එහි දන්නවුන් විසින් දනිමුයි කියයුතු වන්නේය. නොදන්නවුන් විසින් නොදනිමුයි, කියයුතු වන්නේය. යමක් ගැන වනාහි සැකයක්

හෝ විමතියක් හෝ වන්නේද? ස්වාමීනි, මෙය කෙසේද මෙහි අර්ථය කවරේදැ'යි එය මගෙන්ම ඇසිය යුතුය.

"ස්වාමීනි, ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේ අපට යමක් පවරයිද එතෙකින් සතුටු සිත් ඇත්තෝ කැමැතිවූවෝ වෙමු."

**19.** "නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද, ඇස නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක හෝ සැප වේද?"

"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දකින්ට සුදුසුද?"

"ස්වාමීනි, මෙය එසේ නොවේමැයි."

"නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද? කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"නාසය නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"දිව නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"කය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"සිත නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම් දුක නම් වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමි, එය මගේ ආත්මයයි දක්නට සුදුසුද?"

"ස්වාමීනි, එය එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, අප විසින් මෙසේද මෙසේ මේ අධ්‍යාත්මිකවූ ආයතනයෝ සදෙන අනිත්‍යහයි පළමුවම තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් මනාකොට දක්නාලදී."

"නැගණිවරුනි, යහපත, යහපත. නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නාවූ ආයර්‍යශ්‍රාවකයෙකුට ඒ කාරණය එසේමයි."

**20.** "නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද? රූපයෝ නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම් දුක් නම් වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දක්නට සුදුසුද?"

"ස්වාමීනි, එසේ නොවේ."

"නැගණිවරුනි, එය කුමකැයි හඟිව්ද? ශබ්දයෝ නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍යයහ."

"ගන්ධයෝ නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍යයහ."

"රසයෝ නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍යයහ."

"ස්පර්ශයෝ නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍යයහ."

"ධර්මයෝ නිත්‍යය හෝ අනිත්‍යය හෝ වෙද්ද?"

"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම් දුක් නම් වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දක්නට සුදුසුද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, අප විසින් මෙසේද මෙසේ මේ බාහිරවූ ආයතනයෝ සදෙන අනිත්‍යහයි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් මනාකොට දක්නා ලදී."

"නැගණිවරුනි, යහපත, යහපත. නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත්වූ නුවණින් දක්නාවූ ආර්‍ය්‍යශ්‍රාවකයෙකුට ඒ කාරණය එසේයි."

21. "නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද, චක්ඛු විඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුක හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක නම්, වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දක්නට සුදුසුද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

22. 'නැගණිවරුනි, ඒ කුමකැයි හඟිව්ද? සොත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"ඝාණවිඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"ජිව්හාවිඤ්ඤාණය නිත්‍යය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"මනොවිඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුක හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍ය නම් දුක නම් වෙනස්වන ස්වභාව ඇත්තේ නම්, එය මාගේය, එය මම වෙමියි, එය මාගේ ආත්මයයි දකින්ට සුදුසුද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, මෙසේද මෙසේ විඤ්ඤාණ කායයෝ සදෙන අනිත්‍යයෝයයි, අප විසින් පළමුකොටම තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් මනාකොට දක්නාලදී."

"නැගණිවරුනි, යහපත, යහපත, නැගණිවරුනි තත්වූ පරිද්දෙන් මනානුවණින් දක්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙකුට ඒ කාරණය එසේමයි."

23. "නැගණිවරුනි, යම්සේත් ඇවිලෙන්නාවූ තෙල් පහනක තෙලද අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තේ වේද, පහන් වැටියද අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තේ වේද, පහන් සිලද අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තී වේද, ආලෝකයද අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තක් වේද? නැගණිවරුනි, යමෙක් වනාහි මේ ඇවිලෙන්නාවූ තෙල් පහනෙහි තෙලද අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තේය. වැටියද අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තීය. පහන්සිලද අනිත්‍ය වෙනස්වන ස්වභාව ඇත්තීය. මේ පහණේ ආලෝකයක් වේද, එය නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, වෙනස් නොවන ස්වභාව ඇත්තේයයි, කියන්නේද නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම මනාකොටම කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, මේ ඇවිලෙන්නාවූ තෙල් පහණේ තෙලද අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය. වැටියද අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය. පහන් සිලද අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය. ඒ පහණේ ආලෝකය අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය යනු කියනුම කවරේද?"

24. "නැගණිවරුනි, එපරිද්දෙන්ම යමෙක් වනාහි මේ අධ්‍යාත්මිකවූ ආයතනයෝ සදෙන වනාහි අනිත්‍යයහ. අධ්‍යාත්මිකවූ ආයතනයන් සදෙන නිසා යම් සැපයක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳිම්ද, එය නිත්‍යය. ස්ථිරය, සදාකාලිකය, වෙනස් නොවන ස්වභාව ඇත්තේයයි කියන්නේ නම්, නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම වනාහි මනාකොට කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

'ස්වාමීනි, ඒ ඒ වේදනා හටගන්නාවූ හේතූන් නිසා ඒ ඒ හේතුවෙන් හටගන්නා වේදනාවෝ උපදිත්. ඒ ඒ වේදනා හටගන්නා ඒ ඒ හේතූන්ගේ නිරුද්ධවීමෙන් ඒ ඒ හේතූන්ගෙන් හටගත් වේදනාවෝ නිරුද්ධ වෙත්මයි."

"නැගණිවරුනි, යහපත යහපත, නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙකුට ඒ කාරණය එසේමයි."

**25.** "නැගණිවරුනි, යම්සේක් පිහිටියාවූ සාරවත්වූ මහත් වූ වෘක්ෂයාගේ මුලත් අනිත්‍යද වෙනස්වන ස්වභාව ඇත්තේද, කඳත් අනිත්‍යද වෙනස්වන ස්වභාව ඇත්තේද, අතු හා කොළත් අනිත්‍යද වෙනස්වන ස්වභාව ඇත්තේද, සෙවනැල්ලත් අනිත්‍යද වෙනස්වන ස්වභාව ඇත්තේද, නැගණිවරුනි, යමෙක් වනාහි පිහිටියාවූ සාරවත්වූ මේ මහත්වූ වෘක්ෂයාගේ මුලත් අනිත්‍යය, වෙනස්වන ස්වභාව ඇත්තේය, කඳත් අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තේය. අතු හා කොළත් අනිත්‍යය වෙනස්වන ස්වභාව ඇත්තේය. මේ ගසේ යම් සෙවනැල්ලක් වන්නීද, එය නිත්‍යය. ස්ථිරය, සදාකාලිකය. යමක් වෙනස්වන ස්වභාව නැත්තේයයි යමෙක් කියන්නේ නම් නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම මනාකොටම කියන්නේද?"

"ස්වාමීනි, පිහිටියාවූ සාරවත්වූ මේ මහත්වූ වෘක්ෂයාගේ වනාහි මුලත් අනිත්‍යනම්, විපරිනාම ස්වභාව ඇත්තේනම් කඳත් අනිත්‍යනම් වෙනස්වන ස්වභාව ඇත්තේනම් අතු හා කොළත් අනිත්‍යනම් වෙනස්වන ස්වභාව ඇත්තේනම් ඒ ගසේ සෙවනැල්ලද අනිත්‍යවූ වෙනස්වන ස්වභාව ඇත්තේය යනු කියනුම කවරේද?"

**26.** නැගණිවරුනි, එපරිද්දෙන්ම මේ බාහිරවූ ආයතනයෝ සදෙන වනාහි අනිත්‍යයහ. වෙනස්වන ස්වභාව ඇත්තාහ.

බාහිරවූ ආයතනයන් සඳෙන නිසා යම් සැපයක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, එය නිත්‍යය. ස්ථිරය. සදාකාලිකය. වෙනස්වන ස්වභාව නැත්තේයයි යමෙක් කියා නම් නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම මනාකොටම කියන්නේද?"

"ස්වාමීනි මෙය එසේ නොවේමැයි"

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි ඒ ඒ වේදනා හටගන්නාවූ හෙතුන් නිසා ඒ ඒ හෙතුවෙන් හටගන්නාවූ වේදනාවෝ උපදිත්. ඒ ඒ වේදනා හටගන්නාවූ හෙතුන් නිරුද්ධවීමෙන් ඒ ඒ වේදනා උපදින්නාවූ හෙතුන්ගෙන් හටගන්නාවූ වේදනාවෝ නිරුද්ධ වෙත්මයි"

**26.** "නැගණිවරුනි, යහපත යහපත, නැගණිවරුනි, තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දන්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙකුට ඒ කාරණය එසේමැයි. නැගණිවරුනි, යම්සේ දක්ෂවූ ගවඝාතකයෙක් හෝ ගවඝාතකයෙකුගේ අතවැසියෙක් හෝ ගවදෙනක් මරා සියුම්වූ ගෙරිකපන කැත්තෙන් ඇතුළත මසත් පලුදුනොකොට පිටත සමත් පලුදුනොකොට අතර බැඳී පවත්නා සිවියද, අතරවූ නහරද, අතරවූ බැඳුම්ද ඇත්තේද, එපමණක්ම සියුම්වූ ගෙරිකපන කැත්තෙන් සිඳින්නේද, කපන්නේද, නැවත නැවත කපන්නේද, සිඳ කපා නැවත නැවත කපා පිට හම ගසා ඒ සමින්ම ඒ ගවදෙන වසා දමා පළමුසේම මේ ගවදෙන මේ සමින් යුක්තවූවායයි කියන්නේය. නැගණිවරුනි, එසේ කියන්නාවූ හෙතෙම මනාකොටම කියන්නේද?"

"ස්වාමීනි මෙය එසේ නොවේමැයි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, මේ දක්ෂවූ ගවඝාතකයා හෝ ගවඝාතකයාගේ අතවැසියා හෝ ගවදෙනක් මරා සියුම්වූ ගෙරිකපන කැත්තෙන් ඇතුළත මසද පලුදු නොකොට පිට සමද පලුදු නොකොට එහි අතර සිවිද අතර නහරද අතර බැඳුම්ද ඇත්නම් එපමණක්ම

සියුම්වූ ගෙරිකපන කැත්තෙන් සිඳින්නේය. කපන්නේය, හාත්පස කපන්නේය. සිඳ කපා හාත්පස කපා පිට සම ගසා ඒ සමින්ම ඒ ගවදෙන වසා, හෙතෙම පෙරසේම මේ ගවදෙන මේ සමින් යුක්තවූවායයි කියන්නේද එතකුදු වුවත් ඒ ගවදෙන ඒ සමින් යුක්ත නොවූවා වෙයි.”

27. “නැගණිවරුනි, මා විසින් මේ උපමාව වනාහි අර්ථය හැඟවීමට දක්වනලදී. මෙය එහි අර්ථය වේ නැගණිවරුනි, ඇතුළත මස යනු අධ්‍යාත්මිකවූ ආයතන සයට මෙය නමකි නැගණිවරුනි, පිටත සම යනු බාහිර ආයතන සයට මෙය නමකි. නැගණිවරුනි, අතරවූ සිවිය අතරවූ නහරය, අතරවූ බැඳුම්ය යනු නන්දිරාගයයි කියනලද තෘෂ්ණාවට මෙය නමකි. නැගණිවරුනි, තියුණුවූ ගෙරි කපන කැත්තය යනු ආර්‍ය්‍යවූ ප්‍රඥාවට මේ නමකි. යම් මේ ආර්‍ය්‍යවූ ප්‍රඥාවක් වේද, ඕතොමෝ අධ්‍යාත්මික බාහිර ආයතන අතර ඇති ක්ලෙශය අතරවූ සංයොජනය අතරවූ බන්ධනය, සිඳියි, කපයි, හාත්පසින් කපයි.

28. “නැගණිවරුනි, යමෙකුන් වඩනලද බහුලවශයෙන් කරණලද භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීමෙන් අනාශ්‍රවවූ අර්හත් ඵල සමාධියට අර්හත් ඵල ප්‍රඥාවට මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද ඒ බොජ්ඣංග ධර්ම සතක් වෙත්. කවර සතක්දයත්? නැගණිවරුනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරෝධය ඇසුරු කළාවූ කෙලෙස් දුරුකිරීම පිණිස පවත්නාවූ සති සම්බොජ්ඣංගය වඩයිද, ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, විරිය සම්බොජ්ඣංගය වඩයිද, පීති සම්බොජ්ඣංගය වඩයිද, පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, සමාධි සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ කෙලෙස් දුරලීම පිණිස පවත්නාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩයිද, නැගණිවරුනි, මොහු වනාහි බොජ්ඣංග සතවෙත්. යම් ධර්ම කෙනෙකුන් වඩනලද බහුල වශයෙන් කරනලද භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීමෙන් අනාශ්‍රවවූ අර්හත් ඵල සමාධියටද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

අර්හත්ඵල ප්‍රඥාවටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කෙරේද, ඔහුයි.

**29** "ඉක්බිති ආයුෂ්මත් නන්දක ස්ථවිර තෙමේ ඒ භික්ෂුණීන්ට මේ අවවාදයෙන් අවවාදකොට නැගණිවරුනි, යව් මේ සුදුසු කල්වේයයි" කාලයද දැන්වීය.

එකල්හි ඒ භික්ෂුණීහු අයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව, හුනස්නෙන් නැගිට ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණාකොට, භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන්වහන්සේට වැඳ එකත්පස්ව සිටියාහුය. එකත්පස්ව සිටියාවූම ඒ භික්ෂූණීන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය (වදාළේය.) "භික්ෂුණීවරුනි, මේ සුදුසු කාලය වේයයි" (වදාළේය.)

**30.** ඉක්බිති ඒ භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණා කොට ගියාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුණීන් බැහැරගියාවූ නොබෝ කල්හි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, යම්සේක් එදවස්හිවූ පසළොස්වක් පොහොය ඇතිකල්හි සඳ අඩුද සම්පූර්ණදැයි බොහෝදෙනාට සැකයක් හෝ විමතියක් හෝ නොවේද සඳ සම්පූර්ණවූයේම වේද, මහණෙනි, එපරිද්දෙන්ම ඒ භික්ෂුණීහු නන්දකයාගේ ධර්මදෙශනාවෙන් සතුටුසිත් ඇත්තාහුද, සම්පූර්ණවූ අදහස් ඇත්තාහුද වූහ. මහණෙනි, ඒ පන්සියයක් පමණ භික්ෂුණීන්ගෙන් පශ්චිමවූ යම් භික්ෂුණියක්වීද, ඕතොමෝ සෝවාන් වූවා අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තී නියත වූවා සම්බොධිය පිහිටකොට ඇත්තීවීයයි" වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුයි.

**සතරවැනි නන්දකොවාද සූත්‍රය නිමි. (5-4)**

## 47. චූල රාහුලොවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරණසේක. එකල්හි ඵල සමාපත්තියෙන් නැගීසිටි භාග්‍යවතුන් වහන්සේහට මෙබඳු අදහසක් පහළවූසේක. 'රාහුලගේ අර්හත්ඵල ඥානය මූකරවන්නාවූ ධර්මයෙහි මේරීමට පැමිණියාහුය. දැන් මම රාහුල මත්තෙහි ආශ්‍රවයන් ක්ෂය කරන්නාවූ ධර්මයන්හි හික්මවන්නෙම් නම් යහපති' කියායි. එකල වනාහි භාග්‍යවතුන්වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිව්රු ගෙන සැවැත් නුවරට පිඬු පිණිස වැඩිසේක. සැවැත් නුවර පිඬු පිණිස හැසිර පසු බත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළැක්කේ ආයුෂ්මත් රාහුලයන්ට ආමන්ත්‍රණයකළ සේක. 'රාහුලය නිසීදනය (හිඳිනා අසුන) ගනුව අන්ධවනය යම් තැනෙක්හිද, දවල් කාලයෙහි විසීම පිණිස එහි යන්නෙමුයි" (වදාළේය) "ස්වාමීනි, එසේය කියා ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන්වහන්සේට උත්තරදී නිසීදනය රැගෙන භාග්‍යවතුන් වහන්සේගේ පිටිපසින් ගියේය.

2. ඒ කාලයෙහි බොහෝ දහස් ගණන් දෙවියෝ අද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රාහුල භද්‍රයන් මත්තෙහි ආශ්‍රවයන් ක්ෂයකිරීමෙහි හික්මවන්නේයයි භාග්‍යවතුන් වහන්සේ පසුපස ගියාහුය.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ අන්ධවනයට පැමිණ එක්තරා ගසක් මුල පණවන ලද අස්නෙහි වැඩහුන්සේක. ආයුෂ්මත් රාහුල තෙමේද භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන්නාවූ ආයුෂ්මත් රාහුල භද්‍රයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. "රාහුලය, තා කුමකැයි" සිතන්නෙහිද? චක්ෂු ප්‍රසාදය නිත්‍ය වන්නේද? අනිත්‍ය වන්නේද?" යනුයි.

"ස්වාමීනි අනිත්‍ය වන්නේය"

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් වන්නේද සැප වන්නේද?

"ස්වාමීන් වහන්ස දුක් වන්නේය. ස්වාමීනි එය දුකය."

"යමක් දුක නම් අනිත්‍ය නම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසු වන්නේද?"

"ස්වාමීනි සුදුසු නොවන්නේමයයි" කී.

3. "රාහුල ඒ කුමකැයි හඟින්නෙහිද? රූපයෝ නිත්‍ය වන්නාහුද? අනිත්‍ය වන්නාහුද?"

"ස්වාමීනි අනිත්‍ය වන්නාහුය."

"යමක් වනාහි අනිත්‍ය නම් ඒ දුක් වන්නේද? සැප වන්නේද?"

"ස්වාමීනි දුක් වන්නේය."

"යමක් වනාහි අනිත්‍ය නම් දුක්නම් පෙරළෙන ස්වභාව ඇත්තේ නම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසු වන්නේද?"

"ස්වාමීනි සුදුසු නොවන්නේය."

"රාහුලය, ඒ කුමකැයි සිතන්නෙහිද? චක්ෂුර් විඥානය නිත්‍යවන්නේද, අනිත්‍ය වන්නේද?"

"ස්වාමීනි අනිත්‍ය වන්නේය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක්වන්නේද? සැප වන්නේද?"

"ස්වාමීනි දුක්වන්නේය."

"යමක් වනාහි අනිත්‍යවේද? දුක්වේද? පෙරළෙන ස්වභාව ඇත්තේද එය මාගේය එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසු වන්නේද?"

ස්වාමීනි, නොවන්නේයයි” (කී)

**4.** “රාහුලය ඒ කුමකැයි සිතන්නෙහිද? චක්ඛුසම්ඵස්සය නිත්‍ය වන්නේද?” අනිත්‍ය වන්නේද?

“ස්වාමීනි අනිත්‍ය වන්නේයි”

“යමක් වනාහි අනිත්‍ය වේනම් එය දුක්වන්නේද සැප වන්නේද?”

“ස්වාමීනි දුක්වන්නේය.”

“යමක් වනාහි අනිත්‍යනම් දුකනම් පෙරලෙන ස්වභාවයක් ඇත්තේනම් එය මම වෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසු වන්නේද?”

“ස්වාමීනි, නොවන්නේය”

**5.** “රාහුලය, ඒ කුමකැයි හඟින්නෙහිද? චක්ඛුසම්ඵස්සය නිසා හටගන්නාවූ යම් වේදනාවක් යම් සංඥාවක් යම් සංඛාරයක් යම් විඤ්ඤාණයක් වේද? එය නිත්‍ය හෝ වේද අනිත්‍ය හෝ වේද?”

“ස්වාමීනි, අනිත්‍ය වන්නේය.”

“යමක් වනාහි අනිත්‍ය වන්නේ නම් එය දුක්වන්නේද? සැපවන්නේද?”

“ස්වාමීනි එය දුක්වන්නේය. යමක් වනාහි අනිත්‍යනම් දුක නම් පෙරළෙන ස්වභාව ඇත්තේ නම් එය මාගේය එය මම වෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසු වන්නේද?”

“ස්වාමීනි සුදුසු නොවන්නේය”

**6.** “රාහුලය ඒ කුමකැයි සිතන්නෙහිද? ශ්‍රොත්‍රප්‍රසාදය නිත්‍ය වන්නේද? අනිත්‍ය වන්නේද?”

“ස්වාමීනි අනිත්‍ය වන්නේය.”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප වන්නේද?"

"ස්වාමීනි, එය දුක්වන්නේය"

"යමක් වනාහි පෙරළෙන ස්වභාව ඇත්තේ නම්, අනිත්‍ය නම්, දුක්නම් එය මාගේය එය මම වෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසු ද?"

"ස්වාමීනි, සුදුසු නොවන්නේය."

"ඝාණප්‍රසාදය නිත්‍ය වන්නේද? අනිත්‍ය වන්නේද?"

"ස්වාමීනි අනිත්‍ය වන්නේය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප වන්නේද?"

"ස්වාමීනි, එය දුක් වන්නේය."

"යමක් වනාහි පෙරළෙන ස්වභාව ඇත්තේනම් අනිත්‍ය නම් දුක් නම් එය මාගේය. එය මමවෙමි. එම මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසුද?"

"ස්වාමීනි, සුදුසු නොවන්නේය"

"ජිව්හා ප්‍රසාදය නිත්‍යවන්නේද? අනිත්‍ය වන්නේද?"

"ස්වාමීනි අනිත්‍ය වන්නාහුයයි"

"යමක් වනාහි අනිත්‍යනම් එය දුක් හෝ සැප වන්නේද?

"ස්වාමීනි, එය දුක්වන්නේය."

"යමක් වනාහි පෙරළෙන ස්වභාව ඇත්තේනම් අනිත්‍ය නම් දුක්නම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසුද?"

"ස්වාමීනි, සුදුසු නොවන්නේමය."

"කායප්‍රසාදය නිත්‍යවන්නේද? අනිත්‍ය වන්නේද?"

"ස්වාමීනි අනිත්‍යවන්නේය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුක් හෝ සැපවන්නේද?"

"ස්වාමීනි, එය දුක් වන්නේය"

"යමක් වනාහි පෙරළෙන ස්වභාව ඇත්තේනම් අනිත්‍ය නම්, දුක්නම්, එය මාගේය. එය මමවෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, සුදුසු නොවන්නේය."

"සිත නිත්‍ය වන්නේද?" අනිත්‍යවන්නේද?"

"ස්වාමීනි අනිත්‍ය වන්නේය."

"යමක් වනාහි අනිත්‍ය වන්නේනම් එය දුක්වන්නේද, සැප වන්නේද?"

"ස්වාමීනි දුක්වන්නේය." "යමක් වනාහි අනිත්‍ය නම්, දුක් වන්නේ නම් පෙරළෙන ස්වභාව ඇත්තේ නම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසු වන්නේද?"

"ස්වාමීනි සුදුසු නොවන්නේය"

7. "රාහුලය, එය කුමක් සිතන්නෙහිද? ධර්මයෝ නිත්‍ය වන්නාහුද අනිත්‍ය වන්නාහුද?"

"ස්වාමීනි අනිත්‍යවන්නාහුය."

"යමක් වනාහි අනිත්‍ය වන්නේ නම් එය දුක් වන්නේද සැපවන්නේද?"

"ස්වාමීනි දුක් වන්නේය."

"යමක් වනාහි අනිත්‍ය වන්නේ නම් පෙරළෙන ස්වභාව ඇත්තේනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසු වන්නේද?"

"ස්වාමීනි සුදුසු නොවන්නේය"

8. "රාහුලය, ඒ කුමකැයි සිතන්නෙහිද? මනො විඤ්ඤාණය නිත්‍යවන්නේද අනිත්‍ය වන්නේද?"

"ස්වාමීනි අනිත්‍යවන්නේය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුක් වන්නේද සැප වන්නේද?"

'ස්වාමීනි දුක්වන්නේය."

"යමක් වනාහි අනිත්‍යනම්, දුක්නම්, පෙරළෙන ස්වභාව ඇත්තේනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසු වන්නේද?"

"ස්වාමීනි, සුදුසු නොවන්නේය."

9. "රාහුලය, ඒ කුමකැයි සිතන්නෙහිද? මනොසම්ඵස්සය නිත්‍ය වන්නේද, අනිත්‍ය වන්නේද?"

"ස්වාමීනි, අනිත්‍ය වන්නේය."

"යමක් අනිත්‍යනම් එය දුක් වන්නේද, සැපවන්නේද?"

"ස්වාමීනි, දුක් වන්නේය."

"යමක් වනාහි අනිත්‍යනම් දුක්නම්, පෙරළෙන ස්වභාව ඇත්තේනම් එය මාගේය. එය මමවෙමි. එය මාගේ ආත්මය වන්නේයයි දැකීමට සුදුසු වන්නේද?"

"ස්වාමීනි, සුදුසු නොවන්නේය."

10. "රාහුලය, ඒ කුම කැයි හඟින්නෙහිද? මනො ස්පර්ශය හේතුකොටගෙන යම් වේදනාවක්, යම් සංඥාවක් යම් සංඛාරයක් යම් විඤ්ඤාණයක් උපදීනම් එය නිත්‍ය වන්නේද, අනිත්‍ය වන්නේද?"

"ස්වාමීනි අනිත්‍යවන්නේය."

"යමක් වනාහි අනිත්‍යනම් එය දුක්වන්නේද, සැප වන්නේද?"

"ස්වාමීනි දුක් වන්නේය."

"යමක් වනාහි අනිත්‍යනම් දුක්නම් පෙරළෙන ස්වභාව ඇත්තේනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්ම යයි දැකීමට සුදුසු වන්නේද?"

"ස්වාමීනි සුදුසු නොවන්නේය"

11. "රාහුලය, මෙසේ දකින්නාහු ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවක තෙමේ ඇසෙහි කලකිරෙන්නේය, රූපයන්හි කලකිරෙන්නේය. චක්ඛු විඤ්ඤාණයෙහි කලකිරෙයි. චක්ඛුසම්ඵස්සයෙහි කලකිරෙයි. යම් මේ චක්ඛුසම්ඵස්සයත් හේතුකොට ගෙන වේදනාවක් සංඥාවක් සංඛාරයක් විඤ්ඤාණයක් උපදීද, එහිද කලකිරෙයි. කණෙහි කලකිරෙයි. ශබ්දයන්හි කලකිරෙයි. නාසයෙහි කලකිරෙයි. ගන්ධයන්හි කලකිරෙයි. දිවෙහි කලකිරෙයි. රසයන්හි කලකිරෙයි. කයෙහි කලකිරෙයි. ස්පර්ශයන්හි කලකිරෙයි. සිතෙහි කලකිරෙයි. ධර්මායතනයන්හි කලකිරෙයි. මනෝවිඥානයෙහි කලකිරෙයි. මනොසම්ඵස්සයෙහි කලකිරෙයි. මනොසම්ඵස්සය හේතු කොටගෙන යම් වේදනාවක් සංඥාවක් සංඛාරයක් විඤ්ඤාණයක් උපදීද, එහිද කලකිරෙන්නේය. කලකිරෙන්නේ නොඇලෙන්නේය. නොඇලීමෙන් ක්ලෙශයන්ගෙන් මිදෙන්නේය. මිදුන කල්හි මිදුනේය යන අර්හත් ඥාණ ඵල උපදියි. ඉපදීම කෙළවර වන්නේය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. ඉන්පසු මේ ආත්මභාව පිණිස කළයුත්තක් නැතැයි දන්නේය."

12 භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. සතුටු සිත් ඇති ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට විශේෂයෙන් සතුටුවූයේ වෙයි.

මේ දෙශනාව කරනු ලබන කල්හි ආයුෂ්මත් රාහුලයන්ගේ සිත උපාදානයන්ගෙන් තොරව කාමාදී ආශ්‍රවයන් ගෙන් මිදුනේ වේ. ඒ බොහෝ දහස් ගණන් දෙවියන්ටද හටගැනීම් ස්වභාවය

ඇති යම් කිසිවක් ඇත්නම් ඒ සියල්ල හැකිවන ස්වභාව ඇත්තේයයි කෙලෙස් රජස් නැති දුරුවූ කෙලෙස් මළ ඇති ධර්ම චක්ෂුසයයි කියනලද මාර්ගඥාන පහළ විය.

චූලරාහුලෝවාද සූත්‍රය නිමි. (4-5)

---

## 48. ඡඡක්ක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු මහසිටුහු විසින් කරවනලද ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනි'යි අඬගැසූ සේක. ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි'යි උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, තොපට මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද, අර්ථ සහිතවූද, ව්‍යඤ්ජන සහිතවූද, ධර්මයක් දෙශනා කරමි. ප්‍රකාශ කරමි. එනම් සයේ ධර්ම සයක්ය. එය අසව්. මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමියි" වදාළේය. ඒ භික්ෂූහු "එසේය, ස්වාමීනි යයි" භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ "අධ්‍යාත්මික ආයතන සයක් දතයුතුය. බාහිරායතන සයක් දතයුතුය. විඤ්ඤාණකාය සයක් දතයුතුය. ඵස්සකාය සයක් දතයුතුය. වේදනාකාය සයක් දතයුතුය. තණ්හාකාය සයක් දතයුතුයයි" වදාළේය.

"සවැදෑරුම් අධ්‍යාත්මික ආයතන දතයුතුයයි මෙසේ කියනලදී. එය කුමක් සඳහා කියන ලද්දේද? චක්ඛායතනය, සොතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය යන මොහුයි. සවැදෑරුම් අධ්‍යාත්මිකායතන දතයුතුයයි යමක් කියන ලද්දේ නම් එය මේ සඳහා කියන ලදී. මේ පළමුවැනි ධර්ම සයයි.

3. "සවැදෑරුම් බාහිරායතන දතයුතුයයි මෙසේ කියන ලදී. ඒ කුමක් සඳහා කියන ලද්දේද? රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, පොට්ඨබ්බායතනය, ධම්මායතනය යන මොහුයි. සවැදෑරුම් බාහිරායතන දතයුතුයයි යමක් කියන ලද්දේ නම් ඒ මේ සඳහා කියන ලදී. මේ දෙවැනි ධර්ම සයයි.

4. "සවැදෑරුම් විඤ්ඤාණකාය දතයුතුයයි මෙසේ කියන ලදී. එය කුමක් සඳහා කියන ලද්දේද? ඇසත් රූපයනුත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. කණත් ශබ්දයනුත් නිසා සොතවිඤ්ඤාණය උපදියි. නාසයත් ගන්ධයනුත් නිසා ඝාණ විඤ්ඤාණය උපදියි. දිවත් රසයනුත් නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. කයත් ප්‍රෂ්ටව්‍යයනුත් නිසා කාය විඤ්ඤාණය උපදියි. සිතත් ධර්මාරම්මණයනුත් නිසා මනො විඤ්ඤාණය උපදියි. සවැදෑරුම් විඤ්ඤාණකාය දතයුතු යයි යමක් කියන ලද්දේ නම් ඒ මේ සඳහා කියනලදී. මේ තුන්වැනි ධර්ම සයයි.

5. "සවැදෑරුම් ඵස්සකාය දතයුතුයයි මෙසේ කියනලදී. ඒ කුමක් සඳහා කියන ලද්දේද? ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. කණත් ශබ්දයත් නිසා සොතවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. නාසයත් ගඳත් නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. දිවත් රසත් නිසා ජිව්හාවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. කයත් ස්පර්ශයත් නිසා කායවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. සිතත් ධර්මාරම්මණත් නිසා මනොවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. සවැදෑරුම් ඵස්සකාය දතයුතුය යමක් කියන ලද්දේ නම් ඒ මේ සඳහා කියනලදී. මේ සතරවැනි ධර්ම සයයි.

6. "සවැදෑරුම් වේදනාකාය දතයුතුයයි මෙසේ කියනලදී. එය කුමක් සඳහා කියන ලද්දේද? ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි.

ඵස්සය නිසා වේදනාව උපදියි. කණත් ශබ්දයත් නිසා සොත විඤ්ඤාණය උපදියි. නාසයත් ගඳත් නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. දිවත් රසත් නිසා ජිව්හාවිඤ්ඤාණය උපදියි. කයත් ප්‍රෂ්ටව්‍යයත් නිසා කායවිඤ්ඤාණය උපදියි. සිතත් ධර්මාරම්මණත් නිසා මනොවිඤ්ඤාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා වේදනාව උපදියි. සවැදෑරුම් වේදනාකාය දතයුතුයයි යමක් කියන ලද්දේ නම්, ඒ මේ සඳහා කියනලදී. මේ පස්වැනි ධර්ම සයයි.

7. "සවැදෑරුම් තණ්හාකාය දතයුතුයයි මෙසේ කියන ලදි. එය කුමක් සඳහා කියන ලද්දේද? ඇසත් රූපයත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා වේදනාව උපදියි. වේදනාව නිසා තණ්හාව උපදියි. කණත් ශබ්දයත් නිසා සොතවිඤ්ඤාණය උපදියි. නාසයත් ගඳත් නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. දිවත් රසත් නිසා ජිව්හාවිඤ්ඤාණය උපදියි. කයත් ප්‍රෂ්ටව්‍යයත් නිසා කායවිඤ්ඤාණය උපදියි සිතත් ධර්මාරම්මණයත් නිසා මනො විඤ්ඤාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා තණ්හාව උපදියි. සවැදෑරුම් තණ්හාකාය දතයුතුය යන යමක් කියන ලද්දේ නම් ඒ මේ සඳහා කියනලදී. මේ සයවැනි ධර්ම සයයි.

8. "ඇස ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් සෙයින්ද?) ඇසේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මයද උපදින්නේය, බිඳෙන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් ඇස ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. එහෙයින් ඇස අනාත්මයි. රූපයෝ ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. කුමක් හෙයින්ද? රූපයන්ගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදින්නේය, විනාශවන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් යමෙක් රූප ආත්මයයි කියන්නේ

නම් එය නොයෙදෙන්නේය. මෙසේ ඇසත් අනාත්මයී. රූපයෝත් අනාත්මයි

9. "චක්ඛුවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. කුමක් හෙයින්ද? චක්ඛුවිඤ්ඤාණයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි. විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් චක්ඛුවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ ඇසත් අනාත්මය, රූපයෝත් අනාත්මය චක්ඛුවිඤ්ඤාණයත් අනාත්මයයි දතයුතුය.

10. "කණ ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) කණේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මයද උපදින්නේය, බිඳෙන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් කණ ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. එහෙයින් කණ අනාත්මයි, ශබ්දයෝ ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. කුමක් හෙයින්ද? ශබ්දයන්ගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත්

10. "චක්ඛුසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) චක්ඛුසම්ඵස්සයාගේ ඉපදීමත් විනාශයත් පෙණෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් චක්ඛුසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ ඇසත් අනාත්මය, රූපයෝත් අනාත්මය, චක්ඛුවිඤ්ඤාණයත් අනාත්මය, චක්ඛුසම්ඵස්සයත් අනාත්මයි.

11 "වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) වේදනාවගේ

ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් වේදනාව ආත්ම යයි යමෙක් කියන්නේ නම්, ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ ඇසත් අනාත්මය, රූපයෝත් අනාත්මය, චක්ඛුවිඤ්ඤාණයත් අනාත්මය, චක්ඛුසම්ඵස්සයත් අනාත්මය, වේදනාවත් අනාත්මයි.

12. "තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) තණ්හාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මයත් උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් තණ්හාව ආත්ම යයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ ඇසත් අනාත්මය, රූපයෝත් අනාත්මය, චක්ඛුවිඤ්ඤාණයත් අනාත්මය, චක්ඛුසම්ඵස්සයත් අනාත්මය, වේදනාවත් අනාත්මය, තණ්හාවත් අනාත්මය.

13. "කණ ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) කණේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මයද උපදින්නේය, බිඳෙන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් කණ ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. එහෙයින් කණ අනාත්මයි.

14. "ශබ්දයෝ ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ශබ්දයන්ගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදින්නේය, විනාශවන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් යමෙක් ශබ්ද ආත්මයයි කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ කණත් අනාත්මයි. ශබ්දයෝත් අනාත්මයි.

15. "සොතවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) සොතවිඤ්ඤාණයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් සොතවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ කණත් අනාත්මය, ශබ්දයෝත් අනාත්මය, සොතවිඤ්ඤාණයත් අනාත්මයි.

16. "සොතසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) සොතසම්ඵස්සයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මය උපදියි' විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් සොතසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ කණත් අනාත්මය, ශබ්දයෝත් අනාත්මය, සොතසම්ඵස්සයත් අනාත්මයි.

17. "වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) වේදනාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේනම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ කණත් අනාත්මය ශබ්දයෝත් අනාත්මය සොතවිඤ්ඤාණයත් අනාත්මය සොතසම්ඵස්සයත් අනාත්මය වේදනාවත් අනාත්මයි.

18. "තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේනම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) තණ්හාවෙන් ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයක් පෙනේනම් මගේ ආත්මය උපදියි විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් තණ්හාව ආත්මයයි යමෙක්

කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ කණත් අනාත්මය ශබ්දයෝත් අනාත්මය සොතවිඤ්ඤාණයත් අනාත්මය සොතසම්ඵස්සයත් අනාත්මය වේදනාවත් අනාත්මය තණ්හාවත් අනාත්මය.

19. "නාසය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) නාසයේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මයද උපදින්නේය, බිඳෙන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් නාසය ආත්මයයි, යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. එහෙයින් නාසය අනාත්මයි.

20. "ගන්ධයෝ ආත්මයයි යමෙක් කියන්නේනම් එය නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ගන්ධයන්ගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මය උපදින්නේය, විනාශ වන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් යමෙක් ගන්ධයෝ ආත්මයයි කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ නාසයත් අනාත්මයි. ගන්ධයෝත් අනාත්මයි.

21. "ඝාණවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ඝාණවිඤ්ඤාණයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මය උපදියි, විනාශ වෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් ඝාණවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ නාසයත් අනාත්මය, ගන්ධයෝත් අනාත්මය ඝාණවිඤ්ඤාණයත් අනාත්මයි.

22. "ඝාණසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ඝාණසම්ඵස්සයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත්

පෙනේ නම් මාගේ ආත්මය උපදියි, විනාශ වෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් ඝාණසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ නාසයත් අනාත්මය, ගන්ධයෝත් අනාත්මය ඝාණවිඤ්ඤාණයත් අනාත්මය, ඝාණසම්ඵස්සයත් අනාත්මයි.

23 "වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) වේදනාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ නාසයත් අනාත්මය ගන්ධයෝත් අනාත්මය ඝාණවිඤ්ඤාණයත් අනාත්මය ඝානසම්පස්සයත් අනාත්මය වේදනාවත් අනාත්මයයි.

24. "තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) තණ්හාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මයත් උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ නාසයත් අනාත්මය, ගන්ධයෝත් අනාත්මය, ඝාණවිඤ්ඤාණයත් අනාත්මය, ඝාණසම්ඵස්සයත් අනාත්මය වේදනාවත් අනාත්මය, තණ්හාවත් අනාත්මය.

25. "දිව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) දිවේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මයද උපදින්නේය, බිඳෙන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් දිව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. එහෙයින් දිව අනාත්මයි.

26. "රසයන් ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) රසයන්ගේ ඉපදීමත්

විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මය උපදින්නේය, විනාශවන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් යමෙක් රසයන් ආත්මයයි කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ දිවත් අනාත්මයි. රසයෝත් අනාත්මයි.

27. "ජිව්හාවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ජිව්හාවිඤ්ඤාණයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මය උපදියි විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් ජිව්හාවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ දිවත් අනාත්මය, රසයෝත් අනාත්මය ජිව්හාවිඤ්ඤාණයත් අනාත්මයි.

28. "ජිව්හාසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ජිව්හාසම්ඵස්සයාගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මය උපදියි, විනාශවෙයි. යන කාරණයට ඊට පැමිණෙන්නේය. එහෙයින් ජිව්හාසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ දිවත් අනාත්මය, රසයෝත් අනාත්මය ජිව්හාවිඤ්ඤාණයත් අනාත්මය, ජිව්හා සම්ඵස්සයත් අනාත්මයි.

29. "වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ ඒ කීම නොයෙදෙන්නේය. (කුමක්හෙයින්ද?) වේදනාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණයට ඊට පැමිණෙන්නේය. එහෙයින් වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ දිවත් අනාත්මය, රසයෝත් අනාත්මය ජිව්හාවිඤ්ඤාණයත් අනාත්මය, ජිව්හාසම්ඵස්සයත් අනාත්මය, වේදනාවත් අනාත්මයි.

30. "තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) තණ්හාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මයත් උපදියි, විනාශ වෙයි යන කාරණයට ඊට පැමිණෙන්නේය. එහෙයින් තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ දිවත් අනාත්මය, රසයෝත් අනාත්මය, ජිව්හාවිඥ්ඥාණයත් අනාත්මය, ජිව්හාසම්ඵස්සයත් අනාත්මය, වේදනාවත් අනාත්මය, තණ්හාවත් අනාත්මය.

31. "කය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) කයේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මයද උපදින්නේය, බිඳෙන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් කය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. එහෙයින් කය අනාත්මයි.

32. "ප්‍රෂ්ටව්‍යයෝ ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ප්‍රෂ්ටව්‍යයන්ගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදින්නේය, විනාශ වන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය එහෙයින් යමෙක් ප්‍රෂ්ටව්‍යය ආත්මයයි කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ කයත් අනාත්මයි. ප්‍රෂ්ටව්‍යයෝත් අනාත්මයි.

33. "කායවිඥ්ඥාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) කායවිඥ්ඥාණයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණයට ඊට පැමිණෙන්නේය. එහෙයින් කායවිඥ්ඥාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ කයත් අනාත්මය, ප්‍රෂ්ටව්‍යයෝත් අනාත්මය, කාය විඥ්ඥාණයත් අනාත්මය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

34. "කායසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) කායසම්ඵස්සාගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේනම් මාගේ ආත්මය උපදියි, යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් කායසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ කයත් අනාත්මය ප්‍රෂ්ටව්‍යයෝත් අනාත්මය කාය විඥ්ඥාණයත් අනාත්මය කායසම්ඵස්සයත් අනාත්මයි.

35. "වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඔහුගේ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) වේදනාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. මෙසේ කයත් අනාත්මය, ප්‍රෂ්ටව්‍යයත් අනාත්මය, කාය විඥ්ඥාණයත් අනාත්මය, කායසම්ඵස්සයත් අනාත්මය, වේදනාවත් අනාත්මය.

36. "තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේ නම් කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) තණ්හාවගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යන කාරණය ඊට පැමිනෙන්නේය. එහෙයින් තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ කයත් අනාත්මය, ප්‍රෂ්ටව්‍යයත් අනාත්මය, කායවිඥ්ඥාණයත් අනාත්මය, කායසම්ඵස්සයත් අනාත්මය, වේදනාවත් අනාත්මය, තණ්හාවත් අනාත්මය.

37. "සිත ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) සිතේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මාගේ ආත්මයද උපදින්නේය, බිඳෙන්නේය යන කරුණ ඊට

පැමිණෙන්නේය. එහෙයින් සිත ආත්මයයි යමෙක් කියන්නේ නම් ඒ කීම නොයෙදෙන්නේය. එහෙයින් සිත අනාත්මයි.

38. "ධර්මාරම්මණයන් ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) ධර්මාරම්මණයන්ගේ ඉපදීමත් විනාශයත් පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදින්නේය, විනාශ වන්නේය යන කරුණ ඊට පැමිණෙන්නේය. එහෙයින් යමෙක් ධර්මාරම්මණයෝ ආත්මයයි යමෙක් කියන්නේනම් එය නොයෙදෙන්නේය. මගේ සිත අනාත්මයි. ධර්මාරම්මණත් අනාත්මයි.

39. "මනොවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) මනොවිඤ්ඤාණයේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමද විනාශයද පෙනේ නම් මගේ ආත්මය උපදියි, විනාශවෙයි යනමේ කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් මනොවිඤ්ඤාණය ආත්මයයි යමෙක් කියන්නේනම් එය නොයෙදෙන්නේය. මගේ සිතද අනාත්මයි, ධර්මාරම්මණයෝ ද අනාත්මයි මනොවිඤ්ඤාණයද අනාත්මයි.

40. "මනොසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේනම් ඔහුගේ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) මනොසම්ඵස්සයාගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමත් විනාශයත් පෙනේ නම් මගේ ආත්මය උපදියි බිඳෙයි යන මේ කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් මනොසම්ඵස්සය ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ සිතද අනාත්මයි, ධර්මාරම්මණයෝ ද අනාත්මයි, මනොවිඤ්ඤාණයද අනාත්මයි. මනොසම්ඵස්සයද අනාත්මයි.

41. "වේදනාව ආත්මයයි යමෙක් කියන්නේ නම් එය නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) වේදනාවගේ ඉපදීමද

විනාශයද පෙනෙයි. යමක ඉපදීමද විනාශයද පෙනේනම් මාගේ ආත්මය උපදියි විනාශවෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් යමෙක් වේදනාව ආත්මයයි කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ සිතද අනාත්මයි. ධර්මයෝ ද අනාත්මයි මනොවිඤ්ඤාණයද අනාත්මයි. මනොසම්ඵස්සයද අනාත්මයි. වේදනාවද අනාත්මයි.

42. "තණ්හාව ආත්මයයි යමෙක් කියන්නේනම් ඒ කීම නොයෙදෙන්නේය. (කුමක් හෙයින්ද?) තණ්හාවගේ ඉපදීමද විනාශයද පෙනෙන්නේය. යමක ඉපදීමද විනාශයද පෙනේ නම් මගේ ආත්මය උපදියි බිඳෙයි යන කාරණය ඊට පැමිණෙන්නේය. එහෙයින් යමෙක් තණ්හාව ආත්මයයි කියන්නේ නම් එය නොයෙදෙන්නේය. මෙසේ සිතද අනාත්මයි. ධර්මාරම්මණයෝ ද අනාත්මයි. මනොවිඤ්ඤාණයද අනාත්මයි. මනොසම්ඵස්සයද අනාත්මයි. වේදනාවද අනාත්මයි. තණ්හාවද අනාත්මයි.

43. "මහණෙනි, මේ වනාහි මමයයි ගන්නා වැරදි දැකීම ඉපදීම කරා යන්නාවූ ප්‍රතිපදාව වෙයි. 'එනම්, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, ඇස දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, රූපයන් දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, චක්ඛුවිඤ්ඤාණය දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, චක්ඛුසම්ඵස්සය දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි වේදනාව දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි තණ්හාව දකියිද,

44. "මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, කණ දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි ශබ්දයන් දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි සොත විඤ්ඤාණය දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි සොත සම්ඵස්සය දකියිද,

මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි වේදනාව දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි තණ්හාව දකියිද,

45. "මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි නාසය දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි ගන්ධයන් දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි ඝාණ විඤ්ඤාණය දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි ඝාණ සම්ඵස්සය දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි වේදනාව දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි තණ්හාව දකියිද,

46. "මෙය මගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි, දිව දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, රසයන් දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි. ජිව්හාවිඤ්ඤාණය දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, ජිව්හාසම්ඵස්සය දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, වේදනාව දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, තණ්හාව දකියිද,

47. "මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි කය දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, ප්‍රෂ්ටව්‍යයන් දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, කායවිඤ්ඤාණය දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, කායසම්ඵස්සය දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, වේදනාව දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, තණ්හාව දකියිද,

48. "මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, සිත දකියිද, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි,

ධර්මරම්මණයන් දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, මනොවිඤ්ඤාණය දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, මනොසම්ඵස්සය දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, වේදනාව දකියිද, මෙය මගේය මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි, තණ්හාව දකියිද, යන මේ, මාර්ගයයි,

**49.** "මහණෙනි, මේ වනාහි මමයයි ගැනීම නිරුද්ධකිරීමේ මාර්ගයවේ. එනම්ඃ මෙය මගේ නොවේය මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, ඇස දකියිද, මෙය මගේ නෙවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේ යයි, රූපයන් දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, චක්ඛුවිඤ්ඤාණය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, චක්ඛුසම්ඵස්සය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, වේදනාව දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, තණ්හාව දකියිද,

**50.** "මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, කණ දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, ශබ්දයන් දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නෙවේයයි, සොතවිඤ්ඤාණය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, සොතසම්ඵස්සය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, වේදනාව දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි තණ්හාව දකියිද,

**51.** "මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි නාසය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි ගන්ධයන්

දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි ඝාණවිඤ්ඤාණය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි ඝාණසම්ඵස්සය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, වේදනාව දකියිද, මෙය මගේ නොවේ, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි තණ්හාව දකියිද,

52. "මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි දිව දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි රසයන් දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නෙවේයයි ජිව්හාවිඤ්ඤාණය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි ජිව්හාසම්ඵස්සය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි වේදනාව දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි තණ්හාව දකියිද,

53. "මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි කය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි ප්‍රෂ්ටව්‍යයන් දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නෙවේයයි කායවිඤ්ඤාණය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි කායසම්ඵස්සය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි වේදනාව දකියිද, මෙය මගේ නොවේ, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි තණ්හාව දකියිද,

54. "මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි සිත දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ නොවේයයි ධර්මාරම්මණයන්

දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි, මනොවිඤ්ඤාණය දකියිද, මෙය මගේ නොවේය, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේ යයි මනොසම්ඵස්සය දකියිද, මෙය මගේ නොවේ මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි වේදනාව දකියිද, මෙය මගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේයයි තණ්හාව දකියිද යන මේ මාර්ගයයි.

55. "මහණෙනි, ඇසත් රූපයනුත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ මැදහත්වූ හෝ යම් විඳීමක් උපදියිද, සැප වේදනාවක් ලැබුණු හෙතෙම සතුටු වෙයි. හොඳය හොඳයයි කියයි. එහි බැසගෙණ සිටියි. ඔහුගේ රාගානුසය වැඩෙයි. හෙතෙම දුක් වේදනාවක් ලැබුයේ ශෝක වෙයි, ක්ලාන්තවෙයි, වැළපෙයි. පපුවේ අත් ගසමින් හඬයි. මුළාවට පැමිණෙයි. ඔහුගේ පටිඝානුසය වැඩෙයි. මැදහත් වේදනාවක් ලැබුයේ ඒ වේදනාවේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද, තත්වාකාරයෙන් නොදකියි. ඔහුගේ අවිජ්ජානුසය වැඩෙයි. මහණෙනි, හෙතෙමේ සුඛ වේදනාවෙහි රාගානුසය පහ නොකොට දුක්ඛ වේදනාවෙහි පටිඝානුසය දුරු නොකොට අදුක්ඛමසුඛ වේදනාවෙහි අවිජ්ජානුසය නූදුරා අවිද්‍යාව දුරුකොට විද්‍යාව නූපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන කාරණය සිදු නොවන්නේය.

56 "මහණෙනි, කණත් ශබ්දයනුත් නිසා සොත විඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ මැදහත්වූ හෝ යම් විඳීමක් උපදියිද, සැප වේදනාවක් ලැබුණු හෙතෙම සතුටු වෙයි. හොඳය, හොඳයයි කියයි. එහි බැසගෙණ සිටියි. ඔහුගේ රාගානුසය වැඩෙයි. හෙතෙම දුක් වේදනාවක් ලැබුයේ ශෝකවෙයි, ක්ලාන්තවෙයි, වැළපෙයි. පපුවේ අත් ගසමින් හඬයි. මුළාවට පැමිණෙයි. ඔහුගේ පටිඝානුසය වැඩෙයි. මැදහත් වේදනාවක්

ලැබුයේ ඒ වේදනාවේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද, තත්වාකාරයෙන් නොදකියි. ඔහුගේ අවිජ්ජානුසය වැඩෙයි. මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහ නොකොට දුක්ඛ වේදනාවෙහි පටිඝානුසය දුරු නොකොට අදුක්ඛමසුඛ වේදනාවෙහි අවිජ්ජානුසය නූදුරා අවිද්‍යාව දුරුකොට විද්‍යාව නූපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන කාරණය සිදු නොවන්නේය.

57. 'මහණෙනි, නාසයත් ගන්ධයනුත් නිසා ඝාණවිඤ්ඤාණය උපදියි ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ මැදහත්වූ හෝ යම් විඳීමක් උපදියිද, සැප වේදනාවක් ලැබුණු හෙතෙම සතුටු වෙයි. හොඳය හොඳයයි කියයි. එහි බැසගෙණ සිටියි. ඔහුගේ රාගානුසය වැඩෙයි. හෙතෙම දුක් වේදනාවක් ලැබුයේ ශෝකවෙයි, ක්ලාන්තවෙයි, වැළපෙයි. පපුවේ අත් ගසමින් හඬයි මුළාවට පැමිණෙයි. ඔහුගේ පටිඝානුසය වැඩෙයි. මැදහත් වේදනාවක් ලැබුයේ ඒ වේදනාවේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද, තත්වාකාරයෙන් නොදකියි. ඔහුගේ අවිජ්ජානුසය වැඩෙයි. මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහ නොකොට දුක්ඛ වේදනාවෙහි පටිඝානුසය දුරු නොකොට අදුක්ඛමසුඛ වේදනාවෙහි අවිජ්ජානුසය නූදුරා අවිද්‍යාව දුරුකොට විද්‍යාව නූපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන කාරණය සිදු නොවන්නේය.

58. "මහණෙනි, දිවත් රසයත් නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ මැදහත්වූ හෝ යම් විඳීමක් උපදියිද, සැප වේදනාවක් ලැබුණු හෙතෙම සතුටු වෙයි. හොඳය හොඳයයි කියයි. එහි බැසගෙණ සිටියි. ඔහුගේ රාගානුසය වැඩෙයි. හෙතෙම දුක් වේදනාවක් ලැබුයේ ශෝක වෙයි, ක්ලාන්තවෙයි, වැළපෙයි. පපුවේ අත් ගසමින් හඬයි. මුළාවට පැමිණෙයි. ඔහුගේ පටිඝානුසය වැඩෙයි. මැදහත් වේදනාවක් ලැබුයේ ඒ වේදනාවේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද, තත්වාකාරයෙන් නොදකියි. ඔහුගේ අවිජ්ජානුසය වැඩෙයි. මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහ නොකොට දුක්ඛ වේදනාවෙහි පටිඝානුසය දුරු නොකොට අදුක්ඛමසුඛ වේදනාවෙහි අවිජ්ජානුසය නුදුරා අවිද්‍යාව දුරුකොට විද්‍යාව නූපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන කාරණය සිදු නොවන්නේය.

**59.** "මහණෙනි, කයත් ප්‍රශ්ටව්‍යයත් නිසා කායවිඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ මැදහත්වූ හෝ යම් විඳීමක් උපදියිද, සැප වේදනාවක් ලැබුණු හෙතෙම සතුටු වෙයි. හොඳය හොඳයයි කියයි. එහි බැසගෙන සිටියි. ඔහුගේ රාගානුසය වැඩෙයි. හෙතෙම දුක් වේදනාවක් ලැබුයේ ශෝක වෙයි, ක්ලාන්තවෙයි, වැළපෙයි. පපුවේ අත් ගසමින් හඬයි. මුළාවට පැමිණෙයි. ඔහුගේ පටිඝානුසය වැඩෙයි. මැදහත් වේදනාවක් ලැබුයේ ඒ වේදනාවේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද, තත්වාකාරයෙන් නොදකියි. ඔහුගේ අවිජ්ජානුසය වැඩෙයි. මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහ නොකොට දුක්ඛ වේදනාවෙහි පටිඝානුසය දුරු නොකොට අදුක්ඛම සුඛ වේදනාවෙහි අවිජ්ජානුසය නුදුරා අවිද්‍යාව දුරුකොට විද්‍යාව නූපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන කාරණය සිදු නොවන්නේය.

**60.** "මහණෙනි, සිතත් ධර්මාරම්මණයනුත් නිසා මනො විඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ නිදුක් නොසැපවූ හෝ විඳීම උපදියි. හෙතෙමේ සැප වේදනාවක් ලැබුයේ සතුටුවෙයි. හොඳය හොඳයයි කියයි. එහි ගිලී සිටියි. ඔහුගේ රාගානුසය වැඩෙයි. දුක් වේදනාවක් ලැබුයේ ශොක කරයි, ක්ලාන්තවෙයි. වැළපෙයි. පපුවට අතගසමින් හඬයි. මුළාවට පැමිණෙයි. ඔහුගේ පටිඝානුසය වැඩෙයි. නිදුක් නොසැප වේදනාවක් ලැබුයේ ඒ

වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිශ්ශරණයද ඇති සැටියෙන් නොදනියි. ඔහුගේ අවිජ්ජානුසය වැඩෙයි. මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහනොකොට දුක්ඛවේදනාවෙහි පටිඝානුසය දුරු නොකොට මොහානුසය මුලින් නූපුටා අවිද්‍යාව දුරු නොකොට විද්‍යාව නූපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේය යන කාරණය සිදු නොවන්නේය.

**61.** "මහණෙනි, ඇසත් රූපයනුත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සය වේ ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ නිදුක් නොසැපවූ හෝ වේදනාව උපදියි. හෙතෙම සැප වේදනාවක් ලැබූයේ සතුටු නොවෙයි. හොඳය හොඳයයි නොකියයි. එහි නොගිලෙයි. ඔහුගේ රාගානුසය දුරු වන්නේය. දුක් වේදනාවක් ලැබූයේ ශෝක නොකරයි, ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවට අත ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි, ඔහුගේ පටිඝානුසය දුරුවෙයි. නිදුක් නොසැප වේදනාවක් ලැබූයේ ඒ වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිශ්ශරණයද ඇති සැටියෙන් දනියි. ඔහුගේ අවිජ්ජානුසය දුරුවෙයි.

මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහකොට දුක් වේදනාවෙහි පටිඝානුසය දුරුකොට නිදුක් නොසැප වේදනාවෙහි අවිජ්ජානුසය මුලින් උදුරා අවිද්‍යාව පහකොට විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන මෙය සිදුවන්නේය.

**62.** "මහණෙනි, කණත් ශබ්දයනුත් නිසා සොත විඤ්ඤාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ නිදුක් නොසැපවූ හෝ වේදනාව උපදියි. හෙතෙම සැප වේදනාවක් ලැබූයේ සතුටු නොවෙයි. හොඳය හොඳයයි නොකියයි. එහි නොගිලෙයි. ඔහුගේ රාගානුසය දුරු වන්නේය. දුක් වේදනාවක් ලැබූයේ ශෝක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවට අත

ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි, ඔහුගේ පටිඝානුසය දුරු වෙයි. නිදුක් නොසැප වේදනාවක් ලැබුයේ ඒ වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිශ්ශරණයද ඇතිසැටියෙන් දනියි. ඔහුගේ අවිජ්ජානුසය දුරුවෙයි.

මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහකොට දුක් වේදනාවෙහි පටිඝානුසය දුරුකොට නිදුක් නොසැප වේදනාවෙහි අවිජ්ජානුසය මුලින් උපුටා අවිද්‍යාව පහකොට විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන මෙය සිදුවන්නේය.

**63.** "මහණෙනි, නාසයත් ගන්ධයනුත් නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ නිදුක් නොසැපවූ හෝ වේදනාව උපදියි. හෙතෙම සැප වේදනාවක් ලැබුයේ සතුටු නොවෙයි. හොඳය හොඳයයි නොකියයි. එහි නොගිලෙයි. ඔහුගේ රාගානුසය දුරු වන්නේය. දුක් වේදනාවක් ලැබුයේ ශෝක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි, පපුවට අත ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි, ඔහුගේ පටිඝානුසය දුරුවෙයි. නිදුක් නොසැප වේදනාවක් ලැබුයේ ඒ වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිශ්ශරණයද ඇති සැටියෙන් දනියි. ඔහුගේ අවිජ්ජානුසය දුරුවෙයි.

මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහකොට දුක් වේදනාවෙහි පටිඝානුසය දුරුකොට නිදුක් නොසැප වේදනාවෙහි අවිජ්ජානුසය මුලින් උපුටා අවිද්‍යාව පහකොට විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන මෙය සිදුවන්නේය.

**64.** "මහණෙනි, දිවත් රසයනුත් නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ නිදුක් නොසැපවූ හෝ වේදනාව උපදියි.

හෙතෙම සැප වේදනාවක් ලැබුයේ සතුටු නොවෙයි. හොඳය හොඳයයි නොකියයි. එහි නොගිලෙයි. ඔහුගේ රාගානුසය දුරු වන්නේය. දුක් වේදනාවක් ලැබුයේ ශෝක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවට අත ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි, ඔහුගේ පටිඝානුසය දුරුවෙයි. නිදුක් නොසැප වේදනාවක් ලැබුයේ ඒ වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිශ්ශරණයද ඇති සැටියෙන් දනියි. ඔහුගේ අවිජ්ජානුසය දුරුවෙයි.

මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහකොට දුක් වේදනාවෙහි පටිඝානුසය දුරුකොට නිදුක් නොසැප වේදනාවෙහි අවිජ්ජානුසය මුලින් උපුටා අවිද්‍යාව පහකොට විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන මෙය සිදුවන්නේය.

**65.** "මහණෙනි, කයත් ප්‍රෂ්ටව්‍යයත් නිසා කාය විඥ්ඥාණය උපදියි. තිදෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ නිදුක් නොසැපවූ හෝ වේදනාව උපදියි. හෙතෙම සැප වේදනාවක් ලැබුයේ සතුටු නොවෙයි. හොඳය හොඳයයි නොකියයි. එහි නොගිලෙයි. ඔහුගේ රාගානුසය දුරුවන්නේය. දුක් වේදනාවක් ලැබුයේ ශෝක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවට අත ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි, ඔහුගේ පටිඝානුසය දුරුවෙයි. නිදුක් නොසැප වේදනාවක් ලැබුයේ ඒ වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිශ්ශරණයද ඇති සැටියෙන් දනියි. ඔහුගේ අවිජ්ජානුසය දුරුවෙයි.

මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහකොට දුක් වේදනාවෙහි පටිඝානුසය දුරුකොට නිදුක් නොසැප වේදනාවෙහි අවිජ්ජානුසය මුලින් උපුටා අවිද්‍යාව පහකොට විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන මෙය සිදුවන්නේය.

**66.** "මහණෙනි, සිතත් ධර්මාරම්මණයනුත් නිසා මනො විඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සයයි. ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ නිදුක් නොසැපවූ හෝ වේදනාව උපදියි. හෙතෙම සැප වේදනාවක් ලැබුයේ සතුටු නොවෙයි. හොඳය හොඳයයි නොකියයි. එහි ගැලී නොසිටියි. ඔහුගේ රාගානුසය දුරු වෙයි. හෙතෙම දුක් වේදනාවක් ලැබුයේ ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවට අත ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි. ඔහුගේ පටිඝානුසය දුරුවෙයි. නිදුක් නොසැප වේදනාවක් ලැබුයේ ඒ වේදනාවගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිශ්ශරණයද ඇති සැටියෙන් දනියි. ඔහුගේ අවිජ්ජානුසය දුරුවෙයි.

මහණෙනි, හෙතෙමේ සැප වේදනාවෙහි රාගානුසය පහකොට දුක් වේදනාවෙහි පටිඝානුසය දුරුකොට නිදුක් නොසැප වේදනාවෙහි අවිජ්ජානුසය මුලින් උපුටා අවිද්‍යාව පහකොට විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේය යන මෙය සිදු වන්නේය.

**67.** "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම ඇසෙහි කලකිරෙයි. රූපයන්හි කලකිරෙයි. චක්ඛු විඤ්ඤාණයෙහි කලකිරෙයි. චක්ඛු සම්ඵස්සයෙහි කලකිරෙයි. වේදනාවෙහි කලකිරෙයි. තණ්හාවෙහි කලකිරෙයි. කණෙහි කලකිරෙයි. ශබ්දයන්හි කලකිරෙයි. නාසයෙහි කලකිරෙයි. ගන්ධයන්හි කලකිරෙයි. දිවෙහි කලකිරෙයි. රසයන්හි කලකිරෙයි. කයෙහි කලකිරෙයි. ප්‍රෂ්ටව්‍යයන්හි කලකිරෙයි. සිතෙහි කලකිරෙයි. ධර්මාරම්මණයන්හි කලකිරෙයි. මනො විඤ්ඤාණයෙහි කලකිරෙයි. මනොසම්ඵස්සයෙහි කලකිරෙයි. වේදනාවෙහි කලකිරෙයි. තණ්හාවෙහි කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීම හේතුකොටගෙන කෙලෙසුන් කෙරෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේය යන ඤාණය උපදියි. ඉපදීම ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මින් පසු කළයුත්තක් නැතැයි දැනගනී."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය. මේ සූත්‍ර දේශනාව දේශනා කරන කල්හි සැට නමක් භික්ෂූන්ගේ සිත් තණ්හා දිට්ඨි මානයන් විසින් අල්වානොගෙන ආශ්‍රව ධර්මයන් කෙරෙන් මිදුනාහුය.

**සය වැනිවූ ඡඡක්ක සූත්‍රය නිමි. (5-6)**

---

## 49. මහාසළායතන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩවාසය කරණසේක. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි" කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "ස්වාමීනි" ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළේය.

2 "මහණෙනි, මම තොපට මහත්වූ ෂඩායතනයන් ප්‍රකාශකරන්නාවූ ධර්ම කොට්ඨාශයක් දෙශනා කරන්නෙමි. එය අසව්. මොනවට මෙනෙහි කරව්. කියන්නෙමි" වදාළේය. "එසේය ස්වාමීනි යයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ මෙසේ වදාළහ.

"මහණෙනි, චක්ඛායතනය තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේවේද, රූපායතනයන් තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේවේද, චක්ඛුසම්ඵස්සය තත්වූ පරිද්දෙන් නොදන්නේ නොදක්නේවේද, යම් මේ චක්ඛුසම්ඵස්සය හෙතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ සැප නොවූ දුක් නොවූ හෝ විඳීමක් උපදීද, එයද තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේ උපදීද,

චක්ඛායතනයෙහි ඇලෙන්නේ වේද, රූපායතනයන්හි ඇලෙන්නේ වේද, චක්ඛු විඤ්ඤාණයෙහි ඇලෙන්නේවේද, චක්ඛුසම්ඵස්සයෙහි ඇලෙන්නේවේද, යම් මේ චක්ඛුසම්ඵස්සය හෙතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ සැප නොවූ දුක් නොවූ හෝ වේදනාවක් උපදීද, එහි ඇලෙන්නේද, එහි ඇළුනාවූ එයින් යුක්තවූ එයින් මුළාවූ ආශ්වාද වශයෙන් දකිමින් වාසය කරන්නාවූ ඔහුගේ මත්තෙහි පඤ්චූපාදානස්කන්ධයෝ වැඩීමට පැමිණෙත්. ඔහුගේ දෙවෙනි භව ඇතිකරන්නාවූ ඒ ඒ භවයෙහි ඇලෙන්නාවූ නන්දිරාගය සමග පවත්නාවූ තෘෂ්ණාවක්වේද, ඔහුගේ ඒ තෘෂ්ණාවද වැඩෙන්නීය. ඔහුගේ කායික දාහයෝද වැඩෙන්නාහුය. මානසික දාහයෝද වැඩෙන්නාහුය. කායික සන්තාපයෝද වැඩෙන්නාහුය. මානසික සන්තාපයෝද වැඩෙන්නාහුය. කායික පරිදැවිලිද වැඩෙන්නාහුය. මානසික දැවිලිද වැඩෙන්නාහුය. හෙතෙමේ කායික දුකද මානසික දුකද විඳින්නේ වේ.

3. "මහණෙනි, හෙතෙමේ සෝතායතනය තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේද, මහණෙනි, ඝාණායතනය තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේද, මහණෙනි, ජිහ්වායතනය තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේද, මහණෙනි, කායායතනය තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේද, මහණෙනි, මනායතනය තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේද, මහණෙනි, ධර්මායතනයන් තත්වූ පරිද්දෙන් නොදන්නේ නොදක්නේද, මහණෙනි, මනො විඥානය තත්වූපරිදි නොදන්නේ නොදක්නේද, මහණෙනි, මනොසම්ඵස්සය තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේද, යම් මේ මනොසම්ඵස්සය හෙතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ සැප නොවූ දුක් නොවූ හෝ වේදනාවක් උපදීද, එයද තත්වූපරිද්දෙන් නොදන්නේ නොදක්නේද සිතෙහි ඇලෙන්නේද ධර්මයන්හි ඇලෙන්නේද, මනොවිඥානයෙහි ඇලෙන්නේද, මනොසම්ඵස්සයෙහි ඇලෙන්නේද යම් මේ මනොසම්ඵස්සය

හෙතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ සැප නොවූ හෝ දුක් නොවූ හෝ වේදනාවක් උපදීද, එහිද ඇලෙන්නේද, එහි ඇළුනාවූද යෙදුනාවූද මුළාවූද ආශ්වාද වශයෙන් දකිමින් වාසය කරන්නහුගේ පඤ්චූපාදානස්කන්ධයෝ මත්තෙහි වැඩීමට යන්නාහුය. ඔහුගේ දෙවෙනි භවය ඇතිකරන්නාවූ නන්දිරාගයෙන් යුක්තවූ ඒ ඒ තැන ඇලෙන්නාවූ තෘෂ්ණාවක් වේද ඒ තෘෂ්ණාවද වැඩෙන්නීය. ඔහුගේ දාහයෝද වැඩෙන්නාහුය. මානසික දාහයෝද වැඩෙන්නාහුය. කායික සන්තාපයෝද වැඩෙන්නාහුය. මානසික සන්තාපයෝද වැඩෙන්නාහුය. කායික දැවීම්ද වැඩෙන්නාහුය. මානසික දැවීම්ද වැඩෙන්නාහුය. හෙතෙමේ කායික දුකද මානසික දුකද විඳින්නේය.

4. "මහණෙනි, චක්ඛායතනයද තත්වූපරිද්දෙන් දන්නේ, දක්නේද, රූපයන් තත්වූපරිද්දෙන් දන්නේ, දක්නේද, චක්ඛුවිඤ්ඤාණය තත්වූපරිද්දෙන් දන්නේ, දක්නේද, චක්ඛුසම්ඵස්සය තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද යම් මේ චක්ඛුසම්ඵස්සයක් හෙතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක් නොවූ සැප නොවූ හෝ විඳීමක් උපදීද, එයද තත්වූපරිදි දන්නේ දක්නේද, චක්ඛායතනයෙහි නොඇලෙන්නේද රූපායතනයන්හි නොඇලෙන්නේද, චක්ෂුර්විඥානයෙහි නොඇලෙන්නේද, චක්ඛුසම්ඵස්සයෙහි නොඇලෙන්නේද, යම් මේ චක්ඛුසම්ඵස්සය හෙතු කොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක් නොවූ සැප නොවූ හෝ විඳීමක් උපදීද, එහිද නොඇලෙයිද, එහි නොඇළුනාවූ නොයෙදුනාවූ මුළා නොවූ ආදීනව වශයෙන් දක්නා ස්වභාව ඇතිව වාසයකරන්නහුගේ පඤ්චූපාදානස්කන්ධයෝ මත්තෙහි වැඩීමට නොයන්නාහුය. ඔහුගේ දෙවන භවය ඇතිකරන්නාවූ නන්දිරාගයෙන් යුක්තවූ ඒ ඒ තන්හි ඇලෙන්නාවූ තෘෂ්ණාවක් වෙයිද ඔහුගේ ඒ තෘෂ්ණාවද ප්‍රහීණවෙයි. ඔහුගේ කායික දාහයෝද ප්‍රහීණවෙත්. මානසික දාහයෝද ප්‍රහීණවෙත්. කායික සන්තාපයෝද

ප්‍රහීණවෙත්. මානසික සන්තාපයෝද ප්‍රහීණවෙත්. කායික දැවිලිද ප්‍රහීණවෙත්. මානසික දැවිලිද ප්‍රහීණවෙත්.

5. "හෙතෙමේ කායික සැපයද, මානසික සැපයද විඳියි. ඔහුගේ කුසල් සිත සමග යෙදුණු සැපයෙන් යුත් යම් දැකීමක් වේද, එය ඔහුගේ සම්‍යක්දෘෂ්ටිය වන්නීය. ඒ ආකාරයෙන්වූ ඔහුගේ යම් කල්පනාවක් වේද, එය ඔහුගේ සම්‍යක් සංකල්පනාව වන්නේය. ඒ ආකාරයෙන්වූ ඔහුගේ යම් ව්‍යායාමක් වේද, එය ඔහුගේ යම් සිහියක් වේද, එය ඔහුගේ සම්‍යක් ස්මෘතිය වේ. ඒ ආකාරයෙන්වූ ඔහුගේ යම් සමාධියක් වේද, එය ඔහුගේ සම්‍යක් සමාධිය වේ. ඒ ආකාරයෙන්වූ ඔහුගේ කාය කර්මයද වාක් කර්මයද, ආජීවයද පළමුවෙන්ම පිරිසිදුවූයේවේ. මෙසේ වනාහි ඔහුගේ මේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය තෙමේ වැඩීමට සම්පූර්ණ බවට යන්නේය.

6. "මෙසේ මේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය වඩන්නාවූ ඔහුට සතර සතිපට්ඨානයෝද වැඩීමට සම්පූර්ණ බවට යන්නාහුය. සතර සම්‍යක් ප්‍රධානයෝද වැඩීමට සම්පූර්ණ බවට යන්නාහුය. සතර ඍද්ධිපාදයෝද වැඩීමට සම්පූර්ණ බවට යන්නාහුය. පඤ්චෙන්ද්‍රිය ධර්මයෝද වැඩීමට සම්පූර්ණ බවට යන්නාහුය. පඤ්ච බලයෝද වැඩීමට සම්පූර්ණ බවට යන්නාහ. සප්තබොධ්‍යංගයෝද වැඩීමට සම්පූර්ණ බවට යන්නාහ. ඕහට සමථයද විදර්ශනාවද යන මේ ධර්මදෙක යුගන්ධවූවාහු (එක්ව) පවතිත්.

7. 'හෙතෙමේ යම් ධර්මකෙනෙක් විශිෂ්ටඥානයෙන් පිරිසිඳ දතයුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂඥානයෙන් පිරිසිඳ දන්නේය. යම් ධර්ම කෙනෙක් විශිෂ්ටඥානයෙන් දැන පහ කළ යුත්තාහුද, ඒ ධර්මයන් විශිෂ්ටඥානයෙන් දැන දුරුකරන්නේය. යම් ධර්ම කෙනෙක් විශෙෂඥානයෙන් දැන වැඩිය යුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් දැන වඩන්නේය. යම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකළ යුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "මහණෙනි, කිනම් ධර්මකෙනෙක් විශෙෂප්‍රඥාවෙන් පිරිසිඳ දතයුත්තාහුද, පඤ්ච උපාදානස්කන්ධයෝයයි කිය යුත්තේය. හේ කවරේද? රූපූපාදානස්කන්ධය, වේදනානූපාදානස්කන්ධය සංඥොපාදානස්කන්ධය, සංස්කාරෝපා දානස්කන්ධය, විඥානොපාදානස්කන්ධය, (යන මොහුයි) මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් පිරිසිඳ දතයුත්තාහුය. මහණෙනි, කිනම් ධර්ම කෙනෙක් විශෙෂඥානයෙන් ප්‍රහීණ කළයුත්තාහුද, අවිද්‍යාවද, භවතෘෂ්ණාවද, යන දෙකය. මේ ධර්මයෝ විශෙෂඥානයෙන් ප්‍රහීණ කටයුත්තාහ. මහණෙනි, කිනම් ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් වැඩියයුත්තාහුද, සමථයද විදර්ශනාවද යන දෙකය. මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් වැඩියයුත්තාහුය. මහණෙනි, කිනම් ධර්මකෙනෙක් විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂකළ යුත්තාහුද? අර්හත් මාර්ගඥාන විද්‍යාවද ඵලවිමුක්තියද (යන දෙකය.)

"මේ ධර්මදෙක විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකළ යුත්තාහුය. මහණෙනි, සොතායතනය තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද, මහණෙනි, ඝාණායතනය තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද, මහණෙනි, ජිහ්වායතනය තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද, මහණෙනි, කායායතනය තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද, මහණෙනි, මනායතනය තත්වූපරිද්දෙන් දන්නේද දක්නේද, මහණෙනි, ධර්මාරම්මණයන් තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද, මහණෙනි, මනොවිඥානය තත්වූ පරිද්දෙන් දන්නේ, දක්නේද, මහණෙනි, මනොසම්ඵස්සය තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද, යම් මේ මනොසම්ඵස්සය හෙතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක් නොවූ සැප නොවූ හෝ විඳීමක් උපදීද, එයද තත්වූපරිද්දෙන් දන්නේ දක්නේද, සිතෙහි නොඇලෙන්නේද, ධර්මාරම්මණයන්හි නොඇලෙන්නේද, මනොවිඥානයෙහි නොඇලෙන්නේද, මනොසම්ඵස්සයෙහි නොඇලෙන්නේ යම් මේ මනොසම්ඵස්සය හේතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක් නොවූ සැප නොවූ හෝ විඳීමක් උපදීද, එහිද

නොඇලෙන්නේ ද එහි නොඇළුනාවූ මුළා නොවූ නොයෙදුනාවූ ආදීනව දක්නා ස්වභාව ඇතිව වාසය කරන්නහුගේ මත්තෙහි පඤ්චූපාදානස්කන්ධයෝ විනාශයට යන්නාහුය.

"ඔහුගේ ඒ ඒ තැන ඇලෙන්නාවූ දෙවෙනි භවයෙහි ඉපදීම ඇතිකරන්නාවූ නන්දිරාගයෙන් යුත් තෘෂ්ණා තොමෝ වන්නීද, ඒ තෘෂ්ණා තොමෝද ප්‍රහීණ වන්නේය. ඔහුගේ කායික දාහයෝද ප්‍රහීණවෙත්. මානසික දාහයෝද ප්‍රහීණවෙත්. කායික සන්තාපයෝද ප්‍රහීණවෙත්. මානසික සන්තාපයෝද ප්‍රහීණවෙත්. කායික දැවිලිද ප්‍රහීණවෙත්. මානසික දැවිලිද ප්‍රහීණවෙත්. හෙතෙම කායික සැපයද මානසික සැපයද විඳින්නේවේ. ඔහුගේ තත්වූපරිදි දක්නාවූ දෘෂ්ටියක් වේද එය ඔහුගේ සම්‍යක් දෘෂ්ටිය වෙයි. ඔහුගේ තත්වූපරිදිවූ යම් කල්පනාවක් වේද, එය ඔහුගේ සම්‍යක් සංකල්පනාව වේ. ඔහුගේ තත්වූපරිදිවූ යම් ව්‍යායාමයෙක් වේද, එය ඔහුගේ සම්‍යක් ව්‍යායාමයවේ ඔහුගේ තත්වූපරිදිවූ යම් සිහියක් වේද, එය ඔහුගේ සම්‍යක් ස්මෘතිය වෙයි.

ඔහුගේ තත්වූපරිදිවූ යම් සමාධියක්වේද, එය ඔහුගේ සම්‍යක්සමාධිය වන්නේය. පළමුව ඔහුගේ කායකර්මයද වාක්කර්මයද ආජීවයද පිරිසිදුවූයේ වේ. මෙසේ ඔහුගේ මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට යන්නේය. මෙසේ මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වඩන්නාවූ ඔහුට සතර සතිපට්ඨානයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්. සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෝ වැඩීමට සම්පූර්ණ බවට යන්නාහ. සතර ඍද්ධිපාදයෝ වැඩීමට සම්පූර්ණ බවට යන්නාහ. පඤ්චෙන්ද්‍රියයෝ වැඩීමට සම්පූර්ණ බවට යන්නාහ. පඤ්චබලයෝ වැඩීමට සම්පූර්ණ බවට යන්නාහ. සප්තබොධ්‍යංගයෝ වැඩීමට සම්පූර්ණ බවට යන්නාහ. ඔහුට සමථයද විදර්ශනාවද එක්ව පවත්නාහුය.

**9.** "හෙතෙමේ යම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් පිරිසිඳ දතයුත්තාහුද ඒ ධර්මයන් විශෙෂඥානයෙන් පිරිසිඳ

දැනගන්නේය. යම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් දැන පහ කළයුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂඥානයෙන් දැන පහකරන්නේය. යම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් දැන වැඩිය යුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් දැන වඩන්නේය. යම් ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කළයුත්තාහුද ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කරයි. මහණෙනි, කිනම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් දැන පිරිසිඳ දතයුත්තාහුද, පඤ්චොපාදානස්කන්ධයෝයයි කියයුතු වන්නේය. හේ කවරේද? රූපූපාදානස්කන්ධය, වේදනූපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපොදානස්කන්ධය විඥානොපාදනස්කන්ධය, යන මොහුය. මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් දැන පිරිසිඳ දතයුත්තාහුය.

10. "මහණෙනි, කිනම් ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් දැන පහකළ යුත්තාහුද, අවිද්‍යාවත් භව තෘෂ්ණාවත්ය. මේ ධර්මයෝ විශෙෂඥානයෙන් දැන පහකළ යුත්තාහුය. මහණෙනි, කිනම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් දැන වැඩියයුත්තාහුද, සමථයත් විදර්ශනාවත්ය. මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් දැන වැඩිය යුත්තාහුය.

"මහණෙනි, කිනම් ධර්මකෙනෙක් විශෙෂ ප්‍රඥාවෙන් දැන ප්‍රත්‍යක්ෂ කළයුත්තාහුද, අර්හත් මාර්ගඥාන විද්‍යාවත් ඵල විමුක්තියත්ය. මේ ධර්මයෝ විශේෂ ප්‍රඥාවෙන් දැන ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහුයයි" වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළේය. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේගේ දෙශනාවට විශෙෂයෙන් සතුටුවූවාහුයි.

**සත්වැනි සළායතන සූත්‍රය නිමි. (5-7)**

---

# 50. නගරවින්දෙය්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂුසංඝයා සමග කොසොල් දනව්වෙහි චාරිකාවෙහි හැසිරෙනු ලබන්නේ, නගරවින්දෙය්‍ය නම්වූ කොසොල්රට වැස්සන්ගේ බමුණු ගම යම් තැනෙක්හිද එහි වැඩමවූසේක. නගරවින්දෙය්‍යක නම් බ්‍රාහ්මණ ගෘහපතීහු වනාහි, ශාක්‍යපුත්‍රවූ ශාක්‍ය කුලයෙන් පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මහත්වූ භික්ෂු සංඝයා සමග කොසොල් දනව්වෙහි චාරිකාවෙහි හැසිරෙනු ලබන්නේ නගරවින්දෙය්‍ය නම් බමුණු ගමට පැමිණියේය.

2. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳුවූ යහපත් කීර්ති ශබ්දයක් පැනනැංගේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුදු අර්හත් නම් වූයේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුදු සම්‍යක් සම්බුද්ධ නම් වූයේය. අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත හෙයින් විද්‍යාචරණ සම්පන්න නම් වන සේක. යහපත් ගති ඇති හෙයින් සුගත නම් වන සේක. සියලු ලොව දත් හෙයින් ලොකවිදූ නම් වන සේක. තමන් වහන්සේට වඩා උසස් කෙනෙක් නැති හෙයින් නිරුත්තර නම් වන සේක. දමනය නොකොට හැකි පුරුෂයන් දමනය කරණ හෙයින් පුරිසදම්ම සාරථී නම් වන සේක. දෙව් මිනිසුන්ට අනුශාසනා කරණ හෙයින් ශාස්තෘ නම් වනසේක. චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය අවබොධ කළ හෙයින් බුද්ධ නම් වන සේක. රාගාදිය නැසූ හෙයින් භාග්‍යවත් නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිතවූද, මාරයා සහිතවූද, බ්‍රහ්මයා සහිතවූද, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූද, දෙව් මිනිසුන් සහිතවූද, මේ ලොකය තමන් වහන්සේ විසින් විශෙෂ ප්‍රඥාවෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරන්නේය

ඒ භාග්‍යවතුන් වහන්සේ මුල යහපත්වූද, මැද යහපත්වූද, කෙළවර යහපත්වූද, අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ, හාත්පස

සම්පූර්ණවූ ධර්මය දෙශනා කරන්නේය. පිරිසිදුවූ බ්‍රාහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරන්නේය. එබඳුවූ රහතුන්ගේ දැකීම යහපත් වන්නේය' කියායි.

3. එකල්හි වනාහි නගරවින්දෙය්‍යක නම් බ්‍රාහ්මණ ගෘහපතීහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි එළඹියාහුය. එළඹ, ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසක හුන්නාහුය. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූවාහුය. සතුටු විය යුතුවූ, සිහි එලවිය යුතුවූ කථාව කොට නිමවා එකත්පසක හුන්නාහුය. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි ඇඳිලිබැඳ වැඳ, එකත්පසක හුන්නාහුය. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි නාම ගොත්‍රයන් හඟවා එකත්පසක හුන්නාහුය. ඇතැම් කෙනෙක් නිශ්ශබ්දව එකත්පසක හුන්නාහුය.

4. එකත්පසක හුන්නාවූ නගරවින්දෙය්‍යක නම් බ්‍රාහ්මණ ගෘහපතීන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. 'ගෘහපතියෙනි, ඉදින් තොප අතින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ 'ගෘහපතියෙනි, කෙබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර නොකට යුත්තාහුද, ගරුකාර නොකට යුත්තාහුද, බුහුමන් නොකට යුත්තාහුද, නොපිදිය යුත්තාහුදැ'යි මෙසේ විචාරන්නාහුද? ගෘහපතියෙනි, මෙසේ විචාරණ ලද්දාහු තොපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට මෙසේ ප්‍රකාශ කරන්නාහුය. 'යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇසින් දතයුතුවූ රූපාරම්මණයන්හි පහනොකළ රාගය ඇත්තාහුද, පහනොකළ ද්වේෂය ඇත්තාහුද, පහනොකළ මොහය ඇත්තාහුද, ඇතුළත නොසන්සුන් සිත් ඇත්තාහු, කයින්ද, වචනයෙන්ද, මනසින්ද, කලින් කල යහපත්වූද, අයහපත්වූද, පැවතුමෙන් හැසිරෙත්ද, මෙබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර නොකට යුත්තාහුය. ගරුකාර නොකට යුත්තාහුය. බුහුමන් නොකට යුත්තාහුය. නොපිදිය යුත්තාහුය.'

5. ඊට කාරණා කවරේද? අපිදු වනාහි ඇසින් දතයුතුවූ රූපාරම්මණයන් කෙරෙහි පහනොකරණ ලද රාග ඇත්තාහුය. පහනොකරණ ලද ද්වෙෂ ඇත්තාහුය. පහනොකරණ ලද මොහ ඇත්තාහුය. ඇතුළත නොසන්සුන් සිත් ඇත්තාහු කයින්ද, වචනයෙන්ද, සිතින්ද, කලින් කල සම විෂම චර්‍ය්‍යාවන්ගේ වශයෙන් හැසිරෙන්නමු. ඒ අපගේ මේ සම චර්‍ය්‍යා වශයෙන් හැසිරීමද මත්තෙහි නොදක්නවුන්ගේය. එහෙයින් පින්වත්වූ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර නොකටයුත්තාහුය. ගරු නොකටයුත්තාහුය. බුහුමන් නොකටයුත්තාහුය. නොපිදිය යුත්තාහුය. යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ශ්‍රොතාවිඥෙය ශබ්දාරම්මණයන් කෙරෙහිද, ඝ්‍රාණ විඥෙය ගන්ධාරම්මණයන් කෙරෙහිද ජිහ්වා විඥෙය රසාරම්මණයන් කෙරෙහිද, කායවිඥෙය ස්පර්ශ ආරම්මණයන් කෙරෙහිද, සිතින් දැනගතයුතු ධර්මාරම්මණයන් කෙරෙහිද පහනොකරණලද රාග ඇත්තාහු, පහ නොකරණලද ද්වෙෂ ඇත්තාහු, පහනොකරණලද මොහ ඇත්තාහු, ඇතුළත නොසන්සුන් සිත් ඇත්තාහු කයින්ද, වචනයෙන්ද, මනසින්ද, කලින්කල සම විසමයන්ගේ වශයෙන් හැසිරෙත්ද, එබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර නොකළ යුත්තාහුය, ගරු නොකට යුත්තාහුය, බුහුමන් නොකට යුත්තාහුය, නොපිදිය යුත්තාහුය. ඊට කාරණා කවරේද? අපිදු වනාහි සිතින් දැනගතයුතු ධර්මාරම්මණයන්හි පහනොකළ රාගය ඇත්තාහු, පහනොකළ ද්වෙෂය ඇත්තාහු, පහනොකළ මොහය ඇත්තාහු, ඇතුළත නොසන්සුන් සිත් ඇත්තාහු කයින්ද, වචනයෙන්ද, මනසින්ද සම විසමචර්‍ය්‍යා වශයෙන් හැසිරෙමු. ඒ අපගේ මේ සමවූ හැසිරීමද, මතු නොබලන්නවුන්ගේය. එහෙයින් පින්වත්වූ ඒ මහණ බමුණෝ සත්කාර නොකට යුත්තාහුය, ගරු නොකටයුත්තාහුය, බුහුමන් නොකට යුත්තාහුය, නොපිදිය යුත්තාහුයි. ගෘහපතියෙනි, මෙසේ අසන ලද්දාවූ තොපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජිකයින්ට මෙසේ ප්‍රකාශ කරන්නාහුය.

6. "ගෘහපතියෙනි, ඉදින් වනාහි තොපගෙන් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ අසන්නාහුද, ගෘහපතියෙනි, කෙබඳුවූ

ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර කටයුත්තාහුද, ගරු කටයුත්තාහුද, බුහුමන් කටයුත්තාහුද, පිදිය යුත්තාහුද කියායි. ගෘහපතියෙනි, මෙසේ අසන ලද්දාහු තොපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරන්නාහුය. යම් ඒ මහණ බමුණු කෙනෙක් ඇසින් දතයුතු රූපාරම්මණයන් කෙරෙහි පහවූ රාග ඇත්තාහු, පහවූ ද්වෙෂ ඇත්තාහු, පහවූ මොහ ඇත්තාහු, ඇතුළත සන්සුන් සිත් ඇත්තාහු කයින්, වචනයින්, මනසින් සමචරියා වශයෙන් හැසිරෙද්ද, මෙබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර කටයුත්තාහුය, ගරු කටයුත්තාහුය, බුහුමන් කටයුත්තාහුය, පිදිය යුත්තාහුය. ඊට හේතු කවරේද? අපි වනාහි ඇසින් දතයුතුවූ රූපාරම්මණයන් කෙරෙහි පහනොවූ රාග ඇත්තාහු, පහනොවූ ද්වෙෂ ඇත්තාහු, පහනොවූ මොහ ඇත්තාහු, ඇතුළත නොසන්සුන් සිත් ඇත්තාහු, කයින්, වචනයින්, මනසින්, සම විසමචරියා වශයෙන් හැසිරෙන්නමු. ඒ අපගේ මේ සමචරියා වශයෙන් හැසිරීමද, මතු බලන්නවුන්ගේය. එහෙයින් ඒ පින්වත්වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර කටයුත්තාහුය, ගරු කටයුත්තාහුය, බුහුමන් කටයුත්තාහුය, පිදියයුත්තාහුය. යම් මේ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් කණින් දතයුතුවූ ශබ්දාරම්මණයන්හිද, නාසයෙන් දතයුතුවූ ගන්ධා රම්මණයන්හිද, දිවෙන් දතයුතුවූ රසාරම්මණයන්හිද, කයින් දතයුතුවූ ඓාට්ඨබ්බාරම්මණයන්හිද, සිතින් දත යුතුවූ ධර්මාරම්මණයන්හිද, පහවූ රාග ඇත්තාහු, පහවූ ද්වෙෂ ඇත්තාහු, පහවූ මොහ ඇත්තාහු, ඇතුළත සන්සුන් සිත් ඇත්තාහු, කයින් වචනයින්, මනසින්, සම හැසිරීමෙන් හැසිරෙත්ද, මෙබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර කටයුත්තාහුය, ගරු කටයුත්තාහුය, බුහුමන් කටයුත්තාහුය, පිදිය යුත්තාහුය. ඊට හේතු කවරේද? අපි වනාහි සිතින් දතයුතුවූ ධර්මයන් කෙරෙහි පහනොවූ රාග ඇත්තාහු, පහනොවූ ද්වෙෂ ඇත්තාහු, පහනොවූ මොහ ඇත්තාහු, ඇතුළත නොසන්සුන් සිත් ඇත්තාහු, කයින්, වචනයින්, මනසින්, කලින් කල සම විසම වශයෙන් හැසිරෙන්නමු. ඒ අපගේ මේ සම චරියා

වශයෙන් හැසිරීම්ද, මතු බලන්නවුන්ගේය. එහෙයින් පින්වත්වූ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්කාර කටයුත්තාහ, ගරු කටයුත්තාහ, බුහුමන් කටයුත්තාහ පිදිය යුත්තාහුයි. ගෘහපතියෙනි, මෙසේ විචාරණ ලද්දාහු තොපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරන්නහුය.

7. "ගෘහපතියෙනි, ඉදින් වනාහි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ තොප අතින් මෙසේ විචාරන්නාහුද, ආයුෂ්මත්නි, යම් හෙයකින් තොපි මෙසේ කියන්නාහුද, ඒකාන්තයෙන් ඒ ආයුෂ්මත්හු, පහවූ රාග ඇත්තාහු හෝ වෙත්, රාගය දුරු කිරීම පිණිස පිළිපන්නාහු හෝ වෙත්, පහකරණ ලද ද්වෙෂ ඇත්තාහු හෝ වෙත්, ද්වෙෂය නැති කිරීම පිණිස පිළිපන්නාහු හෝ වෙත්, පහකරණලද මොහය ඇත්තාහු හෝ වෙත්, මොහය දුරු කිරීම පිණිස පිළිපන්නාහු හෝ වෙත් ඒ ආයුෂ්මත් වරුන්ගේ වනාහි කවර ආකාරයක් වන්නාහුද, කවර වංශයක් වන්නාහුද කියායි. ගෘහපතියෙනි, මෙසේ අසන ලද්දාහු තොපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරන්නාහුය. එපරිද්දෙන් වනාහි ඒ ආයුෂ්මත්හු වනයෙහි ග්‍රාමාන්තය ඉක්මවා වනගතවූ ග්‍රාමාන්ත සේනාසනයන් සේවනය කරත්. යම්බඳු රූපයන් දැක දැක ඇලෙන්නාහුද, එහි එබඳුවූ ඇසින් දතයුතුවූ රූපයෝ නැත්තාහුමය. යම්බඳුවූ ශබ්දයන් අස අසා ආශාවෙන් සිත් අලවන්නාහුද, එහි එබඳුවූ කණින් දතයුතුවූ ශබ්දයෝ නැත්තාහුමය. යම් සුවඳක් ආඝ්‍රාණය කොට සිත් අලවන්නාහුද, එබඳුවූ නාසයෙන් දතයුතුවූ සුගන්ධයෝ එහි නැත්තාහුමය. යම් රසයක් විඳ විඳ සිත් අලවන්නාහුද, එබඳුවූ දිවෙන් දතයුතුවූ රසයෝ එහි නැත්තාහුමය. යම් ස්පර්ශයක් ස්පර්ශ කොට සිත් අලවන්නාහුද, එබඳුවූ කයින් දතයුතුවූ ස්පර්ශයෝ එහි නැත්තාහුමය. ඇවැත්නි, මේ ආකාර ඇත්තාහුමය. මේ වංශ ඇත්තාහුමය. ආයුෂ්මත්නි, යම් හෙයකින් අපි මෙසේ කියන්නෙමුද, ඒකාන්තයෙන් ඒ ආයුෂ්මත්හු පහ කරණලද රාග ඇත්තෝ හෝ රාගය දුරුකිරීම පිණිස පිළිපන්නෝ හෝ පහකරණ

ලද ද්වේෂය ඇත්තේ හෝ ද්වේෂය දුරු කිරීම පිණිස පිළිපන්නේ හෝ පහකරණලද මොහය ඇත්තෝ හෝ මොහය දුරුකිරීම පිණිස පිළිපන්නෝ වෙත්යයි, ගෘහපතියෙනි, මෙසේ අසන ලද්දාහු තොපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියන්නාහුයයි වදාළේය.

8. මෙසේ වදාළ කල්හි නගරවින්දෙය්‍යක නම් බ්‍රාහ්මණ ගෘහපතිහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළාහුය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, ඉතා යහපත භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරණලද්දක් උඩුකුරු කරන්නේ හෝ වසන ලද්දක් විවෘත කරන්නේ හෝ මංමුලාවූවෙක්හට මග කියන්නේ හෝ අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි, තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයාණන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය තෙමේ ප්‍රකාශ කර වදාරණ ලද්දේය. ඒ අපි භාග්‍යවත්වූ ගෞතමයන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද සරණකොට යන්නෙමු භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගියාවූ අපි උපාසකයන් කොට දරණ සේක්වායි" යනුයි.

**නගරවින්දෙය්‍ය සූත්‍රය නිමි. (5-8)**

---

## 51. පිණ්ඩපාත පාරිශුද්ධි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ සවස් කාලයෙහි ඵලසමවතින් නැගී සිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළැඹියේය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පස්ව හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්

වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. ශාරීපුත්‍රය, තොපගේ ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ. ඡවිවර්ණය පිරිසිදුය. ශාරීපුත්‍රය, ඔබ දැන් කවර විහරණයකින් බහුලව වසන්නෙහි දැයි ඇසූහ. "ස්වාමීනි, මම මේ කාලයෙහි බහුලකොට ශූන්‍යතා ඵලසමාපත්ති විහරණයෙන් වෙසෙමි" යි කීයේය.

2 "යහපති, යහපති. ශාරීපුත්‍රය, මහාපුරුෂයන්ගේ විහරණයෙන් ඔබ දැන් බහුලව වෙසෙයි. ශාරීපුත්‍රය, යම් මේ ශූන්‍යතා ඵල සමාපත්තියක් වේද, එය මහාපුරුෂයන්ගේ වාසය වන්නේය. එහෙයින් ශාරීපුත්‍රය, මේ ශාසනයෙහි මහණතෙම බහුලකොට ඵලසමාපත්ති විහරණයෙන් යුක්තව වසන්නෙමියි, කැමති වන්නේද, ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතුයි. 'මම යම් මගෙකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසෙක්හි පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මාර්ගයකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එහිදී චක්ෂුර්විඥානයෙන් දතයුතුවූ රූපාරම්මණයන්හි කැමැත්ත හෝ ඇලීම හෝ ද්වෙෂය හෝ මුළාවීම හෝ කිපීම හෝ මාගේ සිතෙහි ඇත්තේද' කියායි. ඉදින් ශාරීපුත්‍රය, මහණතෙම නුවණින් ප්‍රත්‍යවේක්ෂා කරන්නේ 'මම යම් මගකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසෙක්හි පිඬු පිණිස හැසුරුණෙම්ද, යම් මාර්ගයකින් ගමේ පිඬු සිඟීමෙන් වැළකී ආයෙම්ද, එතැන්හි චක්ෂුර්විඥානයෙන් දතයුතුවූ රූපාරම්මණයන්හි කැමැත්ත හෝ ඇලීම හෝ ද්වෙෂය හෝ මෝහය හෝ කිපීම හෝ ඇතැයි' දනී නම් ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් ලාමකවූ ඒ අකුසල කර්මයන්ගේම ප්‍රහාණය පිණිස වෑයම් කටයුතුය. ඉදින් වනාහි ශාරීපුත්‍රය, මෙනෙහි කරන්නාවූ ඒ මහණතෙම 'මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එහි චක්ෂුර්විඥානයෙන් දතයුතුවූ රූපාරම්මණයන්හි ඡන්දය හෝ ඇලීම හෝ ද්වෙෂය හෝ

මෝහය හෝ කිපීම හෝ නැතැයි' දනී නම් ශාරීපුත්‍රය, රෑ දාවල් දෙක්හි කුශල ධර්මයන්හි අනුව හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් ඒ ප්‍රීතියෙන්ම වාසය කළ යුතුය.

3. "ශාරීපුත්‍රය, නැවතද ඒ භික්ෂුව විසින් මෙසේ නුවණින් කල්පනා කටයුතුය. 'මම යම් මගකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මඟකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, ශ්‍රොතා විඥානයෙන් දතයුතුවූ ශබ්දයන්හිද, ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ මාගේ සිතෙහි ඇත්තේදැයි' මෙනෙහි කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණතෙම නුවණින් කල්පනාකොට බලන්නේ මෙසේ දකීද, 'මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළැකී පෙරළා ආයෙම්ද, එතැන්හි කණින් දතයුතුවූ ශබ්දයන්හි මා සිත පිළිබඳව ඡන්දය හෝ රාගය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ ඇතැයි' දනී නම් ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් ලාමකවූ ඒ අකුශල ධර්මයන්ගේම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතුය. ශාරීපුත්‍රය, ඉදින් වනාහි නුවණින් කල්පනාකොට බලන්නාවූ මහණතෙම 'මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එහි කණින් දතයුතුවූ ශබ්දයන්හි ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ නැතැයි' දනී නම් රෑ දාවල් දෙක්හි කුශල ධර්මයන්හි අනුව හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් ඒ ප්‍රීතියෙන්ම වාසය කළ යුතුය.

4. "ශාරීපුත්‍රය නැවතද ඒ භික්ෂුව විසින් මෙසේ නුවණින්කල්පනා කටයුතුය. 'මම යම් මගකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මඟකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, ඝ්‍රාණ විඥානයෙන් දතයුතුවූ ගන්ධයන්හිද ඡන්දය හෝ රාගය හෝ

ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ මාගේ සිතෙහි ඇත්තේදැයි, මෙනෙහි කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණතෙම නුවණින් කල්පනා කොට බලන්නේ මෙසේ දකීද, ‘මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළැකී පෙරළා ආයෙම්ද, එතැන්හි නාසයෙන් දතයුතුවූ ගන්ධයන්හි මා සිත පිළිබඳව ඡන්දය හෝ රාගය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ ඇතැයි’ දනී නම්, ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් ලාමකවූ ඒ අකුශල ධර්මයන්ගේම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතුය. ශාරීපුත්‍රය, ඉදින් වනාහි නුවණින් කල්පනාකොට බලන්නාවූ මහණතෙම ‘මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එහි නාසයෙන් දතයුතුවූ, ගන්ධයන්හි ඡන්දය හෝ ද්වෙෂය හෝ රාගය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ නැතැයි දනී නම් රෑ දාවල් දෙක්හි කුශල ධර්මයන්හි අනුව හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් ඒ ප්‍රීතියෙන්ම වාසය කළයුතුය.

5. "ශාරීපුත්‍රය, නැවතද ඒ භික්ෂුව විසින් මෙසේ නුවණින් කල්පනා කළයුතුය. ‘මම යම් මගෙකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, ජිහ්වා විඥානයෙන් දතයුතුවූ රසයන්හිද, ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ මාගේ සිතෙහි ඇත්තේදැයි, මෙනෙහි කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙම නුවණින් කල්පනාකොට බලන්නේ මෙසේ දකීද, ‘මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එතැන්හි දිවෙන් දතයුතුවූ රසයන්හි මා සිත පිළිබඳ ඡන්දය හෝ රාගය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ ඇතැයි’ දනී නම්, ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් ලාමකවූ ඒ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

අකුශල ධර්මයන්ගේම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතුය. ශාරීපුත්‍රය, ඉදින් වනාහි නුවණින් කල්පනා කොට බලන්නාවූ මහණතෙම 'මම යම් මාර්ගයකින් පිඩු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඩු සිගා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඩු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එහි දිවෙන් දතයුතුවූ රසයන්හි ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ නැතැයි දනී නම් ඒ දාවල් දෙක්හි කුශල ධර්මයන්හි අනුව හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් ඒ ප්‍රීතියෙන්ම වාසය කළයුතුය.

**6.** "ශාරීපුත්‍රය, නැවතද ඒ භික්ෂුව විසින් මෙසේ නුවණින් කල්පනා කළයුතුය. 'මම යම් මගෙකින් පිඩු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඩු සිගා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඩු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, කාය විඥානයෙන් දතයුතුවූ ස්පර්ශයන්හිද ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ මාගේ සිතෙහි ඇත්තේදැයි මෙනෙහි කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණතෙම නුවණින් කල්පනාකොට බලන්නේ මෙසේ දකීද, 'මම යම් මාර්ගයකින් පිඩු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඩු සිගා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඩු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එතැන්හි කයෙන් දතයුතුවූ ස්පර්ශයන්හි මා සිත පිළිබඳව ඡන්දය හෝ රාගය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ ඇතැයි' දනී නම්, ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් ලාමකවූ ඒ අකුශල ධර්මයන්ගේම ප්‍රහාණය පිණිස වෑයම් කළ යුතුය. ශාරීපුත්‍රය, ඉදින් වනාහි නුවණින් කල්පනා කොට බලන්නාවූ මහණතෙම 'මම යම් මාර්ගයකින් පිඩු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඩු සිගා ඇවිද්දෙම්ද, යම් මගෙකින් ගමින් නික්ම පිඩු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එහි කයින් දතයුතුවූ ස්පර්ශයන්හි ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ නැතැයි දනී නම් ඒ දාවල්

දෙක්හි කුශල ධර්මයන්හි අනුව හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් ඒ ප්‍රීතියෙන්ම වාසය කළයුතුය.

7. "ශාරීපුත්‍රය නැවතද ඒ භික්ෂුව විසින් මෙසේ නුවණින් කල්පනා කළයුතුය. 'මම යම් මගකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, මනොවිඥානයෙන් දතයුතුවූ ධර්මයන්හිද ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ මාගේ සිතෙහි ඇත්තේදැයි, මෙනෙහි කළ යුතුය. ශාරීපුත්‍රය, ඉදින් මහණ තෙම නුවණින් කල්පනාකොට බලන්නේ මෙසේ දකීද, 'මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මගකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළැකී පෙරළා ආයෙම්ද, එතැන්හී සිතින් දතයුතුවූ ධර්මයන්හි මා සිත පිළිබඳව ඡන්දය හෝ රාගය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ ඇතැයි' දනී නම්, ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් ලාමකවූ ඒ අකුශල ධර්මයන්ගේම ප්‍රහාණය පිණිස වෑයම් කළ යුතුයි. ශාරීපුත්‍රය, ඉදින් වනාහි නුවණින් කල්පනාකොට බලන්නාවූ මහණතෙම 'මම යම් මාර්ගයකින් පිඬු පිණිස ගමට ගියෙම්ද, යම් පෙදෙසක පිඬු සිඟා ඇවිද්දෙම්ද, යම් මඟකින් ගමින් නික්ම පිඬු සෙවීමෙන් වැළකී පෙරළා ආයෙම්ද, එහි සිතින් දතයුතුවූ, ධර්මයන්හි ඡන්දය හෝ රාගය හෝ ද්වෙෂය හෝ මෝහය හෝ ප්‍රතිඝය හෝ නැතැයි' දනී නම් රෑ දාවල් දෙක්හි කුශල ධර්මයන්හි අනුව හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් ඒ ප්‍රීතියෙන්ම වාසය කළ යුතුය.

8. 'නැවතද ශාරීපුත්‍රය, මහණහු විසින් මාගේ පස්කම් ගුණයෝ ප්‍රහීණවූවාහුදැයි මෙසේ සැලකිය යුතුය. ඉදින් ශාරීපුත්‍රය, නුවණින් සලකන්නාවූ මහණතෙමේ "මා විසින් පස්කම් ගුණ ප්‍රහාණය නොකරන ලද්දාහ"යි දනී නම්, ශාරීපුත්‍රය, ඒ භික්ෂුව විසින් පඤ්චකාම බන්ධනයන්ගේ පහකිරීම පිණිස වෑයම් කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, නුවණින් කල්පනා කරන්නාවූ

මහණතෙමේ 'මා විසින් පඤ්චකාම ගුණයෝ පහකරන ලද්දාහුය'යි මෙසේ දනී නම්, ශාරීපුත්‍රය, රෑ දාවල්හි කුශල ධර්මයන්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් ඒ ප්‍රීතියෙන් යුක්තවම විසිය යුතුයි.

9. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් පඤ්චනීවරණයෝ පහකරන ලද්දාහුදැ"යි භික්ෂුව විසින් මෙසේ නුවණින් සැලකිය යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණතෙමේ මෙනෙහි කරන්නේ 'මා විසින් පඤ්චනීවරණයෝ පහනොකරන ලද්දාහ'යි මෙසේ දනී නම් ශාරීපුත්‍රය, ඒ මහණහු විසින් පඤ්චනීවරණයන්ගේ ප්‍රහාණය පිණිස වෑයම් කළ යුතුය. ඉදින් වනාහි ශාරීපුත්‍රය, මහණ තෙමේ මෙනෙහි කරන්නේ 'මාගේ පඤ්චනීවරණයෝ ප්‍රහීණ වූවාහ'යි මෙසේ දනී නම්, ශාරීපුත්‍රය, රෑ දාවල්හි කුසල් දහම්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් එම ප්‍රීතියෙන් වාසය කළ යුතුය.

10. "නැවතද ශාරීපුත්‍රය, භික්ෂුව විසින් 'මා විසින් පඤ්ච උපාදානස්කන්ධයෝ මෙනෙහි කරන්නේ පිරිසිඳ දන්නා ලද්දාහුදැ'යි නුවණින් මෙනෙහි කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණතෙමේ 'මා විසින් පඤ්චඋපාදානස්කන්ධයෝ පිරිසිඳ නොදන්නා ලද්දාහුය'යි දනී නම් ශාරීපුත්‍රය, ඒ භික්ෂුව විසින් පඤ්චඋපාදානස්කන්ධයන් පිරිසිඳ දැනීම පිණිස උත්සාහ කටයුතුය. ඉදින් වනාහි ශාරීපුත්‍රය, නුවණින් සලකන්නාවූ මහණතෙම 'මා විසින් පඤ්චඋපාදානස්කන්ධයෝ පිරිසිඳ දන්නා ලද්දාහුය'යි මෙසේ දනී නම් ශාරීපුත්‍රය, රෑ දාවල්හි කුශල ධර්මයන්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් ඒ ප්‍රීතියෙන් විසිය යුතුය.

11. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහුදැයි' භික්ෂුව විසින් මෙසේ මෙනෙහි කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙමේ මෙසේ මෙනෙහි කරන්නේ 'මා විසින් සතර සතිපට්ඨානයෝ නොවඩන ලද්දාහුය'යි මෙසේ දනීනම්, ශාරිපුත්‍රය, ඒ භික්ෂුව විසින් සතර සතිපට්ඨානයන්ගේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වැඩීම පිණිස උත්සාහ කළයුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙමේ නුවණින් සලකන්නේ, 'මා විසින් සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහු'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, රෑ දාවල් දෙක්හි කුශල ධර්මයන්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් එම ප්‍රීතියෙන් (යුක්තව) විසිය යුතුය.

12. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෝ වඩන ලද්දාහුදැ'යි මහණහු විසින් මෙසේ නුවණින් කල්පනා කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මෙසේ කල්පනා කරන්නාවූ මහණ තෙමේ 'මා විසින් සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෝ නොවඩන ලද්දාහයි' මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, ඒ මහණ විසින් සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයන්ගේ වැඩීම පිණිස වෑයම් කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙම මෙසේ මෙනෙහි කරන්නේ 'මා විසින් සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෝ වඩන ලද්දාහ'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, රෑ දාවල්හි කුසල් දහම්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් එම ප්‍රීතියෙන් (යුතුව) විසිය යුතුය.

13. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් සතර ඍද්ධිපාදයෝ වඩනා ලද්දාහුදැ'යි භික්ෂුව විසින් මෙනෙහි කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙම මෙසේ මෙනෙහි කරන්නේ 'මා විසින් සතර ඍද්ධිපාදයෝ නොවඩනා ලද්දාහයි' මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, ඒ භික්ෂුව විසින් සතර ඍද්ධිපාදයන්ගේ වැඩීම පිණිස උත්සාහ කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙම නුවණින් කල්පනා කරන්නේ 'මා විසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලද්දාහයි' මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, රෑ දාවල්හි කුසල් දහම්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් එම ප්‍රීතියෙන් (යුක්තව) විසිය යුතුය.

14. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ වඩන ලද්දාහුදැ'යි භික්ෂුව විසින් මෙසේ නුවණින් සැලැකිය යුතුය. ඉදින් ශාරීපුත්‍රය, භික්ෂු තෙම මෙසේ සලකන්නේ 'මා විසින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පඤ්චෙන්ද්‍රියයෝ නොවඩනා ලද්දාහුය'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, ඒ භික්ෂුව විසින් පඤ්චෙන්ද්‍රියයන් වැඩීම පිණිස වෑයම් කළ යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මෙනෙහි කරන්නාවූ භික්ෂු තෙම 'මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ වඩන ලද්දාහ'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, ඒ භික්ෂුව කුසල් දහම්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් එම ප්‍රීතියෙන් (යුක්තව) විසිය යුතුය.

15. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් පඤ්චබලයෝ වඩනා ලද්දාහුදැ'යි භික්ෂුව විසින් මෙසේ (නුවණින්) සැලැකිය යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙම මෙසේ නුවණින් බලන්නේ 'මා විසින් පඤ්ච බලයෝ නොවඩන ලද්දාහුය'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, ඒ භික්ෂුව විසින් පඤ්චබල වඩනු පිණිස වෑයම් කළයුතුය. ඉදින් ශාරීපුත්‍රය, මෙනෙහි කරන්නාවූ මහණතෙමේ 'මා විසින් පඤ්චබල වඩන ලද්දාහ'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, කුසල් දහම්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් එම ප්‍රීතියෙන් (යුක්තව) විසිය යුතුය.

16. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් සප්තබෝධ්‍යංගයෝ වඩන ලද්දාහුදැ'යි භික්ෂුව විසින් මෙසේ සැලැකිය යුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙම නුවණින් බලන්නේ 'මා විසින් සප්තබොධ්‍යංගයෝ නොවඩන ලද්දාහුය'යි මෙසේ දනී නම්, ශාරීපුත්‍රය, ඒ භික්ෂුව විසින් සප්තබෝධ්‍යංගයන්ගේ වැඩීම පිණිස උත්සාහ කටයුතුය. ඉදින් ශාරීපුත්‍රය, භික්ෂු තෙම මෙනෙහි කරන්නේ 'මා විසින් සප්තබෝධ්‍යංගයෝ වඩන ලද්දාහුය'යි මෙසේ දනී නම්, ශාරීපුත්‍රය, කුසල් දහම්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ මහණහු විසින් එම ප්‍රීතියෙන් (යුක්තව) විසිය යුතුය.

17. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය වඩන ලද්දේදැ'යි භික්ෂුව විසින් මෙසේ (නුවණින්) සැලැකිය යුතුය. ඉදින් ශාරීපුත්‍ර තෙම මෙනෙහි කරන්නේ 'මා විසින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ආර්‍ය්‍යඅෂ්ටාංගිකමාර්ගය නොවඩන ලදැ'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, ඒ මහණ විසින් ආර්‍ය්‍යඅෂ්ටාංගිකමාර්ගය වඩන පිණිස වෑයම් කළයුතුය, ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙමේ මෙනෙහි කරන්නේ 'මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය වඩන ලදැ'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, කුසල් දහම්හි දිවා රෑ දෙක්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් එම ප්‍රීතියෙන් (යුක්තව) විසිය යුතුය.

18. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් සමථයත් විදර්ශනාවත් වඩන ලද්දාහුදැ'යි භික්ෂුව විසින් මෙසේ (නුවණින්) සැලැකිය යුතුය ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙමේ 'මා විසින් සමථයද, විදර්ශනාවද නොවඩන ලද්දාහුය'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, ඒ භික්ෂුව විසින් සමථ විදර්ශනා වන්ගේ වැඩීම පිණිස වෑයම් කළයුතුය. ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙම මෙනෙහි කරන්නේ 'මා විසින් සමථයද විදර්ශනාවද වඩන ලද්දාහුය'යි මෙසේ දනීනම්, ශාරීපුත්‍රය, කුසල් දහම්හි දිවා රෑ දෙක්හි හික්මෙන්නාවු ඒ භික්ෂුව විසින් එම ප්‍රීතියෙන් (යුක්තව) විසිය යුතුය.

19. "නැවතද ශාරීපුත්‍රය, 'මා විසින් විද්‍යාව (ඵලඥාණය) ද විමුක්තිය (ඵලසම්ප්‍රයුක්ත සෙසු ධර්මයෝ) ද ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහුදැයි" භික්ෂුව විසින් මෙසේ (නුවණින්) මෙනෙහි කළ යුතුය, ඉදින් ශාරීපුත්‍රය, මහණ තෙමේ (නුවණින්) සලකන්නේ, 'මා විසින් විද්‍යාවද විමුක්තියද ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දාහුයයි' මෙසේ දනීනම් ශාරිපුත්‍රය, ඒ මහණ විසින් විද්‍යා විමුක්තීන්ගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වෑයම් කළ යුතුය. ඉදින් ශාරිපුත්‍රය, මහණ තෙම මෙනෙහි කරන්නේ 'මා විසින් විද්‍යාවද, විමුක්තියද ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහුය'යි මෙසේ දනී නම් ශාරීපුත්‍රය, කුසල් දහම්හි රෑ දාවල් දෙක්හි නැවත නැවත හික්මෙන්නාවූ ඒ භික්ෂුව විසින් එම ප්‍රීති ප්‍රමෝද්‍යයෙන් (යුක්තව) විසිය යුතුය.

20. 'ශාරීපුත්‍රය, අතීත කාලයෙහි යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ පිණ්ඩපාතය පිරිසිදු කළාහුද, ඒ

සියල්ලෝ මෙසේ මෙනෙහිකොට මෙනෙහිකොට පිණ්ඩපාතය පිරිසිදු කළහ. ශාරීපුත්‍රය, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ අනාගතයෙහි පිණ්ඩපාතය පිරිසිදු කරන්නාහුද, ඒ සියල්ලෝ මෙසේම මෙනෙහිකොට මෙනෙහිකොට පිණ්ඩපාතය පිරිසිදු කරන්නාහුය ශාරීපුත්‍රය, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ දැන් (මෙකල) පිණ්ඩපාතය පිරිසිදු කෙරෙද්ද, ඒ සියල්ලෝ මෙසේම පිණ්ඩපාතය පිරිසිදු කෙරෙති. එහෙයින් ශාරීපුත්‍රය, තොප විසින් ප්‍රත්‍යවෙක්ෂා කොට ප්‍රත්‍යවෙක්ෂා කොට පිණ්ඩපාතය පිරිසිදු කරන්නෙමුයි' මෙසේ හික්මිය යුතුයි. ශාරීපුත්‍රය තොප විසින් මෙසේම හික්මිය යුතුයයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. සතුටු සිත් ඇති ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ.

**නවවැනි පිණ්ඩපාත පාරිසුද්ධි සූත්‍රය නිමි. (5-9)**

---

## 52. ඉන්ද්‍රිය භාවනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කජංගල නම් නියම්ගම සමීපයෙහිවූ මුවෙලු වෙනෙහි (මුබෙලු නම් එක් වෘක්ෂ විශෙෂයෙකි. ඒ මුවෙලු රුකින් ගැවසීගත් මහ වනලැහැබෙක) වැඩවසන සේක. ඉක්බිති "පාරාසරිය" නම් බමුණාගේ අතවැසිවූ "උත්තර" නම් මානවකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට එළඹියේය. එළඹ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පස්ව උන්නාවූ පාරාසරිය බ්‍රාහ්මණයාගේ අතවැසිවූ උත්තර නම් මානවකයාට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක. "උත්තරය, පාරාසරිය බ්‍රාහ්මණ තෙමේ

ශ්‍රාවකයන්ට ඉන්ද්‍රිය භාවනාව දෙශනා කෙරේදැයි' ඇසූහ. "ගෞතමයන් වහන්ස, පාරාසරිය, බමුණු තෙමේ ශ්‍රාවකයන්ට ඉන්ද්‍රිය භාවනාව දෙශනා කෙරේයයි" (කීය.)

2. "උත්තරය, ඒ කෙසේ වනාහි පාරාසරිය බමුණු තෙමේ ශ්‍රාවකයන්ට ඉන්ද්‍රිය භාවනාව දෙශනා කෙරේදැයි" වදාළසේක. "භවත් ගෞතමයන් වහන්ස, මේ ලොකයෙහි ඇසින් රූපය නොබලයි. කණින් ශබ්දය නොඅසයි. භවත් ගෞතමයන් වහන්ස, මෙසේ පාරාසරිය බමුණුතෙමේ ශ්‍රාවකයන්ට ඉන්ද්‍රිය භාවනාව දෙශනා කෙරේ" (යයි කීය.)

3. "උත්තරය, පාරාසරිය බමුණාගේ වචනය යම් ප්‍රකාරයකින් වේද, එසේ ඇති කල්හි වනාහි අන්ධතෙම වඩන ලද ඉඳුරන් ඇත්තෙක් වන්නේය. බිහිරා වඩනලද ඉඳුරන් ඇත්තෙක් වන්නේය. ඒ එසේමැයි, අන්ධ තෙමේ රූප නොදකී. බිහිරා හඬ නොඅසායයි" (වදාළසේක.)

මෙසේ වදාළ කල්හි පාරාසරිය බමුණාගේ අතවැසිවූ උත්තර මානවක තෙමේ නිහඬ බවට පැමිණියේ තේජස් රහිත බවට පැමිණියේ කරබා ගත්තේ යට හෙලා ලූ මුව ඇත්තේ සිතිවිලි සිතමින් වැටහීම නැත්තෙක්ව හුන්නේය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පාරාසරිය බමුණාගේ අතැවැසිවූ, නිශ්ශබ්දවූ, තේජස් නැති බවට පැමිණියාවූ, කරබාගත් මුහුණ පහත් කරගෙන කල්පනා කරන්නාවූ, කරුණු නොවැටහෙන්නාවූ උත්තර මානවකයා දැක, ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්ට කථා කළසේක. ආනන්දය, පරාසරිය බමුණා ශ්‍රාවකයන්ට ඉඳුරන් වැඩීම අන් ආකාරයකින් කියයි. ආර්‍ය්‍ය විනයෙහි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාව අන් ආකාරයකින් වේයයි (වදාළසේක.)

5. "යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ආර්‍ය්‍ය විනයෙහි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාව දෙශනා කරන්නේ නම්

භාග්‍යවතුන් වහන්ස, මේ එයට කල් වන්නේය. සුගතයන් වහන්ස, මේ එයට කල් වන්නේය. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුයයි” (කීය.)

**6.** “එසේවී නම් ආනන්දය, අසව මනාකොට මෙනෙහිකරව. කියන්නෙමි”යි වදාළේය. “එසේය, වහන්සැ”යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවත්හට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

“ආනන්දය, කෙසේ වනාහි ආයඝී විනයෙහි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාව වේද යත්? ආනන්දය, මේ ශාසනයෙහි මහණහට ඇසින් රූප දැක ඇලීම උපදියිද, කිපීම උපදියිද, සිත ඇලීම හා කිපීම උපදියිද, හෙතෙම මෙසේ මට ලොභය උපන්නේය. ද්වෙෂය උපන්නේය. ලොභය හා ද්වෙෂය උපන්නේය. එය වනාහි ප්‍රත්‍යයන් විසින් කරන ලද්දේය. ඖළාරිකය, හේතුවෙන් උපන්නේය. යම් මේ විදර්ශනොපෙක්ෂාවක් වේද, එය ශාන්තය. එය ප්‍රණීතයයි දනීද, ඔහුට උපන් ඒ ලොභ සිතද, උපන් කෝප සිතද, ලොභ සිත හා කෝප සිතද නිරුද්ධ වෙයි. විදර්ශනා උපෙක්ෂාව මනාව පිහිටයි. ආනන්දය, යම්සේ වනාහි පිරිසිදු ඇස් ඇති පුරුෂයෙක් ඇස්පිය අරින්නේද, ඇස් ඇර පියන්නේද, ආනන්දය, එපරිද්දෙන්ම යම් කිසිවෙකුට මෙසේ වහා, මෙසේ ඉක්මනින්, මෙසේ පහසුවෙන් උපන් ලොභ සිතද, උපන් කෝප සිතද, උපන් ලොභ සහ කෝප සිතද නිරුද්ධ වෙයි. විදර්ශනොපෙක්ෂාව මනාව සිටී. ආනන්දය, ආයඝීවිනයයෙහි මෙය ඇසින් දතයුතුවූ රූපාරම්මණයන්හි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාවයයි කියනු ලැබේ.

7. “නැවතද ආනන්දයෙනි, භික්ෂුවට කණින් (ශ්‍රොත විඥානයෙන්) ශබ්ද අසා මනාප සිතද උපදී. අමනාප සිතද උපදී. මනාප අමනාප සිතද උපදී. හෙතෙම මෙසේ දනීද, මට මේ ලෝභ සහගත සිත උපන්නේය. ද්වෙෂ සහගත සිත උපන්නේය. එයද වනාහි හේතුවෙන් හටගත් ඖළාරිකාරම්මණය

නිසා උපන්නේය. යම් මේ (විදශීනා) උපෙක්ෂාවක් වේද, මෝතොමෝ ශාන්ත වන්නීය. මෝතොමෝ ප්‍රණීත වන්නීය. ඔහුගේ උපන් ඒ මනාප සිතද, උපන් අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැති වෙයි. විදශීනොපෙක්ෂාව මනාව සිටීයයි ආනන්දයෙනි, යම්සේ වනාහි ශක්තිමත් පුරුෂයෙක් අසුර ගසන්නේද, එපරිද්දෙන්ම ආනන්දයෙනි, යම් කිසිවෙකුට මෙසේ වහා මෙසේ ඉක්මනින් මෙසේ පහසුවෙන් උපන් මනාපවූ සිතද, උපන් අමනාපවූ සිතද උපන් මනාප අමනාප සිතද, නිරුද්ධ වෙයි. විදශීනොපෙක්ෂාව මනාව සිටීද, ආනන්දය, මෙය ආයර්‍ය විනයයෙහි කණින් දතයුතුවූ ශබ්දයන්හි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාවයයි කියනු ලැබේ.

8. "නැවතද ආනන්දයෙහි, මහණහට ඝ්‍රාණවිඥානයෙන් (නැහැයෙන්) ගඳ ආඝ්‍රාණයකොට මනාප සිතද උපදී. අමනාප සිතද උපදී. මනාප-අමනාප සිතද උපදී. හෙතෙම මෙසේ දනී. මට මේ ලොභ සහගත සිත උපන්නේය. ද්වෙෂ සහගත සිත උපන්නේය. එයද වනාහි හේතුවෙන් හටගත් ඕළාරිකාරම්මණය නිසා උපන්නේය. යම් මේ (විදර්ශනා) උපෙක්ෂාවක් වේද, මෝතොමෝ ශාන්ත වන්නීය, මෝතොමෝ ප්‍රණීත වන්නීය. ඔහුගේ උපන් ඒ මනාප සිතද, උපන් අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැතිවෙයි. විදර්ශනොපෙක්ෂාව මනාව සිටී. ආනන්දයෙනි, යම්සේ වනාහි මඳක් නැබුරුවූ නෙලුම් කොළයෙකැ වැටෙන්නාවූ දියබින්දු නොසිටිද්ද, එපරිද්දෙන්ම ආනන්දයෙනි, යම් කිසිවෙකුට මෙසේ වහා, මෙසේ ඉක්මනින්, මෙසේ පහසුවෙන්, උපන් මනාප සිතද, උපන් අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැති වෙයිද, විදර්ශනොපෙක්ෂාව මනාව සිටීද, ආනන්දයෙනි, මෙය ආර්ය විනයයෙහි නාසයෙන් දතයුතුවූ ගන්ධයන්හි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාවයයි කියනු ලැබේ.

9. 'නැවතද ආනන්දය, භික්ෂුහට ජිව්හා විඥානයෙන් (දිවෙන්) රස විඳගෙන මනාප සිත උපදී. අමනාප සිතද උපදී.

මනාප-අමනාප සිතද උපදී. හෙතෙම මෙසේ දනී. මට මේ ලෝභ සහගත සිත උපන්නේය. ද්වෙෂ සහගත සිත උපන්නේය. එයද වනාහි හේතුවෙන් හටගත් ඖළාරිකාරම්මණය නිසා උපන්නේය. යම් මේ (විදර්ශනා) උපෙක්ෂාවක් වේද, මෝතොමෝ ශාන්ත වන්නීය. මෝතොමෝ ප්‍රණීත වන්නීය. ඔහුගේ උපන් ඒ මනාප සිතද, උපන් අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැති වෙයි. විදර්ශනාඋපෙක්ෂාව මනාව පිහිටයි. ආනන්දයෙනි, යම්සේ ශක්තිය ඇති පුරුෂයෙක් දිවග කෙළ පිඩක් එකතුකොට පහසුවෙන් කෙළගසන්නේද, එපරිද්දෙන්ම ආනන්දය, යම් කිසිවෙකුට මෙසේ වහා, මෙසේ ඉක්මනින්, මෙසේ පහසුවෙන්, උපන් මනාප සිතද, අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැති වෙයි. විදර්ශනොපෙක්ෂාව මනාව පිහිටයිද ආනන්දය, එය ආර්ය විනයෙහි දිවෙන් දතයුතු රසයන්හි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාවයයි කියනු ලැබේ.

10. "නැවතද ආනන්දය, මහණහට කයින් පහස ස්පර්ශකොට මනාපවූ සිතද උපදී. අමනාප සිතද උපදී. මනාප-අමනාප සිතද උපදී. හෙතෙම මෙසේ දනී මට මේ ලෝභ සහගත සිත උපන්නේය. ද්වෙෂ සහගත සිත උපන්නේය. එයද වනාහි හේතුවෙන් හටගත් ඖළාරිකාරම්මණය නිසා උපන්නේය. යම් මේ (විදර්ශනා) උපෙක්ෂාවක් වේද, මෝතොමෝ ශාන්ත වන්නීය. මෝතොමෝ ප්‍රණීත වන්නීය, ඔහුගේ උපන් ඒ මනාප සිතද, උපන් අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැතිවෙයි. විදර්ශනොපෙක්ෂා මනාව පිහිටයි. ආනන්දය, යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත හෝ දිගහරින්නේද, දික්කළ අත හෝ වක් කරන්නේද, එපරිද්දෙන්ම ආනන්දය, යම් කිසිවෙකුට මෙසේ වහා, මෙසේ ඉක්මනින්, මෙසේ පහසුවෙන්, උපන් මනාප සිතද, අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැති වෙයිද, විදර්ශනොපෙක්ෂාව මනාව සිටීද, ආනන්දය, මෙය ආර්ය විනයෙහි කයින් දතයුතු ස්පර්ශයන්හි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාවයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11, 'නැවතද ආනන්දය, මහණහට මනසින් ධර්මාරම්මණයන් දැන මනාප සිත උපදී. අමනාප සිතද උපදී. මනාප අමනාප සිතද උපදී. හෙතෙම මෙසේ දනී. මට මේ ලෝභ සහගත සිත උපන්නේය. ද්වෙෂ සහගත සිත උපන්නේය. එයද වනාහි හේතුවෙන් හටගත් ඖළාරිකාරම්මණය නිසා උපන්නේය. යම් මේ (විදර්ශනා) උපෙක්ෂාවක් වේද, මෝතොමෝ ශාන්ත වන්නීය. මෝතොමෝ ප්‍රණීත වන්නීය. ඔහුගේ උපන් ඒ මනාප සිතද, උපන් අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැතිවෙයි. විදර්ශනොපෙක්ෂාව මනාව සිටී. ආනන්දයෙනි, යම්සේ වනාහි ශක්ති ඇති පිරිමියෙක් දවස මුළුල්ලෙහි තැවුණු යකඩ තැටියක දිය බින්දු දෙකක් හෝ තුනක් හෝ හෙලන්නේද, ආනන්දයෙනි, ඒ දිය බින්දු වැටීම හෙම්හිටය. එතකුදුවුවත් වහාම ඒ දිය බින්දු හාත්පස ක්ෂයවීමට වැනසීමට යන්නේද, එපරිද්දෙන්ම ආනන්දයෙනි, යම් කිසිවෙකුට මෙසේ වහා, මෙසේ ඉක්මනින්, මෙසේ පහසුවෙන් උපන් මනාප සිතද, අමනාප සිතද, උපන් මනාප-අමනාප සිතද නැතිවෙයිද, විදර්ශනොපෙක්ෂාව මනාව සිටීද, ආනන්දයෙනි, එය ආර්යවිනයයෙහි සිතින් දතයුතුවූ, ධර්මාරම්මණයන්හි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාවයයි කියනු ලැබේ.

"ආනන්දයෙනි, මෙසේ වනාහි ආයඝ්‍යීවිනයයෙහි නිරුත්තරවූ ඉන්ද්‍රිය භාවනාව වේ" (යයි වදාළසේක.)

12. "නැවතද ආනන්දය, කෙසේ නම් ශෛක්ෂ තෙමේ ප්‍රතිපදාවෙන් යුක්තවේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණහට ඇසින් රූප දැක මනාප සිතද උපදී, අමනාප සිතද උපදී. මනාප අමනාප සිතද උපදී. හෙතෙම උපන් ඒ මනාප සිත කරණකොටද, උපන් අමනාප සිත කරණකොටද, උපන් මනාප අමනාප සිත කරණකොටද හැකිලෙයි, ලජ්ජා වෙයි, පිළිකුල් කෙරෙයි. කණින් ශබ්ද අසා මනාප සිතද උපදී. අමනාප සිතද උපදී. මනාප-අමනාප සිතද උපදී. හෙතෙම උපන් ඒ මනාප සිත කරණකොටද, උපන් අමනාප සිත කරණකොටද, උපන්

මනාප-අමනාප සිත කරණකොටද හැකිලෙයි, ලජ්ජාවෙයි, පිළිකුල් කෙරෙයි. නාසයෙන් ගඳ ආඝ්‍රාණය කොට මනාප සිතද උපදී, අමනාප සිතද උපදී, මනාප-අමනාප සිතද උපදී. හෙතෙම උපන් ඒ මනාප සිත කරණකොටද, උපන් අමනාප සිත කරණකොටද, උපන් මනාප-අමනාප සිත කරණකොටද, හැකිලෙයි, ලජ්ජාවෙයි. පිළිකුල් කෙරෙයි. දිවෙන් රස ආස්වාදනයකොට (විඳ) මනාප සිතද උපදී. අමනාප සිතද උපදී. මනාප අමනාප සිතද උපදී. හෙතෙම උපන් ඒ මනාප සිත කරණකොටද, උපන් අමනාප සිත කරණකොටද, උපන් මනාප-අමනාප සිත කරණකොටද හැකිලෙයි, ලජ්ජාවෙයි, පිළිකුල් කෙරෙයි. කයින් ප්‍රෂ්ටව්‍යය ස්පර්ශකොට මනාප සිතද උපදී. අමනාප සිතද උපදී. මනාප අමනාප සිතද උපදී. හෙතෙම උපන් ඒ මනාප සිත කරණ කොටද, උපන් අමනාප සිත කරණකොටද, උපන් මනාප-අමනාප සිත කරණකොටද, හැකිලෙයි, ලජ්ජාවෙයි, පිළිකුල් කෙරෙයි. සිතින් ධර්මාරම්මණය දැන මනාපවූ සිතද උපදී. අමනාපවූ සිතද උපදී. මනාප-අමනාපවූ සිතද උපදී. හෙතෙම උපන් ඒ මනාප සිතින්ද, උපන් අමනාප සිතින්ද, උපන් මනාප අමනාප සිතින්ද කරණකොටගෙන හැකිලෙයි, ලජ්ජා වෙයි, පිළිකුල් කෙරෙයි, ආනන්දය, මෙසේ වනාහි ශෛක්ෂ තෙමේ පිළිපැදීමෙන් යුක්ත වේ.

13. "ආනන්දය, කෙසේ නම් ආයඝ්තෙමේ වැඩුණු ඉඳුරන් ඇත්තේ වේද, ආනන්දය; මේ ශාසනයෙහි මහණහට ඇසින් රූප දැක මනාප සිත උපදීද, අමනාපවූ සිත උපදීද, මනාප අමනාපවූ සිතද උපදී. ඉදින් පිළිකුල් අරමුණෙහි 'අප්‍රතිකූල සංඥාව ඇත්තෙක්ව වසන්නෙමි'යි කැමැති වේද, එහි අප්‍රතිකූල සංඥාව ඇත්තෙක්ව වාසය කෙරේ. ඉදින් පිළිකුල් නොවූ අරමුණෙහි 'පිළිකුලය යන සංඥාව ඇත්තෙක්ව වසන්නෙමි'යි කැමැති වේද, එහි පිළිකුලය යන හැඟීම ඇත්තෙක්ව වාසය කෙරේ. 'ඉදින් පිළිකුල් අරමුණෙහිද නොපිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල්ය යන සංඥාව ඇත්තෙක්ව වසන්නෙමි'යි කැමැති

වේද, එහි අප්‍රතිකූල සංඥාව ඇත්තෙක්ව වසයි. ‘ඉදින් නොපිළිකුල් අරමුණෙහිද පිළිකුල් අරමුණෙහිද පිළිකුල් සංඥාව ඇත්තෙක්ව වසන්නෙමි’යි කැමැති වේද, එහි පිළිකූලය යන සංඥාව ඇත්තෙක්ව වසයි. ‘ඉදින් පිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල් අරමුණෙහිද (පිළිකූලය නොපිළිකූලය යන) ඒ සංඥා දෙකම හැර සිහි ඇත්තෙක්ව, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව, උපෙක්ෂා ඇත්තෙක්ව (මැදහත්ව) වසන්නෙමි’යි කැමැති වේද, සිහියෙන් යුක්තව නුවණින් යුක්තව, මැදහත්ව වාසය කෙරේ.

14. “නැවතද ආනන්දය, කණින් ශබ්ද අසා, නාසයෙන් ආඝ්‍රාණය කොට, දිවෙන් රස විඳ, කයින් ස්පර්ශකොට, සිතින් ධර්මයන් දැන, මනාප සිත උපදීද, අමනාප සිත උපදීද, මනාප අමනාප සිත උපදීද, ‘ඉදින් පිළිකුල් අරමුණෙහි නොපිළිකූලය යන සංඥාව ඇත්තෙක්ව වසන්නෙමි’යි කැමැති වේද, එහි නොපිළිකුල්ය යන සංඥාව ඇතිව වාසය කෙරෙයි. ඉදින් නොපිළිකුල් අරමුණෙහි පිළිකුල්ය යන සංඥා ඇත්තෙක්ව වසන්නෙමි’යි කැමැතිවේද, එහි පිළිකුල්ය යන සංඥා ඇතිව වාසය කෙරෙයි. ‘ඉදින් පිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල් අරමුණෙහිද නොපිළිකුල්ය යන සංඥා ඇතිව වසන්නෙමි’යි කැමැති වේද, එහි නොපිළිකුල්ය යන සංඥා ඇතිව වාසය කෙරෙයි.. ‘ඉදින් නොපිළිකුල් අරමුණෙහිද, පිළිකුල් අරමුණෙහිද, පිළිකුල් සංඥා ඇතිව වසන්නෙමි’යි කැමැති වේද, එහි පිළිකුල්ය යන සංඥා ඇතිව වසයි. ‘ඉදින් නොපිළිකුල් අරමුණෙහිද, පිළිකුල් අරමුණෙහිද, පිළිකුල්ය යන සංඥා ඇතිව වසන්නෙමි’යි කැමැති වේද, එහි පිළිකුල්ය යන සංඥා ඇතිව වසයි. ‘ඉදින් පිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල් අරමුණෙහිද, ඒ පිළිකුල් නොපිළිකුල් දෙකද හැර සිහි නුවණින් යුක්තව, උපෙක්ෂාව ඇත්තෙක්ව, වසන්නෙමි’යි කැමැති වේද, එහි සිහි නුවණින් යෙදී මැදහත්ව වසයි. ආනන්දය, මෙසේ වනාහි ආය්‍ය්‍යීතෙමේ වඩනලද ඉඳුරන් ඇත්තේ වේ.

15. “ආනන්දයෙනි, මෙසේ වනාහි මා විසින් ආය්‍ය්‍යී විනයෙහි නිරුත්තරවූ, ඉන්ද්‍රිය භාවනාව දෙශනා කරනලදී.

ශෛක්ෂ ප්‍රතිපදාව ඇති පුද්ගලයා දෙශනා කරන ලද්දේය. වඩනලද ඉන්ද්‍රියයන් ඇති ආර්‍ය්‍යතෙම දෙශනා කරන ලද්දේය. ආනන්දයෙනි, ශ්‍රාවකයනට හිතෛෂීවූ අනුකම්පා කරන්නාවූ ශාස්තෘන් විසින් අනුකම්පා පිණිස යමක් කටයුතුද, එය මා විසින් තොපට කරනලදී. ආනන්දය, ඒ වෘක්ෂමූලයෝ වෙති. ඒ සූන්‍යාගාරයෝ වෙති. ආනන්දය, භාවනා කරව්. පමා වූවෝ නොවව්. පසුව විපිළිසර වූවෝ නොවව්. මේ තොපට අපගේ අනුශාසනයයි."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. සතුටු සිතැති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය.

**දශවැනිවූ ඉන්ද්‍රිය භාවනා සූත්‍රය නිමි. (5-10)**

**(පස්වැනිවූ සළායතන වර්ගයයි.)**

**උපරිපණ්ණාසකය නිමි.**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk